203 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 203 - இல. 4
**Volume 203 - No. 4**

2011 ඔක්තෝබර් 20 වන බ්‍රහස්පතින්දා
2011 ஒக்ரோபர் 20, வியாழக்கிழமை
**Thursday, 20th October, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත :**
නියමය

**ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

**කල් තැබීමේ යෝජනාව :**
සිවිල් ආරක්ෂක කමිටු බලගැන්වීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்:**
கட்டளை

**கமநல அபிவிருத்தி (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
சிவில் பாதுகாப்புக் குழுக்களைப் பலப்படுத்துதல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

STRATEGIC DEVELOPMENT PROJECTS ACT:
Order

AGRARIAN DEVELOPMENT (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Empowerment of Civil Defence Committees

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 ඔක්තෝබර් 20 වන බ්‍රහස්පතින්දා***
*2011 ஒக்ரோபர் 20, வியாழக்கிழமை*
*Thursday, 20th October, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p. m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විමල් වීරවංශ මහතා - පැමිණ නැත.

ගරු වයි.ජී. පද්මසිරි මහතා - පැමිණ නැත.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ගොඩමග හන්දිය - වැල්තොට දක්වා මාර්ගය : අලුත්වැඩියාව
### கொடமக சந்தி - வெல்தொட்ட வீதி : திருத்த வேலைகள்
### ROAD FROM GODAMAGA JUNCTION TO WELTOTA : REPAIR WORK

0957/'10

**2. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩමග හන්දියේ සිට වැල්තොට දක්වා මාර්ගය වර්ෂ ගණනාවක සිට අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැඩි සේ අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අයත් වන ආයතනය කුමක්ද;

(ii) මෙම මාර්ගය ගමනාගමනයට සුදුසු ලෙස අලුත්වැඩියා කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩ කටයුතු ආරම්භ කරන දිනය හා අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මුදල් මේ වන විට වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாணசபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் திஹகொட பிரதேச செயலாளர் பிரிவில் கொடமக சந்தியிலிருந்து வெல்தொட்ட வரையிலான வீதி பல வருடங்களாக திருத்தப்படா மையின் காரணத்தால் மிகவும் மோசமான நிலையை அடைந்துள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இவ்வீதி எந்த நிறுவனத்திற்கு சொந்தமான தென்பதையும்,

(ii) இவ்வீதியை போக்குவரத்துக்குப் பொருத்தமான விதத்தில் திருத்துவதற்கு திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்,

(iii) ஆமெனில், இப்பணிகளை எப்போது ஆரம்பித்து எப்போது பூர்த்திசெய்வதற்கு உத்தேசிக்கப் பட்டுள்ளது என்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இப்பாதையை அபிவிருத்தி செய்வதற்கு மதிப்பீடு செய்யப்பட்டுள்ள பணத்தொகை எவ்வளவென் பதையும்,

(ii) இப்பணத்தொகை ஏற்கனவே ஒதுக்கீடு செய்யப் பட்டுள்ளதா என்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils :

(a) Is he aware that the road from Godamaga junction to Welthota in Thihagoda Divisional Secretary's Division in Matara district has become badly dilapidated due to lack of repair for several years ?

(b) Will he inform this House-

(i) of the institution under which that road comes;

(ii) whether plans have been made to repair that road to be suitable for transportation;

(iii) if so, of the date on which repair work will be commenced and the proposed date by which that work is to be completed ?

(b) Will he state -

(i) the amount estimated for the development of that road;

(ii) whether that amount has been allocated by now ?

(c) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.

(ii) 00 සිට 1.0 කිලෝමීටර් දක්වා කොටස ඇස්තමේන්තු සකස් කර ඇති අතර ඇස්ෆෝල්ට් යොදා සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

(iii) ආරම්භ කළ දිනය: 2011.09.15 අවසන් කිරීමට යෝජිත දිනය: 2011.11.30

(ඇ) (i) රු.63,181,313.07

(ii) ඔව්.

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම විමසන ගොඩමග හන්දියේ සිට වැල්තොට දක්වා මාර්ගයේ මේ කියන කොටසේ -ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කරපු- මීට මාස හතකට කලින් ගල් සහ ගල් කුඩු විතරක් දාලා තාවකාලිකව තලලා දාලා තවමත් තිබෙනවා. පාර තිබුණාට වැඩිය අබලන් වෙලා තිබෙනවා. ඒ නිසා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත්, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් මිනිස්සුන්ට සහ අඩුම වශයෙන් motorcycleවල යන අයට බරපතළ අනතුරු වීමේ අවදානමකුත් තිබෙනවා. ඒ නිසා මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි, අඩුම ගණනේ මේ කිලෝමීටර් ගණන අවසන් කරන්න කොච්චර කාලයක් ගන්නවාද කියලා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, අපි මේ ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් දීලා තිබෙනවා. මේ වන කොට අපි ඒ මාර්ග carpet කර ගෙන යනවා. මෙතුමා සඳහන් කරලා තිබෙන මාර්ගය carpet කරන්න අපි මේ වන කොට වැඩ කටයුතු කර ගෙන යනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා carpet කිරීම පිළිබඳව සඳහන් කළත්, මේ මොහොත වෙන කොට ඒ පාරේ සමහර ස්ථානවල කොන්ක්‍රීට් කිරීමක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙනම් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට දුන්නු පිළිතුරේ වැරදි බවක් තිබෙනවා. එහෙම නැත්නම් මට දැන ගන්න ඕනෑ මේ කොන්ක්‍රීට් උඩින් carpet දමනවාද කියලා. [බාධා කිරීමක්] එහෙනම් මේ කොන්ක්‍රීට් කරන්න මුදලක් වියදම් කළේ ඇයි?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, මේ තොරතුරු අප ලබා ගන්නේ පළාත් සභාව හරහායි. අපේ අමාත්‍යාංශයෙන් කරන්නේ සම්බන්ධීකරණය කරලා මේ තොරතුරු ලබා ගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමයි. එතුමා අහන ඒ ප්‍රශ්නය සඳහා නියමිත පිළිතුර අප ලබා දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඒක පළාත් සභාවට යොමු කරමු.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට මට පිළිතුරක් ලැබුණේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියටත් ආපහු අහන්නේ ඒකමයි. මේ පාරේ සමහර කොටස් කොන්ක්‍රීට් කළා. දැන් ආපහු carpet කරනවා. එතකොට කොන්ක්‍රීට්වලට මෙච්චර වියදමක් කරලා තියෙද්දි ආපහු මේ මුළු පාරටම carpet කරන්න තිබෙන ක්‍රමවේදය මොකක්ද? ඇයි මෙහෙම මුදල් නාස්ති කරන්නේ? කොන්ක්‍රීට් කඩලා අයින් කරනවාද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
අපට එහෙම සඳහන් කරලා නැහැ, කොන්ක්‍රීට් කරලා තිබෙනවා කියලා. නමුත් කොන්ක්‍රීට් අබලන් වෙලා තිබෙනවා නම් ඒ කොන්ක්‍රීට් ඉවත් කරලා සම්පූර්ණයෙන් carpet කරන්න කටයුතු කරගෙන යනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඒක අපි පළාත් සභාවට යොමු කරමු.

## යුද හමුදා මූලස්ථානය වෙනස් කිරීම : විස්තර
## இராணுவத் தலைமையக இடமாற்றம் : விபரம்
## SHIFTING OF ARMY HEADQUARTERS : DETAILS

1318/'11

4. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ගාලුමුවදොර පිහිටි ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය මේ වනවිට එම ස්ථානයෙන් ඉවත් කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) දැනට යුද හමුදා මූලස්ථානය පවත්වාගෙන යනු ලබන ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට යුද හමුදා මූලස්ථානයේ කටයුතු සඳහා කුලී පදනම මත ගොඩනැඟිලි ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

(iii) එම එක් එක් ස්ථානයේ අයිතිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ මාසිකව ගෙවනු ලබන කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) காலி முகத்திடலில் அமைந்துள்ள இலங்கை இராணுவத் தலைமையகம் தற்போது அந்த இடத்திலிருந்து நீக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின் அதற்கான காரணம் என்ன என்பதையும்;

(iii) தற்போது இராணுவத் தலைமையகம் எந்த இடத்தில் இயங்கி வருகின்றது என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) தற்போது இராணுவத் தலைமையக பணிகளுக்காக வாடகை அடிப்படையில் கட்டிடங்கள் பெறப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) அவ்வாறெனின் அந்த இடங்கள் எவை என்ப தையும்;

(iii) அந்த ஒவ்வொரு இடத்தினதும் உரிமையாளர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் மாதாந்த வாடகை வெவ்வேறாக யாவையென்பதையும்

அவர் இச் சபையில் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) whether the Army Headquarters situated at Galle Face has been shifted to another place by now;

(ii) if so, the reasons for it; and

(iii) of the place in which the Army Headquarters is located at present?

(b) Will he state-

(i) whether any buildings have been obtained on rent basis by now for the activities of the Army Headquarters;

(ii) if so, what those premises are;

(iii) separately, the names and addresses of the owners of each of the aforesaid premises and the monthly rental?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) (i) ඔව්.

(ii) ආසිරි සෙන්ට්‍රල් හොස්පිට්ල් (පුද්) ආයතනය, කොළඹ 03 හා ගෝල්ෆේස් ටෙරස්, අංක 29 දරන ලිපිනය සහිත ගොඩනැඟිල්ල.

(iii) ආසිරි සෙන්ට්‍රල් හොස්පිට්ල් (පුද්) ආයතනය, නො: 37, හෝර්ටන් පෙදෙස, කොළඹ 07. මාසික කුලිය රුපියල් පනස්හත් ලක්ෂයකි. (මෙයට වරිපනම් හා වැට් ඇතුළු අනෙකුත් බදු මුදල්ද ඇතුළත් ය.)

එම්. තාරික් ජබීර් මහතා, නො: 07 බී, 8 වන පටුමඟ, කොළඹ 03. මාසික කුලිය රුපියල් දහනව ලක්ෂ තිස්අට දහසයි. (මෙයට වරිපනම් හා වැට් ඇතුළු අනෙකුත් බදු මුදල්ද ඇතුළත් ය.)

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මගේ පළමු අතුරු ප්‍රශ්නය හැටියට මම මේ කාරණය අහන්න කැමැතියි. ගරු අමාත්‍යතුමනි, මොන වාගේ ආයතනද මේකට අරගෙන ගිහිල්ලා තිබෙන්නේ? මොකද ෂැන්ග්‍රි-ලා සමාගමට මේ ඉඩම විකුණුවාට පස්සේ හමුදා බැරැක්ක සියල්ලම නාරාහේන්පිට, ඇල්විටිගල මාවතේ පිහිටි යුද හමුදා රෝහල වෙතට අරගෙන ගිහිල්ලා තිබෙනවාය කියලා තමයි කියන්නේ. ඒකයි මම අහන්නේ, "අදාළ නැහැ"ය කියන්නේ කොහොමද කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

දැනට ඉවත් කරලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එතකොට ලක්ෂ 57ක සහ ලක්ෂ 19ක මාසික කුලියක් ගෙවා අරගෙන තිබෙන්නේ මොනවටද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

යුද හමුදා රෝහල් වාට්ටු ආදියේ කටයුතු සඳහා මේ ස්ථානයට ගෙනැල්ලා තිබෙනවා. යුද හමුදා රෝහලට තවත් ස්ථාන අවශ්‍යයි. ඒ කටයුතු සඳහා මේ ස්ථානයට ගෙන ගිහිල්ලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපේ හමුදාවේ සෙබළු ලෙඩ වුණාම ඉන්න රෝහලක් තමයි මේ අයින් කරලා තිබෙන්නේ. ලක්ෂ 57ක් ඒ වාගේම ලක්ෂ 19ක් වැනි විශාල මුදලක් මාසයකට වියදම් කරලා අපේ හමුදාවේ සෙබළු ටික අරගෙන ගිහිල්ලා වෙන තැන්වලට දානවා. ඉඩම දෙනවා, සුද්දන්ට.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සුද්දන්ට ඉඩම දෙන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙනම් සුද්දන්ට දෙන්නේ නැත්නම් කාටද දෙන්නේ? ලංකාවේ එක්කෙනා කවුද කියලා කියන්න කෝ එහෙනම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සුද්දන්ව බදා ගෙන, විවෘත ආර්ථිකය කියලා නාඩගමක් පටන් ගෙන, මේ තිබුණු ඒවා ඔක්කොම දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නාඩගම තමයි තවමත් අරගෙන යන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විවෘත ආර්ථිකය රටට හිතවත් ආකාරයට සකස් කරලා රජය ගෙන යනවා. ඒ නිසා හමුදාවේ කිසිම සෙබළෙකු හෝ හමුදා රෝහලේ ඇඳක් හෝ, එහි සිටින රෝගියෙකුට හානියක් සිදු වන්නේ නැහැ. වග කීමෙන් යුතුව ප්‍රශ්න අහන්න කියලා මම ඉල්ලනවා. විශේෂයෙන් හමුදාවට අපහාස කරන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම නම් හමුදාවට අපහාස කළේ නැහැ. මෙය හමුදා සෙබළුන්ට අපහාසයක් කියලා යි මම කියන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හමුදා සෙබළුන් ආරක්ෂා කළා. හමුදා සෙබළුන්ට අවශ්‍ය සියලු පහසුකම් දෙනවා. ඉදිරියටත් අතිගරු ජනාධිපතිතුමා ඒ පහසුකම් ලබා දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා දෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලා වාගේ හමුදා සෙබළුන් අපි කොටින්ට භාර දීලා නැහැ. තමුන්නාන්සේලා ඔක්කොම හොර රහස් ගිවිසුම් ගහලා, කොටින්ට අපේ හමුදා අංශවල අයව භාර දුන් අය. අද මොනවාද කථා කරන්නේ? [බාධා කිරීම්] මේ ජයග්‍රණය ඇති නොකරන්නට තමුන්නාන්සේලා හිටියේ කොටින්ගේ පැත්තේ. අපි ජයග්‍රහණය කරනකන් තමුන්නාන්සේලා සිටියේ කොටින්ගේ පැත්තේ. දැන් ලජ්ජා නැතිව කථා කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට අහන්න දෙන්නේ නැහැ නේ. මෙතුමා වෙන වෙන දේවල් කියනවා. මේ පුවත් පත් වාර්තාව බලන්න, කේපී ගේ මුදල් භාරකරුට නඩු දමලා. [බාධා කිරීම්] නඩු දමලා තිබෙන්නේ කේපීගේ මුදල් භාරකරුට. කේපීට මොකද වෙලා තිබෙන්නේ? කේපී ඔහේ ඉන්නවා. කේපී හොඳින් ඉන්නවා බුදියාගෙන. කේපීගේ මුදල් භාරකරුට තමයි නඩු පවරා තිබෙන්නේ. ලැජ්ජයි. තව දේශප්‍රේමය ගැන කථා කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එය මේකට අදාළ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි ගරු කථානායකතුමනි. මෙතුමා වෙන වෙන ඒවා කියනකොට තරහා යන්නේ නැද්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තරහා යන්නේ නැහැ, කොහොමවත්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර දීර්ඝ නොවන විධියට ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පිළිතුර දීර්ඝ වැඩියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කොහොමවත් තරහා යන්නේ නැහැ. රටට විරුද්ධ වෙච්ච එක ගැනයි තරහාව. රටට වෛර කරපු එක ගැනයි තරහාව.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අනේ, කවුරුවත් රටට විරුද්ධව වෛර කළේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ රට එකක් කරන්න හදලා, රට බෙදන පැත්තට ඔත්තු දුන්නා. ඒකයි තරහා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි නම් කිසි තරහක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මතක තියා ගන්න. පාර්ලිමේන්තුව ඇතුළත කරපු කථාවල් අපි මෙහේ ඉඳගෙන අහගෙන හිටියා. අද නැහැ කියලා කථා කරන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම එහෙම කථාවක් කළේ නැහැ. ඔබතුමා දන්නවා ඇති.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කළාද නැද්ද කියා දැන ගන්න. හමුදාව ඉස්සරහට යන විට හමුදාවට කරපු අපහාස අමතකද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම එහෙම කථා කළේ නැහැ. ඒකයි මම කියන්නේ

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කළාද නැද්ද කියා හැන්සාඩ් එක කියවලා බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කිව්වේ නැහැයි කියලා රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා කියලා කියන්නද හදන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ කරපු කථාවල් කියවලා බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
උදෙන්ම හරියට තරහා ගිහින්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තරහක් නැහැ. නමුත් ඇත්ත කියන්න ඕනෑ. මේ ගොල්ලන් කරපු දේවල් ගැන ඇත්ත කියන්න ඕනෑ. මේ ගොල්ලන් අද කථා කරන්නේ උපාසකයෝ වාගෙයි. කිරි බබාලා. කොටින්ට කිරි පොවලා දැන් කිරි බබාලා වාගේ කථා කරනවා. මේ කොටින්ට කිරි පොවපු අය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
උදේ පාන්දර කවුරු හරි එක්ක රණ්ඩු වෙලා ඇවිල්ලා තිබෙනවා. ඒකයි ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම හිතන විධියට උදේ පාන්දරම තමුන්නාන්සේවම තමයි හම්බ වෙලා තිබෙන්නේ. ඒ නිසා වෙන්න ඇති. දැන් දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් සන්සුන් වෙලා දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අද දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට රැස්වීම පටන් ගන්නකොටම තරහා ගිහිල්ලා වාගෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකත් එක ප්‍රශ්නයක්. ඒකට පිළිතුර අහන්න. දැන් දෙවන අතුරු ප්‍රශ්නයත් ඇහුවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙතුමා නිවෙනතුරු ඉඳලා දෙවන ප්‍රශ්නය අහන්නද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හොඳටම නිවිලා ඉන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් නිවිලාද ඉන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් දෙවන අතුරු ප්‍රශ්නය අහලා නැවත මෙතුමා තරහා කර ගන්න ඕනෑ නැහැ. මම ඉඳගන්නම්. ප්‍රශ්න ඇහුවා ඇති. නැවත අහන්නේ නැහැ. හොඳ නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. එහෙම කරනවා නම් සහයෝගයෙන් වැඩ කරන්න හැකියි.

ප්‍රශ්න අංක 5 -1435/'11- (1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 -0765/'10- (2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කුල් වෙන උත්තරයක් දුන්නානේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා ඇවිල්ලා පිළිතුරු දේවි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හික්කඩුව බස් නැවතුම් පොළ : අලුත්වැඩියාව
ஹிக்கடுவ பஸ் தரிப்பு நிலையம்: புனரமைப்பு
HIKKADUWA BUS STATION : RENOVATION

1276/'11

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව බස් නැවතුම්පොළෙහි වහලය සහ අනෙකුත් උපකරණ විනාශ වෙමින් පවතින බවත්;

(ii) එම තත්ත්වය හික්කඩුව ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සංචාරක ව්‍යාපාර වෙත විදේශ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා බාධාවක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බස් නැවතුම්පළ නොපමාව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) බස් නැවතුම්පළෙහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தில் ஹிக்கடுவ பஸ் தரிப்பு நிலையத்தின் கூரை மற்றும் உபகரணங்கள் அழிவடைந்து வருகின்றதென்பதையும்;

(ii) இந்நிலைமையானது ஹிக்கடுவ பிரதேசத்தில் பேணிவரப்படுகின்ற உல்லாசப் பிரயாணக் கைத்தொழிலின்பால் வெளிநாட்டு உல்லாசப் பிரயாணிகளை கவர்ந்திழுப்பதற்கு தடையாக அமைந்துள்ளது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பஸ் தரிப்பு நிலையத்தைப் புனரமைப் பதற்கு உடனடியாக நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், தற்போது இதற்குத் தேவையான நிதி ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) பஸ் தரிப்பு நிலையத்தின் புனரமைப்பு நடவடிக் கைகள் எத்திகதியில் ஆரம்பிக்கப்படவுள்ளது என்ப தையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils :

(a) Is he aware that-

(i) the roof and the other equipment of the Hikkaduwa bus station in Galle District have fallen into disrepair; and

(ii) the aforesaid situation has become an obstacle to attracting foreign tourists for the tourism businesses conducted in Hikkaduwa area?

(b) Will he inform this House-

(i) whether steps will be taken to renovate the aforesaid bus station without delay;

(ii) if so, whether necessary funds have been allocated for that purpose by now; and

(iii) the date on which the renovation work of the bus station will be started?

(c) If not ,why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. හික්කඩුව බස් නැවතුම්පොළ ගොඩනැඟිලි අලුත්වැඩියා කළ යුතු තත්ත්වයකට පත්ව ඇත.

(ii) ඔව්.

(ආ) (i) බස් නැවතුම්පොළ අලුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.

(ii) ඔව්.

(iii) 2011 ජූනි 23 දින ගිවිසුම් අත්සන් කර අලුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම මේකේදී අහන්නේ එක අතුරු ප්‍රශ්නයයි. ගරු ඇමතිතුමා පිළිගත්තා, හික්කඩුව බස් නැවතුම්පොළ අබලන් වෙලාය කියලා. මේ වාගේ අබලන් වුණු බස් නැවතුම්පොළවල් පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, වැස්සත් එක්ක මගී ජනතාව දැඩි අපහසුතාවට පත් වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සියල්ල හඳුනා ගෙන පළාත් සභා හරහා මේ අලුත්වැඩියා කටයුතු සිදු කරන්න කඩිනමින් වැඩ පිළිවෙළක් යොදනවාද කියලායි මා අහන්නේ.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, අපි මේ වන විට ඒවා හඳුනා ගෙන තිබෙනවා. අපේ අලුත් ව්‍යාපෘතියක් තිබෙනවා "පුර නැඟුම" කියලා. ඒ ව්‍යාපෘතිය හරහා ප්‍රාදේශීය සභා ශක්තිමත් කරන්න මේ වන විට අපි කටයුතු කරගෙන යනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම ස්තුතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දෙවන අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මීට පෙර අහපු ප්‍රශ්නයකට ඔබතුමා කදිම උත්තරයක් ලබා දී තිබෙනවා. දැන් අපි දන්නා විධියට කොළඹ නගර සභාවේ පුරපති පළමු වැනි දා දිවුරුම් දෙන්න-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එම අතුරු ප්‍රශ්නය අදාළ නැත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ. ඒ දිවුරුම් දීම-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එම අතුරු ප්‍රශ්නය මේ ප්‍රශ්නයට අදාළ නැත.

ප්‍රශ්න අංක 9. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම ප්‍රශ්නය අහනවා ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමා ඒකට තරහා යන්නේ නැති උත්තරයක්ද දෙන්න තිබෙන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඕනෑද උත්තරයක්?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

දැන් නිවිලාද ඉන්නේ? නැත්නම් hospital එකට අර ගෙන යන්න වුණොත් එහෙම.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hospital එකට නම් යන්න ඕනෑ නැහැ. මේකෙන් මහරගම ගැන අහන නිසයි මා-

## හරිත උද්‍යානය සහ ක්‍රීඩා පිටිය සඳහා වෙන් කළ භූමි ප්‍රමාණය : මහරගම නගර සංවර්ධන සැලැස්ම
## பசுமைப் பூங்கா மற்றும் விளையாட்டுத்திடலுக்காக ஒதுக்கிய காணி: மஹரகம நகர அபிவிருத்தித் திட்டம்
## LAND ALLOCATED FOR GREEN PARK AND PLAYGROUND : MAHARAGAMA URBAN DEVELOPMENT PLAN

1343/’11

9\. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මහරගම නගර සංවර්ධන සැලැස්ම යටතේ, තලවතුගොඩ නගරයේ ඉදි කරනු ලබන හරිත උද්‍යානය සහ ක්‍රීඩා පිටිය සඳහා වෙන් කළ භූමි ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉදි කිරීම් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) මේ වන විට එම ඉදි කිරීම් අවසන් කර තිබේද;

(iv) නො එසේ නම් මේ වන විට එම භූමිය කුමන කටයුත්තක් සඳහා භාවිත කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ක්‍රීඩා පිටියට හා හරිත උද්‍යානයට වෙන් කළ ඉඩම වෙනත් කටයුත්තක් සඳහා භාවිත කරන්නේ නම්, හරිත උද්‍යානය සහ ක්‍රීඩා පිටිය සඳහා වෙන් කළ මුදල කුමක් සඳහා භාවිත කළේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மஹரகம நகர அபிவிருத்தித் திட்டத்தின்கீழ் தலவத்துகொட நகரில் நிர்மாணிக்கப்படும் பசுமைப் பூங்கா மற்றும் விளையாட்டுத் திடலுக்காக ஒதுக்கப் பட்ட காணியின் பரப்பளவு ஏக்கர்களில் எவ்வள வென்பதையும்;

(ii) மேற்படி நிர்மாணத்திற்காக ஒதுக்கப்பட்ட பணத் தொகை எவ்வளவென்பதையும்;

(iii) தற்போது மேற்படி நிர்மாணிப்புகள் பூர்த்தி செய்யப் பட்டுள்ளதா என்பதையும்;

(iv) இன்றேல், இன்றளவில் மேற்படி நிலம் எந்த நடவடிக்கைக்காகப் பயன்படுத்தப்படுகிறதென் பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) விளையாட்டுத்திடல் மற்றும் பசுமைப் பூங்காவிற்கு ஒதுக்கிய காணி பிறிதொரு தேவைக்காகப் பயன் படுத்தப்படுமாயின் பசுமைப் பூங்கா மற்றும் விளை யாட்டுத்திடலுக்காக ஒதுக்கிய பணத்தொகை எதற்காகப் பயன்படுத்தப்பட்டதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) in acres, the extent of the land allocated to the green park and the playground to be constructed in the Thalawathugoda town under the Maharagama Urban Development Plan;

(ii) the amount of money allocated for the aforesaid constructions;

(iii) whether the aforesaid constructions have been completed by now; and

(iv) if not, the purpose for which the aforesaid land being used at present?

(b) Will he inform this House, the purpose for which the money allocated for the green park and the playground was utilized, if the land allocated for the green park and the playground is used for some other purpose?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) අක්කර 1.94කි.

(ii) මේ වන තෙක් ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන් කර නොමැත. නමුත් වියළි කාලයේදී පමණක් භාවිත කළ හැකි ක්‍රීඩා පිටියක් ඉදි කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් රුපියල් මිලියන 17ක ඇස්තමේන්තුවක් ලැබී ඇත.

(iii) මුල්‍යමය ප්‍රතිපාදන නොමැති බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොමැත.

(iv) පසු ගිය කාල වකවානුව තුළ සිදු වූ ගංවතුර තර්ජන නිසා සැලසුම් ක්‍රමවේදයක් තුළ කෝට්ටේ හා පාර්ලිමේන්තුව අවට ගංවතුර පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ප්‍රස්තුත ප්‍රදේශය ස්වාභාවික ජල රැඳවුම් ප්‍රදේශයක් ලෙස සකස් කිරීම සඳහා තෝරා ගෙන ක්‍රියාත්මක වෙමින් පවතී.

(ආ) මේ වන තෙක් එම ව්‍යාපෘතියට මුදල් වෙන් කර නොමැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, එයට රුපියල් මිලියන 25ක් වෙන් කරලා තිබෙනවාය කියලා අතිගරු ජනාධිපතිතුමාගේත් ඔබතුමාගේත් ඡායාරූප සහිතව ප්‍රදර්ශනය කරලා තිබුණා. තලවතුගොඩ හරිත උද්‍යානය සහ ක්‍රීඩා පිටිය කියලා තමයි එහි සඳහන් කරලා තිබුණේ. ක්‍රීඩා පිටිය හැදීමට නියමිතව තිබූ තැන දැන් ජලාශයක් බවට පත් කරලා තිබෙනවා. මා අහන්න කැමැතියි එහෙම නම් ක්‍රීඩා පිටිය කොහේද හැදෙන්නේ කියා. ජලාශය තිබෙන තැනට වියදම් කරපු මුදල් ටිකට මොකද වෙන්නේ? ඒකයි මා මේ විස්තර ටිකත් එක්ක ඇහුවේ. තරහ ගන්නේ නැතුව උත්තර දෙන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා අහන තැන කොතැනද කියලා පැහැදිලි නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
භයයි, තරහ ගියොත් එහෙම. ඊට පස්සේ පැය ගණනක් බණිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. මන්ත්‍රීතුමාවත් පැහැදිලි කරන්නේ නැහැ, කොතැනද කියලා. හරිත උද්‍යානය හා ක්‍රීඩා පිටිය හදන ස්ථානය -ඒ ඉඩකඩ- ජලාශයක් කරලා නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතැන ඔබතුමාගේ photo එකත් එක්කම ගහලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මගේ photo එක සවි කරලා තිබෙන තැන බලන්න. අවශ්‍ය නම් ඔබතුමා දැන් මාත් එක්ක යන්න එන්න. කාර් එකේ යන්න පුළුවන්. වැඩි දුර නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තලවතුගොඩ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා ඔබතුමාට කියන්නේ, ඔබතුමාට දීලා තිබෙන්නේ වැරැදි උපදෙසක් කියලායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ළඟ ආරක්ෂකයෝ විතරයි නේ ඉන්නේ; thugsලා නැහැ නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. මට ආරක්ෂකයෝ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා එන්නම් කාර් එකේ යන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මන්ත්‍රීතුමා වැහි දවසක එම ස්ථානයට ගිහින් තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා තමයි මගේ ආරක්ෂකයා හැටියට ඉන්නේ, එහා පැත්තේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා කාර් එකේ යන්න එන්නම්. කාර් එක ඇතුළේ වෙන thugsලා නැහැ නේ. කරපිංචා චමින්ද වාගේ කවුරු හරි සිටියොත්?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මන්ත්‍රීතුමා, පාරෙන් දකුණු පැත්ත තමයි ක්‍රීඩා පිටියට හා හරිත උද්‍යානයට යෝජිත. පාරෙන් වම් පැත්ත භූමිය පාර්ලිමේන්තුව දක්වා ජලාශයක් බවට දැන් පරිවර්තනය කර ගෙන යනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. තව තරහ ගන්න කලින් මා ඉඳ ගන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තරහ ගන්නේ මොකටද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි පහු වෙලා කාර් එකේ යමු. ගිහින් පොඩ්ඩක් බලලා එමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඊයේ වැඩිය කථා නොකළාට ස්තුතියි.

## අග්‍රාමාත්‍යතුමාගේ උපදේශකයින් : විස්තර
### பிரதம அமைச்சரின் ஆலோசகர்கள்: விபரம்
### ADVISERS UNDER PRIME MINISTER : DETAILS

1436/'11

10. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අග්‍රාමාත්‍යතුමාට මේ වන විට සිටින උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයින්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

[ගරු අජිත් කුමාර මහතා]

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பிரதம அமைச்சரின் கீழ் தற்போது சேவையாற்று கின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்கு செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காக செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங்கப் படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப் படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகையொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப்பனவுத் தொகை தனித் தனியாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) the number of advisers who serve under the Prime Minister at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them; and

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) of the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles; and

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them;

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) එකයි. (01)

(ii) නම : මහින්ද ධර්මසිරි බන්දුසේන මහතා.

අධ්‍යාපන සුදුසුකම් :

ශාස්ත්‍රවේදී උපාධිධාරී - (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) - 1962 අප්‍රේල්

සංවර්ධන අධ්‍යයන ඩිප්ලෝමාව - (කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය) - 1977 ජූලි

වගකීම් - ගරු අග්‍රාමාත්‍යතුමාගේ රාජකාරි කටයුතුවලට අදාළ උපදේශන කටයුතු.

වැටුප රුපියල් 40,000 (අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව මාසික ස්ථාවර

වැටුපක් ගෙවනු ලබයි)

| | | |
|---|---|---|
| දීමනා -1/3 දීමනාව | - | රු.13,333.33 |
| ජීවන වියදම් දීමනාව | - | රු. 3,175.00 |
| ඉන්ධන දීමනාව | - | රු.18,750.00 |
| ප්‍රවාහන දීමනාව | - | රු.30,000.00 |

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලුම දීමනාවල එකතුව - රු.65,258.33කි.

(ආ) (i) නැත.

(ii) ඉන්ධන දීමනාව - රු.18,750.00

(ඇ) (i) නම - මහින්ද ධර්මසිරි බන්දුසේන මහතා

(ii) නැත.

(ඈ) පැන නොනඟී.

මේ සියලු දීමනාවල් සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛනවලට අනුව කටයුතු කරලා තිබෙනවා. එතුමා අපේ රටේ ඉතා ජ්‍යෝෂ්ඨතම රාජ්‍ය සේවකයෙක් බවත් මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-1064/'11- (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, උත්තර දීම සඳහා මා එම ප්‍රශ්නය මුදල් අමාත්‍යාංශයෙන් අහනවා. අද නම් උත්තර ලැබෙයි. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා නේ උත්තර දෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා තව මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අයියායි මල්ලියි අතර වෙනසක් නැහැ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගොඩගම නගර සංවර්ධනය : දේපොළ පවරා ගැනීම
## கொடகம நகர அபிவிருத்தி : சொத்துகள் சுவீகரிப்பு
## DEVELOPMENT OF GODAGAMA TOWN : TAKING OVER OF PROPERTY

1284/’11

12. **ගරු බුද්ධික පතිරණ මහතා**
( மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර - කොළඹ අධිවේගී මාර්ගයේ, මාතර පිවිසුම් ස්ථානය වන ගොඩගම කුඩා නගරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා පවරා ගැනීමට නියමිත භූමියේ වර්ග ප්‍රමාණය කොපමණද;

(iii) එම දේපළ වෙනුවෙන් වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(iv) වන්දිය ගෙවීම මුදලින් සිදු කරන්නේ නම්, එක් පර්චසයක් වෙනුවෙන් ගෙවනු ලබන මුදල කොපමණද;

(v) පවරා ගත් නිවාස හා ඉඩම් වෙනුවෙන් නව නිවාස හා ඉඩම් ලබා දෙන්නේ නම්, ඒවා එම ප්‍රදේශයේ ඇති වන සංවර්ධනයේ ප්‍රතිලාභ පහසුවෙන් ලබා ගත හැකි ස්ථානවලින් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) මේ වන විට ඉඩම් හා නිවාස ලබා දීමට සැලසුම් කර ඇති ප්‍රදේශ කවරේද;

(vii) එම ඉඩම් හා නිවාස අදාළ පුද්ගලයින්ට ලබා දෙනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை - கொழும்பு கடுகதி நெடுஞ்சாலையில் மாத்தறை புகுவழியான கொடகமவை சிறு நகரமாக அபிவிருத்திசெய்யும் திட்டம் ஏதும் உள்ளதா;

(ii) அவ்வாறெனின் அதற்காகச் சுவீகரிக்கப்படவுள்ள காணியின் பரப்பளவு எவ்வளவு;

(iii) அந்த சொத்துக்களுக்காக நட்டஈடுகள் செலுத்தப்படுமா;

(iv) நட்டஈடு பணமாக வழங்கப்படுவதாக இருப்பின், ஒரு பர்ச்சஸுக்கு செலுத்தப்படும் தொகை எவ்வளவு;

(v) சுவீகரிக்கப்பட்ட வீடுகள் மற்றும் காணிகளுக்காக புதிய வீடுகள் மற்றும் காணிகள் வழங்கப்படுவதாக இருப்பின், அவற்றை அந்த பிரதேசத்தில் உருவாகின்ற அபிவிருத்தியின் பயன்களை இலகுவாகப் பெறக்கூடிய இடங்களில் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுப்பாரா;

(vi) தற்போது காணிகள் மற்றும் வீடுகளை வழங்க திட்டமிடப்பட்டுள்ள பிரதேசங்கள் எவை;

(vii) அந்தக் காணிகள் மற்றும் வீடுகளைக் குறிப்பிட்ட நபர்களுக்கு வழங்கும் கால வரையறை யாது

என்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he inform this House-

(i) whether there is a plan to develop Godagama, the entry point at Matara to the Matara-Colombo Expressway, as a small town;

(ii) if so, of the extent of land due to be taken over for that purpose;

(iii) whether compensation will be paid for that property ;

(iv) if compensation will be paid with money, the amount paid per perch;

(v) if new housing and lands will be provided in place of those taken over, whether measures will be taken to provide them from locations which provide easy access to the benefits of the development that would take place in that area?

(vi) of the areas from where lands and houses are planned to be provided at present;

(vii) of the time frame for providing such lands and housing to the relevant people?

(d) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)
ගරු කථානායකතුමනි, ගරු වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

[ගරු නිර්මල කොතලාවල මහතා]

(ii) ඉහත අංක (i) අනුව අදාළ නොවේ.

(iii) ඉහත අංක (i) අනුව අදාළ නොවේ.

(iv) ඉහත අංක (i) අනුව අදාළ නොවේ.

(v) ඉහත අංක (i) අනුව අදාළ නොවේ.

(vi) ඉහත අංක (i) අනුව අදාළ නොවේ.

(vii) ඉහත අංක (i) අනුව අදාළ නොවේ.

(ආ) ඉහත අංක (i) අනුව අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අතුරු ප්‍රශ්න නැහැ.

## ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ උපදේශකයින්: දීමනා
## அனர்த்த முகாமைத்துவ அமைச்சின் ஆலோசகர்கள்: கொடுப்பனவுகள்
## ADVISERS OF MINISTRY OF DISASTER MANAGEMENT: ALLOWANCES

1437/'11

13. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මේ වන විට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයින්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அனர்த்த முகாமைத்துவ அமைச்சின் கீழ் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனை;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவை;

(iii) இவர்களுக்கு செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவை ;

(iv) கடந்த மாதத்திற்காக செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை யாவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங்கப் படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப் படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப்படு மெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகையொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப்பனவுத் தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management:

(a) Will he state-

(i) the number of advisers who serve under the Ministry of Disaster Management at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them; and

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles; and

(ii) separately, the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them; and

(ii) separately, the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
( மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) 01යි.

(ii) නම - ඩබ්ලිව්.කේ.එම්. ද සිල්වා මයා

අධ්‍යාපන සුදුසුකම් - ශාස්ත්‍රපති උපාධිය

වගකීම් - ආපදා කළමනාකරණ අමාත්‍යතුමාට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශන සැපයීම

(iii) මාසික දීමනාව - රු.30,000/=

ඉන්ධන දීමනාව - රු. 17,500/=

(iv) රු.47,500/=කි.

(ආ) (i) නම - ඩබ්ලිව්.කේ.එම්. ද සිල්වා මයා

ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව - 01

නිල රථයේ විස්තර - කුලී පදනම මත ලබා ගන්නා ලද Mitsubishi Lancer වර්ගයේ අංක KA 7449 දරන මෝටර් රථය

(ii) ඉන්ධන දීමනාව මසකට (පෙට්‍රල්) ලීටර් 140ක් සඳහා ලබා දේ. (රු.125x140 = රු. 17,500/=)

(ඇ) (i) නම - ඩබ්ලිව්.කේ.එම්. ද සිල්වා මයා

(ii) මසකට රු.8,000/=ක උපරිමයකට යටත්ව දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කෙරේ.

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15 - 1618/'11- (1) ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය - ප්‍රශ්න අංක 1, ගරු රවි කරුණානායක මහතා

## අපනයන සභාව : රැස්වීම්
## ஏற்றுமதிச் சபை: கூட்டங்கள்
## EXPORT COUNCIL : MEETINGS

0723/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා යටත් පිරිසෙයින් වර්ෂයකට වරක් හෝ අපනයන සභාවේ රැස්වීමක මුලසුන දරා තිබේද;

(ii) රජයේ අපනයන ප්‍රතිපත්ති සම්පාදනය සිදු කරන පාර්ශ්වයන් කවරේද;

(iii) එබඳු ප්‍රතිපත්ති සම්පාදනයක් අවසන් වරට සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එමෙන්ම,

(i) 2009 වර්ෂයේදී සහ 2010 වර්ෂයේදී, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 13 වගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රතිපාදන ලබා දුන් සමාගම්වල නම් සහ එම එක් එක් සමාගමට එක් එක් වර්ෂයේදී ලබා දුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2009 සහ 2010 වර්ෂයන්හිදී සෙස් බදු ප්‍රතිපූරණය කිරීමට අමතරව රජය විසින් අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ලබා දුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில், வாணிப அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சட்டத்தின் ஏற்பாடுகளின் பிரகாரம், வருடத்திற்கு ஒரு தடவையாயினும் மேதகு சனாதிபதி அவர்கள் ஏற்றுமதிச் சபைக் கூட்டத்திற்கு தலைமை தாங்கியுள்ளாரா என்பதையும்;

(ii) அரசாங்க ஏற்றுமதிக் கொள்கைகளை வகுக்கும் சம்பந்தப்பட்ட தரப்பினர் யார் என்பதையும்;

(iii) அவ்வாறான கொள்கை உருவாக்கம் இறுதியாக எப்போது செய்யப்பட்டது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2009, 2010ஆம் ஆண்டுகளில் இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டத்தின் 13ஆம் பிரிவின் கீழ் பணம் ஒதுக்கப்பட்ட கம்பனிகளின் பெயர்கள் மற்றும் அவற்றிற்கு ஒதுக்கப்பட்ட பணத்தொகை ஆகியவற்றை ஆண்டுவாரியாகவும் நிறுவனவாரி யாகவும்;

(ii) 2009, 2010ஆம் ஆண்டுகளில் செஸ் வரிக்கு மீள் நிதியளிப்பதற்குப் பதிலாக அரசாங்கம் ஏற்றுமதி அபிவிருத்திச் சபைக்கு ஒதுக்கிய பணத்தின் அளவை வெவ்வேறாகவும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු රවි කරුණානායක මහතා]

asked the Minister of Industry and Commerce:

(a) Will he state-

(i) whether His Excellency the President has presided a meeting of the Export Council at least once a year, as per the provisions of the Sri Lanka Export Development Act;

(ii) the relevant parties which make Government export policies; and

(iii) as to when such policy-making was last done ?

(b) Will he also state-

(i) the names of the companies and the amount of money allocated to them under Section 13 of the Sri Lanka Export Development Act, in the years 2009 and 2010, separately on per year and per entity basis; and

(ii) the amount of money allocated to Export Development Board by the Government in the years 2009 and 2010 separately, rather than refunding of Cess ?

(c) If not, why?

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පසු ගිය කාලය තුළදී අපනයන සංවර්ධන අමාත්‍ය කමිටුව රැස් කිරීමට හැකියාවක් නොලැබුණි. කෙසේ වුවද, අතිගරු ජනාධිපතිතුමා මෙම රැස්වීමේ මුලසන දැරිය යුතු බැවින්, එතුමාගේ උපදෙස් ලබා ගෙන මෙම රැස්වීම කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී.

(ii) අපනයන ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්තිමය කරුණු, අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැසවීම්වලදී සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ අපනයන නිෂ්පාදන විශේෂිත උපදේශක සභා සමඟ සාකච්ඡා කර, අවශ්‍ය නිර්දේශ රජය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

(iii) මෙවැනි නිර්දේශ 2011 ජතික අය වැයට ඉදිරිපත් කරනු ලැබීය.

(ආ) (i) 2009 හා 2010 වර්ෂ තුළදී, මුදල් ප්‍රතිපාදන ලබා දුන් සමාගම්වල නම් හා ලබා දුන් මුදල් ප්‍රමාණය :

දුහුස් දිරිය ගෙවීම

| අංකය | ආයතනයේ නම | ගෙවීම (රුපියල්) | |
|---|---|---|---|
| | | 2009 | 2010 |
| 01 | කේ අයි කේ ලංකා (පුද්) සමාගම | 2,000,000.00 | 1,316,250.00 |
| 02 | හේකාබ් සමාගම | - | 1,620,117.84 |
| 03 | අක්බාර් බ්‍රදර්ස් (පුද්) සමාගම | 2,089,433.70 | - |
| 04 | රයිලිස් සමාගම | - | 2,798,114.00 |
| 05 | ඇකෝලේඩ් කොම්පසයිට් ටෙක්නොලොජිස් | 658,039.37 | - |
| 06 | හැන්ඩිස් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම | - | 3,716,586.63 |
| 07 | ෆැල්කන් ට්‍රේඩින් (පුද්) සමාගම | 2,000,000.00 | 5,092,440.00 |
| 08 | එස්ජේ ඉලෙක්ට්‍රෝමැග් (පුද්) සමාගම | - | 215,832.60 |
| 09 | ඇමසන් ට්‍රේඩිං (පුද්) සමාගම | 2,000,000.00 | 508,504.98 |
| 10 | ලයන් බෲවරි (ලංකා) පී එල් සී | - | 1,401,016.50 |
| 11 | ක්වික් ටී (පුද්) සමාගම | 1,000,000.00 | 8,302,200.07 |
| 12 | රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම | - | 4,671,645.00 |
| 13 | සුපර් කලෙක්ෂන් | 210,285.00 | - |
| 14 | ඇඩම්පී ලක්මන්පී | 1,000,000.00 | 2,994,648.33 |
| 15 | ඇක්වමැරයින් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම | - | 953,760.89 |
| 16 | ඩී එස් එල් ලංකා (පුද්) සමාගම | - | 1,880,000.00 |
| | එකතුව | **10,957,758.07** | **35,471,116.84** |

ඒකාබද්ධ ආදර්ශ කෘෂි ව්‍යාපෘති සඳහා ගෙවීම (IAMP)

| අංකය | ආයතනයේ නම | ගෙවීම (රුපියල්) | |
|---|---|---|---|
| | | 2009 | 2010 |
| 01 | සෝලා ග්‍රීන් ප්ලාන්ටේෂන් (පුද්) සමාගම | 3,272,707.00 | 900,000.00 |
| 02 | නේචර් හාවස්ට් | 876,250.00 | - |
| 03 | ෆෞට්ස් ඇන්ඩ් නට්ස් (පුද්) සමාගම | 570,000.00 | - |
| 04 | ෆොකොන්ස් කැනරීස් | 87,000.00 | - |
| 05 | කොකො ඇග්‍රො (පුද්) සමාගම | 1,000,000.00 | 2,120,000.00 |
| 06 | සී එෆ් ටී ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම | 1,000,000.00 | 3,238,200.00 |
| 07 | ඔමෙගා ග්‍රීන් (පුද්) සමාගම | 1,000,000.00 | 1,212,472.00 |
| 08 | විටා ඕගනික් (පුද්) සමාගම | 332,400.00 | 2,808,344.00 |
| 09 | ග්‍රීනට් ප්ලාන්ට්ස් ඇන්ඩ් ප්ලවර්ස් (පුද්) සමාගම | 864,510.50 | - |
| 10 | ග්‍රීන් වේ ඒෂියා ලංකා (පුද්) සමාගම | - | 1,132,201.00 |
| 11 | සදර්න් ඇග්‍රෝක්‍රාෆ්ට් (පුද්) සමාගම | - | 1,025,000.00 |
| 12 | කොන්සාක් (පුද්) සමාගම | - | 4,250,000.00 |
| 13 | කොකෝටෙක් (පුද්) සමාගම | - | 775,000.00 |
| 14 | වයඹ ඇක්වේරියම් | - | 659,000.00 |
| 15 | ප්‍රියන්ත ඇක්වේරියම් | - | 399,200.00 |
| | එකතුව | **9,002,867.50** | **18,519,417.00** |

සෙස් ගෙවීම (Cess)

| අංකය | ආයතනයේ නම | 2009 | 2010 |
|---|---|---|---|
| 01 | ලංකා කැනරීස් සමාගම | - | 1,281,648.54 |
| 02 | ඩී සැම්සන් ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම | - | 213,301.49 |
| | එකතුව | - | **1,494,950.03** |

(ii) 2009 හා 2010 වර්ෂයන්හිදී රජය විසින් අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ලබා දුන් මුදල් ප්‍රමාණය:

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2009 | 414.35 |
| 2010 | 493.75 |

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, කවදා ද ජනාධිපතිතුමා ඒ රැස්වීමේ මූලාසනය දැරුවේ?

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

එතුමා මූලාසනය දැරුවේ නැහැ. ඒ සඳහා එතුමාගේ උපදෙස් ලබා ගෙන රැස්වීමක් කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ අපනයන සංවර්ධන මණ්ඩලය ඒ කාලයේ හැදුවේ රටේ ජනාධිපති හැම වර්ෂයකම ඒ මණ්ඩලයත් එක්ක සාකච්ඡා කර, දැවෙන ආර්ථික ප්‍රශ්නවලට උත්තර සපයන්නටයි. දැනට සිටින ජනාධිපතිතුමා හෝ මීට පෙර හිටපු ජනාධිපතිවරු අවුරුදු එකොළහක් මේ සංවර්ධන මණ්ඩලවලට ගිහින් නැහැ. ඒ සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. රටේ දැවෙන ප්‍රශ්නවලට උත්තර සපයන්නටයි ජනාධිපතිතුමා එතැනට ගෙනෙන්නේ. භාණ්ඩ අපනයනය කරන රටකට තිබෙන දැවෙන ප්‍රශ්න වන විදේශ අනුපාතය, නිෂ්පාදන වියදම යනාදිය සම්බන්ධයෙන් උත්තර දෙන්නේ කවුද කියන ප්‍රශ්නයට කරුණාකර ඇමතිතුමාට අපට උත්තරයක් දෙන්න පුළුවන් ද?

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු කථානායකතුමනි, මම හිතන විධියට අපනයන ක්ෂේත්‍රයේ ශීඝ්‍ර සංවර්ධනයක් තිබෙනවා. එහෙම ලොකු, දැවෙන ප්‍රශ්න කියා මතභේදයක් නැහැ.

විෂය භාර ඇමතිවරයාට අවශ්‍ය උපදෙස් දීලා බලය පවරලා තිබෙන්නේ. අපේ විෂය භාර අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා අවශ්‍ය අවස්ථාවලදී වරින් වර අතිගරු ජනාධිපතිතුමා මුණ ගැහිලා උපදෙස් අරගෙන තමයි කටයුතු කරන්නේ. ජනාධිපතිතුමා අසුන් නොගත්ත නිසා මේ ප්‍රශ්නය ඇති වුණා කියා ඔබතුමාට ඉලක්ක සහගතව යම් කිසි ගැටලුවක් හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ගැන අපෙන් විමසුවා නම් අපට ඒකට උත්තර දෙන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නියෝජ්‍ය ඇමතිතුමනි, මම මෙතැනදී ප්‍රශ්නයක් අහන්නේ දේශපාලන අරමුණකින් නොවෙයි. රටේ නිෂ්පාදනකරුවන්ට ප්‍රශ්න තිබෙනවා. එම ව්‍යවස්ථාව හදන අවස්ථාවේදී අපනයන සංවර්ධන මණ්ඩලය ජනාධිපති යටතට ගත්තේ ඒකේ තිබෙන විශේෂ වටිනාකම නිසායි. ගියාද, නැද්ද කියන එක නොවෙයි වැදගත් වන්නේ. එදා ඉඳලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඒ තැනට ගියේ ඒ ගැන සොයලා උත්තර දෙන්න පුළුවන් නිසායි. ඊට පස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිවරු අවුරුදු 18ක් හිටියාට හය වතාවයි ගිහිල්ලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඉන්දියාව, පාකිස්ථානය, බංග්ලාදේශය ආදී රටවල් අතර තිබෙන ප්‍රශ්නවලට ශ්‍රී ලංකා අපනයනකරුවෙක් පිළිතුරු සපයන්නේ කොහොමද කියන එක පිළිබඳ උත්තරයක් ඔබතුමාට මේ පාර්ලිමේන්තුවට දෙන්න පුළුවන්ද?

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

කරුණාකරලා ඔබතුමා ඒ සම්බන්ධව ප්‍රශ්නයක් න්‍යාය පත්‍රයට ඇතුළු කරලා අපෙන් අහන්න. එතකොට අපි නිසි විධියට උත්තර දෙන්නම්. ගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධව අවශ්‍ය උපදෙස් දෙනවා විතරක් නොවෙයි, ඒ සම්බන්ධව සෘජු මැදිහත් වීමක් කරනවා. දැනට එතුමා මේ රැස්වීම් සඳහා සහභාගි වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමිනුයි පවතින්නේ. ඔබතුමා ඒ තරමම ඒක දේශපාලන මතභේදයක් කර ගන්න අවශ්‍ය නැහැ. ඔබතුමා දේශපාලනය ගැන කථා කරන්නේ නැහැ කිව්වාට, දේශපාලන මතභේදයකට අවශ්‍ය මූලික බීජයක් රෝපණය කරන්න වාගෙයි උත්සාහ කරන්නේ. ඒ නිසා ඔබතුමාට අපනයන සංවර්ධන ක්ෂේත්‍රයේ මොකක් හරි ගැටලුවක් තිබෙනවා නම් කරුණාකරලා අලුත් ප්‍රශ්නයක් විධියට අපෙන් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඔබතුමා තමයි පාර්ලිමේන්තුවේදී අපට ඇහුම් කන් දෙන්නේ. අපි ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නේ උත්තරයක් ලබා ගන්නයි. අද අපනයනකරුවන්ට විශේෂ ප්‍රශ්න තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ සහෝදරයා වන ජනාධිපතිතුමාට කථා කරලා, රටේ අපනයනකරුවන්ට තිබෙන ප්‍රශ්න විසඳන්න, අප අහන ප්‍රශ්නවලටත් ඇහුම් කන් දෙන්න කියන එක කාරුණිකව දැනුම් දෙන්න. මේ ඇමතිවරුන්ගෙන් අහලා වැඩක් නැහැ. අගමැතිතුමාගෙන් ඇහුවා නම් උත්තරයක් ලැබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම හොඳයි. ජනාධිපතිතුමා මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට පැමිණිය යුතුයි. ඒ අවස්ථාවේදී ඔබතුමාගේ ප්‍රශ්නය යොමු කිරීමට කටයුතු කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ ප්‍රශ්නය අහන විට අපනයනකරුවන් කොට උඩ. ඒ අය බැංකුවලට ගිහින් තිබෙන්නේ. ඒ අයගේ ප්‍රශ්නවලට උත්තර ලැබෙන්නේ නැහැ.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු කථානායකතුමනි, අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මාසිකව රැස් වන අපේ උපදේශක කාරක සභාවට සම්බන්ධ වෙලා මේ ප්‍රශ්නය යොමු කරන්න. අපි නිසි පිළිතුරු සපයන්න සූදානම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම එතැනට ඇවිල්ලා ප්‍රශ්න අහලා නැද්ද? එතැන ඔබතුමා දැකලා නැහැ. ජනාධිපතිතුමා එනවා. මම ප්‍රශ්න අහලා තිබෙනවා.

[ගරු රවි කරුණානායක මහතා]

[බාධා කිරීම්] මේ ප්‍රශ්නවලට ඔබතුමාට උත්තර දෙන්න බැරි නම් කියන්න. මම අගමැතිතුමාගෙන් අහන්නම්. එතුමා උත්තර දෙයි.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ඉදිරි සතියේ අපේ උපදේශක කාරක සභාව රැස් වෙනවා. කරුණාකරලා ඔබතුමා ඉදිරි සතියේ එයට සම්බන්ධ වන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අවධානයට යොමු කර ගන්න. මම හිතන්නේ දැන් අතුරු ප්‍රශ්න දහයක් විතර ඇහුවා. කථා පවත්වන්න බැහැ.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු මන්ත්‍රීතුමා, අපේ උපදේශක කාරක සභාවට පැමිණෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි හම්බන්තොට යන්නේ ගාල්ල, මාතර හරහා,- [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මම තුන්වෙනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ මෙයයි. දැන් බලන්න, මේ අවස්ථාවේදී අපනයනකරුවන්ට තේ සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. තේ කිලෝවක් නිෂ්පාදනය කරන්න අද රුපියල් 180කට වැඩි වියදමක් දරන්න සිදු වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපනයන සංවර්ධන මණ්ඩලයට කථා කළාම ඒ අය කියනවා ඒ අයට සල්ලි නැහැ කියලා. මේ වාගේ අවස්ථාවල ජනාධිපතිතුමා එතැන හිටියොත් කෙළින්ම නියෝගයක් දෙන්න පුළුවන්. ඔබතුමාට ඇමතිවරයා වශයෙන් මේ අය සම්බන්ධයෙන් කොයි ආකාරයෙන්ද ප්‍රතිචාර දක්වන්න පුළුවන් වන්නේ?

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

අපනයනකරුවන් විටින් විට අපට ඉදිරිපත් කරන කරුණු සම්බන්ධයෙන් අපි ක්ෂණිකව පිළිතුරු දීලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විටින් විට නොවෙයි, දැන් ප්‍රශ්නය තිබෙනවා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ඔබතුමා අපනයනය කියලා "හෝල් සේල්" කථා කළාට නිශ්චිත වශයෙන් අපට මේ කරුණු ඉදිරිපත් කරපු කෙනෙක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම ප්‍රශ්නය අහන්නේ අපනයන සංවර්ධන මණ්ඩලය ගැනයි. අපනයන ගැන අහන කොට ආනයනය ගැන කථා කළාට වැඩක් නැහැ.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නය යොමු කළාට, අපේ උපදේශක කාරක සභාවේදී, අපනයන සංවර්ධන මණ්ඩලයත් එක්ක මාසිකව පවත්වන රැස්වීම්වල දී, අපනයනකරුවෝ නිරන්තරයෙන්ම මුණ ගැසෙන සාකච්ඡාවලදී ඔබතුමාගේ ප්‍රශ්නය අපට යොමු වෙලා නැහැ. ඔබතුමා දැන් ඉදිරිපත් කරනවා නම්, අපි ඇහුම්කන් දීලා ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගන්න සූදානම්. අද තමයි පළමු වැනි වතාවට ඔබතුමා මේ ප්‍රශ්නය අපට යොමු කළේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා අපනයනකරුවෙක් නොවන නිසා ප්‍රශ්න දන්නේ නැහැ.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල : ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය

### 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சு

### MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011 : MINISTRY OF CONSTRUCTION, ENGINEERING SERVICES, HOUSING AND COMMON AMENITIES

1257/'11

3. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - கௌரவ சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Sunil Handunnetti)

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக் களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற் கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வள வென்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்ப தையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he state the total amount of money spent by the Ministry of Construction, Engineering Services, Housing and Common Amenities on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above-mentioned expenses?

(d) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa )

ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) අමාත්‍යාංශය කිසිදු මුදලක් වැය කර නොමැත.

(ආ) (i)

| | | |
|---|---|---|
| ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව | රු. | 614,898.25 |
| ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | රු. | 459,600.00 |
| රජයේ කර්මාන්තශාලාව | රු. | 753,939.55 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | රු. | 2,966,239.96 |
| නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | රු. | 272,549.98 |
| සහධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | වැය කර නොමැත | |
| රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | රු. | 453,000.00 |
| ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන ආයතනය | රු. | 243,367.66 |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | රු. | 981,420.00 |

(ii) **ගොඩනැඟිලි දෙපාර්තමෙන්තුව**

- ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ ආරම්භය හා එහි වර්තමාන කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීම
- ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව මඟින් ඉදි කරන ලද රජයේ ආයතනයන්හි ගොඩනැඟිලි ආකෘතියක් සකස් කර ඉදිරිපත් කිරීම.

**ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**

- ලෝක ශිෂ්ටාචාර පිළිබඳව නරඹන්නන් දැනුවත් කිරීම.
- ජාතික භෞතික සැලස්ම 2030 ඇතුළු පළාත්බද භෞතික සැලසුම් පිළිබඳව නරඹන්නන් දැනුවත් කිරීම.
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳව නරඹන්නන් දැනුවත් කිරීමට අත් පත්‍රිකා භාෂා මධ්‍ය තුනෙන්ම බෙදා හැරීම.

**රජයේ කර්මාන්ත ශාලාව**

- රජයේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන භාණ්ඩ හා ව්‍යාපෘති පිළිබඳව ප්‍රදර්ශන කුටියක් ඉදි කරන ලදී.

**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය**

- වර්ග අඩි 604ක ප්‍රමාණයේ ස්ථිර අඩු වියදම් ආදර්ශ නිවහනක් ප්‍රදර්ශන භූමියේ ඉදි කර නිවාස ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමවේද පිළිබඳව ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනීමක් ජනතාවට ලබා දීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් නිවාස ණය ලබා ගෙන නිවාස ඉදි කර ගැනීමට අපේක්ෂිත පුද්ගලයන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම සහ එකී පුද්ගලයින් ලියාපදිංචි කර ගැනීම.
- නිවාස ණය ලබා දෙන වාණිජ බැංකු පිළිබඳව හා එම ආයතන මඟින් ණය ලබා ගැනීමේදී පවතින සංකීර්ණභාවය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් නිවාස ණය ලබා ගැනීමේදී ඇති සරලභාවය සහ සහන පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සියලුම දිස්ත්‍රික් කාර්යාල ආශ්‍රිත පිහිටුවනු ලබන සහන පියස උපදේශන මධ්‍යස්ථාන හා ඒවායේ සැපයෙන සේවා පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
- නිවාස ඉදිකිරීමට සමගාමීව ආදර්ශවත් ගෙවත්තක් සැකසීම හා දේශීය ආහාර භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ජනජීවිතයේ ජනාවාසකරණය වීමේ විකාශනය පිළිබඳව ත්‍රිමාණ රූප මඟින් පෙන්වා දීම.
- සඟරා, පුවත්පත් සහ අත් පත්‍රිකා මඟින් ජනතාවගේ නිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා දීම.

[ගරු විමල් වීරවංශ මහතා]

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

- ජනතාව දැනුවත් කිරීම සඳහා එම ප්‍රදේශයට සහ දැයට කිරුළ ප්‍රදර්ශනයට ගැළපෙන පරිදි අත් පත්‍රිකා සකස් කිරීම.
- තුන්කල් දැක්ම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන පුවරු අලුත්වැඩියා කර දැයට කිරුළ ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශනය කිරීම.
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද පහන ප්‍රදර්ශන භූමියේ තැබීම.

**රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව**

- සංස්ථාවේ ආරම්භයේ සිට මේ දක්වා කරන ලද ව්‍යාපෘති පින්තූර මඟින් පැහැදිලි කිරීම.
- ඉදිරියට කිරීමට නියමිත ව්‍යාපෘති පින්තූර මඟින් පැහැදිලි කිරීම.
- හරිත ගොඩනැඟිලි පිළිබඳව නරඹන්නන් දැනුවත් කිරීම. ලෝකයේ දැනට ඇති හරිත ගොඩනැඟිලි හා ලංකාවේ දැනට ඇති හරිත ගොඩනැඟිලි පිළිබඳ නරඹන්නන්ට පැහැදිලි කිරීම.
- නරඹන්නන් වෙත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ඉදිරිපත් කර එහි ජයග්‍රාහකයන්ට මග් හා ටී ෂර්ට් තෑගි කරන ලදී.

**ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය**

- ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන ආයතනය මඟින් ඉටු කරනු ලබන සේවා පිළිබඳව ඉදිකිරීම් කර්මාන්තයේ යෙදෙන්නන් හා පොදු ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන කුටිය පවත්වා ගෙන යෑම.

(iii) **ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව**

| | | |
|---|---|---|
| • ප්‍රදර්ශන කුටිය සඳහා | රු. | 54,500.00 |
| • ප්‍රදර්ශන පුවරු සඳහා | රු. | 29,500.00 |
| • ප්‍රදර්ශන ආකෘතිය සඳහා | රු. | 11,000.00 |
| • අත්පොත සහ බැනර් මුද්‍රණය | රු. | 29,930.88 |
| • වෙනත් වියදම් | රු. | 30,000.00 |
| • සේවයේ යෙදුණු නිලධාරින් සඳහා ගමන් වියදම්, අතිකාල හා නිවාඩු දින වැටුප්, ඉන්ධන හා පොදු වියදම් | රු. | 459,967.37 |

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| • ලෝක ශිෂ්ටාචාර පිළිබඳ පුවරු 4 සඳහා | රු. | 181,600.00 |
| • පොදු ප්‍රදර්ශන කුටිය සඳහා | රු. | 130,000.00 |
| • පොදු වියදම් ලෙස ආයතන අතර බෙදීම ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල | රු. | 148,000.00 |

රජයේ කර්මාන්තශාලාව

| | | |
|---|---|---|
| • රජයේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන භාණ්ඩ හා ව්‍යාපෘති පිළිබඳව කුටිය සඳහා | රු. | 434,545.54 |
| • අමාත්‍යාංශයට අයත් සියලුම ආයතනවල කුටි සඳහා විදුලි රැහැන් පද්ධතිය සකස් කිරීම සහ පිටත සහ කුටි ඇතුළත විශේෂ ආලෝකය සැපයීම | රු. | 319,394.01 |

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

| | | |
|---|---|---|
| • ස්ථිර අඩු වියදම් ආදර්ශ නිවහන ඉදි කිරීමට | රු. | 245,841.00 |
| • ජන ජීවිතයේ ජනාවාසකරණය වීම නිරූපනය කළ ආකෘති, පුවරු සැකසීම සඳහා | රු. | 1,163,648.96 |
| • ප්‍රදර්ශන කුටියේ බාහිර පිවිසුම් අලංකාරයට | රු. | 585,750.00 |
| • ප්‍රදර්ශන කුටියේ පැති ආවරණය ඉදි කිරීම සඳහා | රු. | 766,000.00 |
| • ගෙවත්තක් සැකසීම හා දේශීය ආහාර භාවිතය ගැන දැනුවත් කිරීම | රු. | 105,000.00 |
| • සහරා පුවත්පත් සහ අත්පත්‍රිකා මුද්‍රණය සඳහා | රු. | 100,000.00 |

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

| | | |
|---|---|---|
| • ප්‍රදර්ශනයට සුදුසු ආකාරයට ආකෘති හා ප්‍රදර්ශන පුවරු අලුත්වැඩියාව | රු. | 16,680.08 |
| • ප්‍රදර්ශන භාණ්ඩ බුත්තලට රැගෙන යාම හා ආපසු රැගෙන ඒම සඳහා ප්‍රවාහන කුලිය | රු. | 40,000.00 |
| • ප්‍රදර්ශනයට සහභාගී වූ නිලධාරීන්ට නවාතැන් පහසුකම් හා අනෙකුත් වියදම් | රු. | 67,869.90 |
| • පොදු වියදම් ලෙස ආයතන අතර බෙදීම ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල | රු. | 148,000.00 |

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

| | | |
|---|---|---|
| • පොදු වියදම් ලෙස ආයතන අතර බෙදීම අනුව අමාත්‍යාංශය වෙත ගෙවූ මුදල | රු. | 148,000.00 |
| • ප්‍රදර්ශන ආකෘති සැකසීම | රු. | 225,000.00 |
| • කාර්ය මණ්ඩල නවාතැන් හා වෙනත් වියදම් | රු. | 80,000.00 |

ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන ආයතනය

| | | |
|---|---|---|
| • දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම හා ඊට අදාළ පුනරාවර්තන වියදම | රු. | 95,367.66 |
| • පොදු වියදම් ලෙස ආයතන අතර බෙදීම ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල | රු. | 148,000.00 |

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

| | | |
|---|---|---|
| • අමුද්‍රව්‍ය | රු. | 125,000.00 |
| • ප්‍රවාහන පහසුකම් | රු. | 45,000.00 |
| • නාවතැන් පහසුකම් | රු. | 45,000.00 |
| • ආහාරපාන | රු. | 40,000.00 |
| • ටී ෂර්ට් | රු. | 67,500.00 |
| • ජල බඳුන් | රු. | 28,000.00 |
| • ශබ්ද විකාශන යන්ත්‍ර | රු. | 25,000.00 |
| • මෙටල් - සිවිලිම සඳහා වියදම් | රු. | 541,000.00 |
| • බදු මුදල | රු. | 64,920.00 |

(ඈ) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල : විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
### 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: மின்வலு, எரிசக்தி அமைச்சு
### MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011 : MINISTRY OF POWER AND ENERGY

1258/'11

7. **ගරු අජිත් කුමාර මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அஜித் குமார- கௌரவ சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Ajith Kumara on behalf of the Hon. Sunil Handunnetti)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக மின்வலு, எரிசக்தி அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்களினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத்துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின்கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he state the total amount of money spent by the Ministry of Power and Energy on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ). අමාත්‍යාංශය ලෙස කිසිදු මුදලක් වැය කර නැත.

(ආ)

(i) එක් එක් ආයතනයන් මගින් වැය කළ මුදල මෙසේය.

1. ලංකා විදුලිබල මණ්ඩලය රු.මි.2.1
2. සුනිත්‍ය බලශක්ති අධිකාරිය රු.මි.1.5
3. ලංකා විදුලි (පුද්) සමාගම රු.මි.2.0
4. පරමාණුක බලශක්ති අධිකාරිය රු.මි.0.5
5. එල්.ටී.එල්.හෝල්ඩිංස් ආයතනය රු.මි.1.0

(ii)

(1) 2011 ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉටු කළ කාර්යයන් පහත පරිදි වේ.

- 2011 දැයට කිරුළ ප්‍රදර්ශන භූමියට හා ප්‍රදර්ශන කුටි සඳහා විදුලිය සැපයීම.
- 2011 දැයට කිරුළ ප්‍රදර්ශනයට ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරමින් ඒ සඳහා සහභාගි වීම.
- ප්‍රදර්ශන කුටිය තුළ විදුලි බිල්පත් මධ්‍යස්ථානයක් හා පාරිභෝගික ගැටලු සඳහා ඒකකයක් පවත්වා ගනිමින් පාරිභෝගිකයන්ට අවශ්‍ය සේවා සැපයීමට කටයුතු කිරීම.

(2). සුනිත්‍ය බලශක්ති අධිකාරිය, පරමාණුක බලශක්ති අධිකාරිය, හා ලංකා විදුලි (පුද් )සමාගම යන ආයතන ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කරමින් සහභාගි වූ අතර ජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීමට දායකත්වය ලබා දුනි.

(iii)

| | ආයතන | කාර්යය | වැය කරන ලද මුදල (රු.මි.) |
|---|---|---|---|
| 1 | ලංකා විදුලිබල මණ්ඩලය | ප්‍රදර්ශන කුටිය සඳහා | 2.1 |
| 2 | සුනිත්‍ය බලශක්ති අධිකාරිය | ප්‍රදර්ශන කුටිය සඳහා | 1.5 |
| 3 | ලංකා විදුලි (පුද්) සමාගම | ප්‍රදර්ශන කුටිය සඳහා | 2.0 |
| 4 | පරමාණුක බලශක්ති අධිකාරිය | ප්‍රදර්ශන කුටිය සඳහා | 0.5 |
| 5 | එල්.ටී.එල්.හෝල්ඩිංස් ආයතනය | ප්‍රදර්ශන කුටිය සඳහා | 1.0 |
| | එකතුව | | 7.1 |

(ඇ) රජයේ වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා නැති අතර වැය කිරීම්ද කර නැත.

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 14-1591/'11-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව
## சட்டவாக்க நிலைக்குழு
## LEGISLATIVE STANDING COMMITTEE

### I

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 46(අ) (3) (ආ)හි විධිවිධානවල කුමක් සඳහන් වුවද, ගරු කථානායකතුමා විසින් 2011 සැප්තැම්බර් මස 20 වැනි දින "බී" ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරන ලද බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරිය ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව ස්වකීය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා එම ස්ථාවර කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව 2011 නොවැම්බර් මස 30 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය."

***ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 46(අ) (3) (ආ)හි විධිවිධානවල කුමක් සඳහන් වුවද, ගරු කථානායකතුමා විසින් 2011 සැප්තැම්බර් මස 20 වැනි දින "බී" ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරන ලද බස්නාහිර පළාතේ පොලිතින් භාවිතය පාලනය කිරීමේ ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව ස්වකීය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා එම ස්ථාවර කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව 2011 නොවැම්බර් මස 30 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය."

***ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අද දින ප්‍රධාන කටයුතු. න්‍යාය පත්‍රයේ අංක 01 සිට 04 දක්වා ඇති ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියම හතරක් අනුමත කිරීම සහ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම.

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත : නියමය
## செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்: கட்டளை
## STRATEGIC DEVELOPMENT PROJECTS ACT : ORDERI

[අ. භා. 1.31]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජූලි 11 දිනැති අංක 1714/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය."

ගරු කථානායකතුමනි, මෙම පනත යටතේ තවත් නියමයන් තුනක් පිළිබඳවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කරුණු ඉදිරිපත් කරනවා ඇති.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා දැන් ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කරුණු ඉදිරිපත් කරනවා ඇති. මෙම විෂයයන් පහම එකට සාකච්ඡාවට ගැනෙනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 1.32]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

ගරු කථානායකතුමනි, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතට අපි අද සංශෝධන ඉදිරිපත් කරනවා. මහින්ද චින්තන ඉදිරි දැක්මේ පිටු අංක 79 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"ලංකාවේ අද ගොවියන්ගේ ඉදිරි පරම්පරාවන් මුහුණ දී සිටින අවිනිශ්චිතතාවන් සඳහා තිරසාර විසඳුමක් සැපයිය යුතු බව මගේ විශ්වාසයයි."

ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු ඒ මහින්ද චින්තන වැඩ පිළිවෙළ අනුවයි අපි මෙම සංශෝධන ඉදිරිපත් කරන්නේ. කෘෂිකාර්මික ඉඩම් අයිතිය අතලොස්සක් අතර බෙදී ගොස්, වැඩි පිරිසක් කෘෂිකාර්මික ඉඩම් අයිතිකරුවන්ගේ කම්කරුවන් බවට පත්වීම නිසා ඇති වන සමාජ ආතතිය නැති කිරීම සඳහා කෘෂිකාර්මික කම්කරුවන්ගේ වගා අයිතිවාසිකම් තහවුරු කිරීමට

කටයුතු කිරීම ගොවිජන විප්ලවය ලෙස හැඳින්වේ. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ආසියාතික රටවල් බොහොමයක මෙම පරිවර්තනය සිදු වූ අතර, ශ්‍රී ලංකාවෙන් ඒ සඳහා ගනු ලැබූ පළමු පියවර ලෙස 1958 අංක 1 දරන කුඹුරු පනත හැඳින්විය හැකියි. එදා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමාගේ රජයේ ඉඩම් අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු, අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ පියා වන පිලිප් ගුණවර්ධන මැතිතුමා එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එදා වැඩවසම් යුගයේ කම්කරුවෝ හැටියට කටයුතු කරපු, අව්වට වේලි වේලී, වැස්සට තෙමී තෙමී මේ රටට බත සපයන ගොවීන් වහලුන් බවට පත්වීම වළක්වන්න තමයි එදා විශාල බලාපොරොත්තු තියා ගෙන ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමා ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. ඒ කුඹුරු පනත අවස්ථා ගණනාවකදී සංශෝධනය වුණා.

1958.02.01 දින 1958 අංක 1 යටතේ, 1958.09.16 දින 1958 අංක 30 යටතේ, 1961.06.23 දින 1961 අංක 61 යටතේ, 1964.08.01 දින 1964 අංක 11 යටතේ එම සංශෝධනයන් සිදු වුණා. 1958 අංක 1 දරන කුඹුරු පනතේ සංශෝධන මඟින් ප්‍රධාන වශයෙන් මෙතෙක් කුඹුරු ඉඩම්වල කම්කරුවන් ලෙස සිටි ගොවීන්ගේ අඳ අයිතිය තහවුරු කිරීම කෙරුණා. ඒ වාගේම ගොවි කාරක සභා පිහිටෙව්වා. සුළු වාරිමාර්ග අයිතිය නෛතික වශයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට භාර කළා. ඒ වාගේම අඳ ගොවියාගේ පසු අයිතිය නම් කිරීමේ හැකියාවට 6(1) උපවගන්තිය යටතේ සැලකිල්ල යොමු කළා. ඒ අනුව ඒ ප්‍රතිපාදන යෙදුවා. ලිඛිත හෝ වාචික ගිවිසුමක් මත වගා කරන හෝ බදු ගත් තැනැත්තකු අඳ ගොවියා ලෙස පිළිගැනීම එදා පනතින් සිදු වුණා.

ගරු කථානායකතුමනි, ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේ රජයේ හිටපු කෘෂිකර්ම අමාත්‍ය හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා 1972 අංක 2 දරන කෘෂිකාර්මික ඵලදා වර්ධන පනත ඉදිරිපත් කළා. කෘෂිකාර්මික ඉඩම්වලින් නිසි ප්‍රයෝජනය ගැනීමත්, ඒවායේ කාර්ය සංවිධානය නිසි පරිදි කිරීමත්, කෘෂිකාර්මික භෝග සහ පශු සම්පත පිළිබඳ කාර්යක්ෂම කාර්ය සංවිධානයක් ඇති කිරීමත් මඟින් උපරිම ඵලදා වර්ධනය ඇති කිරීම සඳහා 1972 අංක 2 දරන කෘෂිකාර්මික ඵලදා වර්ධන පනත ඇති කළා. අප දන්නවා, මේ යටතේ අපේ රටේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 557ක් පිහිටුවලා ඉතාම සැලසුම්සහගත කෘෂිකාර්මික වැඩ පිළිවෙළක් එදා හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාගේ යුගයේදී කෙරුණු බව.

ඊට පස්සේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත හඳුන්වා දුන් අතර, එම පනත මඟින් අඳ ගොවි අයිතිය හා අනුප්‍රාප්තික අයිතිය තවදුරටත් තහවුරු කළා. ඊ ළඟට අඳ ගොවියා හට පවුලේ සාමාජිකයකු වෙත පසු අයිතිය නම් කිරීමේ අයිතියත් ලබා දුන්නා. ඒ වාගේම තට්ටුමාරු, කට්ටිමාරු ගොවීන්ගේ අඳ අයිතිය සහ අනුප්‍රාප්තිය තහවුරු කළා. ඒ වාගේම අඳ ගොවියකු පත් කිරීමේ බලය ඵලදා වර්ධන කමිටුවට ලබා දුන්නා. ඊට පස්සේ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත නැවත සංශෝධනය වුණා. 1972 අංක 2 දරන කෘෂිකාර්මික ඵලදා වර්ධන පනත සහ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත ඉවත් කරමින් 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත පැනෙව්වා. එම 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත 1991 අංක 4 දරන පනතින් නැවත සංශෝධනය කළා. එම පනතට අඳ ගොවි අයිතිවාසිකම් වඩාත් සුරක්ෂිත කිරීම, අඳ ගොවියා හට පවුලේ සාමාජිකයකු වෙත පසු අයිතිය නම් කිරීමේ අයිතිය ලබා දීම, අඳ ගොවි අයිතිවාසිකම් පිළිබඳ ආරවුල් විසඳීම ගොවිජන සේවා කොමසාරිස් විසින් සිදු කිරීම වැනි ප්‍රතිපාදන ඇතුළත් කළා.

ඊ ළඟට පරීක්ෂණ නිලධාරිගේ තීරණයෙන් අතෘප්තියට පත් වන පාර්ශ්වයන් වෙත එම පනතින් පිහිටුවා තිබූ සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම සඳහා අවස්ථාව සලසා දීමක් සිද්ධ වුණා. ඊට පස්සේ නැවත 1991 අංක 4 දරන සංශෝධිත පනත ආපසු සංශෝධනය වුණා. කෙසේ හෝ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත 1991 අංක 4 දරන ගොවිජන සේවා (සංශෝධන) පනතෙන් සංශෝධනය කළ අතර එම සංශෝධන මඟින් අඳ ගොවි අයිතිවාසිකම් පිළිබඳ ආරවුල් විසඳීම සඳහා පරීක්ෂණ නිලධාරිවරයකු පත් කිරීම සිද්ධ වුණා.

ඊ ළඟට පරීක්ෂණ නිලධාරිගේ තීරණයට අතෘප්තියට පත් පාර්ශ්වයන් වෙත එම පනතින් පිහිටුවා තිබූ සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න හැකි වුණා. කෙසේ වුවද 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතින් සලසා දී තිබූ අඳ ගොවියා හට පවුලේ සාමාජිකයකු වෙත පසු අයිතිය නම් කිරීමේ අයිතිය ලබා දීම 1991 අංක 4 දරන ගොවිජන සේවා (සංශෝධන) පනතෙන් අහෝසි කෙරුණා.

ඊ ළඟට 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත වශයෙන් එය නැවත සංශෝධනය වුණා. ඒ, දැනට ක්‍රියාත්මක වන පනතයි. 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත ඉවත් කරමින් 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සම්මත කරන ලද අතර එමඟින් පරීක්ෂණ නිලධාරි තනතුර සහ සමාලෝචන මණ්ඩලය අහෝසි කර ත්‍රිපුද්ගල ගොවිජන විනිශ්චය සභාවක් පිහිටුවීමත්, අඳ ගොවීන් සඳහා තිබූ අඳ ගොවි අනුප්‍රාප්තිය සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොතිබීමත් සිදු වුණා.

අපේ ගරු අගමැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දී ඒ ප්‍රතිපාදන සලසා තිබුණේ ගොවීන්ගේ යහපත සඳහායි. ගොවියාටම එම ඉඩම ලබා ගන්න පුළුවන් වෙයි කියන බලාපොරොත්තුවෙනුයි එතුමා ඒ ප්‍රතිපාදන සලසා තිබුණේ. ඒක සමාජවාදී වැඩ පිළිවෙළක්; ඒක ගොවියාට සහනයක් දෙන්න කරපු වැඩ පිළිවෙළක්.

ඊ ළඟ කාරණය වන්නේ අලුතෙන් අඳ ගොවීන් බිහි නොවීම නිසා නීත්‍යානුකූල පදනමක් මත ඔවුනට සුරක්ෂිතභාවයක් ලබා දීමට හැකියාවක් නොතිබීමයි. මොකද, ආයෙමත් මේ ප්‍රශ්නය දිගින් දිගටම ගිහිල්ලා අවුලක් බවට පත් වුණා. ඒ නිසා මෙය නැවත ඉදිරියට යාම වළක්වා, සිටින අයටම ඒ ඉඩම් මිලදී ගැනීමේ අවස්ථාව එතුමා ඇති කරලා දුන්නත්, මිලදී ගැනීමේ හැකියාවක් නොමැති නිසා ඒ කටයුත්ත අඳ පස්සට ගිහින් තිබෙනවා. ඒ සම්බන්ධ කටයුතු එතුමාගෙන් පසුව කෙරිලා නැහැයි කියන එකයි මගේ හැඟීම. මෙම තත්ත්වය තුළ එම දිනය දක්වා සිටි දෙලක්ෂ හැත්තෑපන්දහසක් පමණ අඳ ගොවීන්ගේ හා ඔවුන්ගේ උරුමකරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා.

දැනට අවුරුදු එකොළහක් ගත වී තිබුණද, එතුමා බලාපොරොත්තු වුණු ගොවිජන විනිශ්චය සභාව මේ වන තෙක් ස්ථාපිත කරන්න කෙසේ හෝ බැරි වෙලා තිබෙනවා. 2000 වර්ෂයට පෙර සිට තිබුණු සහ 2000 වර්ෂයෙන් පසුව ඇති වූ අඳ ගොවි අයිතිවාසිකම් පිළිබඳව ආරවුල් විසඳීම ඇතුළු ආයතනික වශයෙන් සිදු කරනු ලැබූ වෙනස්කම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් ලංකාව පුරා විහිදී සිටින දෙලක්ෂ හැත්තෑපන්දහසක් පමණ වන මෙරට අඳ ගොවීන් සහ ඉඩම් හිමියන්ගේ නොවිසඳුණු ආරවුල් හාරදහසක් පමණ ප්‍රමාණයක් දැනට ගොඩගැසී තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීමට කටයුතු කළා. එසේම එතුමා වර්තමාන කෘෂිකර්ම අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයට හා ඉදිරියේ දී මතු විය හැකි කරුණු සහ ගැටලු පිළිබඳව සලකා බලා ඊට අවශ්‍ය පිළියම් යෙදීමේ අරමුණ ඇතිව 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතට සංශෝධනයක් වශයෙන් මෙම සංශෝධිත පනත් කෙටුම්පත කඩිනමින් සකස් කිරීමට කටයුතු

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

කළා. 2000 අංක 46 දරන පනතේ මූලික හරයන් එසේම තිබියදී අද ගොවීන්ගේ අයිතිවාසිකම් පිළිබඳව පමණක් සලකා කටයුතු කළා. 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතට අපි වෙනත් කිසිම සංශෝධනයක් කළේ නැහැ. ඒ සියලු දේවල් එසේම තිබියදී අද ගොවි ප්‍රශ්නයට පමණක් අපි සංශෝධන ගෙනෙනවාය කියන එක මා ප්‍රකාශ කරන්නට කැමැතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න කැමැතියි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

කමක් නැහැ, කෙටියෙන් කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මා පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා, අද ගොවියාගේ අද අයිතිය ආරක්ෂා කරන්නට යම් පියවරක් ගැනීම ගැන. මා පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්නට ඕනෑ. 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීම තුළින් අද අයිතිය අහිමි වුණු දහසකුත් අද ගොවියන් සිටිනවා. මේ 2000 - 2011 කාල වකවානුව අතරතුර, විශේෂයෙන්ම 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ විවිධ ප්‍රතිපාදනයන් උපයෝගී කර ගෙන අද ගොවියාගේ අද අයිතිය අහිමි කරපු ඉඩම් හිමියන් සිටිනවා. මම අහන්න කැමැතියි, 2000 - 2011 අතර කාල වකවානුව තුළ ඒ අද අයිතිය අහිමි වුණු අද ගොවියාට නැවතත් ඒ අද අයිතිය ලබා දෙන්න යම් කිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ඔබතුමා කියන්නේ ඉඩම් හිමියා පිළිබඳවද, අද ගොවියා පිළිබඳවද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇත්ත වශයෙන්ම ඉඩම් හිමියා තමයි අද ගොවියාගේ අද අයිතිය අහිමි කර තිබෙන්නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

බලහත්කාරයෙන් ඉඩම්වලට ගිහින් 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ප්‍රතිපාදනයන් උපයෝගී කර ගෙන අද ගොවියාගේ අද අයිතිය අහිමි කරන්න කටයුතු කරපු අවස්ථා ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන කේන්ද්‍ර ගණනාවක මේ තත්ත්වය තිබෙනවා. ගරු කථානායකතුමාත් ඒවා ගැන දන්නවා. 2000-2011 කාලවකවානුව තුළදී ඒ ඉඩම් අයිතිය අහිමි වුණොත්, ඒ අද අයිතිය අහිමි වුණොත් අද ගොවියාට නැවත වරක් ඒ අද අයිතිය ලබා දෙන්නට යම් ප්‍රතිපාදනයක් තිබෙනවාද කියන එකයි මා අහන්නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

අපේ සංශෝධනය තුළ ඒ ප්‍රතිපාදනය තිබෙනවා. නැවත ඒ අයට අභියාචනා මණ්ඩලයට යන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මොකක්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ඒ පිළිබඳව අභියාචනා කරන්න පුළුවන්. අපට ඒ ගැටලුව විසඳා ගන්න බැරි වුණොත් අපි ඒ සඳහා වන්දියක් පවා ලබා දෙන්න ලැහැස්ති වෙලා ඉන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

වන්දිය නොවෙයි මා අහන්නේ. අද ගොවියාගේ අද අයිතිය ආපහු ලබා ගන්න හැකියාව තිබෙනවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

අනවශ්‍ය විධියට අද අයිතිය අහිමි කර තිබෙනවා නම්, නැවත වරක් ඒ පිළිබඳව විනිශ්වය සභාවකට -විනිශ්වය සභාවක් පත් කරනවා.- යන්න පුළුවන්. ඒ පිළිබඳව අභියාචනයක් දමා තමන්ට වුණු අසාධාරණය පිළිබඳව කරුණු කියන්න පුළුවන්; කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ඊට පසු නැවත ඒ පිළිබඳව සමාලෝචනය කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒ අද ගොවීන්ට සාධාරණත්වයක් ඉටු වෙනවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

සාධාරණත්වය ඉෂ්ට කරනවා. මේ පනතෙන් අද ගොවියාට තමයි සාධාරණය ඉෂ්ට කරන්න බලාපොරොත්තු වන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

බොහොම ස්තුතියි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

අද ගොවි අයිතිවාසිකම් වඩා සුරක්ෂිත කිරීම සම්බන්ධවයි මා කියා ගෙන ආවේ. අද ගොවි අයිතිවාසිකම් වඩා සුරක්ෂිත කිරීම; අද ගොවීන්ගේ, තට්ටු මාරු සහ කට්ටි මාරු ගොවීන්ගේ අද අයිතිය සහ අනුප්‍රාප්තිය තහවුරු කිරීම; අද ගොවියා හට පවුලේ සාමාජිකයෙකු වෙත පසු අයිතිය නම් කිරීමේ අයිතිය ලබා දීම; ඒ වාගේම පුද්ගලයන් තිදෙනෙකුගෙන් සමන්විත ගොවිජන

විනිශ්චය සභා වෙනුවට ඒක පුද්ගල විනිශ්චය සභාවක් පිහිටුවීම; ඒ වාගේම විනිශ්චය සභාවේ තීරණය සම්බන්ධව අතෘප්තියට පත් වන අය සඳහා සමාලෝචන මණ්ඩලයට අභියාචනා කිරීමේ අවස්ථාව ලබා දීම; ගොවිජන විනිශ්චය සභාවේ සහ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ තීරණය සම්බන්ධව අතෘප්තියට පත් වන අය සඳහා පළාත්බද මහාධිකරණය වෙත අභියාචනා කිරීමට අවස්ථාව සලසා දීම වැනි කාරණා මේ තුළින් ඉෂ්ට වෙනවා. මේ පිළිබඳව ගොවීන්, ගොවි සංවිධාන හා ස්වේච්ඡා සංවිධාන, විද්වතුන්, දේශපාලන පක්ෂ නියෝජිතයන්ගේ අදහස් මාස ගණනක් තිස්සේ ලබා ගත්තා. ඒවා උපදේශක කාරක සභාවට ඉදිරිපත් කළා. ඒ සියලු දෙනාගේම යෝජනා, අදහස් සැලකිල්ලට අරගෙන තමයි මේ සංශෝධනය ඉදිරිපත් කරන්න කටයුතු කරලා තිබෙන්නේ.

විශේෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, අද ගොවි අයිතිය පිළිබඳව මහින්ද චින්තනයේ පැහැදිලිවම සඳහන් කර තිබෙන බව. ඒ මහින්ද චින්තන වැඩ පිළිවෙළේ එක් අවස්ථාවක් හැටියට අපි මෙය ඉදිරිපත් කරනවාය කියන එක මා කලිනුත් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ හම්බන්තොට, අනුරාධපුරය වැනි දිස්ත්‍රික්කවල තමයි වැඩිපුරම මේ අද ගොවි ප්‍රශ්නයට මුහුණ දුන්නු ගොවීන් ඉන්නේ. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට අද ගොවි ගැටලු ලක් වීම නිසා තමයි මහින්ද චින්තනයට මේක ඇතුළත් කරලා තිබුණේ. ඒක නිසායි අද අපි මේ සහන දෙන්න කටයුතු කරන්නේ. ගොවි ජනතාවට සහන ලබා දීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා අපට නිරන්තරයෙන්ම උපදෙස් දෙනවා. මා ඒක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, අපේ ගරු කථානායකතුමා ඇතුළු හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලන අධිකාරියේ සියලු දෙනාත් මේ ප්‍රශ්නයට කඩිනමින් විසඳුමක් ලබා දෙන්න ඕනෑය කියලා නිතර නිතර අපට උපදෙස් දුන්නා; යෝජනා කළා.

එදා -1958- අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ පියා ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමා ආරම්භ කරපු සමාජවාදී වැඩසටහන -අව්වට, වැස්සට පින්නට ගොදුරු වෙලා අපේ රටට බත සපයන ගොවියා ආරක්ෂා කරන්න, සාධාරණය ඉෂ්ට කරන්න - ශක්තිමත් කරන්න අවශ්‍ය දේ තමයි අපි මේ සංශෝධන තුළින් ඉදිරිපත් කරන්නේ. අතිගරු ජනාධිපතිතුමා නිරන්තරයෙන්ම අපව ශක්තිමත් කිරීම පිළිබඳව, මේ සඳහා උපදෙස් දීම පිළිබඳව විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශයක් නියෝජනය කරන මහ ජන නියෝජිතයෙක් හැටියට මගේ ස්තුතියත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ගරු කථානායකතුමනි, අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ පියා තමයි 1958 මෙහි මූලික පනත ඉදිරිපත් කළේ. එතුමාටත් අවශ්‍ය වෙලා තිබුණා මේ තුළින් ගොවියා ශක්තිමත් කරන්න.

ගරු කථානායකතුමනි, අපේ ගරු අග්‍රාමාත්‍යතුමා ඉතාම හොඳ බලාපොරොත්තුවකිනුයි ගොවියාටම මේ ඉඩම ගන්න පුළුවන් වන විධියට 2000 සංශෝධනය ඉදිරිපත් කළේ. නමුත් ගොවියාට හැකියාව නැතිකම නිසාත්, එතුමාගේ ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන ගියේ නැති නිසාත් තමයි මේ ආරාවුල ඇති වුණේ. අද අපිට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන, උපදේශක කාරක සභාවේ අනුමැතිය ලබා ගෙන, සියලු දෙනාගේම අනුමැතිය ලබා ගෙන මේ සංශෝධනය ඉදිරිපත් කරන්න පුළුවන් වුණා. ගරු කථානායකතුමාගේ නිල කාමරයට ගිහිල්ලා අපි කිහිප වතාවක්ම මේ ගැන සාකච්ඡා කළා. එතුමාටත් මගේ ස්තුතිය, ගෞරවය පුද කරනවා. ගොවිජන සංවර්ධන පනතට ගෙන එන මෙම සංශෝධන තුළින් අපේ රටට බත සපයන ගොවියාට, කෘෂිකාර්මිකයාට සාධාරණය ඉටු වන බව ප්‍රකාශ කරමින් මෙයට සම්බන්ධ වෙච්ච අපේ ලේකම්තුමා සහ කොමසාරිස් ජනරාල්තුමා ඇතුළු ඒ නිලධාරි මණ්ඩලයටත්, අනෙකුත් සියලු දෙනාටමත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, බොහොම ස්තුතියි.

[අ. භා. 1.48]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පතද, ඒ වාගේම ආර්ථික සංවර්ධන ඇමතිතුමාගේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන්ද සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී සාකච්ඡා කරනවා. එක අතකින් අතීතයත් අනික් අතින් අනාගතයත් කියන දෙකම එකට එකතු කරලා වාගෙයි තිබෙන්නේ. අද ලෝකයේ බොහෝ රටවල් අද ගොවි ක්‍රමය වෙනුවට ඒ ගොවීන්ට ඉඩම් බාර දීලා තිබෙනවා. එහෙම නැත්නම් ඉඩම් මිල දී ගන්න අවස්ථා ඇති කරලා තිබෙනවා.

අද ගොවි ක්‍රමය කියන්නේ මොකක්ද? ලෝකයේ හැම තැනම ඒ ක්‍රමය තිබුණේ වැඩවසම් කෘෂිකර්මයකදීයි. එදා ඇතැම් පුද්ගලයන්ට විශාල ඉඩම් ප්‍රමාණයක් තිබුණා. වැඩවසම් ක්‍රමයේදී ඒවා බෙදා දුන්නා ජනතාවට, "ඔය ගොල්ලන්ට ඒවායේ වගා කරන්න පුළුවන්. වගා කරලා ගන්නා නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ඉඩම් හිමියාට දෙන්න." කියලා. අන්න එදා තමයි ඒක ඇති වුණේ.

දැන් මේ ක්‍රමය ක්‍රමානුකූලව නැති වෙමින් යනවා. යුරෝපයේ නම් මේ ක්‍රමය සම්පූර්ණයෙන්ම නැති වෙලා. ආසියාවේත් දකුණු ආසියාවේ හැර අනෙක් රටවල ඒ ක්‍රමය නැති වෙලා තිබෙනවා. මහජන චීනයයි, උතුරු කොරියාවයි කොමියුනිස්ට් ක්‍රමය යටතේ එම ක්‍රමය අහෝසි කළා. දකුණු කොරියාවත්, ජපානයත් ඒ ක්‍රමය අහෝසි කළා. පසුව චීනයට අයිති තායිවාන් දූපතත් ඒ ක්‍රමය අහෝසි කළා. ඒ කාලයේ ඒ දූපත පාලනය කළේ චියැන්ග් කායි-ෂෙක්. කෙසේ හෝ ඒ අයත් ඒක අහෝසි කළා. දෙපැත්තෙන්ම ඒ ක්‍රමය අහෝසි කරලායි තිබෙන්නේ. නමුත් ලංකාවේ තවම අද ගොවි ක්‍රමය තිබෙනවා. මා අහන්නේ අප මෙතැනදී කථා කරන්නේ අද ගොවි ක්‍රමය ඉදිරියට ගෙන යන එක ගැනද, එහෙම නැත්නම් මේ කාරණය දිහා බලලා ගොවියාටත් වාසියක් වන විධියට, ඉඩම් හිමියාටත් අවාසියක් නොවන විධියට මේ ප්‍රශ්නය විසඳනවා කියන එක ගැනද කියායි. එක කොටසක් තිබෙනවා වෙනම සොයා බලා ආරක්ෂා කළ යුතු. ඒ තමයි විහාර දේවාලගම් පනතට සම්බන්ධ ඒවා. ඒවායෙන් තමයි ආදායම් මාර්ග එන්නේ අපේ පන්සල්වලට. නමුත් අනෙක් ඉඩම්වලට මෙතැනදී එක දෙයක් කරන්න පුළුවන්. අඩුම ගණනේ අපි ක්‍රමයක් ඇති කරන්න ඕනෑ.

අද ගොවීන්ට වුවමනා නම් -ස්වේච්ඡාවෙන් හරි- ආණ්ඩුව නියම කරන වටිනාකමට අදාළ මිලක්, වන්දියක් ඉඩම් හිමියාට දීලා ඒ ඉඩම අර ගන්න පුළුවන් ආකාරයේ. ඕනෑ නම් ආණ්ඩුවටත් පුළුවන් ඒකෙන් කොටසක් ලබා දෙන්න. අනෙක් අතට ඉඩම් හිමියාට උදවු කරන්න අද ගොවීන්ට යම්කිසි වන්දියක් ගෙවලා - ආණ්ඩුව නියම කරන වන්දියක් ගෙවලා- ඉඩම අර ගන්න කියලා. අද ගොවි ක්‍රමය ඉදිරියට ගෙන යන එකේ නම් කිසිම වාසියක් මට පෙනෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම ඒ ඉඩම්වල ඵලදායීතාවත් අඩු වෙනවා අද ගොවි ක්‍රමය ඉදිරියට ගෙන ගියොත්. ඒක වැඩි කරන්න පුළුවන්. අපේ ප්‍රතිපත්තිය වෙන්න ඕනෑ ගොවීන්ට අයිතිය දෙන එකයි. ඒකයි එක්සත් ජාතික පක්ෂය විශේෂයෙන් ප්‍රකාශ කරන්නේ.

ඔබතුමන්ලාත් දන්නවා, 1958 ඉඳලායි මේ ප්‍රශ්නය ආවේ කියලා. එදා පිලිප් ගුණවර්ධන මැතිතුමා කෘෂිකර්ම ඇමති හැටියට ඉතා වැදගත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළේ. ඒ පනත් කෙටුම්පත සම්මත කළා නම් අද ගොවි ක්‍රමය නැති වනවා. නමුත්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

කැබිනට් මණ්ඩලය ඇතුළේ විශාල ප්‍රශ්නයක් ඇති වෙලා එතුමාට කැබිනට් මණ්ඩලයෙන් පිට වෙන්න සිදු වුණා. ඒක කැබිනට් මණ්ඩලය ඇතුළෙන් අවසන් වුණේ, අගමැතිතුමාව ඝාතනය වෙලායි. ඒ කථාව අපි දන්නවා. ඒ ගැන මා දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. එදා ඒ පියවර ගෙනාවේ ඇත්ත වශයෙන්ම නැඟෙනහිර ආසියාවේ කොමියුනිස්ට් ධනවාදී රටවල් සියල්ලම ඒක අනුගමනය කළාට පසුවයි.

ගොවියාට මුදල් දෙන්න තමයි මහජන බැංකුව පිහිටෙව්වේ. අපි තවම මේ ක්‍රමය ගෙන යනවා. විශේෂයෙන්ම මහින්ද චින්තනය යටතේ මේ වැඩවසම් ක්‍රමය ආරක්ෂා කරන්න කටයුතු කරනවා විතරක් නොවෙයි, දැන් මේ වැඩවසම් ක්‍රමය සම්පූර්ණ රටටම එනවා. මොකද, අපේ රටේ පරමාධිපත්‍යය තිබෙන්නේ ජනතාව එක්කයි. ජනතාව තමයි නීතියේ ආධිපත්‍යය ක්‍රියා කරන්න ඕනෑ. දැන් නීතියේ ආධිපත්‍යය නැති වුණාම, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කළ ස්වාධීන පොලිස් කොමිසම නැති කළාම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම නැති කළාම, ස්වාධීන මැතිවරණ කොමිසම නැති කළාම, මාධ්‍ය මර්දනය කරන කොට- [බාධා කිරීම්] වැඩවසම් ක්‍රමයක බැහැ නේ, ආර්ථික දියුණුවක් ඇති කරන්න. [බාධා කිරීම්] ඔබතුමාගේ strategic ව්‍යාපාරය කරන්න බැහැ නේ. මහින්ද චින්තනයට ඕනෑ වෙලා තිබෙන්නේ මුළු රටේම වැඩවසම් ක්‍රමයක් ඇති කරන්නයි; [බාධා කිරීම්] අපේ ඡන්ද අයිතියත් නැති කරන්නයි. ඒක තේ වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] එහෙම නම් ඔබතුමාගේ අමාත්‍යාංශය තියෙන්න බැහැ. Toursim නැහැ. වැඩවසම් ක්‍රමය නිසා නේ නිමල් ලාන්සාගේ ගෙදරට STF එක ගියේ. එහෙම නැත්නම් යන්නේ නැහැ නේ. STF එක නිමල් ලන්සාගේ ගෙදරට ගියේ ඇයි? මා අහන්නේ,"වැඩවසම් ක්‍රමය සම්පූර්ණයෙන් නැති කරන්නේ නැත්තේඇයි?" කියලායි. [බාධා කිරීම්] වැඩවසම් ක්‍රමය ගොවීන්අතරත් නැති කරලා දමමු; මේ රටේත් නැති කරලා දමමුයි කියලා ප්‍රකාශ කරනවා. දැන් ඔබතුමා පිළිතුරු දෙන නිසා- [බාධා කිරීම්] සම්පූර්ණයෙන් වැඩවසම් ක්‍රමය නැති කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් අපට තිබෙන අයිතිවාසිකම් හොරකම් කරන්න වෙනවා. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් නැති වුණාමයි වැඩවසම් ක්‍රමයක් එන්නේ. එහෙම නම් මහින්ද චින්තනය කියන්නේ වැඩවසම් ක්‍රමයක්. ඒක නැති කරමුයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊ ළඟට ගරු අගමැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා. 1.54]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
ගරු කථානායකතුමනි, 1956 අවුරුද්දේ එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් වෙලා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ජයග්‍රහණය කළා. ඒ ජයග්‍රහණය කරපු අවස්ථාවේදී සමස්ත ලංකාවේ බොහොමයක් තිබුණු කුඹුරු ඉඩම් අද ගොවීන්ගෙන් වෙනස් කරලා වෙනත් අයට, තමන්ට පක්ෂපාතී අයට දෙන්න සූදානම් කළා. ඒ වැඩ පිළිවෙළ විශාල වශයෙන් ලංකාව පුරාම පැතිර ගියා. ඒ අනුව කැබිනට් මණ්ඩලය රැස් වුණාට පස්සේ, අගමැතිතුමා අලුත් කැබිනට් මණ්ඩලයෙන් වෙනම කණ්ඩායමක් පත් කරලා, පරීක්ෂණයක් පවත්වලා මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා පැවැත් වූවා.

එදා පිලිප් ගුණවර්ධන මැතිතුමා තමයි කෘෂිකර්ම ඇමතිවරයා හැටියට හිටියේ. ඒ සාකච්ඡාවේදී ගත් තීරණයක් අනුව එතුමා යෝජනා කළා, මේ තත්ත්වය යටතේ අපි නව පනතක් ගෙනැල්ලා, ඒ පනත තුළින්, මේ කුඹුරුවල මහන්සියෙන් වැඩ කරපු අයගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට නීතියක් ගෙනෙන්න ඕනෑයි කියලා. ඒ අනුව තමයි ඒ වැඩ පිළිවෙළ සකස් කරලා අස්වැන්නෙන් 3/4ක් අද ගොවියාටත් ඒ කියන්නේ වැඩ කරන එක්කෙනාටත්, 1/4ක් කුඹුරු හිමියාටත් ලැබෙන ආකාරයට ඒ කටයුතු ක්‍රියාත්මක කළේ. එහෙම ක්‍රියාත්මක කළ අවස්ථාවේදී පවා අද ගොවීන් සහ අයිතිකාරයන් අතර විශාල වශයෙන් රණ්ඩු දබර සිද්ධ වුණා. මගේ ආසනයේ ගම්වල පවා එය සිද්ධ වුණා. මාත් ඒ අවස්ථාවේදී සභාපතිවරයකු වශයෙන් ගොවිජන සේවා එකේ සිටියා. මේ විධියට ක්‍රියාත්මක වෙච්ච අවස්ථාවේදී තමයි මේ අද ගොවියාට සාධාරණත්වයක් ඇති කළේ. ඇත්ත වශයෙන්ම ඒ වෙලාවේ හැටියට ඉතාම යෝග්‍ය ක්‍රමයක් තමයි ඒ අද ගොවි තත්ත්වය දීලා සාමාන්‍ය ජනතාවට අයිතිවාසිකම් ලබා දීපු එක. ඒක දිගින් දිගටම ක්‍රියාත්මක කරලා වාර ගණනාවක් - ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා වාගේ- සංශෝධන රාශියක් ඇති කළා. ඒ සංශෝධනවලින් වරින් වර අද ගොවියාගේ අයිතිය සුරැකෙන පරිදිත්, ඒ වාගේම ඒ ක්‍රියා මාර්ග හරියාකාරව ගෙන යෑම සඳහාත් වැඩ පිළිවෙළක් සකස් කළා.

2000 අවුරුද්දේ මා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට පත් වුණාට පස්සේ මා පෞද්ගලික වශයෙන් කල්පනා කරලා, මේ ක්‍රමය දීර්ඝ කාලීනව තිබීම යෝග්‍යද කියන එක ගැන ගොවීන් සම්බන්ධව දන්නා නිලධාරීන් සමඟ, ඒ වාගේම නොයෙක් විධියේ ප්‍රභූවරුන් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා පැවැත් වූවා. මගේ අදහස වුණේ මේ ක්‍රමය වෙනස් කරලා එක් පැත්තක පුද්ගලයෙකුට මේ අයිතිවාසිකම ලැබිය යුතුයි කියන එකයි. එක්කෝ අඳයට වැඩ කරන පුද්ගලයාට, එහෙම නැත්නම් අයිතිකරුට -මේ දෙන්නාගෙන් එක් කෙනකුට - මේ අයිතිය ලැබීම තමයි හරි කියලා අපි තීරණය කළා. ඒ අනුව වැඩ පිළිවෙළක් සකස් කරලා 2000 අවුරුද්දේදී මේ පනත -ගොවිජන සංවර්ධන පනත- ඉදිරිපත් කළා. අනෙක් සියලුම පනත් අහෝසි කරලා මෙම පනත ඉදිරිපත් කළා. ඒ පනත ඉදිරිපත් කරලා ක්‍රියාත්මක කරන්න සූදානම් කළා. ඒ කුඹුර තමන්ට සන්තක වෙන්න ඕනෑයි කියා අද ගොවියා කල්පනා කරනවා නම් ඒ බව අයිතිකාරයාට දැනුම් දෙන්න පුළුවන්.

අයිතිකරු ඒ අවස්ථාවේ ඒ වටිනාකමට අනුව මට මෙච්චර මුදලක් දෙන්න ඕනෑය කියනවා. ඒ වටිනාකමට සතුටු නම් අද ගොවියාට ඒ මුදල ගෙවලා කුඹුර ලබා ගන්න පුළුවන්. එහෙම සතුටු නැත්නම් ඒ කාරණාව කමිටුවට ඉදිරිපත් කරලා එහි සාධාරණ වටිනාකම බලා ඒ සාධාරණ වටිනාකම ගෙවන්න අද ගොවියාට නියම කරන්න පුළුවන්. එතකොට අද ගොවියාට ඒක දෙන්නම ඕනෑ. ඒක ලබා ගන්න අද ගොවියා කැමැති නැත්නම් අයිතිකරුට ආපසු ඒ කුඹුර දෙන්න පුළුවන්. නමුත් වටිනාකමෙන් හතරෙන් තුනක් අද ගොවියාට ගෙවන්න ඕනෑ. එතකොට අයිතිකාරයාට ඒක ලැබෙනවා. අයිතිකරුට ගෙවන්න ඕනෑ වන්නේ හතරෙන් එකයි. හතරෙන් එකක් ගෙවීමයින් පසුව අද ගොවියාට ස්ථිර වශයෙන් සින්නක්කරව ඒ කුඹුර ලැබෙනවා. මෙන්න මේ විධියටයි මේ නීතිය සකස් කළේ. එතකොට දෙගොල්ලක් නැහැ.

මම පිළිගන්නවා, විපක්ෂ නායකතුමා කියපු වැඩවසම් ක්‍රමය කියන එකේ වැරැද්දක් නැති බව. ඒක හරි. වැඩවසම් ක්‍රමය තුළ තමයි මේ විධියේ සැලසුම් සහගත ක්‍රමයක් අතීතයේ ඉඳන්ම - ඉතිහාසයේ පටන්- ලංකාවේ පමණක් නොවෙයි මුළු ලෝකයේම තිබුණේ. ඉඩම් සම්බන්ධව ලෝකයේ තිබුණු තත්ත්වය ඒකයි. ඒ අනුව අපි බලාපොරොත්තු වුණේ මේ තත්ත්වය සම්පූර්ණයෙන්

නැති කරලා එක් පුද්ගලයකුට, එක් පාර්ශ්වයකට පූර්ණ අයිතිවාසිකම් ලබා දීලා ඒ පුද්ගලයාට තමන්ගේ කැමැත්ත අනුව සේවාව කරලා, මහන්සි වෙලා ඒකෙන් ආදායම ලබා ගන්නා විධියට සකස් කරන්නයි. අයිතිකරුට පුළුවන්කම තිබෙනවා ඒ මුදල් ලබා ගෙන එයාගේ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා ඒ මුදල්වලින් ප්‍රයෝජනයක් ගන්න. එතකොට දෙපැත්තටම ප්‍රයෝජනයක් වෙනවා. දෙපැත්තටම අවාසියක් නොවන ආකාරයටයි 2000 දී මේ පනත ඉදිරිපත් කළේ. එහෙම වුණාට මොකද අද ගොවියාට එතරම් මුදල් ගෙවන්න විධියක් නැහැ. ඒක අපි දන්නවා. ඒ නිසා ගොවි ජන බැංකු ඇති කරලා ගොවි ජන බැංකුවෙන් අද ගොවියාට ණය දීලා ඉන් පසුව අද ගොවියා තමන් හැම දාම කුඹුර අස්වද්දනකොට ඒ වීවලින් පංගුවක් ඒ බැංකුවට කොටස් වශයෙන් දීලා අවුරුදු ගණනාවකට පසුව ඒ ඉඩම ඔහුටම ස්ථිර වන හැටියට වැඩ පිළිවෙළ සකස් කළා. අද ගොවියා ඒ ණය ප්‍රමාණය ගෙවන්න ඕනෑ. ඒකට ඉතාම සුළු පොලියක් තමයි නියම කරලා තිබෙන්නේ. මේ විධියට එක පාර්ශ්වයකට මේ භූමියේ අයිතිවාසිකම ලැබුණාම ඒක හරියාකාරව ක්‍රියාත්මක කරන්න පුළුවන් වනවාය කියන එකයි අපි කල්පනා කළේ.

ඒ කාල පරිච්ඡේදය තුළ අද ගොවියා සහ අයිතිකරු අතර නඩු එක්දාස් ගණනක් ඇති වුණා. එහෙම වුණාම තමන්ගේ කාලය ගත වෙනවා. විශේෂයෙන් අද ගොවියා කියන්නේ දුප්පත් කෙනෙක්. ඔහුට ඇති වන්නා වූ අපහසුකම් මොනවාද කියා බැලුවා. එතකොට මේ විධියේ තත්ත්වයක් නැතුව එක පැත්තකට මේක ගියාම තමන් ආශාවෙන් මගේ කුඹුර, මගේ ඉඩම, මම වැඩියෙන් ආදායම් ලබා ගන්න ඕනෑය කියන චින්තනයකින් වැඩ කරලා ඒකෙන් ප්‍රයෝජන ගන්නවා. එතකොට ආර්ථික වශයෙනුත් රටේ දියුණුවක් ඇති වනවා. පුද්ගලයා වශයෙනුත් දියුණුවක් ඇති වනවා. අයිතිකරුට මුදලක් ලැබීම තුළින් ඒ මුදලින් තමන්ට ඕනෑ ප්‍රයෝජනයක් අරගෙන තමන්ගේ ආර්ථිකය දියුණු කර ගන්නත් පුළුවන්.

මෙන්න මේකයි අප 2000 දී ක්‍රියාත්මක කළේ. නමුත් ගරු ඇමතිතුමා කිව්වා වාගේ ඒ වැඩ පිළිවෙළ හරියාකාරව ක්‍රියාත්මක වන්නේ නැති බව මම දන්නවා. එම පනත ක්‍රියාත්මක කරන අමාත්‍යවරයා වශයෙන් මට දීර්ඝ වශයෙන් ක්‍රියා කරන්නට පුළුවන් වුණේ නැහැ. මගෙන් එම අමාත්‍යාංශය වෙනස් වුණා. ඒ වෙනස් වුණාට පස්සේ දීර්ඝ කාලීනව ඒ නීතිය හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවීම තුළ තිබුණාට වඩා අමාරුකම්වලට මුහුණ දෙන්නට ගොවියාට සිද්ධ වුණාය කියන එක මම පිළිගන්නවා. අද ගොවියාට එවැනි තත්ත්වයක් ඇති වුණාය කියන එකත් මම පිළිගන්නවා.

ගරු කථානායකතුමනි, එම නිසා අද මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධනය වැරදි නැහැ. මම එහෙම කිව්වොත් ඒක වැරදි නැහැ. ඇයි කාරණාව? අපට අර තත්ත්වය ක්‍රියාත්මක කරන්න බැරි වුණු නිසා අද ගොවියා ආරක්ෂා කිරීම අපි කළ යුතුව තිබෙනවා. අද ගොවියා ආරක්ෂා කර මේ සංශෝධනය අනුව ක්‍රියාත්මක වන අතර මම යෝජනා කරන්නේ මේ පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගෙන් කණ්ඩායමක් සහ උපදේශකවරුන් පත් කර මේ කුඹුරුවල අයිතිවාසිකම් හරියාකාරව ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම අවශ්‍යයි කියායි. මේ වැඩසටහන් ක්‍රමය අහෝසි කර එක පැත්තකට මේ අයිතිවාසිකම ලබා දෙන්න කටයුතු කරන්නට ඕනෑ. අපේ ආහාරය බත්. මේ රටේ කුඹුරු අක්කර දහඅට ලක්ෂ පණස්දාහක් තිබෙනවා. ඒ කුඹුරු ටික හරියාකාරව අස්වැද්දුවොත් අපට වුවමනා කරන ආහාරය සම්පාදනය කර ගෙන පිට රටටත් සහල් යවන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ තත්ත්වය ඇති කර ගත්තොත් ස්වාධීන ජාතියක් හැටියට අපේ ආර්ථිකය දියුණු තියුණු කර ගන්න පුළුවන් වෙනවා. එම නිසා අපේ ප්‍රධාන ආහාරය සකස් කිරීම සඳහා වුවමනා කරන වැඩ පිළිවෙළ ඉතාම වැදගත් කාරණයක් හැටියට කල්පනා කරන්නට ඕනෑ. අද මේ සංශෝධනය හොඳයි. මේ සංශෝධනය සකස් කර අද ගොවියා ආරක්ෂා කරන අතර, අර විධියේ වැඩ පිළිවෙළක් අනාගතයේදී සකස් කරන්නට ඕනෑය කියා මා කල්පනා කරනවා.

ඊළඟට මට කියන්නට තිබෙන්නේ මේ කාරණයයි. ලංකාවේ කුඹුරු දහඅට ලක්ෂ පණස්දාහක් තිබුණත් සමහර කුඹුරු අද විශාල වශයෙන් ගොඩ කරලා ගොඩනැඟිලි හදන්නට නොයෙක් නොයෙක් දේවල් ක්‍රියාත්මක කරන්නට සූදානම් කර තිබෙනවා. 2000 දී ගෙනා පනතේ 3වන වගන්තිය යටතේ පැමිණිල්ලක් කිරීමෙන් පසු ඒ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියා විසින් ඒ පැමිණිල්ලේ සඳහන් කර ඇති සියලු තැනැත්තන් හා ඒ වරදට සම්බන්ධ යයි ඔහු සිතන හෝ ඔහු විශ්වාස කරන සියලු තැනැත්තන් ද මෙවලම්, උපකරණ, යන්ත්‍ර, වාහන හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ ලේඛනයන්ද අත් අඩංගුවට ගත යුතුය කියා තිබෙනවා. කුඹුරක් පස් දාලා පිරෙව්වොත් එහෙම කරන්නට ඕනෑය කියලායි කියන්නේ. අදත් විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් ඒ වාගේ ප්‍රශ්නයක් අහලා තිබෙනවා. ඒ විධියට කුඹුරු පුරවනවා. පුරවලා ගෙවල් හදනවා. ඒ විධියේ දේවල් ක්‍රියාත්මක කරනවා.

ඒ විධියට මේ වගන්තිය යටතේ,"යම් තැනැත්තකු වරදකට වරදකරුවකු කරනු ලැබූ අවස්ථාවක එම වරද සිදු කිරීම හා සම්බන්ධ යම් භාණ්ඩ, ද්‍රව්‍ය, ඉදි කිරීම් උපකරණ අධිකරණය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් තුළදී ඉවත් කරන ලෙස ඒ තැනැත්තාට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතුය. නොතාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව, කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිදු තැනැත්තකු විසින් යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් ගොඩ කිරීම හෝ යම් කුඹුරු ප්‍රමාණයක පස් ඉවත් කිරීම හෝ යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක යම් ගොඩනැඟිල්ලක් ඉදි කිරීම නොකළ යුතුය." කියා තිබෙනවා. මේ විධියට සඳහන්ව තිබුණත්, අද ඒක සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙනවා. මේ කුඹුරු ගොඩ කර ගොඩනැඟිලි හදනවා.

ඉතිහාසයේ ගොඩ ඉඩම්වල තමයි මිනිස්සු ගෙවල් හැදුවේ. වතුර තිබෙන සෑම තැනම කුඹුරක් හැදුවා. ඒ විධියට එදා සිටි මිනිස්සු බුද්ධිමත්ව ක්‍රියා කළා. එදා සිටියේ ඉගෙන ගත්තේ නැති, විද්‍යාව දන්නේ නැති මිනිස්සු කියලා කිව්වාට අපේ ඉතිහාසයේ අපේ මුතුන් මිත්තන් ඒ විධියටයි ක්‍රියා කළේ. ඒ මිනිස්සු සම්පූර්ණ භූමියෙන්ම ප්‍රයෝජන ගත්තා.

අද පාරවල් අයිනේ තිබෙන සියලුම කුඹුරු ගොඩ කරලා ඒවායේ ගොඩනැඟිලි හදනවා. අපේ ආහාරය ගැන කල්පනා කරන්නේ නැහැ. අපේ හාල් ටික විදේශ රටවලින් ගෙන්වා ගන්න ඕනෑ විධියටයි ක්‍රියා කරන්නේ. මේ අනුව බැලුවාම, කටුගස්තොට, පේරාදෙණිය, ගෙලිඔය, සිංහාපිටිය, කීරපනේ, සපුගස්පිටිය, රත්මලකඩුව, කහටපිටිය, ගම්පොලවෙළ කුඹුරුවල පස් පුරවලා විශාල වශයෙන් ගොඩනැඟිලි හදලා තිබෙනවා.

මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාත්, මාත් ඒ සම්බන්ධයෙන් මහනුවර දිස්ත්‍රික් කමිටුවේදී නොයෙක් අවස්ථාවල ප්‍රකාශයට පත් කළා. කවදාවත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. දිගින් දිගටම එම කුඹුරු පුරවලා ඒ විධියට කටයුතු කළා. යම් කිසි අවස්ථාවකදී ගම්පොල නගරය ගංවතුරෙන් යට වෙන්න ඉඩ තිබෙනවා. පේරාදෙණියේ ඉඳලා සියලුම ඉඩම් ගොඩ කරලා තිබෙනවා. ඒවා ගංවතුරට යට වෙලා විනාශයට පත් වෙන්න ඉඩ තිබෙනවා. ඒ අදාළ නිලධාරීන්ට කිව්වාට කවදාවත් ක්‍රියාත්මක වුණේ නැහැ. මේක මහා දූෂණයක් කියන එක ඒ ප්‍රදේශයේ ජනතාවගේ හැඟීම වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම අප්‍රමාණව දැනුම් දීලා තිබෙනවා. කවදාවත් ඒවා ගණන් අරගෙන ක්‍රියාත්මක වුණේ නැහැ. ලංකාවේ අනෙක් තැන්වලත් මේ තත්ත්වයෙන්ම ඇති කියලා තමයි මම කල්පනා කරන්නේ. ඒ නිලධාරීන්ට බලය තිබෙනවා. මෙම පනත මහින්

[ගරු දි.මු. ජයරත්න මහතා]

කොමසාරිස්වරයාට තමයි බලය ලබා දීලා තිබෙන්නේ. මම බලය භාර දුන්නේත් කොමසාරිස්වරයාටයි. තමන්ගේ රට වෙනුවෙන් කල්පනා කරලා අවංකව ක්‍රියාත්මක වෙයි කියලා මම හිතුවා. තමන්ගේ ප්‍රධාන ආහාරය වෙනුවෙන් කල්පනා කරලා අවංකව ක්‍රියා කරයි කියලා මම හිතුවා. එහෙම හිතලා තමයි ඒ පනත ගෙනාවේ. පනත අදත් ඒ විධියටයි තිබෙන්නේ. අදත් සංශෝධන ගෙනෙන්නේ ඒ ආකාරයටයි. මේ විධියට, කැත විධියට, ජරා විධියට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් මේ රටේ ආර්ථිකය දියුණු කරන්නේ කොහොමද කියලායි මම අහන්නේ.

ඒ විධියට කුඹුරු ගොඩ කරලා, සෑම තැනම ඒ වාගේ තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. එතකොට අපි අනාගතයක් ගැන කල්පනා කරන්නේ කොහොමද? අපේ ප්‍රධාන ආහාරය හැටියට තිබෙන බත් නැති කරන්න අපට පුළුවන්ද? අපි හැම දාම පිටි ආනයනය කරන්නද යන්නේ? මේ රටේ අනාගත පරපුර ස්වයංපෝෂිත ජාතියක් බවට පත් කිරීම සඳහා මේ විධියට බොහොම හැඟීමකින් යුක්තව අපි ක්‍රියා කරලා තිබෙනවා. ඒවාට නිලධාරින් ඉඩ දුන්නේ නැහැ. වැරදි විධියටයි ඒවා ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒවා අස්සේ වෙන වෙන දේවල් තිබෙනවා කියලා තමයි මහ ජනයා ප්‍රකාශ කරන්නේ. ඒ නිසා මේ සංශෝධන පනත් කෙටුම්පත ගෙනාව ඇමතිවරයා හැටියට මම බොහොම දුක් වෙනවා; බොහොම කනගාටු වෙනවා.

1956 දී පිලිප් ගුණවර්ධන මැතිතුමා කුඹුරු පනත ගෙනාව වෙලාවේදී ඒ කොමිටියේ සාකච්ඡාවට සහභාගි වුණ කෙනෙක් මම. එහෙම ඉඳලා, ඒ ගැන කථා කරලා එය ක්‍රියාත්මක කරන්න උත්සාහ කළා. අදයට වැඩ කරන අඳ ගොවියා ආරක්ෂා කරලා, අඳ ගොවියාට සින්නක්කර අයිතිය ලබා දෙන්න ඕනෑ කියන චේතනාවකින් තමයි එදා ක්‍රියා කළේ. නමුත් මේ නිලධාරින්ගේ තත්ත්වය මේකයි. ගරු කථානායකතුමනි, අදත් අපි මේ කටයුත්ත භාර දෙන්න යන්නේ මේ නිලධාරින්ටයි. ඒ නිසා මේ ගැන ඔබතුමාත් කල්පනා කර බලන්න. ඔබතුමන්ලාගේ ප්‍රදේශයේත් විශාල වශයෙන් කුඹුරු වැඩ කරන මිනිසුන් සිටිනවා; හොඳ ගොවියෝ ඉන්නවා. ඒ වාගේම ඒ කාල සීමාව තුළ ඔබතුමාගේ ප්‍රදේශයේ සිටි ගොවීන්ගේ සංවිධානය තමයි ඉතාම දියුණු ගොවි සංවිධානයක් හැටියට ලංකාවේ තිබුණේ. ඒ අය බෙහොම හොඳට ඒ කටයුතු ක්‍රියාත්මක කළා. නමුත් නිලධාරින්ගේ මේ වාගේ තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පැහැදිලි නැහැ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
නැහැ, මට ඒකට උත්තර දෙන්න බැහැ. මගේ කථාව ඉවර කරන්න ඕනෑ. මට වෙලාව නැහැ. ඒක ගැන අපි දෙන්නා පස්සේ කථා කරමු. ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, මේ නිලධාරින් මේ විධියට ක්‍රියා කරනවා නම් ඒ අයට නිසි දඬුවම් දෙන්න කියලා. ඒ අයට නිසි දඬුවම් දීලා මේ රට ආරක්ෂා කරන්න ඕනෑ; මේ රටේ ප්‍රධාන ආහාරය ආරක්ෂා කරන්න ඕනෑ; මේ රටේ ස්වයංපෝෂිත භාවය ආරක්ෂා කරන්න ඕනෑ. මම මෙහෙම කියන්නේ වාර ගණනක් මේ වාගේ දැනුම් දීලා ඒවා ක්‍රියාත්මක කරන්න බැරි වුණ නිසායි. එක වතාවක් ජනාධිපති ලේකම්තුමා පවා ඉල්ලීමක් කළා, අරාබි භාෂාව උගන්වන පාසලක් සඳහා එක කුඹුරකින් පර්චස් ගණනක් දෙන්න කියලා. ඒ කුඹුරු සියල්ලම දැන් ගොඩ කරලා ගෙවල් හදලා තිබෙනවා. නමුත් පාසල සඳහා ඒ අඟල් ගණන ගන්න බැරි වුණා. ජනාධිපතිතුමාට ලියුම දීලාත් ඒ අඟල් ගණන ගන්න බැරි වුණා. ඒ වාගේම තවත් තැනක ඒ වාගේ ඉල්ලීමක් කරලා ඒක දෙන්න කියලා තීරණය කළා. ඒ තීරණයෙන් පසුව ආපසු විභාගයක් කරලා ඒකෙන් කොටසක් දෙන්න තීරණය කළා. ඒක වෙනස් කළා. මොකක්ද මේකේ තත්ත්වය? මොකක්ද මේකේ අවංක භාවය?මොකක්ද මේකේ හරි තත්ත්වය? ඒ හින්දා මෙන්න මේ තත්ත්වයන් ගැන බලන්න ඕනෑ. අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හිනා වෙවී ඉන්නේ ආණ්ඩුවේ කෙනෙක් හැටියටයි, අගමැතිවරයා හැටියටයි මම මෙහෙම කථා කරන්නේ මොකද කියලා වෙන්න ඇති. අඩු පාඩු තිබෙනවා නම් ඒවා කථා කරන එක මගේ ගතියක්. යථාර්ථය කථා කරන එක, අවංකව කථා කරන එක මගේ ගතියක්. මම හැම දාම එහෙමයි කථා කරන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක හරි. අපි ඒක අගය කරනවා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එහෙම නැතුව මේක කරන්න බැහැ. වැරදි තිබෙනවා නම්, අඩු පාඩු තිබෙනවා නම් අපි ඒවා කථා කරන්න ඕනෑ. එහෙම කරලා අපි මේක යථා තත්ත්වයට පත් කරන්න ඕනෑ. ඒ හින්දා මම විපක්ෂයේ සිටින ඔබතුමන්ලාගෙනුත් ඉල්ලනවා අපිත් එක්ක එකතු වෙලා මේ අක්කර 18,050,000ක් තිබෙන කුඹුරු ප්‍රමාණය - දැන් අඩු වෙලා ඇති- හරියාකාරව එක් කොටසකට අයිතිවාසිකම් ලබා දීලා, අපි ස්වයංපෝෂිත ජාතියක් හැටියට සදාකාලිකව අපේ ජනතාවට අපහසුවක් නැතුව ආහාරය භුක්ති විඳින්න පුළුවන් වන ආකාරයට සකස් කර ගනිමු කියලා.

මා මේ විධියට කථා කළේ මොකද කියලා අපේ විපක්ෂයේ සංවිධායකතුමා හිනා වෙනවා මට පෙනෙනවා. [බාධා කිරීමක්] ඒ වුණාට තිබෙන යථාර්ථය කියන එක අපේ යුතුකමක්. අපි මේ රට වෙනුවෙන් ක්‍රියා කරන්නේ. අපි අද හිටියාට හෙට නැති වෙන්න පුළුවන්. නමුත් මේ ජාතිය මේ රටේ ජනතාවට නැති වෙන්නේ නැහැ. මේ භූමිය නැති වෙන්නේ නැහැ. ඒවා ආරක්ෂා කරලා මැරෙන එක තමයි අපේ යුතුකම. අපි අවංකව ඒ කාර්ය කරන්න ඕනෑ කියන චේතනාව තුළයි මම එහෙම කථා කළේ.

මම දන්නවා ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමා බොහොම මහන්සි වී වැඩ කරන කෙනෙක් බව. එතුමා ගොවිතැන සම්බන්ධව පළපුරුද්දක් හා අවබෝධයක් තිබෙන කෙනෙකු හැටියට බොහොම මහන්සියෙන් ක්‍රියා කරනවා. නමුත් මේ පනතට සංශෝධන ගෙනැල්ලා හුඟක් දවස් ගත වෙලා තිබෙනවා. ඒකට එතුමාට කරන්න දෙයක් නැහැ. ඒ නිසා එතුමාත් අපිත් එකතු වෙලා මේ වැඩ පිළිවෙළ සකස් කරලා ඉදිරියේදී සාධාරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමුයි කියලා ප්‍රකාශ කරමින්, අද ගෙනැවිත් තිබෙන සංශෝධන අදට යෝග්‍යයි කියන කාරණයත් ප්‍රකාශ කරමින් මම නවතිනවා. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

මී ළඟට ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 27ක කාලයක් පමණයි තිබෙන්නේ.

[අ. භා. 2.12]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, අගමැතිතුමා කථා කරපු විධියට මමත් පොඩ්ඩක් තිගැස්සුණා. එතුමා කිව්වා,"ජඩ විධියට වැඩ කරන නිලධාරින්" කියලා. ඒ නිලධාරින් පෙන්වා දීලා ඒ කට්ටිය අපේ ආර්ථික සංවර්ධනය සඳහා නැතුව ආර්ථික සංවර්ධනය කඩා වැට්ටීම සඳහා කරන වැඩ කටයුතු ගැන මටත් කථා කරන්න අවශ්‍යතාවක් තිබුණා. ඉතින් එතුමාගේ කථාවෙන් පස්සේ මම කල්පනා කළා මම කලින් හිතා ගෙන හිටපු දේ ගැන පොඩ්ඩක් කථා කරන්න ඕනෑ කියලා.

ආර්ථික සංවර්ධනය ගැන කථා කරන කොට අද "Daily Financial Times" පත්තරයේ ප්‍රධාන ප්‍රවෘත්තිය හැටියට අජිත් නිවාඩ් කබ්රාල් මහත්තයා කියලා තිබෙනවා,"අවුරුදු 50ක් තිස්සේ අර්ථසාධක අරමුදල කිසි විධියකට වංචා කළා කියලා කවුරුවත් කියලා නැහැ. ඒක ඉතාමත්ම හොඳට කළමනාකරණය කළාය" කියලා. දැන් මොකද මේකට හේතුව? ඊයේ එක්සත් ජාතික පක්ෂයේ අපි නිවේදනයක් නිකුත් කරලා පෙන්වා දුන්නා, පසු ගිය සුමානේ අර්ථසාධක අරමුදල කරපු එක ගනුදෙනුවක් නිසා සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ පාඩුව රුපියල් මිලියන 270යි කියලා. දැන් ඇත්ත වශයෙන්ම එතුමා කියනවා, "කිසිම විධියකට නිලධාරින්ට චෝදනා කරන්න එපා. නිලධාරින් ඉතාමත්ම හොඳට අර්ථසාධක අරමුදල කළමනාකරණය කරලා තිබෙනවා" කියලා. ඒක අපිත් පිළිගන්නවා. ගරු කථානායකතුමනි, අවුරුදු 50ක් තිස්සේ සේවක අර්ථසාධක අරමුදල ඉතාම හොඳින් කළමනාකරණය කළා. නමුත් මේ ජඩ විධියට වැඩ කරන උසස් නිලධාරින්ගේ ක්‍රියා කලාපය නිසා මේ ළඟදි දවස්වල අර්ථසාධක අරමුදලට ලොකු පාඩු සිදු වෙලා තිබෙනවා.

දැන් බලන්න, මම අද ගෙනාව මේ පින්තූරය. ගරු කථානායකතුමනි,මේක ඔබතුමාට පෙන්වන්න ඕනෑ. මේ තිබෙන්නේ ලාෆ් ගෑස් ආයතනයේ මිල. මම සටහනක් ඇඳලා තිබෙනවා ගිය මාසයේ මැද හරියේ ඉඳලා කොළඹ කොටස් වෙළෙඳ පොළේ ලාෆ් ගෑස් ආයතනයේ මිල පිළිබඳව. ගරු කථානායකතුමනි,මේ තිබෙන්නේ එහි තිබිච්ච මිල. කොටසක මිල රුපියල් 40යි. රුපියල් 40ට තිබුණු ලාෆ් ගෑස් ආයතනයේ කොටස් මිල හදිසියේම රුපියල් 48ට වැඩි වුණා. ගරු කථානායකතුමනි, සේවක අර්ථසාධක අරමුදල රුපියල් 48 ගණනේ කොටස් මිලියන 33ක් මිලදී ගත්තා. රුපියල් 48ට මිලදී ගත්තාට පස්සේ, දවස් දෙකකින් මේ මිල නැවතත් රුපියල් 40ට වඩා අඩු වුණා. මේ වෙන කොට ඊටත් අඩුයි. අද වෙනකොට රුපියල් 39ට බැහැලා තිබෙනවා. ගරු කථානායකතුමනි,-[බාධා කිරීමක්] කුඹුරු ගැන නොවෙයි. තව තිබෙනවා. ආර්ථික සංවර්ධනය ගැන කථා කරන්නේ. කුඹුරු ගැන පමණක් නොවෙයි. වෙනත් දේවල් ගැන කථා කරන්නත් ඉඩ තිබෙනවා, ක්‍රමෝපාය සංවර්ධනයට අදාළව. මෙහෙම නම් ක්‍රමෝපාය සංවර්ධන,- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

නිශ්ශබ්ද වෙන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

අර්ථසාධක අරමුදල කළමනාකරණය කරන උසස් නිලධාරින්ගේ ක්‍රියා කලාපය මේක නම් ගරු අගමැතිතුමනි,- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අහගෙන ඉන්න. එතුමා ආර්ථික ක්‍රමෝපායන් ගැන කථා කරන්නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මේ තිබෙන්නේ විස්තර. මේක තමයි යථාර්ථය. අගමැතිතුමා කිව්වා වාගේ තමයි. ජඩ වැඩ කරනවා. ඔබතුමා කිව්වා කුඹුරු ගොඩ කරලා බිල්ඩින් හදනවා, කොච්චර කිව්වත් ඒවා නවත්වන්නේ නැහැ කියලා. මම මේ ගරු සභාවේ මේ වාගේ කරුණු අනන්ත අප්‍රමාණ සැරයක් කියලා තිබෙනවා. නමුත් අප කියන දේවල් සත පහකට ගණන් ගන්නේ නැහැ ගරු අගමැතිතුමනි. මේ කටයුතු වංචනිකයි. රුපියල් 40ට තිබෙන කොටස රුපියල් 48ට ගත්තාම, ඊට දවස් දෙකකට පසසේ නැවතත් රුපියල් 40ට බහින්නේ කොහොමද? කාටද මේ පාඩුව? ලාෆ් ගෑස් සමාගමේ එක ගනුදෙනුවක් නිසා රුපියල් මිලියන 270ක් පාඩුයි සේවක අර්ථසාධක අරමුදලට. මේ ඔක්කොම විස්තර මා ළඟ තිබෙනවා, ලාෆ් ගෑස් සමාගමෙන් ඉදිරිපත් කරපු විස්තර. කොටස් මිලියන 33ක් විකුණලා තිබෙනවා සේවක අර්ථසාධක අරමුදලට. මෙතැන විස්තර තිබෙනවා සේවක අර්ථසාධක අරමුදල කොටස් මිලියන 33ක් ගත්තා කියලා. ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා නිලධාරින් ගැන කථා කරපු කරුණු මම වෙනත් පැත්තකින් ඔබතුමාට ඉදිරිපත් කළා.

මම ඇත්ත වශයෙන්ම කථා කරන්න බලාපොරොත්තු වන්නේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියම හතරක් පිළිබඳව.

ගරු කථානායකතුමනි, ඉස්සරවෙලාම මම කියන්න ඕනෑ මේ නියම මේ ගරු සභාවට ඉදිරිපත් කරලා සාකච්ඡා කරන එක, විවාද කරන එක හොඳ දෙයක් බව. අපි මීට කලිනුත් කථා කළා විනිවිදභාවයක් අවශ්‍යයි කියලා. ආණ්ඩුව විනිවිදභාවයකින් යුතුව වැඩ කරනවා නම් අපි ඒකට අනුග්‍රහය ලබා දෙන්න ඕනෑ. අපි ඒක අගය කරන්න ඕනෑ. ඉතින් ආණ්ඩුව ඒ පනත යටතේ මේ නියම ගෙනැත් තිබෙන එක හොඳ දෙයක් කියලා කියන්න අප මැලි වන්නේ නැහැ. නමුත් ගරු කථානායකතුමනි, පොතේ තිබුණු පළියට නීති පාර්ලිමේන්තුවට ගෙනැල්ලා වැඩක් නැහැ. නීතියේ හරය අනුව වැඩ කටයුතු කරන්නත් ඕනෑ. We call it the "spirit of the law". නිකම් නීතියේ තිබිච්ච පළියට පමණක් මේ නියම ගෙනැල්ලා වැඩක් නැහැ. මගේ ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු සගයා - කබීර් හාෂිම් මැතිතුමා- මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත පිළිබඳව, ඒ නියම හතර පිළිබඳව දිගින් දිගට කථා කරන්න සූදානමින් ඉන්නවා. මම ඒ නියම හතරෙන් එකක් පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මම ආණ්ඩුවෙන් මේ කාරණය අහන්න සූදානම්. ඒක ඇසිය යුතු ප්‍රශ්නයක්. මෙහි පස්වැනි නියමය කෝ? මෙතැන අද නියම හතරයි තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මෙතැන නියම පහක් තිබෙන්න ඕනෑ. පස්වැනි එක කෝ? මොකක්ද පස්වැනි එක? පස්වැනි එක තමයි CATIC එකට අදාළ එක. මම ඒක පෙන්වන්නම්. [බාධා කිරීමක්] ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා අහගෙන ඉන්න. මම කථා කරලා ඉවර වෙනකම් අහගෙන ඉන්න. මම පෙන්වන්නම්. ඒක තමයි පස් වැනි එක. මේ ජාවාරම ගැන මම මුලින්ම කථා කළේ මාර්තු මාසයේ 9වැනි දා. ඊට පස්සේ කීප වතාවකදී මම මේ ගැන කථා කළා. මම පෙන්නුම් කළා CATIC ගිවිසුම වලංගු නැති බව. මා ළඟ තිබෙනවා ගිවිසුම. මේක වලංගු නැති ගිවිසුමක් කියලාත් මම පෙන්වලා දුන්නා. ඒත් හොරෙන්ම අක්කර හතරක් විකුණලා තිබෙන බව අපට ආරංචි වෙලා

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

තිබෙනවා. [බාධා කිරීමක්] සින්නක්කරව දීලා තිබෙනවා ගරු අගමැතිතුමනි. ඔබතුමා කිව්වේ මොකක්ද? අක්කර භාගයේ ඉඩම අද ගොවීන්ට සින්නක්කරයට දෙන්න කියලායි. ඒක නේද ඔබතුමා කිව්වේ? ඔබතුමා කිව්වා කීප වාරයක්, දහස් වාරයක් කිව්වා කියලා අක්කර භාගයේ ඉඩම් කැල්ල සින්නක්කරව ඒ අද ගොවීන්ට දෙන්න කියලා. ගරු අගමැතිතුමනි, කිසිම විධියකට මේ පාර්ලිමේන්තුවට දන්වන්නේ නැතිව, ඒ නියමය ගෙනෙන්නේ නැතිව අක්කර හතරක් සින්නක්කරව චීන සමාගමකට දීලා තිබෙනවා.

ඔබතුමා දන්නවාද කියන්න මා දන්නේ නැහැ. මම පෙන්වන්නම්. ඊට පසුව මෙහි තිබෙනවා, කැබිනට් අනුමැතිය දීපු බව - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. Point of Order එකක්.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව ක්‍රමෝපායන් හතරක් ඉදිරිපත් කර තිබෙනවා. මීට ඉස්සෙල්ලා එකක් ඉදිරිපත් කළා. ඒවා සියල්ලක්ම මහ ජනයාට දින 30ක දැනුම් දීමක් ඇතිව ගැසට් නිවේදනයකින් පසුව කරපු ඒවා. ගරු කථානායකතුමනි, මේ කථාව සම්පූර්ණයෙන් වැරැදියි. මෙය නොමඟ යැවීමක්. කිසිම චීන සමාගමකට එක බිම් අඟලක් සින්නක්කරව දීලා නැහැ. [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇමතිතුමා වාඩි වන්න. මම පෙන්වන්නම්. [බාධා කිරීම්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
බොරු කියන්න එපා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොරු කියන්නේ නැහැ. මම කියවන්නම්. මෙන්න Agreement එක. මම මෙය හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා. මම මෙය කියවන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සියලු ප්‍රකාශ වග කීමෙන් යුතුව කරන්න.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එහි තුන්වන පිටුවේ අංක 4 යටතේ මෙසේ සඳහන් වනවා:

"Grant of Strategic Project Status

As also approved, the Government will ensure that the Board of Investment of Sri Lanka will take required actions to declare this investment as a Strategic Project under the Strategic Development Projects Act No. 14 of 2008, upon which the Project will be entitled -"

ගරු කථානායකතුමනි, මෙහි තිබෙනවා, strategic project එකක් යටතේ තමයි එන්නේ කියලා. ඒක තමයි ඇත්ත. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමාට අවස්ථාව තිබෙනවා කථා කරන්න. පසුව පැහැදිලි කරන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, මම කියන්නේ මෙකයි. එතුමා කියනවා, මෙතැන නියම පහක් තිබෙන්න විධියක් නැහැ කියලා. මම කියනවා, නියම පහක් තිබෙන්න ඕනෑ කියලා. එයට කැබිනට් අනුමැතිය ලැබුණු වාර්තාව මා ළඟ තිබෙනවා ගරු කථානායකතුමනි. ඒකෙන් තමයි මා මෙය කියවන්නේ. එහි තිබෙන්නේ Strategic Development Project එකක් හැටියට දුන්නා කියලා, CATIC සමාගමට. It is a Memorandum of Understanding for purchasing the land at Army Headquarters fronting Galle Road in Colombo 1, for a commercial development purpose, which was signed between the Ministry of Finance and Planning and the China National Aero-Technology Import and Export Corporation - CATIC - on 15th February, 2011 at Colombo.

ගරු කථානායකතුමනි, ඉතින් මීට වඩා මට මේ ගැන කථා කරන්න දෙයක් නැහැ. ගරු කථානායකතුමනි, මා ඉතාම වග කීමෙන් යුතුව ගරු ඇමතිතුමාගෙන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ, පස්වෙනි නියමය කෝ කියලායි. පස්වෙනි නියමය කෝ? [බාධා කිරීමක්] ඒක තමයි, නැහැ. ඇයි නැත්තේ? [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, අපි කථා කරන්නේ substance; we are talking about facts. මම බොරු කියනවා නම්, මේකත් බොරුද කියන්න. මෙය අත්සන් කරලා තිබෙන්නේ පී.බී. ජයසුන්දර. මෙය බොරු නොවෙයි, ගරු කථානායකතුමනි. මා මෙය සභාගත කරනවා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ කථාව කරගෙන යන්න. ඒ කරුණු වැරැදි නම් ඇමතිතුමා පිළිතුරු දෙන වෙලාවට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්, ඔබතුමන්ලාට උත්තර දෙන්න අවස්ථාවක් තිබෙනවා. මම කියන දෙයට එතුමාට පුළුවන් උත්තර දෙන්න. [බාධා කිරීම්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන එක හරිම අසික්කිතයි. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට ඒ වචනය ඇහුණේ නැහැ. වැරැදි වචනයක් පාවිච්චි කළා නම්, එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වන්නේ නැහැ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, කරුණාකරලා මේ ගරු සභාවේ හොඳින් හැසිරෙන්න කියන්න. එතුමන්ලාට මේ ගැන විවාද කරන්න ඕනෑ නම් විවාද කරන්න. එතුමන්ලාට අද ඕනෑ තරම් වෙලාව තිබෙනවා කථා කරන්න. මේ කොළේ වහන්න හදන්නේ කාටද ගරු කථානායකතුමනි? කොළේ වහන්න බැහැ. සමහරුන්ට කොළේ වහන්න පුළුවන්. හැබැයි, මම එකක් කියන්නම් ගරු කථානායකතුමනි. මම කොළේ වහන්න දෙන්නේ නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ කරුණු ඉදිරිපත් කරන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, එහෙම නම් ඒ ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ Grand Skylight Catic Hotel කියන එකට අදාළ නියමය වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා මම කියනවා. ඒක ඉදිරිපත් කරන්න අවශ්‍යයි. 2011 පෙබරවාරි මාසයේ 15 වැනිදා ගෙනාපු -

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒ ලියවිල්ල අපට බලන්න එවන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එවන්නම් ගරු අගමැතිතුමනි. එතකොට ඒක කරන්න බැරි නම් මම දෙන්නම් විකල්පයක්. ගරු අගමැතිතුමනි, ඒක කරන්න බැරි නම් මම විකල්පයක් දෙන්නම්. විකල්පය තමයි, ගත්තු සල්ලි ආපසු දීලා -ඩොලර් මිලියන 54ක මුදල ආපසු දීලා- ගෝල්ෆේස් ඉඩම නැවතත් ජනතාවට ලබා දීම. ඒක කරන්න පුළුවන් නේ. ඒක බැරිකමක් නැහැ නේ? මම විකල්ප දෙකක් දෙනවා. එක්කෝ, CATIC එකේ ක්‍රමෝපාය සංවර්ධන නියමය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. එහෙම නැත්නම් ගත්තු සල්ලි ආපසු දීලා ඒ ගෝල්ෆේස් එකේ ඉඩම ජනතා අයිතියට ආපසු දෙන්න. ඒ දෙකෙන් එකක් කරන්න.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)
මේ වාගේ තව දෙන්නෙක් ජාතික ලැයිස්තුවෙන් ගන්න බැරිද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නියමයි නේද? හැබැයි, මා මිත්‍ර ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් ජාතික ලැයිස්තුවෙන් තමයි ගිය වර පාර්ලිමේන්තුවට ආවේ. ඊට පස්සේ- [බාධා කිරීමක්] හොඳයි, හොඳයි. ඔබතුමාත් ජාතික ලැයිස්තුවෙන් තමයි ආවේ. එතැන ගැටලුවක් නැහැ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, දැන් මම කථා කරන්නම්, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය අංක 2, කොළඹ වරාය ව්‍යාපෘතිය පිළිබඳව. ඒකට දීලා තිබෙන්නේ මුහුද ගැඹුරු කිරීම - dredging - , ඒ වාගේම දියකඩනය - breakwater - සහ පළමුවන පර්යන්තය ආදී වශයෙන් container පර්යන්ත තුනක් හදා ගන්න. මේක පුද්ගලික රාජ්‍ය හවුල් ව්‍යාපෘතියක් හැටියටයි කෙරෙන්නේ. It was supposed to be a public-private partnership, Sir. 2006 ඔක්තෝබර් මාසයේ තමයි මේක ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක අත්සන් කළේ. මේ ව්‍යාපෘතිය අවසන් කරන්න තිබුණේ 2010 ඔක්තෝබර් මාසයේ. ඒ කියන්නේ පසු ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ තමයි මේ ව්‍යාපෘතිය අවසන් කරන්න තිබුණේ. ඒ, මුහුද ගැඹුරු කිරීම, දියකඩනය සහ පළමු වන පර්යන්තය ආදී වශයෙන් container පර්යන්ත තුනක් හදා ගැනීම. දෙවන පර්යන්තය ඉවර කරන්න තිබුණේ 2015 දීයි. කෙසේ හෝ පරක්කු වීම නිසා 2008 තමයි මේ ව්‍යාපෘතිය පටන් ගත්තේ. 2012 ඉවර කරනවා කියලා කියනවා. ශ්‍රී ලංකා ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව මේ පිළිබඳව අත්සන් කරපු ලියවිල්ල මා ළඟ තිබෙනවා.

මේ ව්‍යාපෘතියේ මිල ගණන් මෙහෙමයි ඇස්තමේන්තු වුණේ, ගරු කථානායකතුමනි. මුහුද ගැඹුරු කිරීම සහ දියකඩනයට ඇමෙරිකන් ඩොලර් මිලියන 480යි. පර්යන්තයට - terminal එකට - ඇමෙරිකන් ඩොලර් මිලියන 301යි. එතකොට මුළු වියදම ඇමෙරිකන් ඩොලර් මිලියන 781යි. මේකේ ආයෝජනය ආවේ කොහොමද? ආයෝජනය ආවේ මෙහෙමයි. ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 300යි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඩොලර් මිලියන 180යි. ඊ ළඟට පුද්ගලික පර්යන්ත මෙහෙය වන්නන්ගෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 301යි. මේ පසුබිමත් සමඟ, කාලයාගේ ඇවෑමත් සමඟ මේක පටන් ගන්න පරක්කු වුණු නිසා අපට දීපු පළමු වන නියමයේ -අප්‍රේල් මාසයේ 29 වන දා- තිබෙනවා, ඇමෙරිකන් ඩොලර් 301, ඇමෙරිකන් ඩොලර් 466ට වැඩි වෙලා කියා. ඊට පසු අගෝස්තු මාසයේ 12 වන දා එකේ කියනවා, "නැහැ. දැන් ඩොලර් මිලියන 500 දක්වා ඒකේ මිල වැඩි වෙලා" කියා. මා අහන්න කැමැතියි, ගරු කථානායකතුමනි, විමල් වීරවංශ ඇමතිවරයා -

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මේ වැඩය හොඳයි කියා ඊයේ මා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළා. ගෝල් ෆේස් එකේ තිබුණු හමුදා ගොඩනැඟිල්ල වෙන තැනකට ගෙන යන්න රජය වියදම් කර තිබුණා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේක point of Order එකක් නොවෙයි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ලංකාවට කෝටි ප්‍රකෝටි ගණනක ආධාර උපදවා ගන්න පුළුවන් ආකාරයට ක්‍රියා කරන එක හොඳයි කියා ඊයේ මා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළා. ඒ වාගේම ලංකාවේ තවත් ඉඩම් බදු දීලා ලෝකයේ තිබෙන තාක්ෂණය අපි අරගෙන මේ රට දියුණු කරන්න ඕනෑ කියා මා ප්‍රකාශ කළා. ඒකට මා උදාහරණයක් තමයි කිව්වේ. දඹාන ගම්මානයේ ඉන්න අය කොළ අතු ඇඳ ගෙන හිටියා. දැන් ඒ අයට අඳින්න කෝට් එක තිබෙනවා, කමිසය තිබෙනවා, ටයි එක තිබෙනවා ඒ වාගේම කලිසම තිබෙනවා. එහෙම නම් රෙදි අඳින්නේ නැතුව හිටියා නම් හරිද කියා මා අහනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු අගමැතිතුමනි, ඔබතුමා හරි. ඔබතුමාගේ කථාව අද උදේ මා පත්තරෙන් කියෙව්වා. ඒකට මොකක්ද ඔබතුමා කිව්වේ? ඔබතුමා කිව්වේ, "විකුණන්න එපා, බදු දෙන්න" කියා. ඒක නේද ඔබතුමා කිව්වේ?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ලෝකයේ තාක්ෂණය අරගෙන, ලෝකයේ වස්තු අරගෙන මේ රට දියුණු කරන්න ඕනෑ. තමුන්නාන්සේලා සදාකාලිකව මේකට විරුද්ධව කථා කරනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා හැන්සාඩ් වාර්තාව බලන්න. ඔබතුමා කිව්වේ විකුණන්න එපා කියා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එහෙම නැත්නම් දියුණු කරන්න බැහැ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හරි, අගමැතිතුමනි. ඔබතුමා කිව්වේ විකුණන්න එපා, බදු දෙන්න කියායි. ඒක තමයි මමත් කියන්නේ. ගරු අගමැතිතුමනි, සින්නක්කරයට අක්කර 10 ෂැන්ග්‍රි-ලා එකට වික්කා. සින්නක්කරයට අක්කර 4 කාටත් හොරා මේ චීන කොම්පැනියට විකුණලා තිබෙනවා. ඔබතුමා කියන දේට සම්පූර්ණයෙන්ම පරස්පර දෙයක් තමයි මේ නිලධාරි මණ්ඩලය කර තිබෙන්නේ. ඒකයි මම කියන්නේ.

ඒ කාලයේ ඔය විමල් වීරවංශ ඇමතිතුමාලා කිව්වා, "ආර්ථික ඝාතකයෝ ඉන්නවා" කියා. ඊට පසු ආණ්ඩුවේ අනෙක් උදවියත් කිව්වා, "ආර්ථික ඝාතකයෝ ඉන්නවා. කවුද මේ ආර්ථික ඝාතකයෝ? ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, මේ ආර්ථික ඝාතකයෝ. ඒ උදවිය රට අල්ලා ගන්න හදනවා. ඒ උදවිය කොන්දේසි දමනවා" කියා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවාද, ආසියානු සංවර්ධන බැංකුව ණය පිළිබඳව දැමූ කොන්දේසිය? ඒ කොන්දේසිය තමයි මේ construction එක කරන්න, විනිවිදභාවයකින් යුතු විවෘත තරගකාරී ටෙන්ඩර් ප්‍රතිපත්තියක් තියෙන්න ඕනෑ කියන එක. මේ වරායේ දියකඩනය හදන්නත්, terminal එක හදන්නත් open tender එකත් එක්ක තමයි කොරියාවේ හවුන්ඩායි කියන ආයතනයට ඩොලර් මිලියන 345ට මේ ටෙන්ඩර් එක ලබා දුන්නේ. ඒත් එක්කම තවත් දෙයක් දැන ගන්න ඕනෑ. ටෙන්ඩර් නැතුව හම්බන්තොට වරායක් හැදුවා. ඒක හැදුවේ China Harbour Engineering Company Limited කියන ආයතනය. නමුත් ඔය ආයතනය දකුණු වරායටත් ටෙන්ඩර් ඉදිරිපත් කරලා තිබුණා. නමුත් ඒ උදවියට ලැබුණේ නැහැ, ගරු කථානායකතුමනි. මොකද, ඒ ගොල්ලන්ගේ ටෙන්ඩරය, ඒ හම්බ වුණු උදවියගේ ටෙන්ඩරයට වඩා සියයට 70කින් වැඩියි. කොළඹ සියයට 70ක් වැඩි ටෙන්ඩරය දැමූ සමාගමට ටෙන්ඩර් එකක් නැතුව හම්බන්තොට ඒ contract එක හම්බ වුණා. ගරු කථානායකතුමනි, කියන්න පුළුවන්ද, ආර්ථික ඝාතකයෝ රටවලට මෙහෙම කොන්දේසි දමන එක ගැන. එතැන කිසිම ඝාතනයක් නැහැ, ගරු කථානායකතුමනි. එතැන කරන්නේ කළ යුතු දේ. මොකද, විනිවිදභාවයකින් යුතුව open tender එකකින් තමයි මේවා දෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මම හොයලා බැලුවා, China Harbour Engineering Company Limited කියන ආයතනය තව මොනවාද කර තිබෙන්නේ කියා. නොරොච්චෝලේ coal wharf project එක, හම්බන්තොට ගුවන් තොටු පොළ පර්යන්තය, කිහිප ගුණයකින් වැඩි හම්බන්තොට ක්‍රිකට් ක්‍රීඩාංගණය සහ හම්බන්තොට වරායේ දෙවන අදියර. හම්බන්තොට වරායේ දෙවන අදියරට මේ China Harbour Engineering Company Limited කියන ආයතනය කිසිම ටෙන්ඩර් එකක් නැතුව ඩොලර් මිලියන 810කට අත්සන් කර තිබෙනවා. මෙතැන විනිවිදභාවය තිබෙනවා කියා මෙතැනට පනත් ඉදිරිපත් කරලා වැඩක් නැහැ. ඒවා නීතියේ හරයට අනුව වැඩ කරන්න ඕනෑ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, මෙතුමා මේ සභාව පැහැදිලි ලෙසම නොමඟ යවමින් කථා කරනවා. මෙතුමා කියනවා, හම්බන්තොට වරායේ දෙවන අදියරට ඩොලර් මිලියන 810ක් වියදම් කියා. මේක සම්පූර්ණ අසත්‍යයක්. මා වග කීමකින් කියනවා, ගරු කථානායකතුමනි. ඒක සම්පූර්ණ අසත්‍යයක්. මෙතුමා පොතට විතරක් ආර්ථික විශේෂඥයෙක්. මෙතුමාට තනියම බම්බලපිටියේ පාර පනින්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පැහැදිලි කිරීම පසුව කරන්න. ඔබතුමා ඒකට පිළිතුරු දුන්නා නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කරන්නම්. දැන් මා ළඟ නැහැ. නමුත් මා ඔබතුමාට කියන්නම්. [බාධා කිරීම්] Library එකෙන් ගෙනෙනවා. Library එකෙන් ගෙනල්ලා මම ඒක හැන්සාඩ් අංශයට බාර දෙනවා. ඒක තිබෙන්නේ China Harbour Engineering Company Limited කියන ඒ ආයතනයේම official website එකේයි. ඒකෙමයි තිබෙන්නේ. මේ කතාව ඉවර වුණාම පල්ලෙහාට ගිහින් මම ඒක ගෙනවිත් දෙනවා.

අනික් දෙය තමයි ගරු කථානායකතුමනි, ආසියානු සංවර්ධන බැංකුවෙන් මේ ඩොලර් මිලියන 300ක ණයක් ගත්තේ සහනදායී ක්‍රමයට නොවෙයි. දැන් ආණ්ඩුව අපට කියනවා, අපි දියුණුවෙන රටක්ය; දියුණු වෙලා තිබෙන රටක් නිසා අපට සහනදායී ණය ගන්න බැහැ; ඒ නිසා අපට වාණිජමය ණය ගන්න වෙනවාය කියා. ඒක සත්‍යයක් නොවෙයි ගරු කථානායකතුමනි. සත්‍යය තමයි, ආසියානු සංවර්ධන බැංකුව වරාය හදන්න ඩොලර් මිලියන 300ක ණයක් දීලා තිබෙන්නේ වාණිජමය ක්‍රමයකටයි කියන එක. නමුත් සහනදායී වාණිජමය ක්‍රමයකටයි. මොකද, LIBOR කියන අන්තර්ජාතිකපොලී අනුපාතයට දශම හයක පොලියක් එකතු කරලා තමයි ඒ ණය දීලා තිබෙන්නේ. commitment fee කියා තව දශම තුනක් තිබෙනවා.

කොළඹ වරායේ දියකඩනය හදන්නත්, මුහුද ගැඹුරු කරන්නත් ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය අරගෙන තිබෙන්නේ සියයට එකයි දශම පහකටයි. China Harbour Engineering Company Limited කියන ආයතනය අපට වරාය හදන්න ඩොලර් මිලියන 361ක ණයක් දුන්නා. ඊට පසුව තව ඩොලර් මිලියන 148ක් දුන්නා. ගලක් තියෙනවාලු. ඒක කඩන්න ඒකෙන් ඩොලර් මිලියන 40ක්. එතකොට ඔක්කොම ඩොලර් මිලියන 500ක් විතර වෙනවා, ගරු කථානායකතුමනි. මුලින්ම එකඟ වෙලා තිබෙන්නේ LIBOR කියන පොලී අනුපාතයට සියයට දශම නවයක් එකතු කරන්නයි. අද LIBOR කියන එක සියයට දශම හයයි, ගරු කථානායකතුමනි. දශම හයයි, දශම නවයයි කියන්නේ 1.5යි. නමුත් ප්‍රියාත් බන්දු වික්‍රම කියන වරාය අධිකාරියේ සභාපතිතුමා කරපු ප්‍රවෘත්ති සාකච්ඡාවක් මා සතුව තිබෙනවා. එතුමා එහිදී කියා තිබෙනවා, අපි ඒක වෙනස් කරලා සියයට6.3ක ස්ථිර පොලියකට නැවත සංශෝධනය කළාය කියා. ගරු කථානායකතුමනි, සියයට 1.5ක පොලියකට ගන්න තිබෙන ණය දැන් ගන්නේ සියයට 6.3ක පොලියකටයි.

අපේ රෝහිත අබේගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කියා තිබුණු එකක් මම පත්තරෙන් කියෙව්වා. එහි තිබෙනවා, හම්බන්තොට වරාය දැන් මාස නවයක්, දහයක් විතර වැඩ කළාය; ශ්‍රී ලංකා රුපියල් මිලියන 18.5ක ආදායමක් ලබා ගෙන තිබෙනවාය කියා. ඩොලර් මිලියන 500ක්ය කියා ගණන් හැදුවොත් පොලිය රුපියල් මිලියන 3,450ක් වෙනවා. වාරිකය රුපියල් මිලියන 5,500ක් වෙනවා. එතකොට අවුරුද්දකට රුපියල් මිලියන 8,950ක් ඕනෑ වෙනවා. රුපියල් මිලියන 8,950ක් කොහොමද ගෙවන්නේ, රුපියල් මිලියන 18.5න්? ඔන්න ඔතැන තමයි ගැටලුව තිබෙන්නේ. ඇයි මේ වාගේ අතිවිශාල ණය මුදල් ගන්නේ? ඔය ගැන තමයි ප්‍රශ්න කරන්න ඕනෑ.

ආසියානු සංවර්ධන බැංකුවෙන් කොළඹ දකුණු වරාය හදන්න දීපු ණය අවුරුදු 25කිනුයි ගෙවන්න ඕනෑ, ගරු කථානායකතුමනි.ඉතාමත්ම පොඩි ගෙවීම් තමයි කරන්න තිබෙන්නේ. පළමුවැනි අවුරුදු පහේදි සත පහක්වත් ගෙවන්න ඕනෑ නැහැ. නමුත් හම්බන්තොට වරාය හදන්න චීනයෙන් දීපු ණය අවුරුදු 10ක් ඇතුළත ඔක්කොම ගෙවා ඉවර කරන්න ඕනෑ. ණය නොගෙවා ඉන්න හම්බ වෙන්නේ එක අවුරුද්දයි. ඒක තමයි වෙනස ගරු කථානායකතුමනි. ඔවැනි පසුබිමක තමයි මේ පර්යන්තය හදන්න පටන් ගත්තේ. 2007 දී තමයි මේකට ඉස්සෙල්ලාම ලංසු කැඳෙව්වේ. Hutchison Port Holdings Limited, Hanjin Shipping, Hayleys PLC with Carsons Cumberbatch PLC, Port of Singapore Authority with Aitken Spence, John Keells Holdings Company Limited with South Asia Gateway Terminal කියන මේ කොම්පැනි පහ ටෙන්ඩර් ඉදිරිපත් කර තිබෙනවා.

මම හිතන හැටියට ඒ ටෙන්ඩරයට මොකද වුණේ කියා කවුරුත් දන්නවා. සමාවෙන්න, මේක කියන එක ගැන. ඒ ටෙන්ඩරය දෙන්න කලින් ආණ්ඩුව මහදී ටෙන්ඩර් පටිපාටිය වෙනස් කළා. මහදී ටෙන්ඩරය වෙනස් කළාම ආසියානු සංවර්ධන බැංකුවෙන් කිව්වා, මේ ඔක්කොම cancel කරන්නය කියා. මොකද ඒ ගොල්ලන්ගේ කොන්දේසිය වුණේ විවෘත හා විනිවිදභාවයකින් යුතු ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමයි. ඒක කළේ නැති නිසා ඔක්කොම cancel කළා. ඔක්කොම cancel කරලා අන්තිමට නැවතත් ටෙන්ඩර් කතා කරලා, අත්සන් කළේ ගිය මාසයේ අතිගරු ජනාධිපතිතුමා චීනයට ගිය අවස්ථාවේදීයි. ඒ අවස්ථාවේදී තමයි එතුමා මේක අත්සන් කළේ. ඒ කියන්නේ, මේක ඉවර කරන්න තිබුණේ 2010 ඔක්තෝබර් මාසයේදීයි. නමුත් මේ වෙච්ච කලබැගෑනි ඔක්කොම නිසා මේ වැඩේ පටන් ගන්නේ 2012 ජනවාරි මාසයේදීයි.

එතකොට කාටද මේකේ අයිතිය? මේ පර්යන්තයේ අයිතිය තිබෙන්නේ චීන රජයටයි. ගරු කථානායකතුමනි, මේකෙන් සියයට 55ක අයිතිය තිබෙන්නේ චීන රජයටයි. China Merchants Holdings කියන්නේ සියයට සියයක්ම චීන රජයට අයිති ආයතනයක්. ඉතිරි ටිකෙන් Aitken Spence සමාගමට සියයට 30කුත්, Sri Lanka Ports Authority එකට සියයට 15කුත් අයිති වෙනවා. මේ පර්යන්තයට යන වියදම ඩොලර් මිලියන 500ක්ය කියා මම කිව්වා. නමුත් ටෙන්ඩර් පරිපාටිය වෙනස් කරන්නේ නැතුව මේක සැලසුම් කරපු අවස්ථාවේදීම කළා නම් ඩොලර් මිලියන 200ක් විතර අපට ඉතිරි කර ගන්න තිබුණා.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවාද දන්නේ නැහැ, South Asia Gateway Terminal - SAGT - එක හදන්න වියදම් කළේ ඩොලර් මිලියන 227යි කියලා. දැන් මේකට ඩොලර් මිලියන 500ක් වියදම් වෙනවාය කියා තමයි කියන්නේ. ඉදි කර ක්‍රියාත්මක කිරීම සහ පැවරීම කියන ව්‍යාපෘතියක් -BOT project එකක්- හැටියට තමයි මේක දීලා තිබෙන්නේ. කෙළින්ම අවුරුදු 35කට මේක දෙනවා. හැබැයි SAGT එක දීලා තිබෙන්නේ අවුරුදු 30කටයි. එතැනදීම ඔබතුමන්ලා මෙතැන වෙනස්කමක් ඇති කරනවා, private companiesවල competition එක්ක. එක් කෙනෙකුට අවුරුදු 30යි, අනික් එක්කෙනාට අවුරුදු 35යි.

ගරු කථානායකතුමනි, දැන් මෙතැනදී ප්‍රශ්නය තිබෙන්නේ ටෙන්ඩර් සම්බන්ධ ප්‍රශ්නය නිසා ආසියානු සංවර්ධන බැංකුවෙන් මේක cancel කළාම, දෙවන වතාවට ලංසුවක් ඉදිරිපත් කළේ එක්කෙනායි; China Merchants Holdings and Aitken Spence කියන සමාගමයි. ඒ නිසා ඒ අයට ඕනෑ විදියට තමයි මේ වැඩ කටයුතු සිදු වෙන්නේ. ඇත්ත වශයෙන්ම ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවාත් ඇති, 20-foot Equivalent Unit-TEU- එහෙම නැත්නම් අඩි විස්සේ container unit එකකට ඒ අය ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවන්න ලැස්ති වුණේ ඩොලර් 2.25යි කියා. නමුත් SAGT එක ඒ වෙලාවේ ඩොලර් 3.40ක් ගෙව්වා. බලන්න, මොකක්ද මෙතැන තිබෙන්නේ? ඇයි මෙහෙම සිද්ධ වෙන්න දෙන්නේ?

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

ගරු කථානායකතුමනි, ඔබතුමා මේ කතාව දන්නවාද දන්නේ නැහැ. මේක මහ අභූත කතාවක්. ඩොලර් මිලියන 300ට හදන්නය කියපු එක හදන්න ඩොලර් මිලියන 500ක් යනවාය කියා මෙතුමන්ලාම කියනවා. ඒ, China Merchants Holdings and Aitken Spence ආයතනය. ඊට පස්සේ කියනවා, දැන් ඩොලර් මිලියන 350ක ණයක් ගන්නට ඕනෑලු. කොහෙන්ද? China Development Bank එකෙන්. China Development Bank එකෙන් ඩොලර් මිලියන 350ක ණයක් ගන්න ඒ ගොල්ලෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට කියනවා, ඒගොල්ලන්ට ඇප වෙන්නටය කියා. මේක පුදුම කථාවක් නේ. මේක පුදුම කථාවක් ගරු කථානායකතුමනි. China Development Bank එකෙන් China Merchants Holdings and Aitken Spence එකට ඩොලර් මිලියන 350ක් ණයට ගන්න ශ්‍රී ලංකාවේ ආණ්ඩුව මොකටද ඇප වෙන්නේ? එහෙම වන්නට බැහැ නේ. අප කවුරුත් දන්නවා, මොහාන් පීරිස් නීතිපතිතුමා මේ ගැන දීර්ඝව සාකච්ඡා කර තිබෙන බව. අප දන්නේ නැහැ, මෙතැන ඉදිරිපත් කර නැහැ, කොහොම ද ඒ ගැටලුව විසඳා ගත්තේ කියා. මා විශ්වාස කරනවා, අපි ඇපයක් දුන්නේ නැහැ කියා. නමුත් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, කොහොම ද ඒ ගැටලුව විසඳුවේ, ඇපයක් දුන්නා ද නැද්ද කියන එක කරුණාකර එතුමා කථා කරන වෙලාවේ කියන්නය කියා.

දැන් බලන්න. මෙතැන සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? නොයෙකුත් බදු සහන දීලා තිබෙනවා. අවුරුදු 35කට දීලා තිබෙන concession agreement එක බලන්න. ඒ කියන්නේ ඒ ගොල්ලන්ට අවුරුදු තිස්පහක කාලයට අවුරුදු විසිපහකට බදු නිදහසක් දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. නමුත් මා මේ කාරණය කියන්න ඕනෑ. SAGT එකට කොච්චර කාලයක් බදු සහන දීලා තිබෙනවා ද කියා මා සොයා බැලුවා. හරි විහිළු කථාවකුත් මේ අස්සේ තිබෙනවා. මොකක් ද? 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මා කියවා බැලුවා. ඒකේ සඳහන්ව තිබෙනවා ගරු කථානායකතුමනි, පර්යන්ත ක්‍රියාකරුවන්ට -terminal operators- ආදායම් බදු නැහැයි කියා. ආදායම් බදු සියයට බිංදුවයි. වසර ගණනක් ගියත් නැහැ. එතකොට මේ ආණ්ඩුවේම දේශීය ආදායම් (සංශෝධන) පනතේ තිබෙනවා, පර්යන්ත ක්‍රියාකරුවන්ට කිසිදාක බදු ගෙවන්නට ඕනෑ නැහැ කියා.

ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ පනත යටතේ වූ නියමයේ කියනවා, අවුරුදු විසිපහකට බදු නිදහස දෙනවාය කියා. මෙතැන සොයා බලන්නට ඕනෑ, ඇත්ත වශයෙන්ම ලංකාවේ තිබෙන නීතියට මේවා පටහැනි ද නැද්ද කියා. ඊට අමතරව ලාභාංශවලට අවුරුදු 26ක්; ඔය වාගේ නොයෙකුත් සහන දීලා තිබෙනවා. [බාධා කිරීමක්] මට කථා කිරීමට නියමිත කාලවෙලාව අවසාන බව මා දන්නවා. එම නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්න ලැහැස්ති වන්නේ නැහැ. මගේ කථාව අවසාන කරන්නම්.

ගරු කථානායකතුමනි, මා කලින් කිව්වා වාගේ ආණ්ඩුව යම් කිසි විධියක පාරදෘශ්‍යභාවයක් මේ ආයෝජනවලට ගෙනෙනවා නම් එක්සත් ජාතික පක්ෂය හැටියට අප එය හොඳ දෙයක් හැටියට පිළිගන්නවා. ඒක හොඳයි. ඒක කරන්න ඕනෑ. නමුත් ඒ නීතියේ හරයක් තිබෙන්නට ඕනෑ. The spirit of the law must also be taken into consideration, not just because it is a law they do it.

ගරු කථානායකතුමනි, මට කියන්නට ඕනෑ අනෙක් කාරණය මෙයයි. අපට එන්න එන්නම ආයෝජන වැඩි වන්නට ඕනෑ. දැන් ඊයේ පෙරේදා වියට්නාමයේ ගරු ජනාධිපතිතුමා ලංකාවට ඇවිත් සිටියා. ඒ රටට අවුරුද්දකට ඩොලර් බිලියන 12ක් 13ක් ආයෝජන එනවා. නමුත් බදු නිදහසට වැඩිම කාල පරිච්ඡේදය කොපමණ ද ? අවුරුදු 10යි නැත්නම් අවුරුදු 12යි. ඉතා සුවිශේෂී කාරණාවකට විතරයි අවුරුදු 15ක බදු නිදහසක් දෙන්නේ. එහෙම තමයි. මෙහෙම අවුරුදු විසිපහේ බදුවලට සියයට බිංදුවේ බදුවලට නොවෙයි ඒ අය දෙන්නේ. නමුත් යහපාලනය තිබෙනවා. ආර්ථික යහපාලනය තමයි අත්‍යවශ්‍ය වන්නේ ගරු කථානායකතුමනි.

මා මේ කථාව පටන් ගන්නකොට කිව්වා, සමහර උසස් නිලධාරින් ආර්ථික යහපාලනයට පයින් ගහන හැටි. මා ලාෆ් ගෑස් එකේ කථාව පෙන්වා දුන්නේත් ඔය කථාව කියන්නයි. ගරු කථානායකතුමනි, මට නියමිත කාලයටත් වඩා යම් කිසි කාලයක් මට කථා කරන්නට ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ක්‍රමෝපායන ව්‍යාපෘති සංවර්ධන පනත හොඳයි. නමුත් හිතුණු විධියට එහෙන් මෙහෙන් ක්‍රමවේදයක් නැතිව *ad hoc* ක්‍රමයට ආයෝජන ගේන්න එපා. අපට අවශ්‍ය ආයෝජන ගේන්න ඕනෑ නම් රටේ නීතිය, යහපාලනය සහ විශ්වාසය ගොඩ නඟා ගන්නට පුළුවන් වැඩ කරන්න. එතකොට අපට අවුරුදු 25ක බදු නිදහස දෙන්න ඕනෑ නැහැ. අවුරුදු 10ක බදු නිදහසට වියට්නාමයේ, මැලේසියාවේ වාගේ හොඳ ආයෝජකයන් ලංකාවට ගෙන්වා ගන්න පුළුවන් වෙයි. බොහොම ස්තුතියි.

[අ. භා. 2.43]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා හැටියට ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා විශේෂයෙන් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් ඉදිරිපත් කර තිබෙනවා. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3වැනි වගන්තියේ (4)වැනි උප වගන්තිය යටතේ එම නියමයන් පිළිබඳ මෙම පාර්ලිමේන්තුව දැනුවත් කරන මේ අවස්ථාවේ මා විශේෂයෙන් සඳහන් කළ යුතු කාරණාවක් තිබෙනවා. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත මේ ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ඉදිරිපත් කළ සුවිශේෂී පනතක්.

යම් ආයෝජනයක් රටට ගෙනෙනවා නම් ඒ ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ පුළුල් වශයෙන් විග්‍රහ කරලා පාර්ලිමේන්තුවට දැන්වීම, ඒ වාගේම බදු සහනයන් දෙනවා නම් ඒ බදු සහනයන් මොනවාද කියන එක පාර්ලිමේන්තුවට දැන්වීම, රැකියා අවස්ථා ලැබෙන ප්‍රමාණය, විදේශ විනිමය ලැබෙන ප්‍රමාණය, නව තාක්ෂණය රටට ගෙනෙන ආකාරය පාර්ලිමේන්තුවට දැන්වීම තමයි විශේෂයෙන්ම මෙම පනත යටතේ නියමයන් මඟින් කරන්න බලාපොරොත්තු වන්නේ.

2008 අංක 14 දරන ක්‍රමෝපාය ව්‍යාපෘති සංවර්ධන පනත ජී.එල්. පීරිස් ඇමතිතුමා ආයෝජන ප්‍රවර්ධන ඇමතිවරයා හැටියට ඉන්න වෙලාවේ මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. ගරු කථානායකතුමනි, මීට ඉස්සෙල්ලා මේ රටේ ආයෝජන සම්බන්ධයෙන් මෙවැනි විනිවිදභාවයක් තිබුණාද කියලා මම අහනවා. ඒ විධියේ කිසිම විනිවිදභාවයක් තිබුණේ නැති නිසා මේ ආණ්ඩුව විනිවිදභාවයක් ඇති කරන්න කිසිම පැකිළීමක් නැතිව ක්‍රියා කළා. ආයෝජනයේ ප්‍රමාණය, විදේශ විනිමයේ ප්‍රමාණය, තාක්ෂණය ගෙනෙන හැටි, පොලී අනුපාතයන්, ඒ වාගේම ලැබෙන ප්‍රතිලාභ, ආණ්ඩුව ලබා දෙන බදු සහන මොනවාද කියන

එක මේ රටට කියනවා. කලින් මේ විධියට සිදු වුණාද? ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියෙන්ම විමසා බලන්න. අපි කවුරුත් මේ පාර්ලිමේන්තුවේ හිටියා. මගේ කාලය අවුරුදු 17ක් වෙනවා. එම කාලය තුළ මෙම නියමයන් ගෙනාවාද?

අද අපට ප්‍රශ්නයක් තිබෙනවා. හොරණ ආයෝජන කලාපයේ එක්තරා කර්මාන්තශාලාවකට ගිවිසුම් ප්‍රකාරව සහන ලබා දුන්නා. එම කර්මාන්තශාලාවට විරුද්ධව අපට කිසිවක් ක්‍රියාත්මක කරන්න බැරි වී තිබෙනවා. ඒවා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, සහන වශයෙන් ලබා දුන් අවුරුදු ගණන, ඒ ගොල්ලන්ට ගස් කපා ගෙන යන්න දුන් අයිතිය, ඒවා පිළිබඳව අපට කථා කරන්නට බැහැ. එහෙම කථා කරන්න බැරි, ඒවා ගිවිසුම් ප්‍රකාරවම දීලා තිබෙන නිසායි. අද මේ ආණ්ඩුව නියමයන් හතරක් ගෙනැවිත් තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඉතාමත්ම පැහැදිලිව කියනවා, ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා මේ පාර්ලිමේන්තුව නොමඟ යැව්වාය කියා. "කැටික්" සමාගමට කිසිම ඉඩමක් ආණ්ඩුව විකුණලා නැහැ. මම ඉතාමත්ම පැහැදිලිව කියනවා, ආණ්ඩුව ඉඩමක් විකුණලා නැහැ කියා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
There is a point of Order being raised.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එතුමා මගේ නම සඳහන් කරලා කිව්වා, මම පාර්ලිමේන්තුව නොමඟ ඇරියා කියලා. ගරු කථානායකතුමනි, එතුමා මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම නොමඟ යවනවා කියන එකට සාක්ෂි මගේ ළඟ තිබෙනවා. මොකද, එතුමාම හැන්සාඩගත කරපු document එක තිබෙනවා. ඒක මම කියවන්නම්. මේ තියෙන්නේ. ගරු කථානායකතුමනි, මම Code Number එක කියන්නම්. Code Number: 6000/000/00/0006/00/0083/000 කියන මහා භාණ්ඩාගාරයේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ වග කීමෙන් යුතුව කියන එකක් පිළිබඳව පරීක්ෂා කරලා බලමු.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම ඉතාම වග කීමෙන් කියනවා, ආණ්ඩුව විසින් එම ඉඩම විකුණලා නැහැ කියා. ඊට වැඩි ප්‍රශ්නයක් නැහැ. ගරු කථානායකතුමනි, එළියට ගිහිල්ලා මට විරුද්ධව ක්‍රියා කරන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේදී මම ඉතාමත්ම පැහැදිලිව කියනවා, අපි එම ඉඩම සඳහා ගිවිසුමක් අත්සන් කරලාත් නැහැ, විකුණලාත් නැහැ කියලා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වික්කේ නැත්නම් සල්ලි ගත්තේ ඇයි? කෝ සල්ලි?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපි ඒ සමාගමට කියලා තිබෙනවා, අනුනව අවුරුදු බද්දකට එම ඉඩම ලබා ගන්න කියලා. නමුත් එම සමාගම තවමත් එකඟ වෙලා නැහැ ඒක ලබා ගන්න. ගරු කථානායකතුමනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) උපවගන්තිය අනුව අපි පළමුවෙන්ම රටට ලැබෙන ප්‍රතිලාභ මොනවාද කියලා ගැසට් කරලා ඒකට ප්‍රතිචාර දක්වන්න දින 30ක කාලයක් ලබා දෙනවා. එතකොට ජනතාවට පුළුවන් ඒ දින 30 ඇතුළත එම ප්‍රතිලාභවලට විරුද්ධයි කියලා උසාවි යන්න. එහෙම නැත්නම් ලියලා එවන්න පුළුවන්. අපි ලබා දෙන ප්‍රතිලාභවලට කැමැතිද, නැද්ද කියලා එම දින 30 ඇතුළත ඒ අයට සඳහන් කරන්න පුළුවන්. ඒ අවස්ථාව මේ ආණ්ඩුව ලබා දීලා තිබෙනවා. 3(3) උපවගන්තිය අනුව අපි අමාත්‍ය මණ්ඩලය දැනුවත් කරලා තිබෙනවා. ඊ ළඟට 3(4) උපවගන්තිය අනුව මේක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා නැවත ගැසට් කරනවා. එහෙම ගැසට් කරලා දින 90ක කාලයක් නැවතත් ජනතාවට ලබා දෙනවා. දින 90ක් ඇතුළත තමයි මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. ඒක තමයි දැන් මේ කරන්නේ. අපි පළමුවෙන්ම දින 30ක කාලයක් දුන්නා.

අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළා. ඊට පස්සේ ගැසට් කළා. ගරු කථානායකතුමනි, ගැසට් කරලා දින 90ක් ඇතුළත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මීට ඉහත පාර්ලිමේන්තු ඉතිහාසය තුළ මේ වාගේ දෙයක් තිබුණේ නැහැ. ආයෝජනයක් ආවාම ඒ ආයෝජනය කරන ආකාරය -සමාගමේ නම මොකක්ද, සමාගමට ලැබෙන පොලී අනුපාතය කීයද, ඒ ණය ගෙනෙන ආකාරය මොකක්ද, ලැබෙන රැකියා ප්‍රමාණය කොච්චරද, තාක්ෂණය කොච්චරද කියන මේ සියලු දේවල්- අපි මේ ගරු සභාවට ලබා දෙනවා. මෙවැනි ක්‍රමවේදයක් මීට ඉහත මේ පාර්ලිමේන්තුව තුළ තිබුණේ නැහැ. එහෙම නම් මීට වඩා ආණ්ඩුවකින් බලාපොරොත්තු වන විනිවිද භාවය මොකක්ද? ආයෝජන ලබා දුන් සමාගම් හතර පිළිබඳව අපි එකින් එක මේ ගරු සභාව දැනුවත් කරනවා.

පළමුවැනි එක, කොළඹ වරායේ දකුණු කන්ටේනර් බහාලුම් පර්යන්තය සංවර්ධනය කිරීම. සමාගමේ නම සීමාසහිත චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් ඉන්ටර්නැෂනල් සමාගම. ඒ සමාගමට සියයට 55ක් කොටස් තිබෙනවා. සීමාසහිත චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් ඉන්ටර්නැෂනල් සමාගම දැනට චීනයේ සිටින රාජ්‍ය අංශයේ අතිවිශාලතම පර්යන්ත ක්‍රියාකරුවා බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ඒ සමාගම තෝරා ගෙන තිබෙන්නේ.

දෙවැනි එක විධියට අපි ලංකාවේ සමාගමක් තෝරා ගත්තා. එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී සමාගම. ඒ ගොල්ලන්ගෙන් සියයට 30ක කොටස් තිබෙනවා. සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී සමාගම 1868 වර්ෂයේ පිහිටුවපු ශ්‍රී ලංකාවේ තිබෙන ප්‍රමුඛ පෙළේ විවිධාංගීකරණයෙන් යුක්ත ආයතන සමූහයක්.

තුන්වැනි එක ශ්‍රී ලංකා වරාය අධිකාරිය. ශ්‍රී ලංකා වරාය අධිකාරියට සියයට 15ක කොටස් තිබෙනවා. වරාය අධිකාරිය සියයට 15යි, චීන සමාගම සියයට 55යි, එයිට්කන් ස්පෙන්ස් ලංකා සමාගම සියයට 30යි. මේ විධියට තමයි මේ ආයෝජනයේ පෙළ ගැස්ම තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මේ ව්‍යාපෘතියට ඇමෙරිකන් ඩොලර් මිලියන 500ක ස්ථාවර ප්‍රාග්ධන ආයෝජනයක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ව්‍යාපෘතියේ කාලසීමාව අවුරුදු පහයි.

2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනතේ ඇති විධිවිධාන අනුව ආර්ථික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා හැටියට ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා විසින් එහි 3(2)

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

උපවගන්තිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ලබා දෙන සහන, නිදහස් කිරීම පිළිබඳව අංක 1703/45 දරන 2011 අප්‍රේල් මාසයේ 29 දින අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් මහ ජනතාව දැනුවත් කර තිබෙනවා.

ඒ අනුව අපි විනිවිදභාවයකින් කටයුතු කරලා තිබෙනවා. මේක ගැන තැන් තැන්වල කථා කරන්න දෙයක් නැහැ. අපි 2011 අප්‍රේල් මාසයේ 29වන දා මහ ජනතාව දැනුවත් කරලා තිබෙනවා. ඒ වාගේම එම පනතේ 3(3) උපවගන්තියට අදාළව ඉහත කී නිවේදනයෙන් දෙනු ලැබූ සහන පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබෙනවා.

ඊ ළඟට, අදාළ කැබිනට් පත්‍රිකාවෙන් පසුව එම පනතේ 3(4) උපවගන්තිය ප්‍රකාරව මෙම නියමය අංක 1718/32 දරන 2011 අගෝස්තු 12වන දින අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අපි ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. අදාළ නියෝග ප්‍රකාශ කිරීමෙන් අනතුරුව තමයි අපි දැන් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තමුන්නාන්සේලාගේ අනුමැතිය ඉල්ලා සිටින්නේ. අපි සහන ලබා දෙනවා. මේක හංගන්න දෙයක් නැහැ.

ගරු කථානායකතුමනි,මේ රටට ආයෝජන අවශ්‍යයි. ඒ අයෝජනය අපට දේශීය වශයෙන් කරන්න බැහැ. අපට කරන්න පුළුවන් එක්තරා සුළු කොටසක් පමණයි. මේ රටට විදේශීය ආයෝජන අවශ්‍යයි. 1977 විවෘත ආර්ථිකය ආවාට පසුව ආයෝජන මණ්ඩලය පිහිටෙව්වාම විශාල ලෙස සහන දුන්නා. විදේශීය ආයෝජනවලට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා, -බදු බාහිරාදිය ගේන්න සහ නොයෙක් දේවලට- සහන දුන්නා. අද ඒවා සීමා කරලා තිබෙනවා. නමුත් මේ ආයෝජන ගේන්න යම් යම් සහන දෙනවා.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ ලබා දෙන සහන මේවායි. "බදු ගෙවිය යුතු ලාභය සමාගම උපයන මුල් වසරේ ආරම්භය සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර දෙකකට පසු කලින් එළැඹෙන කවර හෝ වසර සිට වසර විසිපහකට ආදායම් බදු පනත යටතේ සංස්ථාපිත ආදායම් බදු නිදහස් කාල පරිච්ඡේදයක්, ඉන් මතු පැහැදිලි කිරීමක් වශයෙන් ඉහත විදහා පෙන්වා දී තිබෙන වසර විසිපහ ඉකුත් වීමෙන් පසුව එවකට බලපවත්නා සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම කෙරෙහි අදාළ වනු ඇත. ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගත් විදේශ ණය සඳහා ගෙවන පොලිය සහ ව්‍යාපෘතිය මඟින් සේවයේ යොදවනු ලබන උපදේශකයින්ට ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගම නිදහස් කරනු ලැබේ."

ඒ වාගේම, එකී වසර විසිපහක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන් මතු වසර එකකට ලාභවලින් කොටස්කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශ ආදායම් බදුවලින් නිදහස් කරනු ලබනවා. "සමාගමේ උපරිම ප්‍රවාසික සේවක සංඛ්‍යාව විස්සකට වසර පහක කාලයකට උපයන විට ගෙවිය යුතු බදු නිදහස අදාළ වනු ඇත."

2002 අංක14 දරන එකතු කළ අගය මත බදු පනත මඟින් ලබා දෙන සහන මේවායි. "ගිවිස ගත් දිනයේ සිට ව්‍යාපෘතිය ඉදි කිරීම් කාලය හෝ වසර පහකට දෙකින් කවර හෝ අඩු කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීම විලම්භනය කරනු ලබනවා."

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන අය කිරීම් පනත යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ/ඉදි කිරීමේ කාලය තුළ බදු අය කරන්නේ නැහැ.

මේ විදියට බදු සහන රාශියක් දෙනවා. ඇයි මේ ව්‍යාපෘතිය සඳහා බදු සහන දෙන්නේ? ඉන්දියාවට ඇතුළු කරන්න බැරි නැව්, ඉන්දියානු වරාය සංවර්ධනය කළොත් ඇතුළු කරන්න පුළුවන් වෙනවා. අපි මේ ව්‍යාපෘතිය ඉන්දියාවට කලින් පටන් ගන්න ඕනෑ. ඉන්දියාවට ලොකු නැව් ඇතුළු කිරීමට පෙර මේ වරායේ ඉදි කිරීමේ කටයුතු අවසන් කිරීමට අපි බලාපොරොත්තු වනවා. එතකොට එම නැව් මේ රටේ වරායට ඇතුළු කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. එහෙම නැත්නම් අපි අනාගතයේදී බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙනවා. අපේ වරායේ ක්‍රියාකාරකම් මීට වඩා අඩු තත්ත්වයකට යන්න පුළුවන්.

අපේ රජය ඉදිරි වසර පහ තුළ අපේක්ෂිත ආර්ථික වර්ධන වේගය සියයට 10 දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබෙනවා. මේ සඳහා සෘජු විදේශීය ආයෝජන ප්‍රධාන සාධකයක් වන බැවින් විදේශීය ආයෝජන වැඩි කිරීම සඳහා අවශ්‍ය බදු සහන ලබා දීම රජයේ ප්‍රතිපත්තිය හැටියට අප අනුගමනය කරනවා.

මෙවැනි ව්‍යාපෘති සඳහා දැරීමට සිදු වන අධික පිරිවැය සැලකීමේදී මේ සඳහා විශාල ආයෝජනයක් රජයට කළ නොහැකි බැවින් ආයෝජනය කිරීමට කැමැත්ත දක්වන සමාගම් ඉදිරිපත් වීම වාණිජමය වශයෙන් රටට වාසිදායක වන බැවින් ආයෝජන සඳහා උනන්දු කිරීමට අපි බදු සහන ලබා දීම කරනවා.

ශ්‍රී ලංකාව ආසියාවේ නාවික කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම රජයේ උපාය මාර්ගික සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රධානතම අංගයක් ලෙස හඳුනා ගෙන තිබෙන නිසා, මෙම ඉලක්කය වෙත යොමු වූ මෙවැනි ව්‍යාපෘතීන් සඳහා ආයෝජකයින් පෙළඹවීමට බදු සහන ලබා දීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා.

කොළඹ වරාය ලොව නැගෙනහිර හා බටහිර මුහුදු මාර්ගයේ පිහිටා ඇති බැවින්, මෙහි නාවික සේවාවන් සැපයීමේ ධාරිතාවන් ඉහළ නැංවීමේ ප්‍රමාණයට, රටට ලැබෙන ආදායම් විශාල ගුණයකින් වැඩි වන නිසා, මෙවැනි ආයෝජන මත ලැබෙන ප්‍රතිලාභ වැඩි ව්‍යාපෘතීන් සඳහා බදු සහන ලබා දීම උපාය මාර්ගය හැටියට අපි අරගෙන තිබෙනවා.

මෙම ව්‍යාපෘතිය තුළින් කොළඹ වරාය, නාවික පර්යන්ත සේවාවන් වැඩි දියුණු කිරීම මඟින් ලොව දෙවැනි විශාලතම වෙළෙඳ පොළ වන ඉන්දියාව හා අනෙකුත් රටවලට නාවික සැපයුමේ සන්ධිස්ථානයක් ලෙස කොළඹ වරාය ප්‍රචලිත කිරීමට දායක වන බැවින් මේ සඳහා බදු සහන ලබා දීමට රජය තීරණය කර තිබෙනවා.

මේ සීමාසහිත චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් ඉන්ටර්නැෂනල් කියන සමාගම මේ වන විට නාවික පර්යන්ත ක්ෂේත්‍රයේ ඉතා ඉහළ ආයෝජනයක් සිදු කර ඇති චීනයේ දැනට තිබෙන විශාලතම සමාගමයි. ඒ නිසා තමයි ආණ්ඩුව තීන්දු කළේ අපි සුළු දායකත්වයක් දීලා, මේ ආයෝජනය චීනයේ විශාලතම පර්යන්ත ක්‍රියාත්මක කරන සමාගම හැටියට ඒ සමාගමට දීම වඩාත් සුදුසුයි කියලා. මේ සීමාසහිත චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් ඉන්ටර්නැෂනල් සමාගම 2008 වර්ෂයේ කන්ටේනර් නැංගුරම් 90කට වැඩි ප්‍රධානතම නාවික පර්යන්ත 11ක ආයෝජනයන් සිදු කර තිබෙනවා. එම නාවික පර්යන්ත ආසන්න වශයෙන් මිලියන 50ක අඩි විස්සට සමානුපාතික ඒකක හසුරවා තිබෙනවා. මෙමඟින් සීමාසහිත චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් ඉන්ටර්නැෂනල් සමාගම ඉහළ ජාතික තලයකට ඔසවා තබන ලද අතර ලොව විශාලතම රාජ්‍ය අංශයේ පර්යන්ත ක්‍රියාකරුවන් ලෙස දැන් ප්‍රමුඛස්ථානය ලබා ගෙන තිබෙනවා.

සීමාසහිත චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් ඉන්ටර්නැෂනල් සමාගම හා එහි මව් සමාගම වන චයිනා මර්චන්ට් ග්‍රූප් ලොව ප්‍රධානතම බහුජාතික සමාගම්වලින් එකක් හැටියට තිබෙනවා. ඒ

වාගේම පාරිභෝගික සම්බන්ධතාවන් ඉහළ මට්ටමක තිබෙන සමාගමක් හැටියට මේක හඳුනා ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, ලංකාවේ සමාගම හැටියට එයිට්කන් ස්පෙන්ස් සමාගම තෝරා ගෙන තිබෙනවා. එය දීර්ඝ ඉතිහාසයක් තිබෙන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විවිධාංගීකරණයෙන් යුක්ත ආයතන සමූහයක් තිබෙන සමාගමක්. එම සමාගම මුල සිටම සමුද්‍රීය ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රකටව සිටි සුප්‍රසිද්ධ නැව් සමාගම් කිහිපයක් අතරින් එක සමාගමක්. ඇමෙරිකානු ඩොලර් මිලියන 210කට වැඩි වාර්ෂික පිරිවැටුමක් මේ සමාගමට තිබෙනවා. මේ සමාගම වසර තුනක වාර්ෂික විකුණුම් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියනයකට ගැනෙන ඇමෙරිකා එක්සත් ජනපදයෙන් පරිබාහිරව -ඇමෙරිකා එක්සත් ජනපදයෙන් එපිට- තිබෙන වඩාත්ම සාර්ථක පොදු ව්‍යාපාර සමාගම් සමූහය ලෙස පසු ගිය වර්ෂයේ ලෝකයේ ප්‍රසිද්ධ ෆෝබ් සඟරාව හඳුනා ගෙන තිබෙනවා. ලංකාවේ - දේශීය- සමාගමක් හැටියට ඒක තෝරා ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, දකුණු අප්‍රිකාවේ ඩර්බන් වරායේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ කාර්යය භාර ගැනීමෙන් එයිට්කන් ස්පෙන්ස් සමාගම විදේශයක වරාය කළමනාකරණය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ඉදිරිපත් වූ ප්‍රථම ශ්‍රී ලාංකීය සමාගම බවට පත්වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ නිසා මේවා තෝරා ගැනීමේ වරදක් කියන්න බැහැ. මේ හැම එකක්ම විනිවිදභාවයෙන් යුතුව අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. අපි තෝරා ගත් මුල් සමාගම මොකක්ද, ඇයි ඒ මුල් සමාගම තෝරා ගත්තේ කියන එක මම කිව්වා. දේශීය සමාගම මොකක්ද, දේශීය සමාගම වන එයිට්කන් ස්පෙන්ස් සමාගම තෝරා ගත්තේ ඇයි කියන එකත් මම කිව්වා.

තුන්වැනි කාරණය විධියට අපි බලාපොරොත්තු වන්නේ, කාර්ය මණ්ඩලය පුහුණු කරපු, විදේශීය වරායන්වල කාර්යක්ෂමතාව පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුවකට භාර දීපු, පිළිගත්ත සමාගමක් හැටියට මේ සමාගමේ වටිනාකම ඒ ආයෝජනට එක් කර ගන්නයි. ගරු කථානායකතුමනි, මේකෙන් රටට අත්වන වාසි මොනවාද කියන එක අපි මේ සභාවට කියනවා. අපි කිව්වා, විනිවිදභාවයකින් යුතුව මෙවැනි සමාගමකට දුන්නේ ඇයි කියලා. අපි දෙවනුවට කිව්වා, දේශීය සමාගමකට දුන්නේ ඇයි කියලා. තුන්වැනි කාරණය විධියට අපි කිව්වා, විදේශීය වරායන්වල කළමනාකරණ පුහුණුව, සේවක පුහුණුව කරපු සමාගමක් හැටියට ඒ සමාගමේ වටිනාකම ගැන. ඊ ළඟට අපි කියනවා, මෙහෙම දෙයක් කරලා රටට අත් වන්නේ මොකක්ද කියලා. මම ඒ කරුණු එකින් එකට කියනවා.

1. වරාය ඒ මුහුද මැද්දට නෙරා තිබුණු ප්‍රමාණය ප්‍රයෝජනයට ගනිමින් දකුණු කන්ටේනර් පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ ඉදි කිරීම් සිදු කරන බැවින් සෝදා ගෙන යාම ඒ හා සම්බන්ධ ඇති පාරිසරික ගැටලු පිළිබඳ ඇති අවදානම ඉතාමත් අඩුයි.

2. සැලකිය යුතු ප්‍රමාණයක් විදේශ විනිමය රට තුළට ගලනය වීමට මඟ පාදන මෙම පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන විට එමඟින් බිහිවන සෘජු රැකියා අවස්ථා ප්‍රමාණය 1,200කට වඩා වැඩිවන අතර 5,000කට අධික වක්‍ර රැකියා අවස්ථා ප්‍රමාණයක් බිහිවන බව නිර්ණය කර තිබෙනවා.

3. දැනට කොළඹ වරායේ ඇති ටීඊයූ (අඩිවිස්සට සමානුපාතික ඒකක) මිලියන 4.5ක් වූ බහාලුම් මෙහෙයවීමේ ධාරිතාවට අමතරව ටීඊයූ මිලියන 2.4ක් මෙම ව්‍යාපෘතිය මඟින් එකතුවීම හේතුවෙන් මෙරට බහාලුම් මෙහෙයවීමේ ධාරිතාව සියයට 53කින් ඉහළ යනවා.

4. වරායේ දැනට ඇති මීටර් 15ක් වූ ගැඹුර මීටර් 18 දක්වා වැඩිවීම හේතුවෙන් -දැනට තිබෙන ගැඹුර මීටර් 15යි- ටීඊයූ 14,500ක ධාරිතාව ඇති නවීන පන්නයේ බහාලුම් නැව් ඇතුළු කිරීමට පහසුකම් ඇති වේ. මේ නිසා කොළඹ වරාය තවදුරටත් ඉන්දියානු උප මහද්වීපයේ කේන්ද්‍රස්ථානය ලෙස පවත්වා ගෙන යැමට හැකි වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! The Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR ] *took the Chair.*

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

5. දකුණු බහාලුම් පර්යන්තය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම තුළින් වරාය ගාස්තු සහ නැව් බඩු බෑම් හා පැටවීමේ ගාස්තු අය කර ගැනීම හේතුවෙන් ආසන්න වශයෙන් වර්ෂයකට ඩොලර් මිලියන 150ක අතිරේක ආදායමක් රටට ලබා ගන්න පුළුවන්.

6. ශ්‍රී ලංකා වරාය අධිකාරියට ද රේගු ගාස්තු/ගබඩා කුලී ආදිය මඟින් ඇමෙරිකානු ඩොලර් මිලියන 50කට ආසන්න වාර්ෂික අතිරේක ආදායමක් මේ රටට උපයා ගන්න පුළුවන්.

7. දකුණු බහාලුම් පර්යන්තය මඟින් සේවා සපයන්නේ විදේශීය නෞකා සඳහා බැවින් ගෙවීම් සිදු කරන්නේ විදේශ මුදල් මඟින් වීම නිසා විදේශ විනිමය ප්‍රතිලාභ මෙරටට අත්වීම වැදගත් වනවා.

8. දකුණු බහාලුම් පර්යන්තයේ සවි කරනු ලබන නවීන දොඹකර විශාල බහාලුම් නැව්වලට සේවා සැපයීම නිසා කඩිනමින් ඒවා ආපසු යැවීමට හැකි වනවා.

9. බහාලුම් සහ යාන්ත්‍රකරණ සේවාව තුළින් වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් මිලියන 20ක පමණ අතිරේක විදේශ විනිමයක් රටට ලැබෙනවා.

10. කොළඹට පැමිණෙන නැව්වලට අවශ්‍ය වන අමතර සේවා වන ඉන්ධන සහ වෙනත් සැපයුම්, කාර්යය මණ්ඩල මාරුවීම්, අලුත්වැඩියාව, සමීක්ෂණ කටයුතු ආදිය තුළින් රටට වක්‍ර ආදායම් ඉපයීමටද පුළුවන් වෙනවා.

11. දකුණු බහාලුම් පර්යන්තයේ ක්‍රියාකාරි කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන නවීන තාක්ෂණය ශ්‍රී ලාංකිකයන්ට පුහුණු කිරීමද අතිරේක වාසියකි.

12. කොළඹ වරායේ දකුණු බහාලුම් පර්යන්තය සංවර්ධනය නොකළහොත් ඉන්දියානු වරාය තුළ මේ වන විට සිදු කරමින් පවතින ප්‍රධාන සංවර්ධන කටයුතු මඟින් කොළඹ වරාය අභිභවා ඉන්දියානු වරාය වෙත නෞකා ආකර්ෂණය කර ගනු ඇත. මෙමඟින් භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේදී හා ශ්‍රී ලංකාවේ සිට අපනයනය කිරීමේදී නැව් සමාගම්වලට ආකර්ෂණීය ප්‍රවාහන ගාස්තු ඉදිරිපත් කිරීමේ

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

හැකියාවක් නැති වන අතර, ශ්‍රී ලාංකිකයන්ට භාණ්ඩ සඳහා වැඩි මිලක් ගෙවීමට සිදු වේ.

13. පොදුවේ ගත් කල කොළඹ වරාය දකුණු බහාලුම් පර්යන්තය සංවර්ධනය කිරීම මඟින් කොළඹ වරාය සංවර්ධනය වන අතර, එය අනෙකුත් කර්මාන්ත, සේවා සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉවහල් වනවා.

ශ්‍රී ලංකාවේ අපි බලාපොරොත්තු වන සියයට දහයේ ආර්ථික වර්ධන වේගයට පූර්ණ වශයෙන් දායකත්වය දෙන්න කොළඹ වරාය මේ ආකාරයට සංවර්ධනය කළ යුතුයි කියලා රජය තීන්දු කරලා තිබෙනවා. ඒක කාලීන අවශ්‍යතාවක් හැටියට රජය සලකා තිබෙනවා. ඒ නිසා මේ ආයෝජනය ලබා ගන්න රජය තීන්දු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ෂැන්ග්‍රි-ලා හොටෙල්ස් ලංකා පෞද්ගලික සමාගමේ හෝටල් ව්‍යාපෘති සඳහා ආයෝජනයක් ගෙන්වා ගත්තා, ඇමෙරිකන් ඩොලර් මිලියන 408ක. මුලදී බොහෝ දෙනා මේ ආයෝජනය ගැන මේ සභාවේදී නොයෙක් විධියට කථා කළා. පස්සේ නම් කිව්වා, මේක හොඳයි කියලා. මුලදී පත්තරවලට කිව්වා, ඉඩම් විකුණනවා, මේ ආයෝජනය මේ විධියයි කියලා. නමුත් ෂැන්ග්‍රි-ලා සමාගම ලංකාවට පැමිණියාට පස්සේ, ලංකාවේ තිබෙන ස්ථාවරභාවය, ඒ ආයෝජනයේ තිබෙන ස්ථාවරභාවය පිළිබඳ අපට ලෝකයට මතයක් දෙන්න පුළුවන්කමක් ලැබුණා. ඒ නිසා ෂැන්ග්‍රි-ලා සමාගම ආයෝජන එකක් විතරක් නොවෙයි, ආයෝජන දෙකක් ලංකාවට ගෙනෙන්න තීන්දු කළා.

පළමුවැනි ආයෝජනය ඇමෙරිකන් ඩොලර් මිලියන 408යි. අපි ඉඩමේ වටිනාකමට ගත්තා ඇමෙරිකන් ඩොලර් මිලියන 12.5ක්. හෝටල් සංකීර්ණයට අපි ගත්තා ඇමෙරිකන් ඩොලර් මිලියන 28.3ක්. ඊ ළඟට මේ සමාගම ලංකාවේ ඉදි කරනවා බද්ධ නිවාස සංකීර්ණයක්. ඒ වාගේම සාප්පු සංකීර්ණයක්. කාමර 600ක් තිබෙන තරු හයේ හෝටලයක් ඉදි කරන්න පස පරීක්ෂා කරගෙන යන කටයුතු ඒ ගොල්ලන් දැනට ආරම්භ කරලා තිබෙනවා. ඒ නිසා මේ ආයෝජනය ලංකාවට ආපු ඉහළම ආයෝජනයක් හැටියට අපි සලකන්න ඕනෑ.

ඒ සමාගමේ විස්තර මෙහෙමයි. 1971 හොංකොං නගරයේ ඉදි කළ පළමු සුපිරි හෝටලයක් වන මෙම සමාගම හෝටල් ක්ෂේත්‍රයට පිවිසිලා තිබෙනවා. එම සමාගම මේ වන විට ආසියාව, උතුරු ඇමෙරිකාව, මැද පෙරදිග, යුරෝපය ආදී විවිධ රටවල හෝටල් කාමර ඉදි කර තිබෙනවා. විශේෂයෙන්ම විදේශීය රටවල. මේ රටේ ඉදි කරන්න යන හෝටල් කාමර 600ට අමතරව, රටවල් 72ක කාමර තිස්දහසක් මේ හෝටල් සමාගමට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ රටවල් 72ක හෝටල් කාමර තිබෙන සමාගමකට මේ ආයෝජනය දුන්නාම තිබෙන වැදගත්කම බලන්න. මීට වඩා වැඩි මිලක් අරගෙන, විදේශීය ආයෝජන එක්ක සම්බන්ධ නැති සමාගමකට මේ ඉඩම දුන්නා නම් අපට ලැබෙන්නේ මුදල විතරයි. නමුත් අද තිබෙන සංචාරක ව්‍යාපාරය තුළ, ඒ හෝටල් කාමර තිස්දහසට තව හෝටල් කාමර 600ක් එකතු වෙනවා ලංකාවෙන්. අර කාමර තිස්දහසට මේක බද්ධ වෙනවා. එතකොට ඒ කාමර තිස්දහසත් එක්ක බද්ධ වූ සංචාරකයන් ප්‍රමාණයක් තමයි ලංකාවට එන්න පටන් ගන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත වේලාව-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි 10ක් ඕනෑ. මා අපේ සංවිධායකතුමාට කිව්වා. මට 30 minutes දීලා තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, you have been given 30 minutes.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
I will finish within another five minutes.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
You have only one more minute but I can adjust that.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හොංකොං නගරයේ ඉඳලා උතුරු ඇමෙරිකාව, මැදපෙරදිග, යුරෝපය ආදී රටවල ක්‍රියාත්මක වෙලා, රටවල් 72ක හෝටල් කාමර තිස්දහසක් පවත්වාගෙන යන ඉතාම ඉහළ සමාගමක් තමයි ලංකාවට ඇවිල්ලා තිබෙන්නේ. මේකට දීපු බදු සහන ගැන මම දැන් කියන්නේ නැහැ, වෙලාව නැති නිසා. මම ඒ පිළිබඳ විස්තර සභාගත කරනවා. අපට මේවා කියන්න කිසිම ගැටලුවක් නැහැ. දීපු බදු සහන මොනවාද කියා අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. පාර්ලිමේන්තුවේ හැන්සාඩ්ගත කරනවා. මේ සමාගමට දීපු බදු සහන සම්බන්ධයෙන් තිබෙන ලිපිලේඛන සියල්ලම මා **සභාගත*** කරනවා.

මේ ආණ්ඩුවට හංගන්න දෙයක් නැහැ. මේවා දුන්නේ ඉතාම විනිවිදභාවයකින් යුතුවයි. ඒ වාගේම මේවා දුන්නේ ආයෝජනය රටට අවශ්‍ය නිසායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොළඹ පළමුවන ආයෝජනය කළාට පස්සේ දෙවන ආයෝජනයත් ආවා. දෙවන ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 120යි. තරු පහේ හෝටලයක්, කාමර 200ක් හා ඒ කාමර 200ට අමතරව විලාස් 60ක් හම්බන්තොට ඉදි කරනවා. ඔවුන් ඒ ඉඩම ගත්තේත් පෞද්ගලික අංශයෙන්; ආණ්ඩුවෙන් නොවෙයි. පෞද්ගලික අංශයෙන් ඒ ඉඩම අරගෙන, ෂැන්ග්‍රි-ලා කොටස් සමාගමේ දෙවන ව්‍යාපෘතිය හම්බන්තොට ඉදි කරන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. මේ ව්‍යාපෘතියත් එක්කම සංචාරක ව්‍යාපාරයේ විශාල පෙරළියක් සිදු වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. පසු ගිය කාලයේ අපි ආයෝජනයන් දිරිමත් කරන කොට විරුද්ධ පක්ෂය මේ ආයෝජනයන් සම්පූර්ණයෙන් අඩාළ කරන්න විවිධ ප්‍රචාර ගෙන ගියා. ෂැන්ග්‍රි-ලා හෝටල් සමාගම ලංකාවට ආවාම මේ බාධාව කළේ නැත්නම් මේ වන කොට මේ වාගේ සමාගම් කිහිපයක් ලංකාවට ඇවිල්ලා. නමුත් ඒ සමාගම් භය කළා. මේ ඉඩම් ගන්න භය කළා. මේක හිතාමතා ම කළ දෙයක් බව මේ පාර්ලිමේන්තුවේදී මා කිහිප වතාවක් ම කිව්වා. මේ ආයෝජනයන් ගැන, විනිවිදභාවයන් ගැන කථා කරන්නේ අදයි.

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

අද ආයෝජන මණ්ඩලයත් එක්ක අපට ප්‍රශ්න තිබෙන බව මා කිව්වා. හොරණ තිබෙන එක කර්මාන්තශාලාවක ගිවිසුම අපට අවලංගු කරන්න බැහැ. ඒවා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ගහපු ගිවිසුම් නොවෙයි. ඒවාට දීපු සහන, ඔවුන්ට දීපු අසීමිත බලතල යන මේ සියල්ලම එක්ක අපට අවුරුදු 12ක් බලා ගෙන ඉන්න වනවා, ඒ ගිවිසුම ඉවර වන කල්. හැබැයි ඒ ගිවිසුම් එකක්වත් පසු ගිය වකවානුව ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. 2008 ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතින් පස්සේ තමයි මේ විනිවිදභාවය පිළිබඳ සියලු දේ මේ පාර්ලිමේන්තුවට, මන්ත්‍රීවරුන්ට දැන ගන්න අවස්ථාවක් ලැබුණේ.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔරුවල ලංකා වානේ සංස්ථාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 80ක ආයෝජනයක් ගෙනෙනවා. ඔරුවල ලංකා වානේ සංස්ථාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 80ක ආයෝජනය ගෙනෙන්නේ Onyx Heavy Industries Construction Company Limited කියන සමාගමයි. මෙම සමාගම 1998 පිහිටවපු ආයෝජන සමාගමක්. මෙම සමාගම ලංකා වානේ සංස්ථාව මිල දී ගෙන මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ආයෝජනය කරලා තිබෙනවා. එම ආයෝජන සමාගම ඇතුළුව මීට අනුබද්ධ සමාගම් 4ක් ලෝකයේ තිබෙනවා. දේශීය වශයෙන් ලංකා වානේ සංස්ථාවත්, විදේශීය වශයෙන් මා දැන් සඳහන් කළ ඒ සමාගමත් ඒකාබද්ධ වෙලා ඔරුවල නවීන වානේ කම්හලක් පිහිටු වීමට අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. වානේ කර්මාන්තශාලාව පිහිටෙව්වාට පස්සේ ඔරුවල GI පයිප්ප බට නිෂ්පාදන යන්ත්‍රාගාරයක් ඇති කරනවා; galvanize කිරීමේ යන්ත්‍රාගාරයක් ඇති කරනවා; කම්බි ඇදීම සහ කම්බි දැල් නිෂ්පාදන යන්ත්‍රාගාරයක් ඇති කරනවා; කම්බි ඇණ නිෂ්පාදන යන්ත්‍රාගාරයක් ඇති කරනවා; වානේ වාත්තු නිෂ්පාදිත කම්හලක් ඇති කරනවා; රැලි තහඩු මෝලක් ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු කරනවා; ව්‍යුහාත්මක වානේ පිරිසැකසීම් ඒකකයක් පිහිටු වීමට අවශ්‍ය පියවර ගන්න තීන්දු කරලා තිබෙනවා. මෙම කර්මාන්තශාලාව පිහිටෙව්වාට පස්සේ විදේශීය වශයෙන් විශාල ලෙස යකඩ ආනයනය කරනවා.

මේ ආයෝජනයන් තුළින් අපි බලාපොරොත්තු වන්නේ, එක පැත්තකින් රැකියා අවස්ථා ඇති කිරීමත්, අනික් පැත්තෙන් විදේශීය ආයෝජනය මෙරටට ගෙනැවිත් දේශීය වෙළෙඳ පොළ ශක්තිමත් කරලා ඉදිරියට ගෙන යැමත් තමයි.

අපි අද ඉදිරිපත් කරපු මේ සමාගම් හතර පිළිබඳව මා ඉතාමත් ම පැහැදිලිව මේ පාර්ලිමේන්තුවට සඳහන් කළා. හැබැයි මා නැවත වරක් කියනවා, කැටික් ගනුදෙනුව පිළිබඳව ගැසට් කරන්නවත්, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නවත්, එහෙම නැත්නම් දින 90ක් ඇතුළත පාර්ලිමේන්තුවට දැනුම් දෙන්නවත් අවශ්‍යතාවක් නැහැයි කියලා. කැටික් සමාගම ගිවිසුම් අත්සන් කරලා නැහැ. කැටික් සමාගම පිළිබඳව තීන්දුවක් අරගෙනත් නැහැ. ෂැන්ග්‍රි-ලා සමාගමට දුන්නා වාගේ අපි මුලදී මේ ඉඩම කැටික් සමාගමට දෙන්න තීන්දු කරලා තිබුණා. නමුත් ඊට පස්සේ අනූනව අවුරුදු බද්දකට දෙන්න කැබිනට් මණ්ඩලයෙන් තීන්දු කළා. අනූනව අවුරුදු බද්දට දෙන්න තීන්දු කළාට පස්සේ ඒ සමාගම ඒකට එකඟ වුණේ නැහැ.

අනූනව අවුරුදු බද්දට මේ ඉඩම ගන්න එකඟ වුණේ නැහැ. ඒ නිසා කැටික් සමාගම පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට හෝ ගැසට් පත්‍රයක් මඟින් නිකුත් කරන්න අවශ්‍යතාවක් අපට තිබුණේ නැහැ. ගනුදෙනුව නියාමාකාරව කරන කොට ඒ සියලු දේවල්වලට එකඟ වුණාට පස්සේ මේ වාගේම පාර්ලිමේන්තුවට ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වනවා. ආයෝජනයන් පිළිබඳව මේ ඉතිහාසය තුළ පාර්ලිමේන්තුවක් දැනුවත් කළ පළමුවන අවස්ථාව මෙකයි.

2008 මේ පනත නොතිබෙන්න, මීට කලින් මේ වාගේ ආයෝජන ගෙනාවාට පස්සේ කිසිම කෙනකු දැනුවත් කිරීමේ අවශ්‍යතාවක් තිබුණේ නැහැ; අවශ්‍යතාවක් ඉෂ්ට කරලා තිබුණෙත් නැහැ. එනම් මහජනතාවට විනිවිදව මේ ක්‍රමවේදය මේ ආණ්ඩුව යටතේ ලබා දීලා තිබෙනවා. ඒක අදියරෙන් අදියර ක්‍රියාත්මක වනවා. දින 30ක් දීලා, දින තිහ ඇතුළත විරෝධතා නැත්නම් කැබිනට් මණ්ඩලය දැනුවත් කරලා, කැබිනට් මණ්ඩලයෙන් අනුමත කළාට පස්සේ එය ගැසට් කරලා, ඊට පස්සේ දින 90ක් ඇතුළත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, ඒ සම්බන්ධයෙන් දෙන බදු සහන සහ අනෙකුත් සියලු දේ පිළිබඳව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමක් -මේ ආයෝජන හතරම පිළිබඳව- අපි මේ පනත යටතේ කරලා තිබෙනවා.

මේ ආයෝජන හතර බැලුවාම ඇමෙරිකන් ඩොලර් මිලියන හාරසිය ගණනේ ඉඳලා ඊ ළඟට තව මිලියන එකසිය ගණනක් අරගෙන, ඊ ළඟට තව මිලියන අසූවක් අරගෙන, ඇමෙරිකන් ඩොලර් මිලියන හයසීයකට වැඩි ප්‍රමාණයක -ඇමෙරිකන් ඩොලර් මිලියන 700-800ක් අතර ප්‍රමාණයකට- ආයෝජනයක් කරලා තිබෙනවා, වරාය සම්බන්ධ ව්‍යාපෘතිය ඇරෙන්න. ඇමෙරිකන් ඩොලර් මිලියන පන්සීයක වෙනම ආයෝජනයක් වරාය සඳහා කරලා තිබෙනවා. එහෙනම් ඇමෙරිකන් ඩොලර් මිලියන දාහකට වැඩි ආයෝජනයක් මේ ආයෝජන හතර යටතේ ලංකාවට මේ කාල සීමාව ඇතුළත ගෙනෙන්න මේ රජයට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මුලින් කිව්වා වාගේ මේ ගනුදෙනුව පිළිබඳව හංගන්න කිසිම දෙයක් තිබුණේ නැහැ. බදු සහන දීපු ඒවා, ගත්ත රිසිට් පත්, මුලින් ගත් සියලුම ඇඩ්වාන්ස් පිළිබඳ විස්තර සහිත මේ ලිපි ගොනු සියල්ල පාර්ලිමේන්තුවේ සභාගත කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.19]

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්නට අවස්ථාව ලැබීම ඇත්තටම සතුටක්. එතුමා කියපු දේවල් කීපයකට උත්තර දෙන්න ඕනෑයි කියලා මම හිතනවා.

ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි, ඒ වාගේම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් පිළිබඳවයි විවාද කරන අද දවසේ ආරම්භයේදීම අද ගොවියා ගැන සාකච්ඡා වුණා; ඉඩම් බෙදීම ගැන කථා වුණා. විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමා අද ගොවියාගේ අයිතිවාසිකම් ගැන කථා කළා. මීට ප්‍රථම අපේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා රජයෙන් ඉල්ලීමක් කරමින් කියා සිටියා, තමන්ටය කියලා අයිති කර ගන්නට පුළුවන් ඉඩම් කැබලි අද ගොවියන්ට ලබා දෙන්නට පුළුවන් නම්, කාලාන්තරයක් තිස්සේ මේ සංස්කෘතිය තුළ අද ගොවි ක්‍රමය තිබුණත්, ඒක වැඩවසම් ක්‍රමය තුළින් ආපු ක්‍රමයක් නිසා ඒ අයට ඉඩම් දීම රජය සතු වගකීමක් කියලා.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා විනිවිදය ගැන ගොඩාක් කථා කළා. විනිවිදය නිසා පාර්ලිමේන්තුවට මේ කරුණු ඉදිරිපත් කළායි කියලා කිව්වා. මම එතුමාගෙන් අහන්න කැමැතියි, එසේ විනිවිදයක් තිබෙනවා නම් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැතුව අනුමත කර ගන්නා සමහර දේවල් ගැන. විශේෂයෙන්ම බදුල්ල, සොරගුණේ රක්ෂිත වනාන්තරයෙන් අක්කර 628ක් වාසු රාසයියා කියන ඇමෙරිකන් පුද්ගලයකුට - ඇමෙරිකාවේ ජීවත්වන ඇමෙරිකන් ජාතිකයෙකුට- golf course එකක් හදන්නට විකුණන්නට නැත්නම් බදු දෙන්නට කටයුතු කරලා තිබෙනවා. ඒකෙන් ගොවීන් 6,000කට පාඩුයි. ඒ වාගේම

[ගරු කබීර් හාෂීම් මහතා]

වැලිඔය අමුණ ව්‍යාපෘතියට විශාල හානියක් සිදු වනවා. ඒ වැලිඔය අමුණ ව්‍යාපෘතියට රුපියල් මිලියන 850ක් වියදම් කළා. එයට හානි වනවා. ඒ ඉඩම් ඇයි ඒ ගොවීන්ට දෙන්නේ නැත්තේ?

ඊ ළඟට, ලංකාවේ තිබෙන රක්ෂිත වනාන්තරයකින් ඇමෙරිකන් සමාගම්වලට, ඇමෙරිකන් ගොවියන්ට අක්කර දහස් ගණනක් බෙදලා දීලා තිබෙනවා. ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. ඒවා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ නොවෙයි. මොන ව්‍යාපෘති යටතේද ඒවා දෙන්නේ? ඒ විනිවිදයක් ඇතුවද? ඒ ඉඩම් ලක්ෂ ගණනක් බෙදලා දෙනවා.

කෙසෙල් වගාව වෙනුවෙන් බුත්තල වැකඩ ව්‍යාපෘතියෙන් අක්කර 500යි; හඳපාන්ගල, කුඩාඔය ව්‍යාපෘතියෙන් -රක්ෂිත වනාන්තරයෙන්- අක්කර 2000යි. සෝමාවතී චෛත්‍යය අසල යුද ජයග්‍රහණයෙන් බේරා ගත් ඉඩම්වලින් අක්කර 11,000ක් ව්‍යාපෘතිවලට දෙනවා. නමුත් අද ගොවියාට ඒ ඉඩම් දෙන්න බැහැ. ලජ්ජා නැතුව ඔබතුමන්ලා මෙතැනට ඇවිල්ලා විනිවිදය ගැන කතා කරනවා. ඒ ගැන මට කනගාටුයි. [බාධා කිරීමක්] ගොවිජන සේවා ඇමතිතුමාට නොවෙයි මේවා අයිති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයටයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
සෝමාවතී චෛත්‍යය ළඟින් ඉඩම් දීලා නැහැ.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
එහෙම නම් ඒක සහතික කරලා කියන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඕක හැමදාම කියනවා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
හැමදාම කියනවා තමයි. අපි ඒවා හැමදාම කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමා ඉදිරිපත් කරපු තර්ක අසත්‍යයි කියා ගරු ඇමතිතුමා කිව්වා. මම ගරු ඇමතිතුමාට කියන්න ඕනෑ, හර්ෂ ද සිල්වා මැතිතුමා ආචාර්යවරයෙක්; ආර්ථික විශේෂඥයෙක්. එතුමා කරුණු සහිතව තමයි මේ සභාවට තොරතුරු ඉදිරිපත් කළේ. මන්ත්‍රීවරයෙක් හැටියට මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒක අපේ අයිතිවාසිකමක්. ඉඩම් අක්කරයක්වත් විකුණුවේ නැහැ කියා ගරු ඇමතිතුමා කියනවා. CATIC සමාගමට අදාළව ව්‍යාපෘති හතරක් පිළිබඳව යෝජනා ඉදිරිපත් කළා. පස්වැනි එක කෝ කියා හර්ෂ ද සිල්වා මැතිතුමා ගරු ඇමතිතුමාගෙන් ඇහුවා. ඔබතුමාම පාර්ලිමේන්තුවට සභාගත කරපු ලිපියක පැහැදිලිව මේ විධියට කියා තිබෙනවා.

"CATIC/AVIC - With the approval of Cabinet of Ministers the total extent of land proposed to be alienated to CATIC/AVIC is 10 acres".

එහි මිල ගණන් යොදා තිබෙනවා. එහි තව දුරටත් මේ විධියට කියා තිබෙනවා:

"Out of US Dollars 136 million an amount of US Dollars 54.4 million for 4 acres of land was received in April, 2011 and accounted in the aforesaid account under Code No. 6000/000/00/0006/00/0083/000"

Advance එකක් හැටියට ඒ මුදල්වලින් ඩොලර් මිලියන 54ක් ලැබුණාය කියා කියනවා. මේක cancel නම් ඒ මුදල් ආපසු යවා තිබෙන්න ඕනෑ. එහෙම නම් ඒ මුදල් ආපහු යවලාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එහෙම තීන්දුවක් අනුව කලින් ෂැංග්‍රි-ලා සමාගමට අල්ලපු ඉඩම හැටියට CATIC සමාගමට මේක දෙන්න ගියා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
විකුණන්න තීරණය කළා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
විකුණන්න ගියා. නමුත් ඊට පසුව කැබිනට් එක තීන්දුවක් ගත්තා, අනුනව අවුරුදු බද්දකට ඉඩම් දිය යුතුයි කියලා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
අපේ ඉල්ලීමක් හින්දා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒක වෙන්න පුළුවන්. මේ ආණ්ඩුව ඇහුම්කන් දෙනවා නේ.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඔව්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අනූනව අවුරුදු බද්දකට යන්න ඕනෑය කිව්වා. CATIC සමාගම කැමැති නැහැ, අනූනව අවුරුදු බද්දට යන්න. හැබැයි දැන් ඒ ගොල්ල කැමැතියි, වෙනත් ස්ථානයකින් ඉඩමක් ගන්න.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
සල්ලිවලට ගන්න. ප්‍රතිපත්තියක් වශයෙන් අපි ඉඩම් විකුණන්නේ නැහැ නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, විකුණන්නේ නැහැ. අපි අනූනව අවුරුදු බද්දට යන්න කැමැතියි. එතකොට අපට පුළුවන්, මේ මුදල් හුවමාරු කර ගන්න ඒ සඳහා. ඒක නිසා අපි මේකෙදි කිව්වේ විකුණලා නැහැ කියන එකයි.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
එතකොට ඒ මුදල් තවම ගිණුමේ තිබෙනවා?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒවායේ කිසිම ගැටලුවක් නැහැ. සමාගම එකඟතාවක් අනුව තමයි ක්‍රියා කරලා තිබෙන්නේ.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඒ කියන්නේ මුදල් තවම තිබෙනවා. ඒ මන්ත්‍රීවරයා ඉතාම පැහැදිලිව කිව්වේ, ඒ වාගේ deal එකක් තිබුණාය කියා. මෙතුමන්ලා විනිවිදය ගැන කතා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක තමයි මෙතුමන්ලාගේ විනිවිදය.

"Memorandum of Understanding for Purchasing the land at Army Headquarters Fronting Galle Road in Colombo 1 for a commercial development purpose between MINISTRY OF FINANCE AND PLANNING, THE GOVERNMENT OF SRI LANKA and CHINA NATIONAL AERO-TECHNOLOGY IMPORT AND EXPORT CORPORATION (CATIC)"

MOU එකක් තියෙනවා, මේ Deal එකක් දමලා. MOU එකේ අත්සන් කරලා තිබෙනවා, Mr. P.B. Jayasundera, Secretary, Ministry of Finance and Planning. එතකොට මේ ඔක්කොම කරලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, මේ වාගේ deal එකක් තිබුණාය, ඒක අනුමත කර ගන්න අපි අවසර ඉල්ලනවාය කියලා. මේකද විනිවිදය? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනික් ඒවායේත් විශේෂයෙන්ම ඒ විධියටම සිදු වන මේ ක්‍රමවේදයන් ගැන මම පෙන්වා දෙන්න කැමැතියි. මෙතැන අසංගතභාවයක් තිබෙනවා. There is an inconsistency. Rubber stamp එකක් ගහලා, deal එක දමලා අත්සන් කරලා, ඔක්කොම ඉවර කරලා ඊට පස්සේ මේක පාර්ලිමේන්තුවට ගෙනෙනවා, අපේ අනුමැතිය අරගෙන නීතිගත කරන්න. මේක වැරැදියි. වැඩේ වෙන්න ඉස්සර වෙලා මෙතැන විවාද කරලා ජනතාව දැනුවත් වෙන්න ඕනෑ. විනිවිදය කියන්නේ ඒකයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඇයි, ගැසට් කරලා දින 30ක් මහ ජනතාවට දුන්නා නේ. ගරු මන්ත්‍රීතුමා දන්නවා නේ. ගරු මන්ත්‍රීතුමා පිළිගන්නවාද ඒක?

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
කොහොමද MoU ගහන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මහ ජනතාවට දින 30ක් දුන්නා නේ මේ සම්බන්ධයෙන්.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මා අහන්නේ, කැබිනට් එක MoU එක අත්සන් කළේ කොහොමද කියලායි. [බාධා කිරීමක්] මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා අත්සන් කරලා තිබෙන්නේ. ඩොලර් මිලියන 54ක් ගත්තේ මේ පාර්ලිමේන්තුව දැන ගෙනද? මේ රටේ මිනිසුන් දැන ගෙනද? මේ ඉඩම් විකුණනවා කියලා සල්ලිත් අරගෙන. කාට හොරාද මේවා කළේ? පාර්ලිමේන්තුවට දැන් මේවා ගෙනෙනවා. අර කථාවක් තිබෙනවා, "නංගි පෙන්නලා අක්කා දුන්නා වගේ" කියලා. මෙතැනදී, අපට අක්කා පෙන්නලා යටින් නංගි දීලා. ඒක තමයි ආණ්ඩුව කරන්නේ. මොකක්ද මේ කරන්නේ? විනිවිදයක් කියන්නේ මේකද?

මුදල් සඳහා සම්පූර්ණ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට; සියලුම මන්ත්‍රීන්ට. එක්සත් ජාතික පක්ෂය පෞද්ගලීකරණය පිළිබඳව තීන්දුවක් ගත්තා නම් ඒක විනිවිදයක් ඇතිවයි කළේ. අපි බය වුණේ නැහැ ඇත්ත කියන්න. අපි බොරුවට දේශ ප්‍රේමිත්වය ගැන කියලා හැංගිලා මිනිසුන් රැවටුවේ නැහැ. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් තිබුණා. ඒ ප්‍රතිපත්තිය මත මේවා කරන්න බැහැ. තමන් ගත්තු වරම අනුව මේක කරන්න බැහැ. ඒක පළමුවෙන්ම හිතේ තියා ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බදු සහන ගැන කථා කළා. මේ යටතේ දීලා තිබෙනවා, ලොකු බදු සහන ප්‍රමාණයක්. ඒ ගැන දීර්ඝ විස්තරයක් තිබෙන්නේ. මා එය ඉක්මනට කියවන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

"වසර 25ක පමණ කාලයක් බදු සහන කාල සීමාවක් ලෙස සැලකිය හැක."

කාලය ගත්තාම, හරියටම අදාළ දිනයේ සිට අවුරුදු 25යි.

"ඊට අමතරව ලාභවලින් කොටස් හිමියන්ට බෙදා හරින ලාභාංශ වසර 10ක බදු නිදහස් කිරීමකට යටත් වන අතර ඉන් පසුවද වසර එකක කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබේ."

ඒ මදිවාට, තවත් සහන දෙනවා. ඒ ගැන මෙසේ සඳහන් වෙනවා:

"තවද සමාගමේ විදේශීය කාර්ය මණ්ඩලයේ 20 දෙනකුගේ උපරිමයකට යටත්ව උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ වූ බදු නිදහස වසර පහක කාලයක් සඳහා වලංගු වේ."

ඒ එන සුදු මහත්වරුන්ටත් ඔවුන්ගේ ගෙවීම් ඔක්කොම දෙන්නේ බදු නැතිවයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඇයි ගරු මන්ත්‍රීතුමා කියන්නේ නැත්තේ බදු සහන ගෙනාවේ 2001දී බව? එදා සියයට සියයක් බදු සහන දුන්නා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඒ පනත ගෙනාපු එක ගැන නොවෙයි, තමුන්නාන්සේලා කරන එක ගැනයි මා කියන්නේ.

එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"එමෙන්ම ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගත් විදේශ ණය මත පොලිය, උපදේශකයන්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තු, කළමනාකරණ ගෙවීම්, රාජ්‍ය භාග ගෙවීම් සහ අළෙවිකරණ ගෙවීම් සීමාසහිත Shangri-La Asia සමාගමේ අනුබද්ධ ආයතනවලින් එක් එක් ආයතනයට හෝ කර ඇත්නම් සමාගම් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් නිදහස් වේ."

තවත් තිබෙනවා කියන්න. මේ කියන්නේ මොකක්ද? ඒ අයට පුළුවන් විශේෂඥයන්ට, උපදේශකයන්ට ඩොලර් ලක්ෂයක් මාසයකට ගෙවනවා කියලා -US Dollars 100,000 ගෙවනවා කියලා- ඒවාට බදු අය නොකර ආපසු ඒ සල්ලි අර ගෙන යන්න. හැම සහනයක්ම දෙනවා. ඒ මදිවාට, ඔවුන් ණය ගත්තාම ඒ

[ගරු කබීර් හාෂීම් මහතා]

ණයවලටත් බදු සහන දෙනවා. පොලියට ණය සහන. ඒ මදිවාට, ගන්නා ණය සහතික කරන්න ඕනෑ අපේ රජයයි. අපේ ඉඩම් සුද්දන්ට විකුණනවා; අපි ඔවුන්ට බදු සහන දෙනවා; ඔවුන් ගන්නා ණයවලටත් අපි ඇප වෙනවා. ඔවුන් ණය ගෙව්වේ නැත්නම් අපේ රජය තමයි ඒක ගෙවන්න ඕනෑ. අපේ රජය නොවෙයි, අපේ රටේ පුරවැසියන්. මේක මොන විකාරයක්ද? මේක පුදුම ප්‍රතිපත්තියක්. හර්ෂ ද සිල්වා ආචාර්යතුමාත් මේ ගැන පැහැදිලිව කරුණු කිව්වා.

මෙහෙම බදු සහන දෙන කිසිම රටක් ලෝකයේ කොහේවත් නැහැ. කොටින්ම කියනවා නම් ඉන්දියාව උපරිම බදු සහන දෙන්නේ අවුරුදු 5ත් 7ත් අතර කාලයකටයි. තෝරා ගත් විශේෂ ව්‍යාපෘතිවලට අවුරුදු 10ක් 12ක් දෙනවා. ඊට වඩා වැඩි වන්නේ නැහැ. ඒ වාගේම ඇල්ජීරියාව අවුරුදු 10කටයි බදු සහන දෙන්නේ. ඒ වාගේම බහරේන්, ඊජිප්තුව වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙන රටවලත් උපරිම බදු සහන දෙන්නේ අවුරුදු 5ක 10ක කාලයකටයි. ටියුනීසියාවේ ලොකු විප්ලවයක් තිබුණා. ඒ රට අවුරුදු 10කට වැඩිය බදු සහන දෙන්නේ නැහැ. යේමනය පුංචි රටක්. අවුරුදු 7කට වැඩිය බදු සහනය දෙන්නේ නැහැ. බංග්ලාදේශය අවුරුදු 5යි, එහෙමත් නැත්නම් උපරිමය අවුරුදු 7යි බදු සහන දෙන්නේ. විදුලිය සඳහා විශේෂ ව්‍යාපෘතිවලට පමණක් අවුරුදු 15ක බදු සහන දෙනවා. එතකොට ලංකාව? උගන්ඩාව වාගේ රටක බදු සහන දෙන්නේ නැහැ. එහෙම නම් අපි විදේශිකයන්ට අපේ රට විකුණන්නේ නැද්ද? ඇයි මෙහෙම වැඳලා ආයෝජකයන් ගෙනෙන්නේ? මේ රටේ අයිතිවාසිකම්, මේ රටේ උරුමයන් මේ විධියට විකුණලා ආයෝජකයන් ගෙනෙන්න ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇමතිතුමා තාක්ෂණය ගැන කථා කළා. ඒ තාක්ෂණයේ දියුණුව ගැන, අපට ලැබෙන රැකියා 1,000 ගැන කථා කළා. රැකියා 1,000ක් උපයා ගන්න මේ රටේ තිබෙන සියලුම උරුමයන් විදේශිකයන්ට විකුණන එක සහතික කරන්න, අනුමත කරන්න පුළුවන්ද? මේ රටට කෝටි ගණනක් එන බදු සල්ලි ඔවුන්ට බදු විරාම මඟින් දීලා ඒකට හරියන්න රස්සාවල් 1,000ක් නැත්නම් මොනවා හෝ තාක්ෂණයක් ගන්න මේ රට විකුණන්න පුළුවන්ද? ඒක කරන්න බැහැ නේ. ඒ නිසා අපට මේකට එකඟ වෙන්න බැහැ. රජයට මේ රටට ආයෝජකයන් ගෙනෙන්න මේ වාගේ විශාල බදු සහන, බදු විරාම විදේශිකයන්ට දෙන්න වෙන්නේ ඇයි? මොකක්ද මේ ප්‍රශ්නය? ප්‍රශ්නය දැන ගෙන ඒකට වැඩ කරනවා මිසක් මේ රටේ අයිතිවාසිකම්, මේ ජනතාවගේ අයිතිවාසිකම් විදේශිකයන්ට කුණු කොල්ලයට විකුණන එකට විපක්ෂයක් හැටියට අපට ඉඩ දෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, OECD කියන ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳව සංවිධානයේ අවදානම් වර්ගීකරණ වාර්තාව ලංකාවට ලකුණු 6යි දීලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාර්තාව මත ඒ මට්ටමේ සිටින අනෙකුත් රටවල් තමයි ඇංගෝලාව, ජෝර්ජියාව, උගන්ඩාව හා ඉරානය. අපි ඒ රටවල මට්ටමට වැටෙන නිසා තමයි තමුන්නාන්සේලාට අවුරුදු 25කට අවුරුදු 50කට නොවෙයි මැරෙන තුරුම බදු විරාම දෙනවා කියලා ආයෝජකයන් ගෙන්වන්න වෙන්නේ. ඒ, මේ රට පිළිබඳව විශ්වාසයක් නැති නිසා; මේ රටේ තිබෙන කීර්තිනාමය පලුදු වෙලා තිබෙන නිසා. ඒකට වග කිව යුත්තේ කවුද? ආණ්ඩුව.

MIGA කියන ලෝක ආයෝජන සහ දේශපාලන අවදානම් පිළිබඳ වාර්තාව අනුව ලංකාව එකතු කරලා තිබෙන්නේ කොළොම්බියාව, උගන්ඩාව, ආර්ජන්ටිනාව වාගේ රටවල් එක්ක. 2011 AON දේශපාලන අවදානම් සිතියම සහ 2011 Maplecroft දේශපාලන අවදානම් සිතියම අනුව ලංකාව හඳුන්වලා තිබෙන්නේ ලිබියාව, ඊජිප්තුව, පේරු කියන රටවල් අතරයි. ඒ ප්‍රශ්න ටික විසඳන්නේ නැතුව මේ රටේ තිබෙන අයිතිවාසිකම් නැති කරලා, විදේශිකයන්ට බදු පිට බදු සහන දීලා, ලෝකයේ කිසිම රටක නැති බදු විරාම ටිකක් අවුරුදු 25කට මේ සමාගම්වලට දෙන එක සාධාරණීයකරණය කරන්න පුළුවන්ද? කොටින්ම කියනවා නම් මේවා ඔක්කෝම කරලා අන්තිමට ලැබෙන ප්‍රතිඵලය මොකක්ද ගරු ඇමතිතුමනි?

2009 වසරේදී යුද්ධයත් ඉවර වෙලාත්, 2009 දී මේ රටේ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඩොලර් මිලියන 601යි. දැන් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, වියට්නාමයේ අවුරුදු 5කට වඩා බදු සහන දෙන්නේ නැහැ කියලා. නමුත් කීයද ආයෝජනය? ඩොලර් බිලියන 15යි. අපේ රටේ ඩොලර් මිලියන 601යි. 2010 වන කොට ඊටත් වඩා අඩු වුණා. 2010 දී ඩොලර් මිලියන 516යි. CATIC එකට නිකම් ඉඩම් දීලා, Shangri-La එකට නිකම් ඉඩම් දීලා, පුංචි ගණන්වලට අපේ ඉඩම් ටිකත් විකුණලා ඒත් තවම ඒ ආයෝජකයෝ ඇවිල්ලා නැහැ. එතකොට මේකෙන් සහතික වන්නේ මොකක්ද ඇමතිතුමා? ඒ ප්‍රශ්නය තිබෙන්නේ වෙනත් තැනක නේ. අපේ අයිතිවාසිකම්, මේ රටට හිමි විය යුතු ආදායම් ටික නැති කරලා මෙහෙම බදු සහන දෙනවා නම් ඕනෑ කොම්පැනියක් එයි. Shangri-La විතරක් නොවෙයි නිකම් දෙනවා නම් මේ රටට ඕනෑ හෝටලයක් එයි. අයියෝ! ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා Six-Star හෝටලයක් ගැන. දැන් මේ Shangri-La හෝටලය හදන්නේ Six-Star හෝටලයක් කියලා නේ. ඔබතුමා මට කියන්න, Six-Star කියන්නේ මොකක්ද කියලා. මොකක්ද ඒකේ නිර්ණායක? ඇත්ත කියන්න. මෙතැන ඇවිල්ලා පව කියන්න එපා. මේකේ විනිවිදයක් ගැන කථා කරනවා. මේ Shangri-Laලා හෝටලය Six-Star ද Two-Star ද කියලාවත් කියන්නේ නැහැ.

ලෝකයේ තිබෙනවා Four Seasons Hotels. මේ Four Seasonsලාගෙන් ඇහුවාද මේ ඉඩම කීයටද ගන්නේ කියලා? ඉල්ලපු පළමු එක්කෙනාට දෙනවා. බදු සහන ඕනෑ තරම් දෙනවා. ඉතින් ඒ මිනිහා නිකම් ලැබෙන ඉඩම, අපේ රත්තරන් ඉඩම ගන්නවා. ඒ මදිවට එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ පිළිරුවත් එක්ක ඒක වික්කා. එතකොට Six-Star කියන්නේ මොකක්ද? ඒ ගොල්ලෝ agreement එකේ කොතැනක හෝ සඳහන් කරලා තිබෙනවාද ඒ හෝටලය Six-Star ප්‍රමිතියට ගහනවා කියලා? ඒ ප්‍රමිතිය කියන්න. ඒ ප්‍රමිතිය ඕනෑ නම් මම කියන්නම්. ඒ ප්‍රමිතිය මා ළඟ තිබෙනවා; Six-Star ප්‍රමිතිය. ඔබතුමන්ලාගේ agreement එකේ ප්‍රමිතියත් නැහැ; මෙතැන කියන්නත් බැහැ. ලෝකයේ සාමාන්‍යයෙන් හෝටල් හඳුන්වන්නේ Five-Star කියලා තමයි. එතැනින් ඉහළ, Six-Star, Seven-Star කියලා නැහැ. Five-Starවලට උඩින් ප්‍රමිති දෙන්නේ නැහැ. කියන්න පුළුවන් Six-Star, Ten-Star කියලා. Shangri-Laලා ඇවිල්ලා කිව්වා Six-Star කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා දන්නේ නැහැ. ඒකයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පුළුවන් නම් කියන්න?

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
නැහැ, මම දන්නේ නැහැ. ඔබතුමා කියා දෙන්න. මම Six-Star හෝටල්වල ඉන්නේ නැහැ. ඇමතිවරු කොහේ, කොහේ හරි

යන කොට Six-Star හෝටල්වල ඉන්නවා ඇති. අපි ඒවායේ ඉඳලා නැහැ. ඔබතුමා කියන්න. මට වඩා ඔබතුමා දන්නවා ඇති. එහෙම තමයි මේ ඉඩම් ටික දීලා තිබෙන්නේ. ඇත්තටම බලන කොට මේක ජාතික අපරාධයක්. ඔබතුමන්ලා ආයෝජකයෝ ගෙන්වා ගන්න මේ වාගේ බදු සහන, බදු විරාම දෙන එක සුදුසු නැහැ. මේ ප්‍රශ්නය තිබෙන්නේ වෙන කොහේ හරි කියලායි මම කියන්නේ. කිසිම රටක කවදාවත් මෙහෙම බදු සහන දීලාත් නැහැ; දෙන්නේත් නැහැ. ඇයි ලංකාව මෙහෙම බදු සහන දෙන තත්ත්වයට තල්ලු වුණේ? එහෙම වුණේ අද මේ රටේ අස්ථාවර ආර්ථික ප්‍රතිපත්තියක් තිබෙන නිසායි. අප එක අඩියක් ඉස්සරහට තියලා අඩි දෙකක් පස්සට ගන්න කොට ආයෝජකයෝ මේ රටට එන්නේ නැහැ.

දෙවැනි කාරණය තමයි මේ රටේ නීතියේ ආධිපත්‍යය බිඳ වැටී තිබීම. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු දෙන්නෙක් කට්ට දවාලේ වෙඩි තියා ගත්ත සිද්ධිය ගැන ඊයේ මේ පාර්ලිමේන්තුවේ විවාද වුණා. ඒ සිද්ධිය ගැන අප කනගාටු වෙනවා. ඒ වාගේ තත්ත්වයක් තියෙන කොට ආයෝජකයෝ මේ රටට එයිද? මේ රටේ නීතියේ ආධිපත්‍ය බිඳ වැටෙන කොට විදේශ ආයෝජකයෝ නොවෙයි, මේ රටේ මිනිස්සු බෝට්ටුවල නැඟලා Cyprus, Italyවලට පැනලා යන ආකාරය අප දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ දූෂණය, වංචාව පිළිබඳව ලෝකයේ වාර්තාගත වෙලා තිබෙනවා. සාමය ලබා ගත්තාට පස්සේ මේ රටේ සදාචාරය, නීතිය පිළිබඳව වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ. ඒ නිසා පළමුවෙන්ම මේ ප්‍රශ්නවලට සැබෑ උත්තරයක් ලබා දෙනවා නම් තමයි ආයෝජකයන් ලංකාවට එන්නේ. එතකොට ආයෝජකයෝ පෝලිමේ ඉඳියි ලංකාවට ඇවිල්ලා මුදල් ආයෝජනය කරන්න. ඒ පරිසරය හදන්න ඕනෑ අපියි. ඔවුන් එන්නේ බදු සහන අහගෙන නොවෙයි. එයාලාට බදු විරාම දෙන එක නොවෙයි කරන්න තිබෙන්නේ. මේ රටට ඩොලර් කෝටි ගණනක් ගෙනැල්ලා අපේ කොන්දේසි මත මේ රටට ආයෝජනය කරන මිනිස්සු ගෙන්වන්නයි අප බලාපොරොත්තු වෙන්න ඕනෑ. ඒ වාගේ දේවල් තමයි ජේ.ආර්. ජයවර්ධනලා කළේ. එහෙම නැතිව රටේ සම්පත් එක එක බදු විරාම අනුව විදේශිකයන්ට විකුණන එක නොවෙයි එතුමන්ලා කළේ. ඒ නිසා මේක විශේෂයෙන්ම මහින්ද චින්තනයට සමගාමීව යන ප්‍රතිපත්තියක්ද කියලා ඔබතුමන්ලා පොඩ්ඩක් හිතලා බලන්න. තමුන්නාන්සේලා යම් කිසි විශ්වාසයක්, මතයක් දැරුවා. මේක ඒ මතයත් එක්ක යන සමගාමී වැඩසටහනක්ද කියලා හිතන්න. ඒක විශේෂයෙන්ම හිතලා බලන්න.

එක පැත්තකින් අප යුද්ධයෙන් මේ රට බේරා ගත්තා. අනික් පැත්තෙන් බේරා ගත්ත ඉඩම්, මේ සම්පත් බදු විරාම හරහා සුද්දන්ට මේ රටින් කෙළින්ම උස්සා ගෙන යන්න ඉඩ දෙනවා. මේක වක්‍රව කරන සොරකමක් හැටියටයි අප දකින්නේ. විදේශිකයන් මේ මහ පොළොව හාරා ගෙන යන ක්‍රමවේදයක් මේක. ඉතින් මෙහෙම බදු විරාම දීලා ඕනෑම ආයෝජනයක් මේ රටට ගේන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ රටේ ආවේණික දේශීය සුළු පරිමාණයේ කර්මාන්තකරුවෝ විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් අපේ රටේ පාරම්පරික කර්මාන්ත කරන අයයි. කම්මල් කර්මාන්ත, පිත්තල කර්මාන්ත, ළමා ඇඳුම් කර්මාන්ත, පේශ කර්මාන්ත ආදී වශයෙන් එයාලා බෙදිලා ඉන්නවා. අය වැය හතක් ඉදිරිපත් කළා මහින්ද චින්තනයෙන්. මේ දේශීය කර්මාන්තකරුවන්ට එක බදු සහනයක්වත් දුන්නේ නැහැ. ඒ වුණාට විදේශයෙන් එන fly-by-night investorsලාට, කොම්පැනිකාරයන්ට ඉඩමත් දෙනවා, guaranteeකරලා ණයත් දෙනවා. ඊට පස්සේ බදු සහනත් දෙනවා. ඒ ඔක්කොම දෙනවා නිකම්ම. ඉතින් මේක පුදුම වැඩක් නේ. විශේෂයෙන්ම මහින්ද චින්තන ප්‍රතිපත්තියේ තිබුණේ පෞද්ගලීකරණය නොකරන බවයි. පෞද්ගලීකරණය නොකරන බව කියන අතර, විදේශිකයන්ට ඉඩම් විකිණීමේදී යම් කිසි රෙගුලාසි පැනෙව්වා. 2004න් පස්සේ ඒ නීති රීති තද කළා. අද ඒ නීති රීති කොහේද? අද ඒ රෙගුලාසි කොහේද? එදා කථා කරපු ඒවා කොහේද?

අද මේ රටේ සදාචාරය, ආචාර ධර්ම, සංස්කෘතිය, නීතිය, විනය පිරිහිලා තිබෙන්නේ. ඇයි? අද ආගමික නායකයෝ, බුද්ධිමතුන්, ඒ වාගේම විද්වතුන් මේ ගැන කථා කරනවා. මේ තත්ත්වය ඇති වුණේ කොහොමද? කිසිම සීමාවක් නැතිව, කිසිම නීති රීතියක්, රෙගුලාසි නැතිව ආයෝජකයෝ මෙහාට ගෙන්වා ගන්න, ඒ වාගේම සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න සල්ලි මෙහාට ගෙන්වා ගන්න බැරි නිසා ඕනෑ ක්‍රමවේදයකින් මේවා ගෙන්වා ගන්න කටයුතු කරන කොට ප්‍රතිඵලය ඕකයි. අද මේක ඇතුළේ විනිවිදය ගැන කථා කරනවා. මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ නො එන වැඩ කොටස් කීයක් අද අනුමත කරලා තිබෙනවාද? කල්පිටියේ දැනට රජයේ ඉඩම් අක්කර 250කට වැඩි ප්‍රමාණයක් ව්‍යාජ ඔප්පු හදලා විදේශිකයන්ට විකුණන බවත්, බදු දෙන බවත් වාර්තා වෙලා තිබෙනවා. ඒ පිළිබඳව රජය ගන්න තීන්දුව මොකක්ද?

ඊ ළඟට, බදුල්ලේ සොරගුනේ රක්ෂිත වනාන්තරයේ අක්කර 627ක ප්‍රශ්නය. ඒ වාගේම ඩෝල් සමාගමට කෙසෙල් වගාව සඳහා දීපු ඒ ඉඩම්. එතැන අක්කර දහස් ගණනක් තිබෙනවා. අපේ කෘෂිකර්මයට, අපේ දේශීය ගොවියාට ඒ ඉඩම් බෙදන්නේ නැතිව ඇමෙරිකන් ගොවියාට ඒ ඉඩම් බෙදන ප්‍රතිපත්තිය මොකක්ද? මේ පාර්ලිමේන්තුව තුළ අනුමැතියක් නැතිව, කථා කරන්නේ නැතිව, විවාදයක් නැතිව, විනිවිදයක් නැතිව ඔය ටික දෙන්නේ කොහොමද? ඔබතුමා විනිවිදය ගැන කථා කරනවා. අපි ඇවිල්ලා මේක කියනවා. එතකොට ඔබතුමාගේ විනිවිදය මොකක්ද? සෝමාවතිය චෛත්‍යය අවට තිබෙන අක්කර 11,000 දුන්නේ නැහැය කියලා ඔබතුමා කියනවා. සහතික කරලා පෙන්වන්න ඒක දුන්නේ නැහැයි කියලා. එතකොට සංචාරක ව්‍යාපාරයට අපේ වැව් 22ක් බදු දෙන්න වාරිමාර්ග අමාත්‍යාංශය 2011 February මාසයේ 17වැනි දා ප්‍රසිද්ධ පුවත් පත්වල දැන්වීම් දැම්මා.

එතකොට අපේ වැව් ටික දැන් සුද්දන්ට බදු දෙන්න යනවා. ඒක හරිද? සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නට ඕනෑය කියලා වෙරළ තීරුවේ නිරුවත්ව හැසිරෙන්නට පුළුවන් විදේශ සංචාරක වැඩ පිළිවෙළක් ගැන නොවෙයි අපි බලාපොරොත්තු වන්නේ. සංචාරකයන් පැමිණීම වැඩි කරන්නට ඕනෑ. නමුත් අපේ අයිතීන්, අපේ උරුමයන් ආරක්ෂා කරගෙන, ඒ ඔක්කොම වටිනාකම් ආරක්ෂා කරගෙන ඒක කරන්න ඕනෑ. එතකොට මේ ටික ගන්න මිනිහෙක් නැති වනකොට, නීති රීති වෙනස් කරලා මේ දෙන එක අපි පිළිගන්නේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා විනිවිදය ගැන කථා කළාමත්, මේ පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොටත්, මේ නියමයන් හතර ගැන කථා කරන කොටත් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා පැහැදිලිව පෙන්නුවා, CATIC එකත් එක්ක MoU එකක් අත්සන් කරලා ඉවරයි කියලා. එතකොට කොහේද විනිවිදය? මේවා ඔක්කොම සිදු වන්නට ඕනෑ ඊට කලින්. ඒ වන විට CATIC එකත් එක්ක MoU එකක් අත්සන් කරලා ඉවරයි. එතකොට මේ ටික පළමුවෙන්ම එතැනින් පටන් ගන්න කියලා, මම ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් කියනවා. මා විශේෂයෙන්ම කියන්න කැමැතියි, -

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඔබතුමා මට විනාඩියක් දෙනවාද?

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
දෙන්නම්.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

මේ CATIC එක ගැන කියන කාරණාව සම්බන්ධයෙන් මම පැහැදිලි කරන්නම්. යම් කිසි ආයෝජන යෝජනාවක් ආවාම මුලින්ම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, ප්‍රතිපත්තිමය වශයෙන් ඒ සඳහා අනුමැතිය ලබා ගන්නවා. අපි ඒ අනුමැතිය ගත්තා. ඊ ළඟට එම සමාගමත් එකක් ගිවිසුමක් අත්සන් කරනවා. ඒ ගිවිසුම තමයි ඔය තිබෙන්නේ. ඊ ළඟට අපි ඒ ගිවිසුම ප්‍රකාරව මහ ජනයාට ප්‍රදර්ශනය කරනවා, ගැසට් නිවේදනයක් මඟින්. ඊට පසුව ඒ සම්බන්ධයෙන් මහජන විරෝධයක් නොමැතිව එය අනුමත වුණාට පසුව නැවත කැබිනට් මණ්ඩලයට යවනවා. ඊට පසුව එතැනිනුත් නතර වන්නේ නැහැ, එය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. පාර්ලිමේන්තුවෙනුත් අනුමත වුණාට පසුව තමයි ඒ කියන කොන්දේසි අනුව ඒ අයට දෙන්නේ.

ඔය CATIC කියන එකේ පළමුවැනි ගිවිසුම කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා ප්‍රතිපත්තිමය තීන්දුව ආවා. දෙවැනි ගිවිසුම අත්සන් කළා. එතැනින් එහාට ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ ක්‍රියාත්මක වුණේ නැත්තේ ඒ අයයි, අපියි අතර ඒ පිළිබඳව ගැටලුවක් ඇති වුණු නිසායි. එතකොට එතැනින් නතර වෙලා. ඊට පසුව තමයි, ඉදිරි පියවරවල් ගැනෙන්නේ. ඒ නිසා මේ ගිවිසුම දැන් වලංගු නැහැ. මේ වාගේ ඒවා එකක් නොවෙයි, තුන, හතරක් තිබෙනවා. ආයෝජකයන් ඇවිල්ලා අපිත් එක්ක එකඟ වෙනවා. නමුත් ඒ එකඟ වුණාට අවසානය දක්වා අපි දෙගොල්ලන් අතර ගිවිසුම පවතින්නේ නැහැ. එතකොට ඒවා එතැනින් අත්හැරෙනවා. ඉතින් ඒ වාගේ එකක් තමයි ඔබතුමා ඔය කියන එකත්.

ඉතින් ඒ නිසා මේ කොනක් අල්ලා ගෙන කථා කරන්න එපා. මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරලා, ගැසට් කළාටත් පසුව තමයි අවසාන තීන්දුව, මේ බදු සහන ආදී සියල්ලක්ම ලැබෙන්නේ. ඔය CATIC කියන සමාගමේ ගිවිසුම මේ අතරතුර හිර වෙලායි තිබෙන්නේ. එතැනින් එහාට යන්න නම්, ඒක අපි කියන කොන්දේසි ප්‍රකාරව මහ ජනයා ඉදිරියට ගිහිල්ලා, ඊට පසුව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමත වන්නට ඕනෑ. ඉතින් ඒ නිසා කරුණාකරලා මේ භාගයට කෙරුණු ඒවා ගැන සඳහන් කරන්න එපා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මගේ කාලය ඊට වඩා දෙන්න බැහැ. ඇමතිතුමනි, ඔබතුමා කරපු පැහැදිලි කිරීමම ඇති, ඔතැන ප්‍රශ්නයක් තිබෙනවා කියලා මට කියන්න. පළමුවෙන්ම line ministry එකේ ඇමතිවරයා ඒ ව්‍යාපෘතිය තෝරා ගෙන ආයෝජනයන් සම්බන්ධයෙන් කටයුතු කරන ඇමතිවරයාට ඒක හඳුන්වා දුන්නාට පසුව, එම ඇමතිවරයා එය ගැසට් කර, කැබිනට් මණ්ඩලයට දැනුම් දෙනවා. ඒ සඳහා කාල සීමාවක් තිබෙනවා. කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගත්තාට පසුව එය ගැසට් පත්‍රයේ පළ කරනවා. ගැසට් පත්‍රයේ පළ කර මාස තුනක් ඇතුළත එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට ඕනෑ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඒ පිළිබඳව සාකච්ඡා වුණාට පසුව තමයි අනෙකුත් කටයුතු කරන්නේ. ඔබතුමන්ලාට agreement ගහලා, ඊට කලින් advance එක ගන්න බැහැ. මේ MoU එක පී.බී. ජයසුන්දර අත්සන් කරලා තිබෙනවා නේ. [බාධා කිරීමක්] MoU එකේ පී.බී. ජයසුන්දර ඇතුළු චීන සමාගමේ ප්‍රධානීන් අත්සන් කරලා, ඩොලර් මිලියන 54ක advance එකක් අරගෙන ඉවරයි. ඊට පසුව පාර්ලිමේන්තුවට මේක ඉදිරිපත් කරලා, ඒ ගැන සාකච්ඡා කරලා වැඩක් තිබෙනවාද? පාර්ලිමේන්තුව ඒක ප්‍රතික්ෂේප කරනවා නම්, ඒකේ අඩු පාඩුවක් තිබෙනවා නම්, ඊට පසුව ඒකෙන් වැඩක් තිබෙනවාද?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

ඒ කට්ටිය ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකරපු නිසා, අපි ඒක -

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

නැහැ, නැහැ, ඒක හරි ගියා නම් එතකොට- [බාධා කිරීමක්] පාර්ලිමේන්තුවේ එය සාකච්ඡා කරන්න ඉස්සර නේ ඒක සිදු වෙලා තිබෙන්නේ? [බාධා කිරීමක්] මේ පාර්ලිමේන්තුවේ ඒක ගැන කථා කරන්න ඉස්සර advance එක ගන්නේ කොහොමද? [බාධා කිරීම්] මම මගේ මොළේ ගැන බලා ගන්නම්. ඔබතුමන්ලා ආණ්ඩුවේ මොළේ බේරා ගන්න. [බාධා කිරීමක්] ඉන්න, ඉන්න, මම කියන්නම්. මම කියන එක අහගන්න, ඇමතිතුමනි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Kabir Hashim, please wind up now.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

Sir, please give me two more minutes. Article 2.2 of this MoU states, I quote:

"The Parties have agreed that;

(a) an Advance payment of US$ 50 million will be paid to the account - Deputy Secretary to Treasury - Urban Development Fund, A/c No. ..................., Bank Of Ceylon…..

(b) A Bank Guarantee to pay the balance US$ 86 mn on or before 21st April 2011 will be given on or before the 28th February 2011."

Here, you have given the last date of the payment, before you brought it to Parliament. So, the deal is sealed. - [*Interruption*.] You do not take the payment and then place it before Parliament. You do not finish a deal first. I cannot understand your logic behind it. - [*Interruption*.] You cannot do this. There is a spirit of the law, like he said.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

දැන් ඔය හතරම කරලා තිබෙනවා නේද? ඔය විධියටම ගිවිසුම් අත්සන් කරලා ඒවා ඔක්කෝම කරලා පාර්ලිමේන්තුවට එන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුව තමයි මේ හතර ඇවිල්ලා තිබෙන්නේ. ඒ ක්‍රමවේදය අවසන් අදියරට ඇවිල්ලා නැහැ.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන විනිවිදය ගැන කථා කරද්දී කිව්වේ, මේක කරන්න ඉස්සර දෙන බදු සහන ගැන, දෙන සහන ගැන කථා කරනවාය කියලායි. නමුත් සල්ලි අරගෙන, ගිවිසුම් අත්සන් කරගෙන, advance එකක් අරගෙන කරනවාය කියලා කිව්වේ නැහැ නේ. දැන් නේ අපි දන්නේ, මේ ඔක්කෝම කරලායි

කියලා. එතකොට වැඩේ කරලා ඉවර වුණාට පස්සේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා වැඩක් නැහැ. විනිවිදය ආරක්ෂා කරන්න නම්, පාර්ලිමේන්තුව සහ ජනතාව දැනුවත් වන්න ඕනෑ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
පාර්ලිමේන්තුව සම්මත නොකළොත් එතැනින් එහාට ගිවිසුම ඉවරයි.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මම තවමත් ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කර ගන්නයි අහන්නේ. මම මේ කාරණය ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඇහුවා. ඩොලර් මිලියන 54ක් ආවා. ඒක තවම account එකේ තැන්පත් කරලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ අපි CATIC එකට විරුද්ධ වුණා. ඊට පස්සේ ආණ්ඩුවත් ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැය කියලා කිව්වා. මේ මුදල් ආපසු ඒ චීන සමාගමට යවනවාද, නැත්නම් MoU එක කියන පරිදි මේ ඉඩම විකුණනවාද? ඊ ළඟට මම අහනවා, ෂැන්ග්‍රි-ලා එකත් එක්ක ගිවිසුම් අත්සන් කරලා තිබෙනවාද කියා. ෂැන්ග්‍රි-ලා එකත් එක්ක ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා නම් ඒ ගිවිසුම් ටික පාර්ලිමේන්තුවට සභාගත කරන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සමාගම රජය කියන කොන්දේසියට එකඟ වුණොත් ඒ අයත් එක්ක ඉදිරියට ඒ ගිවිසුම ක්‍රියාත්මක වනවා. ඒ කට්ටිය අපේ කොන්දේසිවලට එකඟ නැත්නම් ගිවිසුම එතැනින් අහෝසියි.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
කොන්දේසි කියලා කියන්නේ එහි බිම් අඟලක්වත් විකුණන්නේ නැහැය කියන එකයි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
එච්චරයි.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
හොඳයි. ඒ වාගේම ෂැන්ග්‍රි-ලා හෝටල් සමාගමත් එක්ක අත්සන් කරපු එම ගිවිසුම් මේ පාර්ලිමේන්තුවට සභාගත කළ යුතුයි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
එදා කළා නේ.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මේකේ- [බාධා කිරීම්] ඒක තමයි කියන්නේ. ඔබතුමා කියන්නේ මේ අරගෙන තිබෙන-

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒ ඔක්කෝම සභාගත කරලා තිබෙන්නේ.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඒකට තමයි බොරු කිව්වේ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
බොරු කියන්නේ කවුද? ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා මේ සභාව නොමඟ යවන්න එපා. මේ සභාවේදි අපි කවදාවත් බොරු කියලා නැහැ. පැහැදිලිවම කවදාවත් මේ පාර්ලිමේන්තුවට රජයක් විසින් අත්සන් කරපු ඔප්පුවක් ඉදිරිපත් කරලා නැහැ. අපි පෙරේදා ෂැන්ග්‍රි-ලා එකේ ඔප්පුව සභාගත කරලා තිබෙනවා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මගේ කාලය යන නිසා ඇමතිතුමා ඔබතුමාට තවත් කාලය දෙන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, I am not giving way.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒක නිසා අපි අත්සන් කරපු සෑම ඔප්පුවකම ගිවිසුම ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කාලය ඉවර නිසා මම විශේෂයෙන් මේ කාරණය කියන්න කැමැතියි. මේක විනිවිදභාවයකින් කරනවා කියලා කිව්වට අපට මෙහි කිසිම විනිවිදභාවයක් පෙනෙන්නේ නැහැ. වැඩේ කෙරුවට පස්සේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු දෙයක් හැටියටයි අපි මේක දකින්නේ. ෂැන්ග්‍රි-ලා සහ CATIC එක පිළිබඳව මීට වඩා පැහැදිලි කිරීමක් කර ඒ අවශ්‍ය කරන ලියකියවිලි හැම දෙයක්ම පාර්ලිමේන්තුවට සභාගත කරන ලෙස ගරු ඇමතිතුමාගෙන්, නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Dinesh Gunawardena. - [*Interruption.*]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේ නොසණ්ඩාල කථා කියනවා. මම කාගෙන්වත් සල්ලි ඉල්ලුවේ නැහැ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නැති වෙන්නේ කොහොමද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම ෂැන්ග්‍රි-ලා එකෙන් සල්ලි ඉල්ලන්න ගියේ නැහැ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නැති වෙන්නේ කොහොමද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මොකක්ද? ලජ්ජයි. [බාධා කිරීම්] කවුද ගිහිල්ලා සල්ලි ඉල්ලුවේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම කථා කියන්න එපා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ෂැන්ග්‍රි-ලා එකට බනින්නේ නැත්තේ ඒකයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Do not lie. I have not asked for money from any Shangri-La.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
Why not?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

This is slandering. This is slandering! This cannot be tolerated in this House. - [*Interruption.*] You cannot do this.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dinesh Gunawardena, you carry on. - [*Interruption.*] දැන් වාඩි වෙන්න, ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] All this is off the record.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
කීයක්ද ගත්තේ?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කවුද සල්ලි ගත්තේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉද ගන්න කෝ පොඩ්ඩක්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ලජ්ජයි, බැසිල් ඇමතිතුමා.

[අ.භා. 3.50]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පතට ඉදිරිපත් කරන සංශෝධන මෙරට අද ගොවි ජනතාවගේ දීර්ඝ කාලයක බලාපොරොත්තු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉමහත් සේවාවක් ඇති කරනවාට කිසිදු සැකයක් නැති බව මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. දහස් ගණන් අද ගොවි ජනතාවට මෙතෙක් අහිමිව තිබූ අයිතිවාසිකම් තම අනුප්‍රාප්තිකයන්ට ලබා ගැනීම මේ සංශෝධන මඟින් සහතික කරනවා. අතිගරු ජනාධිපතිතුමාට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, මේ අද ගොවි ජනතාවගේ අඛණ්ඩ සුරක්ෂිත බව ඇති කිරීමට ගෙනෙන මේ සංශෝධන සඳහා වූ ක්‍රියා මාර්ගවලට ආශිර්වාදය දීම ගැන.

අපේ ගොවිජන සේවා අමාත්‍ය එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා රජරට ගොවි පුතෙක්. රජරට ගොවි පුතෙක් අද මේ සභාවේදී මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් මෙවැනි සංශෝධන ගෙන ඒම මා හිතන හැටියට 1956 ඓතිහාසික සමාජ විප්ලවයේ සැබෑවක්. ඒ අනුව අද මේ සභාව නියෝජනය කරන්න එතුමාට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා ප්‍රධාන රජය ඉතාම පැහැදිලිව ගමන් කරන්නා වූ මාර්ගය තුළ පොදු ජනතාවගේ ජයගත්‍රණ ශක්තිමත් කිරීමට, අද ගොවි ජනතාවගේ ඉල්ලීම ඉටු කිරීමට මේ සංශෝධන ගෙන එන්න කටයුතු කරපු ඇමතිතුමාටත් නිලධාරින්ටත් මා ස්තුතිවන්ත වෙනවා.

මා හොඳින් දන්නවා, අපේ ගරු කථානායකතුමාත් මේ සඳහා විශාල උත්සාහයක් දැරූ බව. පාර්ලිමේන්තුව ඇතුළත හා පාර්ලිමේන්තුවෙන් පිටත හම්බන්තොට, තිස්සමහාරාම ගොවි සංවිධාන හමු වෙමින්, ගොවි සංවිධාන නියෝජිතයන්ට සවන් දෙමින්, අඳ ගොවීන්ගේ අදෝනාවට සවන් දෙමින් එතුමා කටයුතු කළා. එතුමා සමඟ අපිත් ඒවාට සහභාගි වුණා. එතුමා විවිධ සාකච්ඡා ඇති කරමින් මේ කාර්ය භාරය සාර්ථක කරලා, අඳ ගොවීන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කරන්න, සුරක්ෂිත කරන්න කටයුතු කළා.

1958 දී කුඹුරු පනත ඉදිරිපත් කිරීමේදී මගේ ආදරණීය පියා ඊට මැදිහත් වී පියවර ගත්තා. අද වන විට අවුරුදු 53ක් තුළ විශාල වෙනස්කම් සිදු වී තිබෙනවා. අපේ ගරු අග්‍රාමාත්‍යතුමා මේ විවාදයේදී කරුණු ඉදිරිපත් කළා. එතුමා කෘෂිකර්ම අමාත්‍ය ධුරය දරන කාලයේ, ගොවි ජනතාව මීට වඩා ශක්තිමත් කිරීම සඳහා ගත්තා වූ පියවර, එතුමා තුළ තිබූ ප්‍රාර්ථනාව සඳහන් කළා. ගොවි ජනතාවට මේ අයිතිවාසිකම් ලබා දෙන්න අවශ්‍ය වුණේ ඇයි කියන කාරණාව එතුමා පැහැදිලි කළා.

විශේෂයෙන් අඳ ගොවියා සමාජයේ වහල් ක්‍රමයක තමයි ජීවත් වුණේ. අද සමහර අය මානව අයිතිවාසිකම් ගැන කථා කරනවා. නමුත් එදා අඳ ගොවියාට මානව අයිතිවාසිකමක් තිබුණේ නැහැ. වහලකු හැටියට තමන්ගේ හැම දේම, ගෙදර දොර සහ සමහර විට තමන්ගේ පවුලේ අය පවා ඉඩම් අයිතිකාරයන්ට විකුණා දමන්නට සිදු වුණු කාල පරිච්ඡේදයක් ලංකා ඉතිහාසයේ තිබුණා. ඒවා කනගාටුදායක සමාජ තත්ත්වයන්. අද වන විට ඒවා වෙනසකට භාජන කොට අඳ ගොවියාගේ අයිතිය, අඳ ගොවියාගේ සුරක්ෂිතභාවය ඇති කර තිබෙනවා. ඒ වාගේම නිෂ්පාදනය වැඩි කරන්න ඔවුන් දිරිගැන්වීම කළා. තමන් නිෂ්පාදනය කරන දෙයින් තමන්ට වැඩි දෙයක් ලබා ගත හැකිය කියන විශ්වාසය මත මේ රටේ සහල් නිෂ්පාදනය වැඩි කිරීමට දැවැන්ත ඉදිරි පියවරක් අපේ රටේ අඳ ගොවි ජනතාව තබා තිබෙනවා.

අපේ ආර්ථික ක්‍රමය තුළ මේ රටේ දුගී බවට පත් වී තිබුණු ගම්මානවල දුගී බවින් පෙළුණු ජනයාට, දුගී බවින් ඉවත් වෙලා, තමන් ඇතුළු තමන්ගේ ගෙදර-දොර, දරුවන් දුගී බවින් ගොඩ ගන්නට අඳ ගොවි අයිතිය සුරක්ෂිත කිරීම හේතු සාධක වෙලා තිබෙනවා. එය ඔවුන් ලැබූ ජයග්‍රහණයක් බව පෙනෙනවා. සමස්ත වශයෙන් නිෂ්පාදනය වැඩි කරන්න අඳ ගොවීන් විශාල කාර්ය භාරයක් ඉටු කරලා තිබෙන බව වසර 53ක් ආපසු හැරිලා බලනකොට පෙනෙනවා. සියලු සංඛ්‍යා ලේඛන, මධ්‍යම බැංකු වාර්තා, බැංකු ණය ආදිය ඒ සුරක්ෂිතභාවය සඳහා ගත් පියවර වශයෙන් සාක්ෂි දරනවා.

මේ සමඟම අඳ ගොවි ජනතාවගේ සංවිධාන බිහිවෙලා, ඒ සංවිධාන ඔවුන් වෙනුවෙන් ඉදිරිපත්වෙලා කටයුතු කරන නව ප්‍රවේශයක් අපේ මහින්ද චින්තනය තුළ ක්‍රියාත්මක වනවා. අද ආර්ථිකයේ නව ප්‍රවේශයක් බවට පත් වුණු, ජනතාව ආර්ථික කටයුතුවලට සහභාගි කරවා ගැනීමේ ක්‍රියා මාර්ගය කුඹුරු පනතෙන් අඳ ගොවීන්ට ලබා දුන්නු ඒ ජයග්‍රහණ තුළින් සාක්ෂාත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉඩම් අයිතිකාරයා එක තැනක, නිෂ්පාදකයා තවත් තැනක හිටපු -Absentee Landlordism- ප්‍රතිවිරෝධය වෙනසකට භාජන කරලා, ඈත එපිට තිබෙන, ඉඩම් හිමියා කවදාවත් නොයන ඉඩමක කුඹුරු ගොවිතැන දියුණු කිරීමටත්, ඒ අඳ ගොවියාගේ අයිතිය සුරක්ෂිත කිරීමටත් පුළුවන්කම ලැබුණා. තිබුණු එවැනි අඩු පාඩුකම් නිවැරදි කරන්න මේ සංශෝධනයට හැකි වන බව අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. එය අපේ රටේ ආහාර නිෂ්පාදනයට මෙන්ම අපේ රටේ ආර්ථික තත්ත්වය, අපේ ජනයාගේ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කර ගැනීමටත් හේතු වනවා. ඒ වාගේම වී ගොවිතැන නවීකරණයට භාජන කළ හැකි ආකාරයෙන් ගොවි සංවිධාන ඇති කරගෙන තිබෙනවා. වෙනදා ණයක් නොගත්ත අඳ ගොවියෙක් අද ණය ගන්නවා භය නැතිව. වෙනදා ට්‍රැක්ටරයක් නොගත්ත අඳ ගොවියෙක් අද ට්‍රැක්ටරයක් ගන්නවා. ඒ අයගේ දරුවන්ට නව අවධියකට ගමන් කරන්න පුළුවන් වන මහා පෙරළියකට මඟ පෑදීම සඳහා අපි මේ ක්‍රියා මාර්ගය ගත් බව යළිත් සඳහන් කරන්න ඕනෑ.

ආපසු හැරී බලන කොට එක කාරණාවක් මට මතක් වෙනවා. 1958 පිලිප් ගුණවර්ධන මැතිතුමා, මගේ සහ ගීතාංජන මැතිතුමන්ගේ ආදරණීය පියා මේ පනත සම්මත කරගන්න හදපු අවස්ථාවේ හුඟක් කලබල තිබුණා කියලා අගමැතිතුමා කිව්වා. අගමැතිතුමා දන්නවා ඒ තිබුණු පටලැවිලි. ඒ වෙලාවේ බොහොම අමාරුවෙන් සම්මත කරගෙන, පළමුවෙන්ම ගොවි පනත ගැසට් කරලා ක්‍රියාත්මක කරන දිස්ත්‍රික්කය බවට පත් කළේ හම්බන්තොට දිස්ත්‍රික්කයයි. දිවංගත ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාගේ, ලක්ෂ්මන් රාජපක්ෂ මැතිතුමාගේ දැවැන්ත ශක්තියත් එක්ක අඳ ගොවීන්ගේ අයිතිය සුරක්ෂිත කරන මහා පෙරළියේ ආරම්භය ඇති වුණේ, වැඩිම අඳ ගොවීන් පිරිසක් ජීවත් වන හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්. ඒ වාගේම වැඩිම අඳ ගොවීන් පිරිසක් ජීවත් වන පළාත තමයි දකුණු පළාත. ඒ අයගේ ප්‍රශ්න විසඳීමට මේ ක්‍රියාවලියට පුළුවන්කම ඇති වුණා.

මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා, මෙය තවත් සාර්ථක කරගෙන ඉදිරියට ගමන් කළ හැකි ක්‍රියා මාර්ගයකට අද අපි අවතීර්ණ වෙලා තිබෙනවා. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මම ස්තුතිවන්ත වනවා, මේ පනත ඉදිරියට ගෙන ඒම සඳහා සහාය, ශක්තිය ලබා දීම ගැන. ජනමාධ්‍යයටත් මේ අඳ ගොවීන් වැදගත්. මේ බලන්න, ඊයේ පුවත් පතක "ගොවි දිරිය" යටතේ මේ ගැන සාකච්ඡා වනවා. ඉතින් මේ ජනමාධ්‍යවේදීන් පමණක් නොව, අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා පාර්ලිමේන්තුවේදී අපෙන් ඇහුවා, මේක කවදා කෙරෙයිද කියලා. අද ආණ්ඩුව ඒ කටයුත්ත ඉටු කරමින් තිබෙන අවස්ථාවේදී විපක්ෂය පවා සහයෝගය දැක්විය යුතුයි. මම කැමැතියි, "1958 The Agricultural Plan" -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවකුත් ඉදිරිපත් කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්. සභාව කල් තැබීමේ යෝජනාවක් ගෙනාවා. විවිධ අවස්ථාවල අපි උද්ඝෝෂණය කළා, ඔබතුමාගේ ආදරණීය පියාගේ කාලයේ. නමුත් එදා ගරු ගීතාංජන ගුණවර්ධන මන්ත්‍රීතුමා, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, අපි විරුද්ධ පක්ෂයේ ඉඳගෙන ඒ වෙනුවෙන් සටනක් කළා. මම නම් ඒ කලබලේ ගුටි කෑවේ නැහැ. එදා අඳ ගොවි අයිතිය වෙනුවෙන් සටන් කරන්න පාර්ලිමේන්තුවේ නැඟිටපු වෙලාවේ ඒ අයට පහර දුන්නා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. මම ඒක වළක්වන්න කටයුතු කළත් ඒක අසාර්ථක වුණා. ඒ ඉතිහාසගත අවස්ථාවේ සිට අයිතිවාසිකම දිනා ගන්නා තුරුම අපි නොනැවතී සටන ඉදිරියට ගෙනැවිත් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I have very little time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා පිළිගන්නවාද, අද ගොවියාගේ අද අයිතිය අහිමි වුණේ, ගරු හිටපු කෘෂිකර්ම අමාත්‍ය දි.මු. ජයරත්න මැතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත නිසාය කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැති වුණේ නැහැ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
2000 පනතෙන් ඒක නැති වුණේ නැහැ. ඒක තවදුරටත් තහවුරු කරලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විවිධ නිලධාරින්, නඩු කාරයන් අර්ථ නිරූපණ දෙනවා. ඉතින් අපි මොනවා කරන්නද?

ගරු විපක්ෂ නායකතුමාගේ ආදරණීය සීයා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හිටපු ලේකම්වරයකු හැටියට වාරිමාර්ග ක්ෂේත්‍රය ගැන, කෘෂිකර්මය ගැන ලියලා තිබෙන වාර්තාව කියවන්න. එය ඉතාම වටිනා වාර්තාවක්. මමත් ඒ වාර්තාව කියවලා තිබෙනවා. ඒ, 1930 ගණන්වලයි. මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ සෑම දෙනාටම ගොවි ජනතාව අමතක කළ නොහැකියි. ඒ නිසා ගොවි ජනතාවගේ ජයග්‍රහණයන් ඇති කිරීමට දේශපාලන ක්ෂේත්‍රය කැප විය යුතුයි.

මා ළඟ තිබෙනවා, එදා කෘෂිකර්ම ඇමතිතුමාගේ "1958 The Agricultural Plan" එක. මේ සමඟම තමයි මේ වෙනස්කම් අපේ ගොවිතැනේ ඇති කළ යුතුය කියලා පිළිගෙන එයට සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් ඇතුළත් කළේ. මා විශේෂයෙන් මෙය -"Philip Gunawardena collected speeches"- කියවන්න කැමැති වූ හේතුවක් තිබෙනවා. උතුරු පළාතේ මන්ත්‍රීවරු, නැඟෙනහිර පළාතේ මන්ත්‍රීවරු එදා පක්ෂ සීමාවලින් එහාට වෙලා මේ වෙනුවෙන් සහයෝගය දැක්වූවා. ගරු මුස්තපා මැතිතුමා -නැඟෙනහිර පළාතේ- අද ගොවීන් මේ තත්ත්වයෙන් නිදහස් වීම ගැන ප්‍රකාශ කරපු අදහස් මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා.

මා කැමැතියි ගරු පී. කන්දයියා මැතිතුමා කරපු ප්‍රකාශයක් විශේෂයෙන්ම උතුරේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය පිණිස ගෙන එන්න. "1958 The Agricultural Plan" යටතේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"P. Kandiah, MP for Point Pedro, was critical of the Federal Party for refusing to support the Bill. His comments have great relevance, for it focuses on the issue, that people have many problems unrelated to ethnicity, that when unresolved, contribute to economic difficulties exacerbating the ethnic tensions."

පී. කන්දයියා මැතිතුමා මෙසේ කියා තිබෙනවා:

"There are differences between the Tamil-speaking people and the Sinhalese-speaking people, but on the question of the right of the tenant to his land and to his share of his produce, there are no differences between the Tamils and the Sinhalese."

මෙය තමුන්නාන්සේලාගේ හදවත්වල අදත් දෝංකාර දිය යුතු ඉතාම වැදගත් කථාවක්. මේ රටේ අතිගරු ජනාධිපතිතුමා ප්‍රධාන රජය ආර්ථික සංවර්ධනය උදෙසා ගෙන යන ක්‍රියා මාර්ගවලට භේද භින්නතාවන් ඇති කිරීමෙන් වළකින්නට එදා පී. කන්දයියා මන්ත්‍රීතුමා දුන් උපදෙස අදත් ඔබතුමන්ලාගේ සැලකිල්ලට ගන්නවා ඇතැයි මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසන් කිරීමට මත්තෙන් මා කැමැතියි මේ පනතේ ඇති යම් යම් කරුණු ගරු අමාත්‍යතුමාගේ අවධානයට ගෙනෙන්න. නිෂ්පාදනය, ජලය බෙදා හැරීම වැනි අංශවල ඇති විවිධ අඩු ලුහුඬුකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, ක්ෂේත්‍රයේ විවිධ ප්‍රශ්න විසඳීමේදී -විවිධ ගැටලු නිරාකරණය කිරීමේදී- ගොවි සංවිධානවල අපක්ෂපාති නිර්දේශද සැලකිල්ලට ගත හැකි වන පරිදි එම සංවිධානවල අදහස් ලබා ගැනීම සඳහා ඒ අය ගොවිජන විනිශ්චය සභාවලට කැඳවීම පිළිබඳ අවධානය යොමු කරන්නේ නම් ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳීමේදී එය මෙයටත් වඩා ශක්තියක් වෙනවා. ඒ වාගේම වන්දි ගෙවනු ලබන අවස්ථාවලදී නියමයන් කිරීමේදී සැලකිය යුතු බලතල ඔබතුමා විසින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතයි. එකී බලතල ප්‍රකාශයට පත් කිරීමෙන් ඉක්බිතිව ඒ බලතල ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ අර්ථ දැක්වීම ඇතුළත් කිරීමෙන් ඒ ගැසට් නිවේදනවල සඳහන් අරමුණු වඩාත් ශක්තිමත් කරන්නට පියවර ගන්නවා ඇති කියලා විශ්වාස කරනවා. ඒ වාගේම වන්දි ගෙවීම ආදි කටයුතු සම්බන්ධයෙන් අප මේ ආරම්භ කරපු ගමන ඉදිරියට ගෙන යන්නට හැකියාව ලැබෙනු ඇතැයි අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසාන කිරීමට මත්තෙන් තවත් කාරණයක් කියන්න ඕනෑ. 1978 සිට මේ පනත සඳහා සංශෝධන සිදු කෙරුණා. හම්බන්තොට දිස්ත්‍රික්කය අද ගොවීන් ජීවත් වන ප්‍රදේශයක් ලෙස අඛණ්ඩව ඉල්ලීම් රාශියක් මේ කාලය තුළදී කළා. අද ගොවියා මිය ගිය පසු ඔහුගේ කලත්‍රයාටද, එවැන්නකු නැති විට එම පවුලේ සිටින කෘෂි කර්මාන්තයේ නියැළි දරුවකුටද ඒ අයිතිවාසිකම ලබා දෙමින් කෘෂිකර්ම ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම ඉතාම වැදගත්. අද ගොවීන් කෘෂි කර්මයට පමණක් නොවෙයි, සහල් ගොවිතැනට පමණක් නොවෙයි දායක වන්නේ. කිරි නිෂ්පාදනයටද අද ගොවීන් දායක වන ප්‍රමාණය අපේ ආර්ථිකයට ඉතාම වැදගත් කොටසක්ය කියන ටික අප කියන්න ඕනෑ. අද ගොවි ජනයාගේ ආරාවුල් විසඳීම සඳහා ගොවිජන විනිශ්චය සභා පිහිටුවා විශාල ගැටලු ඇති දිස්ත්‍රික්ක සඳහා විනිශ්චය මණ්ඩල පිහිටුවීම තුළින් අප බලාපොරොත්තු වන්නේ නිශ්චිතව කාලයන් අනුව වැඩ කරාවි කියලායි. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා මේ ප්‍රශ්න අධිකරණයට ගොඩ ගැස්වීම වළක්වා නිරාකරණය කළ හැකි පිළිවෙත්වලට වඩා ශක්තිය දෙන්න.

ජනයා සහභාගි වන ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමයි, අතිගරු ජනාධිපතිතුමා ප්‍රධාන මේ රජය කරලා තිබෙන්නේ. උතුරු පළාතේ සිට දකුණටත්, නැඟෙනහිර පළාතේ සිට බටහිරට හා කඳුකරයටත් ඇතුළුව හැම ප්‍රදේශයටම බලපාන මේ වැදගත් පනත් කෙටුම්පත, කුඹුරු පනතින් ආරම්භ වී, ශක්තිමත් වී ඉදිරියට ගමන් කරන අද ගොවීන්ගේ අයිතියද, ගොවි ජනතාවගේ අයිතිය බවට පරිවර්තනය වෙමින්, අපේ රටේ ආහාර නිෂ්පාදනය වැඩි කරන්න, සහල් නිෂ්පාදනය වැඩි කරන්න, ආර්ථික සුරක්ෂිතභාවය ඇති කරන්න, ඒ වාගේම ආදායම් මාර්ග වැඩි කර ගන්න උපකාරී වී තිබෙනවා.

මා මේ කාරණය කියන්න ලජ්ජා වන්නේ නැහැ. අද අපේ බොහෝ අද ගොවීන් හමු වුණාම ආඩම්බරයෙන් කියනවා, "අපි ගොවිතැන් කළා. අද අපේ දරුවෝ රාජ්‍ය සේවයේ ඉහළට ගිහින් තිබෙනවා"යි කියලා. කොච්චර ආඩම්බරද? මේක තමයි සමාජයේ වෙනස. මේ වෙනසට සහාය දැක්වීම තමයි මේ පාර්ලිමේන්තුවේ සර්ව පාක්ෂිකව කළ යුතු වන්නේ. සමාජයේ වෙනසකට භාජනය වන ඒ සිතුම් පැතුම් ඉදිරියට ගෙන යෑමේ රටේ ජනතාවගේ ඒ බලාපොරොත්තුව ඉටු කිරීම රජයක කාර්ය භාරයයි. අපි මේ සංශෝධන ගෙනැවිත් අද බලාපොරොත්තු වන්නේ ජනතාවගේ ඒ බලාපොරොත්තුව ඉටු කිරීමයි. අපි විශ්වාස කරනවා, අපේ ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමා මේ සංශෝධනයෙන් නිකුත් කරන රෙගුලාසි තුළින් තවත් ශක්තිමත්භාවයට පත් වීමෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරන අරමුණු සාර්ථක කරන්න හැකි බව. එසේ ප්‍රකාශ කරමින් අද දින -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තව අඩු පාඩු තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා මගෙන් අහනවා, තව අඩු පාඩු තිබෙනවාද කියලා. එක්සත් ජාතික පක්ෂය නොදකින අඩු පාඩු -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගොවිජන සංවර්ධන පනතේ අඩු පාඩු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අහෝ දෙවිදත් නොදිටි මොක්පුර!

ඔබතුමන්ලා කවදාද හොඳ දෙයක් කියලා තිබ්බේ. [බාධා කිරීමක්] දැනුත් හෝටලයක් හදන කොට කියනවා, හෝටලය හදන්න එපාය කියලා. එක්සත් ජාතික පක්ෂය පුරුදු වෙලා ඉන්නේ එහෙම කියන්නයි. එම නිසා කොළඹ නගරයේත් බහුතරය නැතිව ගියා. [බාධා කිරීමක්] ඔබතුමන්ලාට දැන් ගමත් නැහැ; නගරයත් නැහැ. මෙහෙම හැසිරීම නිසා තමයි ඒක වෙලා තිබෙන්නේ. ගම නැහැ. සියලුම ගම්වලින් පරාදයි. ඔබතුමන්ලාට නගරත් නැහැ. එකම නගරයයි ලැබුණේ. ඒකත් සුළුතරයයි. බහුතරය නැතිව ගියා. ඉතින් ඔබතුමාට ඒකට සතුටුයි. මා දන්නවා, ඔබතුමාට ඒකට සතුටුයි කියලා. කවුරු කවුරුත් පාඩමක් ඉගෙන ගන්න. [බාධා කිරීමක්] තිබෙන අඩු පාඩුකම් හදා ගෙන අපි ඉදිරියට යනවා. සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ඔබතුමා සහයෝගය දෙන්න. ඔබතුමා ඇත්තටම ගොවි ජනතාවට හිතවත් නම් හම්බන්තොට මන්ත්‍රීතුමා හැටියට මේ පනත් කෙටුම්පතට සහයෝගය දෙන්න. ස්තුතියි.

[பி. ப. 4.09]

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய கமநல அபிவிருத்தி (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் பேசுவதற்கு வாய்ப்பளித்ததற்கு முதலில் நன்றி தெரிவித்துக்கொள்கின்றேன். விவசாயத்துறை என்பது இந்த நாட்டின் வளர்ச்சியில் முக்கிய ஓர் இடத்தைப் பிடித்திருக்கிறது. எங்களுடைய விவசாயிகள் மழை, வெயில் பாராமல் கஷ்டப்பட்டு விவசாயம் செய்வதால் இந்த நாடு வளம்பெற்று வருகின்றது. ஆனால், அடிப்படையில் அந்த விவசாயிகளுக்கு எந்த நன்மையும் கிட்டுவதில்லையென்பதை இங்கு நான் குறிப்பிட விரும்பு கின்றேன். குறிப்பாக, எங்களுடைய விவசாயிகள் உரிய காலபோகங்களில் நெல்லை உற்பத்தி செய்து அறுவடை செய்கின்றபோது அதற்குரிய விலையில் வீழ்ச்சி காணப் படுகின்றது. தன்னுடைய குடும்பத்தையும் இந்த நாட்டையும் வளம்படுத்த வேண்டுமென்று நினைத்து, கடன் வாங்கி, தன்னுடைய உடைமைகளை அடகுவைத்து விவசாயம் செய்யும் ஒரு விவசாயியால், அறுவடையின்போது அந்த நெல்லுக்கான விலையில் வீழ்ச்சி காணப்பட்டால், எப்படித் தன்னுடைய குடும்பத்தை வளமுடன் வாழவைக்க முடியும்? சம்பந்தப்பட்ட அரச திணைக்களங்கள் அரசாங்க நிதியொதுக்கீட்டிலிருந்து சொற்ப நெல்லைத்தான் கொள்முதல் செய்கின்றன. அதனால், பெரும் பாலான விவசாயிகள் தனியார் கொள்முதலாளர்களுக்கே தங்களுடைய நெல்லை விற்கின்றார்கள்; அவர்கள் மிகக்குறைந்த விலைக்கே அந்த நெல்லை வாங்குகிறார்கள். இதனால் எங்களுடைய விவசாயிகள் சொல்லொணாத் துன்பங்களைச் சந்தித்துக்கொண்டிருக்கின்றார்கள். சிலர் தற்கொலை முயற்சிக்குக் கூட எத்தனித்ததையும் எங்களால் கூற முடியும். நாங்கள் எங்களுடைய விவசாயிகளைப்பற்றிப் பெருமையாகப் பேசு கிறோம். ஆனால், அந்த விவசாயிகளைத் தட்டிக்கொடுக்கின்ற வாய்ப்பை நழுவ விடுகின்றோம். அவர்களுடைய அடிப்படைத் தேவைகள்கூடப் பூர்த்திசெய்துகொடுக்கப்படாது அவர்கள் ஏமாற்றப்படுகிறார்கள். ஆகவே, நாங்கள் வெறுமனே பேசிக் கொண்டிருப்பதில் எவ்வித பிரயோசனமும் இல்லை. நெல்லுக்கு நியாயமான விலையை நிர்ணயித்து, விவசாயத் திணைக்க ளங்களினூடாக நிர்ணயிக்கப்பட்ட விலைக்கு இலங்கையி லிருக்கின்ற அத்தனை விவசாயிகளிடமிருந்தும் நெல்லைக் கொள்வனவு செய்தால் எமது விவசாயிகள் நல்ல பயனைப் பெற்று அவர்களுடைய குடும்பத்தினருடன் நல்ல நிலையில் வாழக் கூடியதாக இருக்கும். எனவே, விவசாயிகளுக்குத் தன்னம்பிக்கை யூட்டக்கூடிய வகையிலே அரசாங்கம் நெல்லுக்கான நல்லதொரு விலையை நிர்ணயிக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். அதேநேரம், அரசாங்கம் வெளிநாடுகளிலிருந்து அரிசி இறக்குமதி செய்வதைவிடுத்து, அறுவடைக் காலங்களில் விவசாயத் திணைக் களங்களினூடாக நிர்ணயிக்கப்பட்ட விலையில் நெல்லைக் கொள்முதல் செய்வதன்மூலம் அந்த விவசாயக் குடும்பங்களுக்கு வாழ்வளிக்க முடியுமென்பதையும் நான் இங்கே குறிப்பிட விரும்புகின்றேன்.

இதேபோன்றுதான் மரக்கறி போன்ற விவசாயப் பொருட்களின் விலைகளும் அமைந்துள்ளன. குறிப்பாக, வன்னி மாவட்டத்திலே இன்று ஓரளவுக்கு நிமிர்ந்துவருகின்ற விவசாயிகள் தமது தோட்டங்களிலே கத்தரி, வெண்டி போன்ற மரக்கறி இனங்களைப் பயிரிட்டு அந்த உற்பத்திகளைச் சந்தைப்படுத்து கின்றவேளையில் மிகுந்த நட்டமடைகின்றார்கள். அங்குள்ள முதலாளிகள் விவசாயிகளிடமிருந்து கத்தரிக்காயை ஒரு கிலோ 40 ரூபாய் வீதம் கொள்வனவு செய்து, கிலோ 100 ரூபாய் வீதம் விற்பனை செய்கின்றனர். இதனால் இடைத்தரகர்கள் இலாபம் பெறுகிறார்களேயொழிய, சிறு விவசாயம் செய்யும் எமது உற்பத்தியாளர்கள் எவ்வித இலாபமும் அடைவதில்லை. இதன் காரணமாக அங்குள்ள விவசாயிகள் தொடர்ந்தும் வறுமைக் கோட்டின்கீழேயே வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அவர்கள் இந்த நாட்டின் செல்வம் மிக்க விவசாயிகளாகவோ, நடுத்தர வர்க்கத்தினராகவோ வாழமுடியாத நிலைமை காணப்படுகிறது. காரணம், அங்குள்ள விவசாய உற்பத்திப் பொருட்கள் நிர்ணயிக்கப் பட்ட நியாயமான விலைக்குக் கொள்வனவு செய்யப்படாமைதான். இலாபமீட்டுகின்ற இடைத்தரகர்களின் செயற்பாடுகளின் காரணமாக, கஷ்டப்பட்டு விவசாயச் செய்கையை மேற்கொள்ளும் எமது விவசாயிகள் தகுந்த பலனைப் பெறுவது பூச்சியமாக இருக்கின்றது. ஆகவே, இவ்விடயத்தில் நாம் கவனம் செலுத்த வேண்டும். வடக்கு, கிழக்குப் பிரதேசத்தைப்

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

பொறுத்தமட்டில் குறிப்பாக வன்னிப் பிரதேசத்திலே போர்ச் சூழலினால் பாதிக்கப்பட்டு இடம்பெயர்ந்து இன்று ஒன்றும் இல்லாத நிலையிலே கஷ்டப்பட்ட நிலையில் உள்ளவர்கள்தாம் இந்த விவசாயிகள். ஆகவே, அவர்களுடைய அன்றாட வாழ்க்கை சீராக நகரவேண்டுமாயின் இந்த விவசாய உற்பத்திப் பொருட்கள் நியாயமான விலைக்கு கொள்வனவு செய்யப்பட வேண்டும். இல்லையேல், அவர்கள் அந்தத் துன்பத்திலிருந்து மீள முடியாது. ஆகவே, இந்த அரசு இவ்விடயத்தில் கவனம் செலுத்த வேண்டும் என நான் இங்கு கேட்டுக்கொள்கின்றேன்.

அதுமட்டுமல்ல, முல்லைத்தீவு மாவட்டத்திலே கமநல சேவை நிலையங்கள் 10 இருக்கின்றன. இன்று புதிதாக உருவாக்கப்பட்ட வெலிஓயா AGA Division க்கு எமது பிரதேசத்திலுள்ள கமநல சேவை நிலையங்கள் 10 இலிருந்தும் ஒவ்வொரு tractorஐத் தரும்படி கோரியிருக்கிறார்கள். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, யுத்தத்துக்கு முன்னர் எமது மக்கள் நடுத்தர வர்க்கக் குடும்பத்தினராக இருந்தபொழுதிலும் ஒவ்வொரு குடும்பத்தினரும் ஒரு tractor, மோட்டார் சைக்கிள் ஆகியவற்றை வைத்திருந்தார்கள். ஆனால், முள்ளிவாய்க்கால் பிரச்சினையின் போது அவர்கள் விட்டுச்சென்ற tractor, மோட்டார் சைக்கிள் மற்றும் உடைமைகள் எவையும் இற்றைவரையில் அவர்களுக்குக் கிடைக்கவில்லை. அப்படிப்பட்ட சூழ்நிலையில் இன்று அவர்களுக்கு இந்தியாவால் வழங்கப்பட்ட tractorகளில் 10 tractorகளைத் தரும்படி கோருவது எந்தவிதத்தில் நியாயமானது? அரசாங்கம் புதிய 10 tractorகளை பெற்றுக் கொடுக்கலாம். அதைவிடுத்து, அங்குள்ள விவசாயிகளுக்காகக் கொடுத்த tractorகளிலிருந்து 10 கமநல சேவை நிலையங்களும் ஒவ்வொரு tractorகளைத் தரவேண்டும் எனக் கோருவது எந்த விதத்தில் நியாயம்? ஒன்றுமில்லாத நிலையில் அங்கு வந்த அவ்விவசாயிகளுக்கு அவை நிவாரண உதவியாக வழங்கப் பட்டுள்ளன. அந்த உதவியை இந்த அரசாங்கம் மீண்டும்பெறுவது என்பது நியாயமான காரியமல்ல. அரசாங்கம் அந்த மக்களுக்கு உதவும்வகையில் 10 tractorகளையோ அல்லது அதற்கு அதிகமாகவோ கொடுப்பதென்றாலும் நாங்கள் அதற்கு மறுப் பில்லை. அதற்காக இப்பொழுது எங்களுடைய பகுதிகளிலுள்ள விவசாயிகளுக்குக் கொடுத்துள்ள tractorகளை மீண்டும் எடுக்க வேண்டாம் என்றுதான் நாங்கள் கோருகிறோம்.

அதுமட்டுமல்ல, எமது மாவட்டத்தைச் சேர்ந்த கொக்கிளாய் பிரதேசத்தில் பல நிலங்கள் விவசாயிகளின் பயன்பாட்டுக்கு விடுவிக்கப்படாமல் இருக்கின்றன. முல்லைத்தீவிலுள்ள அந்தப் பிரதேசம் மிகவும் நீண்ட தூரத்தில் உள்ளது. இதனால் அங்குள்ள விவசாயிகள் விவசாயத்தை மேற்கொள்வதில் மிகுந்த சிரமத்தை எதிர்நோக்குகின்றார்கள். அதனால் அவர்கள் கூலி வேலைகளைச் செய்கின்றார்கள். முதலாளிமார் அல்லது பெரும் நிலங்களை வைத்திருப்பவர்கள் அவற்றில் விவசாயம் மேற்கொள்கின்ற போதுதான் அங்கு சென்று தொழில் செய்கின்ற வாய்ப்புக்கள் ஏற்படுகின்றது. ஆனால், முல்லைத்தீவு மாவட்டத்தைப் பொறுத்தமட்டிலே அங்கு அந்த வழிகள் இல்லை. ஆகவே, அவர்கள் நீண்டதூரம் சென்று கூலி வேலை செய்து தங்களுடைய குடும்பத்தைக் காப்பாற்றுகின்ற ஒரு நிலைமைக்குத் தள்ளப்படு கின்றார்கள். எனவே, அங்குள்ள நிலங்கள் விடுவிக்கப்பட வேண்டும். அப்பொழுதுதான் இந்த மீள்குடியேற்றத்தின்மூலம் மக்கள் சரியான பலனை அடைவார்கள். ஆகவே, அந்த நிலங்கள் விடுவிக்கப்பட்டு மக்கள் மீள்குடியேற்றம் செய்யப்பட வேண்டும் என்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்கின்றேன். இல்லை யென்றால் விவசாயிகளுக்காகச் செய்யப்படுகின்ற இந்தச் சட்டத் திருத்தங்கள் அத்தனையும் வீணானவையாகக் கருதப்படும் நிலைக்குத் தள்ளப்படும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

அதுமட்டுமல்ல, இன்றைக்கு அங்குள்ள பல கமநலச் சேவைத் திணைக்களக் கட்டடங்கள் பொலிஸாரின் கட்டுப்பாட்டில் இருக்கின்றன. அவற்றை அவர்கள் உடனடியாக விடுவிப்பதனூ டாகத்தான் அந்த மக்கள் கமநலச் சேவைத் திணைக்களத்தின்மூலம் நற்பயன் அடைய முடியும். இல்லையெனில் அவர்கள் தொடர்ந்தும் சொல்லொண்ணாத் துன்பங்களை அனுபவிப்பார்கள். இதேபோல தான் எங்களுடைய பிரதேசங்களில் விவசாயத் திணைக்களத்தின் மூலம் பராமரிக்கப்பட்டுவரும் பல தோட்டங்கள் மற்றும் வயல் நிலங்கள் இன்றைக்கு இராணுவத்தினரின் கைகளிலே இருக் கின்றன. அவற்றின்மூலம் அவர்கள் வருமானம் ஈட்டக்கூடிய நிலையிலே இருக்கின்றார்கள். அதுமட்டுமல்ல, அங்கே எங்களு டைய மக்கள் போய் கூலி வேலை செய்கின்ற வாய்ப்புக்களும் நழுவிச் செல்கின்றன. ஆகவே, கமநலச் சேவைத் திணைக்களத்துக் குச் சொந்தமான வயல்கள் மற்றும் தோட்டங்கள் அனைத்தும் மீளக் கொடுக்கப்பட வேண்டும். அப்பொழுதுதான் நான் முதலில் சொன்னதுபோல, விவசாயிகளுக்கான செயற்றிட்டங்கள் ஒரு சரியான திசையிலே செல்லும். இல்லையென்றால் அவர்கள் வறுமைக்கோட்டுக்குக் கீழ் வாழ்ந்துகொண்டிருக்கின்ற ஒரு நிலைமையே காணப்படும்.

அதுமட்டுமல்ல, விவசாயத் துறையிலே கால்நடையும் ஒரு முக்கிய பங்கு வகிக்கிறது. எங்களுடைய விவசாயிகளின் கால்நடைகளை இன்றைக்கு யார் யாரோ பிடித்துக்கொண்டு போகின்றார்கள். ஆனால், அவற்றின் சொந்தக்காரர்களான எமது விவசாயிகள் அந்தக் கால்நடைகளைத் தேடிக் கண்டுபிடித்துப் பயன்பெற முடியாதுள்ளது; அதற்கான அனுமதி இல்லை; அதனைச் செய்வதற்கு இராணுவத்தினர் தடுக்கின்றார்கள். எங்களுடைய மக்கள் போரின் காரணமாக இடம்பெயர்ந்து சென்றபோது இந்தக் கால்நடைகளைக் கொண்டுசெல்ல முடியாது அங்கேயே விட்டுவிட்டுச் சென்றார்கள். இதனால் இன்றைக்குப் பல இலட்சக்கணக்கான கால்நடைகள், குறிப்பாக மாடுகள், அங்குள்ள காடுகளில் வாழ்கின்றன. இந்த நிலையில், அவற்றைப் பிடித்துக் கொழும்புக்கும் மற்றும் நகரப் புறங்களுக்கும் கொண்டுசென்று சாப்பாட்டுக்காக அறுக்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலை இன்றைக்கு ஏற்பட்டிருக்கின்றது. அந்த மாடுகளை வைத்துக்கொண்டு பால் கறந்து வளமுடன் வாழ்ந்துவந்த எங்களுடைய மக்கள் அவை தொலைந்துபோவதைப் பார்க்கின்ற போது மிகவும் கவலை கொள்கின்றார்கள். அதேநேரம் வன்னி மாவட்டத்திலே கால்நடைகள் மேய்வதற்கான நிலங்கள் இல்லாத காரணத்தினால் அவர்கள் அந்தக் கால்நடைகளைத் தூரத்திலுள்ள பகுதிகளுக்குக் கொண்டுசென்று மேய்ச்சலுக்கு விடுவதனாலும் அவை காணாமற்போகின்ற நிலைமை ஏற்படுகின்றது. ஆகவே, அந்த விவசாயிகள் இந்தக் கால்நடைகளைத் தேடிக் கண்டுபிடிப்பதற்கான அனுமதியை அமைச்சர் அவர்கள் வழங்க வேண்டும். எங்களுடைய விவசாயிகள் காணாமற்போன தங்களு டைய கால்நடைகளைத் தேடிக் கண்டுபிடிக்கின்ற நடவடிக்கை களைப் பாதுகாப்புப் படையினர் தடுப்பதனால் அவர்கள் தமது கால்நடைகளின்மூலம் பயன்பெறுகின்ற வாய்ப்புக்கள் குறைந் திருக்கின்றன. அவற்றை வேறு யாரும் பிடித்துக் கொண்டுபோய் அறுத்துச் சாப்பிடுகின்றார்கள் என்று கேள்விப்படும்போது உண்மையிலே அந்த விவசாயிகள் மிகவும் வேதனைப்படு கின்றார்கள், துன்பத்துக்குள்ளாகின்றார்கள்.

மீள்குடியேற்றம் செய்யப்பட்ட கிராமங்களிலுள்ள விவசாயி களைப் பொறுத்தமட்டிலே அவர்களுக்குச் சொந்தக் காலிலே நிற்கின்ற தைரியமிருக்கின்றது; அங்கு அதற்குரிய வாய்ப்புக்களும் காணப்படுகின்றன. ஆகவே, அவர்களின் உற்பத்திப் பொருள் களின் விலை நிர்ணயம் மற்றும் அவர்கள் எதிர்பார்க்கின்ற ஏனைய விடயங்கள் நிறைவேற்றப்பட வேண்டும். அப்பொழுது தான் அவர்கள் நலன்பெற முடியும். இதனை நான் வன்னி மாவட்டத்தையோ அல்லது வடக்கு, கிழக்கையோ மாத்திரம் குறிப்பிட்டுக் கூறவில்லை. இலங்கை பூராவுமுள்ள விவசாயிகள் சார்பாக இந்தக் கோரிக்கையை முன்வைக்கின்றேன். இலங்கை யிலே வாழ்கின்ற விவசாயிகள் யாரும் செல்வந்தர்களாக இருந்ததில்லை. எங்களுடைய விவசாயிகளுக்கு நாங்கள் மேற்கொள்கின்ற சிறந்த சேவைகளைக் கொண்டுதான் அவர்கள் நலமுடன் வாழ முடியும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய பிரதேசத்திலே காட்டு யானைகளின் பிரச்சினை கூடுதலாக இருக்கின்றது. அங்கு செய்கை பண்ணப்படுகின்ற சிறு தானியங்கள் மற்றும் மரக்கறி வகைகளை எல்லாம் அவை அழித்துவிடுகின்றன. அதேபோல், தென்னம்பிள்ளைகளையும் அழித்துவிடுகின்றன. எனவே, இந்த யானைகளை அப்பகுதி யிலிருந்து துரத்தவேண்டும் என்று நாங்கள் பல தடவைகள் கோரிக்கை விடுத்தோம். ஆனால், இற்றைவரைக்கும் அது தொடர்பாக எந்தவிதமான நடவடிக்கைகளும் எடுக்கப்படவில்லை. இச்செயற்பாடானது, விவசாயிகளுக்குப் பெரும் இடைஞ்சலாக அமைந்திருக்கின்றது. இந்த யானைகள் தூர இடங்களிலிருந்து இப்பகுதிக்கு கொண்டுவந்து விடப்பட்டிருக்கின்றன என்று சிலர் சொல்கின்றார்கள். விவசாயிகள் தங்களுடைய வாழ்வாதாரத்தை நல்லமுறையில் முன்னேற்றுவதற்குரிய வாய்ப்புக்கள் ஏற்படும் போது, அவற்றை யானைகள் இல்லாமல் செய்கின்றன. இன்று மீள்குடியேற்றக் கிராமங்களிலே கரட், லீக்ஸ் என்பன செய்கை பண்ணப்படுகின்றன. அதாவது, மலையகத்திலே செய்கை பண்ணப்படுகின்ற அத்தனை விவசாய உற்பத்திப் பொருட்களும் மரக்கறி வகைகளும் எங்களுடைய பகுதிகளிலும் செய்கை பண்ணப்படுகின்றன. இவற்றையெல்லாம் யானைகள் அழிப்பதன் காரணமாக, அந்த விவசாயிகள் தொடர்ந்தும் பொருளாதார ரீதியாக நிமிர்ந்து நிற்கக்கூடிய வாய்ப்புக்களை இழந்து நிற்கின்றார்கள். எனவே, சேற்றிலே கால்வைத்து, நெற்றி வியர்வையை நிலத்திலே சிந்தி, ஊருக்குச் சோறுபோடும் எங்களு டைய விவசாயிகள் தங்களுடைய சொந்தக்காலிலே எழுந்து நிற்கவேண்டுமென்றால், அவர்கள் தங்களுடைய குடும்பங்களை நல்லமுறையில் வாழவைக்கவேண்டுமென்றால், நாங்கள் அவர்களை நல்லமுறையில் பராமரிக்கவேண்டும்; யானைகளின் தொல்லைகளிலிருந்து காப்பாற்றவேண்டும். அவ்வாறு செய்யா விடில், இந்த நாடு விரைவில் பட்டினியை எதிர்நோக்க வேண்டிய நிலைமை வரும். ஆகவே, நான் இந்த உயர் சபையிலே கேட்டுக்கொள்வது என்னவெனில், அந்த விவசாயிகளுடைய காணிகளை மீண்டும் பெற்றுக்கொடுப்பதோடு, அவர்களுடைய நெல்லுக்கும் மற்றும் ஏனைய விவசாய உற்பத்திப் பொருட் களுக்கும் அரசினால் விலை நிர்ணயம் செய்யப்படவேண்டும்; அவ்விவசாயப் பொருட்களை அரசாங்கம் நிர்ணய விலையில் கொள்வனவு செய்யவேண்டும் என்பதுதான். அவ்வாறு செய்தால்தான், அந்த விவசாயிகள் விவசாயம் செய்வதற்காக அடைமானமாக வைத்த நகைகள், மாடுகள், காணிகள் என்ப வற்றை மீட்டெடுக்கமுடியும். இவ்வாறே, கடந்த காலங்களிலும், ஒருபுறம் இயற்கையினாலும் மறுபுறம் விலை நிர்ணயம் இல்லாத காரணத்தினால் அறுவடை காலத்தில் உற்பத்திப் பொருட்களுக்குப் போதிய சந்தை வாய்ப்பின்மையினாலும் எங்களுடைய விவசாயிகள் தொடர்ந்து பாதிக்கப்பட்டார்கள். ஆகவே, விலை நிர்ணயமானது எங்களுடைய விவசாயிகளைப் பொறுத்தமட்டில் மிகமுக்கியமான ஒரு விடயமாகும்.

அதனைவிட, நான் முன்னர் குறிப்பிட்டதுபோன்று, யுத்தகாலத்தில் முள்ளிவாய்க்கால் பகுதியிலே விவசாயிகள் இடம்பெயர்ந்த நேரத்தில் விட்டுச்சென்ற விவசாய இயந்திரங்கள், பொருட்கள் என்பவற்றை அரசாங்கம் மீண்டும் அவர்களுக்குப் பெற்றுக்கொடுக்க முயற்சி செய்யவேண்டும். எனினும், அது தட்டிக்கழிக்கப்படுகின்ற நிலையில் அப்பகுதியில் எங்களுடைய மக்கள் விட்டுச்சென்ற விவசாய இயந்திரப் பொருட்கள், வாகனங்கள், tractorகள் மற்றும் இரும்புப் பொருட்கள் லொறி லொறியாக கொழும்புக்குக் கொண்டுவரப்படுகின்றன. இன்று அந்த மக்கள் வீதியோரங்களில் கொட்டகைகளிலே வாழ்கின்ற வர்களாக இருக்கின்றார்கள். இந்நிலையில், தற்பொழுது அவர்களுக்குக் கொடுப்பதற்காக இந்தியாவினால் வழங்கப்பட்ட tractorகள்கூட மீண்டும் பெறப்படுகின்ற ஓர் அவல நிலை ஏற்பட்டுள்ளது. ஆகவே, இந்த நாட்டை வளம்படுத்துகின்ற எங்களுடைய விவசாயிகளுக்கும் அவர்களுடைய குடும்பத்துக்கும் சமூகத்துக்கும் நல்லதொரு எதிர்காலத்தை உருவாக்க வேண்டு மென்றால், அவர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளைச் சரியானமுறையில் இனங்கண்டு, பேச்சளவில் மாத்திரம் நிறுத்திக் கொள்ளாது அவற்றுக்கான தீர்வுகளை நடைமுறைப்படுத்த வேண்டுமென்றும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Y.G. Padmasiri. Before that, will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to take the Chair?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)

I propose that the Hon. (Mrs.) Sriyani Wijewickrama do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු වයි.ජී. පද්මසිරි මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ. භා. 4.28]

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශාල ගොවි ජනතාවක් ජීවත් වන ප්‍රදේශයක් නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමියක් මූලාසනය හොබවන මේ අවස්ථාවේදී ගොවිජන සංවර්ධන සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම මහත් භාග්‍යයක් කොට මා සලකනවා.

1956 දී ලැබූ ජනතා ජයග්‍රහණයෙන් පසු මේ රටේ ඉහළම තැනක් හිමි වුණේ කුඹුරු පනතටයි. එය ජනතා හදවත් තුළට ඉතා තදින් දැනුණු දෙයක්. අද වන විට වසර 53ක් ගෙවිලාත් එහි නිර්මාතෘවරුන් අප ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. මේ කාරණය නිසා එම රජයේ නායකත්වය දැරූ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාට මෙන්ම පනතේ නිර්මාතෘ පිලිප් ගුණවර්ධන මැතිතුමාටත් ගොවි ජනතාව අතර විශාල ගෞරවයක් හිමි වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ තිබෙන ඉඩම් භුක්ති ක්‍රමයේ සුවිශේෂී අංගයක් තමයි අඳ අයිතිය. අප අසා තිබෙන විධියට මුල් යුගයේ ඒ අඳ අයිතිය කුඹුරට, අස්වැන්නට පමණක් සීමා වුණේ නැහැ. මේ පිළිබඳව ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ කථාවේදීත් ඉතාම පැහැදිලිව සඳහන් කළා.

[ගරු වයි.ජී. පද්මසිරි මහතා]

මේ ඉතිහාසය අප අමතක කරන්නට හොඳ නැහැ. කුඹුරු හිමියාගේ සියලු කටයුතුවලදී අඳ ගොවීන් වහල්භාවයට පත් වී සිටියා. පසු කාලීනව ඡන්ද ක්‍රමය ආවාට පස්සේ ඡන්දයත් කුඹුරු හිමියාගේ ඕනෑවට, ඔහුගේ බලපෑමට යටත්ව පාවිච්චි කරන්නට තරම් හැම පැත්තෙන්ම ඒ ගැතිභාවය තිබුණා. මෙයින් නිදහස් වුණේ 1958 කුඹුරු පනතත් එක්කයි. කුඹුරු පනතක් එක්ක තමයි සැබෑ මානව අයිතියත් එක්කම ගොවියකු වශයෙන් හිස එසවීමට අවස්ථාව ලැබුණේ. එදා අඳ ගොවීන් සහ කුඹුරු හිමියන් අතර තිබුණු ගැටුම්, ආරාවුල් දිගටම පැවතුණා. එම නිසා 1958 දී මේ නීති රීති සම්පාදනය කිරීමේදී කුඹුරු පනත මෙන්ම ඊට පසුව එයට එකතු වූ අනෙකුත් නීති අතරත් ගොවි ආරාවුල් විසඳීම පිළිබඳවත් විවිධ විනිශ්චය සභා ඇති කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවීන් අතර ප්‍රශ්න සුහදව සාකච්ඡා කර විසඳීමට එදා ගොවි කාරක සභා, පලදා වර්ධන කමිටු සහ ගොවිජන සංවර්ධන සභා ආදී වශයෙන් ආයතන පිහිටෙව්වා. ගොවි ජනතාවට මේවාට සම්බන්ධ වෙලා තමන්ගේ ප්‍රශ්න විසඳා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ඒ නීති රීති තුළ ඇති වුණා. ඒවායේ වර්ධනයක් තිබෙනවා.

2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ යම් ගැටලුවකට මුහුණ පෑවා. අද මේ සංශෝධනවලින් ඒ ගැටලුව සම්පූර්ණයෙන්ම වාගේ ඉවත් වෙනවාය කියන එක මා සන්තෝෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට සිටින අඳ ගොවීන්ගේ උරුමකරුවන් වෙත අනුප්‍රාප්තිය උරුම වීමට අවශ්‍ය පහසුකම් සැලසීම, ඒ වාගේම ත්‍රිපුද්ගල ගොවිජන විනිශ්චය සභා වෙනුවට ඒක පුද්ගල විනිශ්චය සභා පත් කිරීමට විධිවිධාන සැලැස්වීම, 2000 අගෝස්තු 18 දිනෙන් පසුව මිය ගිය අඳ ගොවීන්ගේ උරුමකරුවන් සම්බන්ධයෙන් අගතියට පත් වී සිටින අවස්ථාවේදී වන්දි ලබා දීමේ වැඩ පිළිවෙළක් ඇති වීම මේ සංශෝධනයේ ඇති ඉතාම අගය කළ යුතු අංශ තුනක්ය කියන එක මා සඳහන් කරන්නට ඕනෑ. මේ අයිතිවාසිකම් තහවුරු වනවාත් එක්කම සඳහන් කළ යුතු කරුණක්, දෙකක් තිබෙනවා.

මේ සම්බන්ධයෙන් ආරාවුල් ඇති වන කරුණු මොනවා ද කියා මා විමසා බැලුවා. ඒවා 5ක්, 6ක් සඳහන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කුඹුරු හිමියා සහ අඳ ගොවියා යන දෙපිරිස අතර නිතර ආරවුල් ඇති වෙලා තිබෙන්නේ ප්‍රවේණිය, එහෙම නැත්නම් අස්වනු ප්‍රමාණය දීම පිළිබඳ ප්‍රශ්නය නිසායි. එහෙම නැත්නම් අස්වනු ප්‍රමාණය අඩුවෙන් දුන්නාය කියන ප්‍රශ්නය නිසායි; ඒ ගැන සැක පහළ වීම නිසායි. ඒ වාගේම හතරෙන් පංගුව දෙකෙන් පංගුව කර ගන්නේ කොහොමද කියන එක රහස් ගිවිසුම් මඟින් යම් බලපෑමකට ලක් වෙලා සමහර වෙලාවට දෙකෙන් පංගුව ගැනීමට අඳ ගොවියාට සිද්ධ වෙලා තිබුණු අවස්ථා තිබෙනවා. ඒ නිසා තමයි ගැටුම ඇති වුණේ. ඒ වාගේම අඳ ගොවියා කුඹුරු ඉඩම අතුරු බදු දෙන අවස්ථා ඇති වෙලා තිබුණා. එම අවස්ථාවල ගැටුම් ඇති වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම කුඹුරට යන පාර අවහිර කරන එක සහ ජලය අවහිර කිරීමත් ගැටුම්වලට බලපෑවා. පසු ගිය වර්ෂයේ පමණක් මට අඳ ගොවි මහත්වරුන් දෙපොළකගෙන් පැමිණිලි ලැබුණා. කමතට යන්න තිබෙන පාර වැසීම සම්බන්ධයෙන් තමයි ඒ පැමිණිලි දෙකම ලැබුණේ. එවැනි අවස්ථාවක ගොවිජන සංවර්ධන සභාවට පැමිණිලි කළත්, ඒ පැමිණිල්ල විභාග කරලා පාර ඇරලා දෙන්නේ කන්නය අවසන් වුණාමයි. ගොවියාට අවශ්‍ය අවස්ථාවක නොවෙයි ඒක නිරවුල් වෙන්නේ. ඒ සිද්ධි දෙකේදීම ලොකු ප්‍රමාදයක් වෙලා තිබෙනවා මා දැක්කා. විනිශ්චය සභාව ඇත්තේත් නැහැ, ගොවිජන සංවර්ධන සභාවේ අදාළ නිලධාරීන් එම ප්‍රශ්න විසඳන්න මැදිහත් වෙන්නේ ඉතාම ප්‍රමාදකාරීවයි. ඉතාම නිද්‍රාශීලීවයි එම කටයුතු කෙරෙන්නේ. ගොවිතැන කියන එක අපට ඕනෑ හැටියට නොව, ස්වභාවධර්මයත්, ඒ වාගේම කාලයත් මුල් කරගෙන කරන දෙයක්. නිසි වෙලාවට පොහොර දැම්මේ නැත්නම් ඒකෙන් ප්‍රයෝජන ලැබෙන්නේ නැහැ වාගේම, ගොයම් කපා ගන්නා කාල සීමාව තුළ කමතට යන්න තිබෙන පාර අවහිර වෙනවා නම් ඒ කෘෂිකර්ම කටයුතුවලට ඒකෙනුත් වෙන්නේ දරුණු බලපෑමක්. ඒ නිසා අවශ්‍ය වෙලාවට ගොවියාට එම සහන සැලසෙන්න ඕනෑ. ඒ සඳහා විනිශ්චය සභා තුළින් සහ ඒ විනිශ්චයට යාමට පෙර ගොවිජන සංවර්ධන සභාව තුළින් එම ප්‍රශ්න සාමකාමීව විසඳලා දෙන්න මීට වඩා දැඩි සැලකිල්ල යොමු වෙන්න ඕනෑය කියන එක මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ඉතාමත් වැදගත් අදහසක් ප්‍රකාශ වුණා. ඒ කියන්නේ 2000 අංක 46 දරන පනත මඟින් ගරු අගමැතිතුමා එදා කෘෂිකර්ම ඇමතිතුමා හැටියට ගැබ් කරලා තිබුණේ අඳ ගොවියා කුඹුරු හිමියා කරන්න ඕනෑය කියන මූලධර්මයයි. ඒක තමයි ඉතාම ප්‍රගතිශීලී තත්ත්වය. අපි ඒ පැත්තට යන්න ඕනෑ. අඳ ගොවියාගේ අයිතිය අපි තහවුරු කරලා දුන්නත්, අඳ ගොවියා කුඹුරු හිමියා කරලා තමන්ගේම කුඹුරේ වැඩ කරන තත්ත්වයක් ඇති වෙන්න ඕනෑය කියන එක අපි කවුරුත් පිළිගන්නවා.

ඒක තමයි මේ යුගයට ගැළපෙන්නේ. ඒක තමයි අනාගතයට ගැළපෙන්නේ. අද කුඹුරුවල තිබෙන ඵලදායීත්වය තවත් වැඩි කර ගන්න එතුමාගේ අදහස ඉතාම වැදගත් වෙනවා. නමුත් පසු ගිය කාලයේත් යම් යම් අවස්ථාවල ඊට සමගාමීව කරුණු රාශියක් සිද්ධ වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ගැන සඳහන් නොකර කථා කළොත් ඒක ලොකු අසාධාරණයක්. 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත නිසා කුඹුරු අයිතිය අක්කර 25ට සීමා වුණා. ඒ සිද්ධ වුණු පෙරළිය ගැන අපි ආපසු හැරී බැලුවොත්, මා හිතනවා ඒකේ වටිනාකම වැඩියි කියලා. අක්කර 25කට වැඩි කුඹුරු අයිතිකාරයෙක් නැහැ; අක්කර සිය ගණන් තිබෙන අය නැහැ. ඒ නිසා කුඹුරු හිමියන්ගේ ශක්තිය අඩු වුණා විතරක් නොවෙයි, ඒ යටතේ රජයට පැවරුණු කුඹුරුවල සිටි අඳ ගොවීන් බොහෝ දෙනෙකුට අඳ අයිතිය වෙනුවට එම කුඹුරුවල අයිතිය ලැබුණා. මා හිතන හැටියට වැවිලි සංස්ථාවේ සහ එම ඉඩම් සීමාවට යටත් වුණු අනෙක් කුඹුරුවලත් ඉතාම සුළු ප්‍රමාණයයි ඉතුරු වෙලා තිබෙන්නේ. එම පනත නිසා වැඩි දෙනෙකුට අඳ අයිතියෙන් කුඹුරක අයිතිකරුවෙක් වෙන්න වාසනාව උදා වුණා. ඒ නිසා අද සම්මත කරන මෙම සංශෝධනත් සමඟ ඉදිරි කාලයේදී අපේ අඳ ගොවියා තව තවත් ශක්තිමත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තවත් වැදගත් පියවරක් වන අඳ ගොවියා කුඹුරු හිමියා කිරීමේ කටයුත්තට ඉතාම සැලකිලිමත්ව පාර්ලිමේන්තුවේ වැදගත් ඉහළ කමිටුවක් මඟින් කරුණු සොයා බලා ඉදිරි පියවරක් ගැනීමටත් රජයට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මෙම පනතට අපේ සැම සහයෝගයක්ම ලබා දෙන බවත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 4.37]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගැන කරුණු දක්වන්නට පෙර, මීට ප්‍රථමයෙන් සිදු වුණු විවාදයේ කරුණු දෙකක් නිවැරදි කරන්නට අවශ්‍යයි. එකක්

ෂැන්ග්‍රි-ලා හෝටලය ගැන. ඒ ගැන මේ සභාවේ හුහක් සාකච්ඡා වුණා. විශේෂයෙන්ම එහි වර්ගීකරණයන් පිළිබඳව මම අද වෙබ් අඩවියෙන් සොයා බැලුවා. ආසියාවේ උසස්ම ගණයේ තිබෙන හෝටල් අතර ෂැන්ග්‍රි-ලා හෝටලය තිබෙන්නේ කොතැන ද කියලා සොයලා බැලුවා. ඒ උසස්ම හෝටල් අතර බැලුවාම චීනයේවත්, ඉන්දියාවේවත්, සිංගප්පූරුවේවත්, ටෝකියෝ නුවරවත් තිබෙන උසස්ම ගණයේ හෝටල් අතරට එන්නේ නැති වුණාට, එය හොංකොං නුවර නම් උසස්ම ගණයේ හෝටලයක් හැටියට සඳහන් වනවා.

දැන් අපේ ගරු නියෝජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා සඳහන් කළා, ඒක තරු හයේ හෝටලයක් කියලා. මම හිතන විධියට තරු පහට වඩා වැඩි හෝටල් තිබෙනවාද, තරු හයේ ඒවා, හතේ ඒවා තිබෙනවාද කියලා ලෝකයේම විශාල වාද විවාදයක් තිබෙනවා. මම මේක කියන්න හේතුව මේකයි. අපි යම් හෝටලයක් තරු පහේ එකක් හරි තරු හයේ එකක් හරි, තරු හතේ එකක් හරි කියලා හිතා ගෙන යම් කිසි ගිවිසුම්වලට ඇතුළු වුණොත්, සමහර වෙලාවට ඕනෑවට වඩා බදු සහන දෙන්නත් පුළුවන්. මෙම විවාදය තුළ කවුරුවත් අසත්‍ය කිව්වේ නැහැයි කියලා ඇමතිතුමා කිව්වා කියලා මා දන්නවා. ඉතින් ඒකෙන් අපට නිගමනය කරන්න වන්නේ එක්කෝ අසත්‍ය කිව්වා කියලායි. අසත්‍ය කිව්වේ නැහැයි කියලා පිළිගන්නවා නම්, නොදැනුවත්කමින් කිව්ව දෙයක් ද දන්නේ නැහැයි කියලා නිගමනය කරන්න වනවා. ඇත්තටම ඒ ෂැන්ග්‍රි-ලා හෝටලයේම වෙබ් අඩවියට ගියොත් ඒ වෙබ් අඩවියේ මුල් පිටුවේම සඳහන් කර තිබෙනවා, ෂැන්ග්‍රි-ලා හෝටලයත් තරු පහේ හෝටලයක් කියලා. නිවැරදි කිරීමක් හැටියටයි මම ඒක කියන්නේ. මොකද, අසත්‍යයක් නොවෙයි නම් නිවැරදි කිරීමක් හරි කරන්න ඕනෑ. මොකද, අපි ගිවිසුමකට ඇතුළු වෙන කොට සෑම කරුණක්ම ඒ නියෝජ්‍ය ඇමතිතුමා දැන ගෙන ඉන්න අවශ්‍යයි කියලා මම හිතනවා.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர் )
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)
ඔහොම යන කොට තරු පෙනෙයි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
දෙවැනි නිවැරදි කිරීම වන්නේ,- [බාධා කිරීමක්] බොහොම හොඳයි. ඒක කියපු නිසා මම මේ ටිකත් කියන්න අවශ්‍යයි. පිට රටවලින්ම වර්ග -brand- අවශ්‍ය නැහැ, මේ රටේත් හුහක් උසස් වර්ග -brands- තිබෙනවා. මේ රටේ හෝටල් තිබෙනවා. හෙරිටන්ස් හෝටලය අහුංගල්ලේ තිබෙනවා. කණ්ඩලම හෝටලය තිබෙනවා. සිනමන් හෝටලය තිබෙනවා. අමානා හෝටලය තිබෙනවා. මේ වාගේ හුහක් හොඳ ඒවා මේ රටේත් තිබෙනවා. නමුත් මම කියන්න හදන්නේ ෂැන්ග්‍රි-ලා මේ කියන තරම් ඉස්තරම් වර්ගීකරණයක් තිබෙන හෝටලයක් නොවෙයි කියන කරුණයි. [බාධා කිරීමක්] තවත් නිවැරදි කිරීමක් කරන්න අවශ්‍යයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)ඉ
(The Hon. Alhaj A.H.M. Azwer)
තමුන්නාන්සේ දන්නවාද-

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
තවත් නිවැරදි කිරීමක් කරන්න අවශ්‍යයි,- [බාධා කිරීමක්] මේ සාකච්ඡාව යන වෙලාවේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථා කරන කොට විශේෂයෙන්ම හම්බන්තොට වරාය ගැන සඳහන් කළා. එතකොට කිව්වා හම්බන්තොට වරායේ දෙවැනි අදියරටත් අත්සන් තැබුවා කියලා. ඒ අවස්ථාවේදී ගරු රෝහිත අබේගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා, එහෙම එකක් වෙලා නැහැයි කියලා. ඇත්තටම ඒක නිවැරදි කරන්න අවශ්‍යයි. ආයෙත් ඔබටම තීරණය කරන්න පුළුවන්, ඒක අසත්‍යයක් ද, නැත්නම් නොදැනුවත්ව කියපු දෙයක් ද කියන එක. මොකද, මේ China Harbour Engineering Company Limited එකේ වෙබ් අඩවියට දැන් ගියොත් එතැන සඳහන් කර තිබෙන කරුණු දැන ගන්න පුළුවන්. ඒ වෙබ් අඩවියෙන් කොටසක් මම කියවන්නම්.

එහි මෙසේ සඳහන් වනවා:

"CHEC SIGNED THE CONTRACT FOR HAMBANTOTA PORT PHASE II PROJECT IN SRI LANKA

CHEC has now formally signed the EPC contract on Sri Lankan Hambantota Port Development Phase II Project with Sri Lanka Ports Authority (SLPA). The value of the contract is around $810 million, with construction duration of 36 months."

More details are given here. I quote further:

"The project mainly includes four 100,000DWT container berths, one 100,000-ton oil wharf, two 30,000-ton branch line berths, harbour basin of 490,000m2 to be shared by Phase II and Phase III projects, one offshore man-made island, roads and yards of 400,000m2 and so on."

I would like to table* this MoU only because the Deputy Minister made an incorrect statement in the House either without his knowledge or he was uttering an untruth. You can determine whichever, and therefore, I would like to correct that situation by tabling this in the House.

Now, I would like to proceed with my speech talking about a few other matters. මම මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ තව කරුණු කීපයක් කියන්න කැමැතියි. අද, BOI එකෙන් දෙන බදු සහන අයින් කරලා, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ කියලා නව ක්‍රමයකට බදු සහන දීගෙන යන බව අපි දන්නවා. සංකීර්ණ බදු ක්‍රමය සරල කිරීමටත්, අහෝසි කරන්නට පුළුවන් බදු අහෝසි කිරීමටත් මහාචාර්ය ලක්ෂ්මන් මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කොමිෂන් සභාවක් තිබුණා. මම හිතන අන්දමට මේ ගැන දීර්ඝ කාලයක් සාකච්ඡා කළා. ජාත්‍යන්තර ගිවිසුම්වලට යන කොට මේ බදු ප්‍රශ්නයක් වෙලා තිබෙන නිසා, ඒවා ගැන දීර්ඝ කාලයක් සාකච්ඡා කරලා යම් කිසි මූලධර්ම කීපයක් ඒ කොමිෂන් සභාව ඉදිරිපත් කළා. ඒ මූලධර්මවලින් එකක් ලෙස සඳහන් කරනවා, ඕනෑම ව්‍යාපාරයකට තරග කරන්නට එක හා සමාන විධියට තිබීම අවශ්‍යයි කියලා. එක හා සමාන විධියට තිබුණොත් තරග කරන්න පහසුයි කියනවා. අපට පෙනෙනවා, මේ BOI ක්‍රමයේ යම් කිසි විනිවිදභාවයක් තිබෙනවා කියලා. මොකද, ඕනෑම කෙනෙකුට දැන ගන්නට පුළුවන්, හරියටම කොහොමද මේ සහන දෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නමුත් මේ අලුත් ක්‍රමයට අනුව එක එක ව්‍යාපෘති, එක එක්කෙනා යෝජනා කරනවා. ඒවා පිළිබඳව සාකච්ඡා තියනවා. ඒ සාකච්ඡාවල විස්තර හැම එක්

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

කෙනාටම දැන ගන්න විධියක් නැහැ. BOI එකෙන්, ආදායම් බදු සහන, රේගු බදු සහන ලැබුණා නම් ඒවාත්, විනිමය පාලන පනතෙන් යම් කිසි සහන ලැබුණා නම් ඒවාත් ලැබෙන බව මේ ගැසට් පත්‍රය අනුව අපට පෙනෙනවා. නමුත් දැන් ඒ රේගු රෙගුලාසි, ආදායම් බදු රෙගුලාසිවලට අමතරව, ආර්ථික සේවා ගාස්තුවලින්, වරාය හා ගුවන් තොටු පොළ සංවර්ධන බදුවලින්, ජාතිය ගොඩනැඟීමේ බදුවලින් සහ වෙනත් නොයෙකුත් බදුවලින් යම් කිසි සහන දී ගෙන යනවා. මම මෙතැන කියන්න හදන්නේ මේකයි. ගිය අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට බදු සරල කිරීම පිළිබඳව යම් කිසි ප්‍රතිපත්තියක් ඉදිරිපත් කළා. නමුත් මම හිතන අන්දමට ඒක මෙතැන සිදු වන්නේ නැහැ. ඒ වාගේම මේ දෙන සහන දීර්ඝ කාලීනයි. අද විවාදයේදී අපට දැන ගන්නට ලැබුණා, වියට්නාමයේ මේ සහන දෙන්නේ අවුරුදු පහකට විතරයි කියලා. නමුත් ලංකාවේ දෙන සමහර සහන කෙටි කාලීන වුවත්, සමහර සහන දීර්ඝ කාලීනයි.

අද ලෝකය විදේශීය ආයෝජන ලබා ගැනීමේදී සහන ක්‍රමයෙන් ගොඩක් ඈත් වෙලායි ඉන්නේ. ඒක 1970 ගණන්වල, 1980 ගණන්වල තිබුණා. නමුත් අද එයින් ගොඩක් ඈත් වෙලා ඉන්නේ. වෙන වෙන ක්‍රමවලට තමයි මේ ආයෝජනය ලබා ගන්නේ. ඉතින් මම අහන්නේ, අපට මේ වාගේ විදේශීය ආයෝජන ලබා ගන්න තිබෙන අපහසුතාව මොකක්ද, මෙවැනි විශාල සහන දෙන්න අවශ්‍ය ඇයි කියලායි.

පසු ගිය අගෝස්තු මාසයේ 10 වන දා මෙතැන විවාද කරන කොට කෙයාන් සමාගම ගැන කිව්වා. ඒ අවස්ථාවේදී ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඒ සහනය ගැන කථා කරලා කිව්වා, ඒ කෙයාන් සමාගමට දෙන සහන අනුව, අනාගතයේදී තෙල් ලැබුණොත් සමහර විට එයින් සියයට 10ක විතර ලාභයක් තමයි අපට ලැබෙන්න යන්නේ කියලා. සහන දුන්නේ නැත්නම් සියයට 38ක් 40ක් විතර ලැබෙයි කියලා කිව්වා. ඒ අවස්ථාවේදීත් ඇමතිතුමා කිව්වා, "නැහැ, නැහැ. අපි මේවා කරලා තිබෙන්නේ යම් කිසි ජාත්‍යන්තර ගිවිසුම් අනුවයි" කියලා. කොයි රටේද මේ වාගේ සහන දීලා තිබෙන්නේ, මේ ජාත්‍යන්තර ගිවිසුම් පිළිබඳව අපව දැනුවත් කරන්න පුළුවන්ද කියලා අවසානයේදී පිළිතුරු කථා කරන කොට කියන්න පුළුවන්ද කියලා මම අහන්න කැමැතියි. අපේ ගරු මන්ත්‍රීවරු අද කථා කරන කොට අනෙක් රටවලින් දෙන සහන ගැන කථා කළා. නමුත් මේ වාගේ සහන දෙන බවක් අපට නම් පෙනෙන්න නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට ප්‍රථමයෙන් මේ විනිවිදභාවය ගැන කථා කරන කොට මම කිව්වා, TGS-NOPEC සමාගමේ තෙල් ගවේෂණ සම්බන්ධයෙන්. ඒ සමීක්ෂණ කරන කොට අපි 2002 දී ඒ අය සමඟ ගිවිසුමකට ඇතුළු වුණා. ඒ ගිවිසුම අනුව ඒ අයට අවස්ථාව ලැබුණා, ඒ ලබා ගන්න දත්ත වෙන සමාගම්වලට විකුණන්න. ඔවුන් එය සමාගම් දෙකකට විකුණුවා. එයින් ඩොලර් මිලියන දෙක ගණනේ ඩොලර් මිලියන හතරක් ලබා ගත්තා.

ඒ ගිවිසුම අනුව අපට ඒකෙන් ලාභයක් ගන්නට පුළුවන්කම තිබුණා. නමුත් ඊට පස්සේ අපි මොනවාද කළේ? අපි ගිහිල්ලා ඩොලර් මිලියන10ක් ගෙවලා ඒ සමාගමෙන්ම ඒ දත්ත ගත්තා. ඒ දත්තවලට අද මොනවාද වෙලා තිබෙන්නේ? කොහොමද ඒ දත්ත පාවිච්චි වෙන්නේ? අපිට ලැබිලා තිබෙන තොරතුරු අනුව ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර computersවල තමයි ඒ දත්ත ගබඩා කරලා තිබෙන්නේ. ඉතින් අපි මේ ක්‍රමයට විරුද්ධ මේකේ විනිවිදභාවය අඩු නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද හුඟක් සාකච්ඡා වුණා, ඉඩම් විකිණීම පිළිබඳව. මේ සභාවේ ඒ ගැන මීට පෙරත් සාකච්ඡා කරලා තිබෙනවා; අවුරුදු පනහකටත් වැඩිය සාකච්ඡා කරලා තිබෙනවා. මේ රට කුඩා දූපතක්. මේ රටේ ඉඩම් පිළිබඳව විශාල සටටන තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ පක්ෂ භේදයෙන් තොරව අපි යම් කිසි සම්මුතියකට එන්න අවශ්‍යයි මේ රටේ ඉඩම් පිළිබඳව. අද මම සන්තෝෂ වුණා, රජයෙන් ඉඩම් විකුණන්නේ නැතුව අවුරුදු 99ක බද්දකට දෙන්න ලෑස්තියි කියන අදහස ඉදිරිපත් වුණ නිසා. මම හිතන්නේ එක හුඟක් හොඳ දෙයක් කියලායි. නමුත් අවුරුදු 99කටම බද්දට දෙන එක හරියට විකුණනවා වාගේම වැඩක් කියලා කියන්න පුළුවන්. බදු කාලය ඊට වඩා හුඟක් කෙටි කාලීන වෙන්න ඕනෑ. මොකද, ව්‍යාපෘතියේ ලාභ අලාභ හොයලා ඒ ව්‍යාපෘතියේ evaluation එක කරන කොට ඊට වැඩිය කෙටි කාලයකට දෙන එක යෝග්‍යයි. අපිට ඒ පිළිබඳ තව උදාහරණ ලබා ගන්න පුළුවන් ආසියාවේ තිබෙන රටවලින්. ඒ නිසා අවුරුදු 33ක හෝ 50ක බද්දට දෙන්න පුළුවන් කියන එක මම සඳහන් කරනවා.

විශේෂයෙන්ම මේ රටේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා අවුරුදු ගණනාවකට උඩදී ජෝන් කීල්ස් සමාගම අක්කර 8ක ඉඩමක් ලබා ගත්තා කියලා. ඒක උසාවිය දක්වා ගිහිල්ලා උසාවිය යම් කිසි තීරණයක් දුන්නා. ඒ තීරණයේ කොටසක් මේ ගරු සභාවට මම කියවන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වෙනවා:

"The purpose for which it was acquired being solely to serve the public purpose......" I am sorry, this is not about that, this is about the other land that was sold. There were two land cases. One was the John Keells case and the other was the Waters Edge case. The instrumental thing that I am trying to point out is that even the court was sensitive to the sale of lands. That is what I am basically bringing to the notice of this House. It states:

"The purpose for which it was acquired being solely to serve a public purpose, was to serve the needs of the general public as distinct from the elite's requirements or a relatively small segment of society in Sri Lanka".
It further states:

"The enactment of laws to allow for such land acquisition was only done because of a legislative belief that private ownership in Sri Lanka is the subject to the paramount, essential and greater need to serve the general public, a significant segment who lack even basic living amenities like running water, electricity and housing."

In this context, Parliament should be wary of ratifying a project which rests on murky land transactions.

මේ උසාවි තීරණයෙන් කියන්න හදන්නේත්, මේ පනතෙත් කියලා තිබෙන්නේත්, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති හැටියට සඳහන් වෙන්නේ මහ ජනතාවගේ යහපත සඳහා වන යෝජිත භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් සැලකිය යුතු ප්‍රමාණයකින් විනිමය ගලා ඒමත්, සැලකිය යුතු ප්‍රමාණයේ රැකී රක්ෂා තිබීමත්, ඒ වාගේම තාක්ෂණය පිළිබඳව අපේක්ෂිත සුබවාදී පරිවර්තනයක් ඇති වීමත් සිදු වන ව්‍යාපෘති කියන එකයි. විශේෂයෙන්ම මම හිතන හැටියට ඉඩම් පිළිබඳව කටයුතු කරන කොට, ඒක බොහොම විනිවිදභාවයෙන් වෙන්න අවශ්‍යයි, ඒ වාගේම ඒක අපේ ජාතික ප්‍රතිපත්තියක් අනුව සිදු වෙන්න අවශ්‍යයි. මට පෙනෙනවා ඒ අතට කටයුතු සිදු වෙනවා කියලා. අපි ඒකට ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නඟන්න අවශ්‍යයි.

Finally, I would like to speak a few words about investment in general. We know that it is two years since the military conflict ended. But, even though the military conflict ended two years ago, we see that foreign investment, whether it is FDI or Portfolio Investment, is basically only trickling into the country. In the year 2009, we had about US Dollars 600 million of Foreign Direct Investment. In the year 2010, we had about US Dollars 500 million of Foreign Direct Investment. This year, the number is higher and we are waiting to know the exact number but we have to disaggregate that Foreign Direct Investment from the sale of assets. We have to compare like with like; mangoes with mangoes. That is the only way we will really understand if we are actually attracting increasing numbers of Foreign Direct Investment. We know that the world presently is going into another crisis. In the first part of 2011, from January to June, Foreign Direct Investment in the world increased. In 2010, it was US Dollars 1.24 trillion but it was projected to be US Dollars 1.6 trillion. In the first six months of the year, it did well and it was about 30 per cent. But, suddenly it is falling off because of the European crisis and a new banking crisis being developed in the Western world. So, we know that we are going into a difficult environment. The first thing to have fallen off in this environment is basically the greenfield projects and in the last quarter, two-thirds of all greenfield projects in the world came to less developed countries like ours. Those have rapidly fallen off. So, we are in a difficult situation.

However, India, in the first quarter of 2010, attracted US Dollars 12.3 billion and it went up to US Dollars 17.8 billion in the same quarter of this year. South Africa went from US Dollars 600 million - something like ours - to US Dollars 2.5 billion this year in that quarter. China increased from US Dollars 10 billion to US Dollars 61 billion. Russia went from US Dollars 4 billion to 23.4 billion Dollars and Brazil, is the same. We know that Sri Lanka has got a small incremental amount of Foreign Direct Investment. We have to disaggregate it for the sale of lands to find out whether there is actually an increase. But, if you look at Portfolio Investment, you will see that there is a net outflow in investments coming in and investments going out because of sales and also of profits and dividends. There was a net outflow in 2009 of about US Dollars 160 million or Rupees 17 billion. In the year 2010, there was an outflow of nearly US Dollars 250 million or Rupees 26 billion. So, if you look at the net amount of foreign investment coming into the country, in 2009, it is about US Dollars 350 million and in 2010, it is about US Dollars 250 million and it will be interesting to see what the figure is going to be in 2011 because there is a net outflow of Portfolio Investment that is going basically out of the country.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාගේ කාලය අවසානයි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම විනාඩියකින් අවසන් කරනවා.

So, obviously the country has a problem. It is not only in Foreign Direct Investment but even in Portfolio Investment. If you examine what is happening in the Stock Market, Sri Lankans are buying shares. We are all for it. But, we need to understand that that is a dangerous argument because even the Appropriation Bill that has been presented to Parliament for 2012 shows that there are expenditures of about Rs. 2,200 billion while the income is about half of it. There is a big gap. That gap has to be serviced, as a Government Member said today, by attracting foreign investment. So, when we see that the Government funds are being used to purchase stocks in the share market, there is a problem because you have crowded out some foreign investment that can come into the market. The biggest problem is that Government institutions are buying shares beyond the economic value of those shares. Therefore, there is reason to believe that there may be some investigation needed. The Governor of the Central Bank today says "EPF is well managed, not corrupt". I am very glad to hear that from the Governor of the Central Bank and I shall certainly frame this and keep it for the future. We need to be careful; the high prices are dangerous.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දී ඇති කාලය අවසානයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමාට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමාට මාගේ කාලයෙන් විනාඩි පහක් ලබා දෙන්න.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
බොහොම ස්තුතියි. The high prices which are not market-driven are dangerous. Insider trading is a crime and therefore we know that the largest hedge fund manager has been sent to prison. Insider trading is a crime but if people are using EPF funds in the process of that trading, it is even a bigger crime than insider trading because EPF belongs to the common people of this country, to the average worker of the country. Insider trading in other countries have depended on their private funds. But, this is about public funds and therefore we need to be careful. We need to remember that we should

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

not allow this to happen. Remember this. Even in the future, those who abuse the EPF will be punished if they are found guilty because these are public funds of the country. It may look distant but we should make no mistake; not only blue-collar crime but white-collar crime will also be punished.

Thank you.

[අ. භා. 5.00 ]

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දිනයේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් කිහිපයක් සහ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ගැනෙනවා. අද ගොවීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව වචන කිහිපයක් කථා කිරීමට මා බලාපොරොත්තු වනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුති වන්ත වනවා.

1958 පිලිප් ගුණවර්ධන මැතිතුමා එදා තිබුණු පන්ති භේදය දුරලා අහිංසක, දුප්පත් අද ගොවීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන්න පනතක් ගෙනාවා. අපි දන්නවා, අපට අහන්න ලැබෙනවා, ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ජෝර්ජ් රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් විශේෂයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රථමයෙන්ම මේක ක්‍රියාත්මක කරලා අද ගොවීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කළ බව. 2000 වසරේදී ඉදිරිපත් වූ පනත් කෙටුම්පතේ අද ගොවීන්ගේ අනුප්‍රාප්තිය පිළිබඳව කිසිම සඳහනක් නොවීම පිළිබඳව අපේ ගම් ඇතුළුව රටේ සෑම ගමකම අද ගොවීන් තුළ යම් කිසි කනස්සල්ලක් දකින්නට ලැබුණා.

රටක් විධියට ත්‍රස්තවාදය පරාජය කරලා, මහා දැවැන්ත සංවර්ධනයක් කරා, ආර්ථික සංවර්ධනයක් කරා රට ගමන් කරන වකවානුවකදී උතුරේ, දකුණේ, නැඟෙනහිර සහ කඳුකරයේ ජීවත් වෙලා ඉන්න සෑම පුරවැසියෙක්ම මේ වන විට නිදහස භුක්ති විඳිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ඔවුන් මේ රටේ සංවර්ධනයේ කොටස්කරුවන් බවට පරිවර්තනය වෙලා ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම වෙනුවෙන් ඔවුන්ගේ හෙට දවස පිළිබඳව සුබවාදී ආකල්ප ඇතිව අපේක්ෂා සහගතව ජීවත් වන යුගයක් මේක.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අපේ අහිංසක, දුප්පත් දෙමවුපියන් ඇතුළු ලංකාවේ අනෙකුත් දිස්ත්‍රික්කවල අද ගොවීන්ගේ අනුප්‍රාප්තිකයන්ට, දරුවන්ට තමන්ගේ අනාගතය පිළිබඳව බලාපොරොත්තුවක් තබා ගත නොහැකි කාලයක් තිබුණා. මේ පිළිබඳව නොයෙක් දෙනා නොයෙක් අවස්ථාවලදී කථා කළා. නොයෙක් අදහස් සහ නොයෙක් යෝජනා ඉදිරිපත් කළා. අතිගරු ජනාධිපතිතුමා මේ රට ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම සඳහා ගොවියාගේ, ධීවරයාගේ සහ කම්කරුවාගේ ආර්ථිකය ශක්තිමත් කරන විට, අද ගොවීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ඔවුන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමට ගනු ලැබූ මේ තීන්දුව නිසා නිරන්තරයෙන් මේ රටේ සෑම ගමකටම ගිහින් කථා කරන විට ඒ දෙමවුපියන්ගෙන් නිතර අහන්න ලැබුණ ගැටලුවකට විසඳුමක් ලැබීම පිළිබඳව තරුණ මන්ත්‍රීවරයෙක් විධියට මා ප්‍රථමයෙන්ම විෂය භාර ගරු අමාත්‍යතුමාටත්, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත් ස්තුතිවන්ත වනවා.

මට මතකයි වසර කිහිපයකට පෙර මමත්, ගරු කථානායකතුමාත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාමයේ එක්තරා ගමක සංවර්ධනය ගැන කථා කරන රැස්වීමකට ගිය වෙලාවකදී ඒ ගමේ එක්තරා කාන්තාවක් ඇවිල්ලා ඇයගේ ඉඩම පිළිබඳව, අද ගොවීන්ගේ අයිතිවාසිකම් පිළිබඳව අඬ අඬා කථා කළා. මුළු පවුලක්ම යැපුණු ගොවි බිම ඔවුන්ට, ඔවුන්ගේ දරුවන්ට අහිමි වීම පිළිබඳව මහා කනස්සල්ලකින් එදා ඒ මැණියන් කථා කළා. මම හිතන්නේ ගරු කථානායකතුමා මේ පාර්ලිමේන්තුව තුළත්, අමාත්‍යවරයා සමඟත් නිරන්තරයෙන් ඒ සම්බන්ධව සාකච්ඡා කරලා මේ පිළිබඳව තීන්දුවක් ගන්න රැස්වීම් මාලාවන් කිහිපයක් පැවැත්වූවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී එතුමාටත් මාගේ ස්තුතිය පුද කරනවා. රටක් විධියට අපි සංවර්ධනය වන විට, ජාතියක් විධියට අපි නැඟී සිටින විට, මේ රටේ සෑම ක්ෂේත්‍රයක්ම සංවර්ධනය කළ යුතුයි. අපි දන්නවා "දිවි නැඟුම" වැඩසටහන හරහා ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කරන බව. ඒ වාගේම පාසල් දහසේ යෝජනා ක්‍රමය හරහා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ශක්තිමත් කරනවා.

අද ධීවර කර්මාන්තය, මිරිදිය ධීවර කර්මාන්තය ශක්තිමත් කරනවා. ඔවුන්ගේ අනාගතය පිළිබඳව සුරක්ෂිතභාවයක් ඇතිව, හෙට දවස පිළිබඳව බලාපොරොත්තුවක් ඇතිව, දේශපාලන චින්තනයක් ඇතිව ඒ යන්නා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. ඒ වැඩ පිළිවෙළ තුළ මේ රට ආර්ථික වශයෙන් ශක්තිමත් වෙන කොට, මේ රට දේශපාලනික වශයෙන් ශක්තිමත් වෙන කොට මේ රටේ සෑම තරුණයෙක්ම, තරුණියක්ම අධ්‍යාපනයෙන් ඉහළට යනවා වාගේම, ගොවිතැනෙන්, ධීවර කර්මාන්තයෙනුත් ඉහළට යන්න පුළුවන් පරිසරය නිර්මාණය කළ යුතුය කියන එක තමයි අප විශ්වාස කරන්නේ. අද ගොවියා කාර්මික යුගය කරා ගමන් කරන්න ඕනෑ. අප ඔවුන්ට නව අධ්‍යාපනය, තාක්ෂණය ලබා දෙනවා. ඔවුන්ගෙන් මේ රටට ලැබෙන දායකත්වය වාගේම ඔවුන්ගේ අයිතිවාසිකම් අප නිරන්තරයෙන්ම ස්ථාවර කරන්න ඕනෑ. එවැනි වැඩ පිළිවෙළක් අද අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ රජය විසින් ක්‍රියාත්මක කිරීම මා හිතන්නේ අප කවුරුත් දේශපාලන පක්ෂ භේදයකින් තොරව සතුටු වෙන්න ඕනෑ කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද වරායවල්, ගුවන් තොටු පොළවල් හැදෙනවා. කෙතරම් පුද්ගලයන් මොනවා කිව්වත්, අද මේ රට තුළ සංචාරක ව්‍යාපාරය දියුණු වෙනවා. නව ආයෝජකයන් උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල පවා නව සංචාරක හෝටල් ඉදි කිරීමේ වැඩ පිළිවෙළ අද ආරම්භ කර තිබෙනවා.

අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා නැඟෙනහිර ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය පිළිබඳව, දකුණු ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය පිළිබඳව නිරන්තරයෙන් කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතින් මා හිතන්නේ මේ කාල සීමාව තුළ අප පටු දේශපාලන අරමුණ දැරිය යුතු නැහැ කියලායි. ගොවීන්ගේ අයිතිවාසිකම් රැකීම වාගේම එදා තිබුණු පන්ති භේදය දුරලලා අද ගොවීන්ගේ අයිතිවාසිකම් තහවුරු කළා වාගේ, අද අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කරනවා. ඒ යන්නා වූ ගමනේ තවත් එක් පියවරක් විධියට අද ගොවීන්ටත්, ඔවුන්ගේ දරුවන්ටත් සුරක්ෂිත හෙට දවසක් බිහි කිරීම සඳහා ගන්නා මේ ඒ තීන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාම ඒකරාශී වෙන්න කියලා ඉල්ලා සිටිමින්, ඒ සඳහා ඔබතුමන්ලාට ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

[අ. භා. 5.07]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ආර්ථික සංවර්ධනය මූලික කර ගත්ත නීති, රෙගුලාසි පැනවීම කාලීන අවශ්‍යතාවක්. රජයක් හැටියට දේශපාලනික වශයෙන් රටේ ආර්ථික සංවර්ධනය මූලික ප්‍රතිපත්තියක්, මූලික අවශ්‍යතාවක්ය කියන කාරණය ගැන කිසිදු සැකයක් නැහැ. මේ රටේ ආයෝජනවලට සුදුසු පරිසරයක් ගොඩ නංවන්න දේශීය ආයෝජකයන් වාගේම විදේශීය ආයෝජකයනුත් මේ රටට අරගෙන එන්නට අවශ්‍ය කරන, සුදුසු ව්‍යාපාරික පරිසරයක් රට තුළ තිබිය යුතුයි. පසු ගිය කාලයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ හිටපු ප්‍රකටම hedge fund ව්‍යාපාරිකයා වන, අපේ හිතවත් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉගෙන ගත් ශාන්ත තෝමස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක් වන රාජ් රාජරත්නම් මහත්මයා ඒ කාලයේ අපේ රටේ බොහෝ දෙනෙක් ආදර්ශයට ගත්ත පුද්ගලයෙක්. නමුත් අවසානයේ වැරැදි ක්‍රියාමාර්ගවලට ගිහිල්ලා, රෙගුලාසිවලට පටහැනිව ව්‍යාපාර කටයුතු කරලා එහි ප්‍රතිඵලයක් විධියට ඔහු වසර 11ක් සිර ගෙට නියම වුණා. නීති කඩන මිනිස්සුන්ට, නීති කඩන ව්‍යාපාරිකයන්ට, නීති කඩන ආයෝජකයන්ට දඬුවම් දෙන එක යහපත් නීති පද්ධතියක ලක්ෂණයක්. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, මේ අවශ්‍යතාව මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් පිළිගත්තා. මහින්ද චින්තන ඉදිරි දැක්මේ කියනවා, මේ රටේ අල්ලස හා දූෂණය මැඩලීම සඳහා නව නීති ගෙන ඒම ප්‍රමුඛ අවශ්‍යතාවක් විධියට හඳුනාගෙන තිබෙනවා කියලා.

එහෙම කියලා පොරොන්දුවක් දෙනවා, “නව පාර්ලිමේන්තුවේ පළමු පනත ලෙස අල්ලස හා දූෂණය මැඩලන නව පනතක් ගෙන ඒම්.”කියලා. ඒක බොහොම නිශ්චිත පොරොන්දුවක්. ඉතාම ප්‍රගතිශීලී පොරොන්දුවක්. මොකද එක අතකින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පරාසය ඉතාම පටුයි. අනෙක් අතට එම කොමිසමට ඇති බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රායෝගික දුෂ්කරතා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, එවැනි පරිසරයක් තුළ අල්ලස හා දූෂණය මැඩලන නව පනතක්, නව පාර්ලිමේන්තුවේ පළමු පනත ලෙස ගෙන එනවාය කියලා මහින්ද චින්තන ඉදිරි දැක්ම මඟින් ගරු ජනාධිපතිතුමා පොරොන්දු වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තු සැසිවාරය පටන් අරගෙන දැන් වසර එකහමාරකටත් වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළා. අලුත් පනත් කෙටුම්පත් විශාල ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. එහෙත් අල්ලස හා දූෂණ වැළැක්වීමට ගෙන එන මේ නව පනත ගැන ආණ්ඩු පක්ෂය කථා කරන්නේවත් නැහැ. විපක්ෂයේ අපි මේ ගැන කථා කළොත් ඒක නෑසුණා සේ සිටීමට රජය කටයුතු කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේ රටේ ආර්ථික සංවර්ධනය ගැන උනන්දුවක් තිබෙන බව අපි දන්නවා. හැබැයි දේශීය ආයෝජකයන් ඒ වාගේම විදේශික යහපත් ආයෝජකයන් - ජාවාරම්කාරයන් නොවෙයි, අපේ රටේ දේශීය සම්පත් සූරා ගෙන කෑමට අත යටින් මුදල් දීලා, කොමිස් දීලා දේශීය සම්පත් මිලදී ගන්න එන පුද්ගලයන් නොවෙයි, ඉහළ මට්ටමේ යහපත් ආයෝජකයන්- ලංකාවට එන්න නම් ලංකාවේ දේශපාලනඥයන්ට, ලංකාවේ නිලධාරින්ට, ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රයට අල්ලස් නොදී, කප්පම් නොදී මේ රටේ ව්‍යාපාර කරන්න අවශ්‍ය කරන පරිසරය ගොඩනඟන්න ඕනෑ. මේ රට නීතියේ ආධිපත්‍ය පවතින, ඉහළ සිට පහළට නීතිය ක්‍රියාත්මක කරන කොතරම් ධනවතෙකු වුණත්, කොතරම් ශක්තිමත් පුද්ගලයකු වුණත්, කොතරම් ඉහළ දේශපාලන තානාන්තරයක් දැරුවත් වැරදිකරුවන්ට දඬුවම් කරන යහපත් පරිසරයක් මේ රටේ තිබෙනවාය කියන කාරණය අපි පෙන්නුම් කරන්න ඕනෑ. ඒ නිසා මගේ ඉල්ලීම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න කියලා නොවෙයි. ජනතා වරම දීලා තිබෙන්නේ ඔබතුමන්ලාටයි. ජනතා වරම දීලා තිබෙන්නේ මේ අල්ලස හා දූෂණ මැඩලන්න ප්‍රායෝගික, වැදගත්, යථාර්ථවාදී නීති සකස් කරන්නයි. ඒ නිසා අපි කවුරුත් එකතු වෙලා මහින්ද චින්තන ඉදිරි දැක්මේ තිබෙන මේ වටිනා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න මූලික විය යුතුව තිබෙනවා.

අපි දැක්කා, ඉන්දියාවේ සංවර්ධන ක්‍රියාදාමයේ මුවාවෙන් ජාතික සම්පත් විශාල විධියට අත යට ව්‍යාපාරිකයන්ට -දේශීය සහ විදේශීය ව්‍යාපාරිකයන්ට- විකිණීම් ක්‍රියාත්මක වෙලා තිබුණු බව. ඉන්දියාවේ ජංගම දුරකථනවලට අදාළ සංඛ්‍යාත ඉතාම අඩු වටිනාකම්වලට අත යට විකිණීම් අනාවරණය වුණා. තොරතුරු දැන ගැනීමට නිදහස පනත -Right to Information Act - ඉන්දියාවේ තිබෙන හින්දා ඒ ගනුදෙනු කොහොමද වුණේ, ඒ ගනුදෙනුවල හුවමාරු වෙච්ච වටිනාකම් මොනවාද, වග කිව යුතු පුද්ගලයන් කවුද කියලා හොයා ගෙන ඒ පිළිබඳව විෂය භාර ඇමතිවරයාගේ ඉඳලා අනෙකුත් නිලධාරින්ට විරුද්ධව නීතිමය වශයෙන් කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. වැරදි කරන මිනිසුන්ට දඬුවම් කරන කොට යහපත් ලෙස ව්‍යාපාර කරන ගුණගරුක ව්‍යාපාරිකයන් ධෛර්යවත් වනවා; ශක්තිමත් වනවා. ඒ වාගේම ඉන්දියාවේ තිබෙන අල්ලස හා දූෂණය පිළිබඳ නීති ශක්තිමත් නොවන හින්දා ප්‍රායෝගික, යථාර්ථවාදීව අල්ලස හා දූෂණය පිළිබඳ නීති ක්‍රියාත්මක කර වීම සඳහා පක්ෂ දේශපාලනයෙන් තොර ක්‍රියාකාරිකයකු වන අන්නා හසාරේගේ මූලිකත්වයෙන් යුතුව ඒ ක්‍රියාත්මක වෙච්ච සත්‍යග්‍රහ ව්‍යාපාරයට බය වෙලා හරි අද ඉන්දියාවේ ව්‍යවස්ථාදායකයට සිද්ධ වෙලා තිබෙනවා, අලුත් නීති ගෙන එන්න.

අපි කියන්නේ නැහැ, අපිට භය වෙන්නය කියලා. අපි කියන්නේ නැහැ, මේ රටේ දේශපාලනයෙන් තොර පුද්ගලයන් විසින් දේශපාලන ව්‍යාපාර ගොඩනඟලා, රජයට බලපෑම් කරන තුරු ඉන්න කියලා.  ඇත්තටම ඉන්දියාවේ තත්ත්වයට වඩා එක අතකින් ලංකාවේ තත්ත්වය හොඳයි. මොකද, රටේ විධායක බලය ඇති ජනාධිපතිවරයා තමන්ගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ කියනවා, නව පාර්ලිමේන්තුවේ පළමු පනත ලෙස අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා  නව පනතක් ගෙන එනවාය,  එයින් මාස තුනක් ඇතුළත ඊට අදාළ රෙගුලාසි ගෙන එනවාය කියා. මේවා තිබෙන්නේ, මහින්ද චින්තන ඉදිරි දැක්මේ. එතකොට මේ ප්‍රතිපත්ති අපි ක්‍රියාත්මක කළොත් අපට මේ රට ඇතුළේ දේශීය සහ විදේශීය ආයෝජකයන්ට, ආයෝජනයන් සඳහා අවශ්‍ය කරන ව්‍යාපාරික පරිසරය ගොඩනඟන්නට පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. නීතිමය පාලනය තුළ වැරැදිකරුවන්ට දඬුවම් දෙන,  අල්ලස් නොදී - පගා නොදී - යහපත් මිනිසුන්ට තම ව්‍යාපාර කර ගෙන යන්නට අවශ්‍ය කරන පරිසරය ගොඩනඟා ගන්නට පුළුවන්.  ඒ අවශ්‍ය කරන වාතාවරණය ගොඩනඟා ගැනීම සඳහා දායක වීමේ  යුතුකමක් අපට තිබෙනවා.  මේ රටේ රණ විරුවන් පක්ෂ පාට භේදයක් නැතිව මේ මාතෘ භූමිය මත තමන්ගේ රුධිරය පූජා කරලා එල්ටීටීඊ ත්‍රස්තවාදය පරාජයට පත් කරලා ලබා ගත් ඒ ජයග්‍රහණය අර්ථවත් වන්නේ, මේ තිබෙන අනෙකුත් ප්‍රශ්න ටිකත් විසඳුවොත් පමණයි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතා වැදගත් අදහසක් ඉදිරිපත් කළා. ඔබතුමා කිව්වා, දේශීය සහ විදේශීය ව්‍යාපාරිකයන්ට ලංකාවේ ආයෝජනයන් සඳහා අවශ්‍ය ඒ පරිසරය සකස් කර දෙන්නය කියලා.  වර්ෂයක් පාසා ලෝක බැංකුව විසින් "Doing Business Index" කියලා index එකක් හදනවා. පසු ගිය

[ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]

අවුරුද්දේ අපි සිටියේ 103 වැනි ස්ථානයේ. අද එම index එක පිට වෙලා තිබෙනවා. එහි අපි 79වැනි ස්ථානයට උසස් වෙලා තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, ඇමතිතුමනි. 89වැනි ස්ථානය. ස්ථාන 10ක් ඉදිරියට ඇවිත් තිබෙනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
සමා වන්න, 89වැනි ස්ථානය. ඒ කියන්නේ එහිදී බලනවා, ඔය කියන බොහෝ කාරණා ගැන. අපි තව ඉදිරියේ දී ඔබතුමා කියන තත්ත්වය මේ රටේ උදා කරනවා. අපේ ඉලක්කය ඊළඟ වර්ෂය වන කොට 60වැනි ස්ථානයට එන්නයි. ඇත්තෙන්ම ඔබතුමා ඉතාම වැදගත් යෝජනාවක් කළේ. දේශීය සහ විදේශීය ව්‍යාපාරිකයන්ට ආයෝජනයන් සඳහා අවශ්‍ය පරිසරය මෙහි ගොඩනැඟීම ගැන මූලධර්ම කිහිපයක් ඔබතුමා සඳහන් කළා. ඒවා සම්පූර්ණ කිරීමට අවංක උත්සාහයක් මේ රජය ගනිමින් සිටිනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට බොහොම ස්තුතියි. ස්ථාන දහයකින් ශ්‍රී ලංකාව ඉදිරියට ඇවිත් තිබෙනවාය කියන එම කාරණය ගැන අපි දැක්කා. අපට ඉතා ඉක්මනින් ඊළඟ පිම් කිහිපය පනින්නට අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, අපි හඳුනා ගෙන තිබෙනවා මේ ප්‍රශ්නය මොකක්ද කියලා. අනෙක් අතට කල්පනා කරලා බලන්න. ඔබතුමන්ලාගේ සංවර්ධන ක්‍රියා දාමය තුළ ආණ්ඩුවට ඉදිරිපත් වන විවේචන තිබෙනවා. ඒ තමයි ආණ්ඩුවේ ඉහළ පෙළේ පුද්ගලයෝ අල්ලස් ගන්නවා, ඒ වාගේම දූෂණ ක්‍රියාවල යෙදෙනවා කියන එක. [බාධා කිරීමක්] අපි හිතමු, ඒවා වැරැදි විවේචන කියලා. එහෙම චෝදනාවක් තිබෙනවා. ඇත්ත, නැත්ත පැත්තක දමමු. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කවුද කියන්නේ? [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අහන්න කෝ ඉතින්. [බාධා කිරීමක්] හා, හොඳයි, මම කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, - [බාධා කිරීමක්] වැදගත් විධියට ඇමතිතුමා උත්තර දුන්නා. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මගේ පෞද්ගලික මතය -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. - [*Interruption.*]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොකක්ද point of Order එක? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමාට මෙය අදාළද කියලා මම දන්නේ නැහැ, තොප්පිය හරි නම් දමා ගන්න කියන්න. අපේ විජේසේකර නියෝජ්‍ය අමාත්‍යතුමාට මෙය අදාළද කියලා මම දන්නේ නැහැ, තොප්පිය හරි නම් දමා ගන්න. හැබැයි, මම මේ කියන්නේ -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Madam Chairperson, the Hon. Member, although new to this House, must really understand the intricacies of the Standing Orders of this House. He cannot make sweeping remarks on all the Hon. Members saying, "දූෂණය කෙරුවා, අරක කෙරුවා, මේක කෙරුවා" කියා. ඒවා ඉල්ලා අස් කර ගන්න ඕනෑ. එහෙම කියන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඒ අයට අවවාද කරන්න ඕනෑ. [බාධා කිරීම්] මේක කෝපි කඩයක් නොවෙයි, පාර්ලිමේන්තුව; උත්තරීතර පාර්ලිමේන්තුව.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම මේ රටේ පොදු ප්‍රශ්නයක් ගැනයි කථා කළේ. පාර්ලිමේන්තුවේදී ගරු අගමැතිතුමා එක දවසක් කිව්වා, "මේ පාර්ලිමේන්තුවේ කුඩුකාරයෝ ඉන්නවා" කියා. මා නොවෙයි කිව්වේ. ගරු දි.මු. ජයරත්න අගමැතිතුමා. අද එතුමා මේ ගරු සභාව ආරම්භයේදීම ප්‍රකාශ කළා, මේක තුළ "ජඩයෝ" ඉන්නවා කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා එහෙම කියන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, එහෙම චෝදනාවක් තිබෙනවා කියායි මා කියන්නේ. ඒ චෝදනාව බොරු වෙන්න පුළුවන්; ඒ චෝදනාව ඇත්ත වෙන්න පුළුවන්. [බාධා කිරීමක්] මේ නීතිය අරගෙන ආවොත් අපේ අස්වර් මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. මේ නීතිය අරගෙන ආවොත් අපේ ගරු අර්ල් ගුණසේකර නියෝජ්‍ය අමාත්‍යතුමාට ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අද ඩේලි මිරර් එකේ මුල් පිටුව බලන්න. ඩේලි මිරර් එකේ ශීර්ෂ පාඨය මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම බොහොම ශාස්ත්‍රීය කාරණයක් ගැනයි කිව්වේ. [බාධා කිරීම්] මේ ආණ්ඩුවට මා මේ කාරණය කිව්වේ මේකයි. "පුහුල් හොරා කරෙන් දැනේ" කියනවා නේ. ගරු ඇමතිතුමනි, මා කියන්නේ ආණ්ඩුවට තිබෙන චෝදනාවන් අයින් කර ගන්න පුළුවන් කියායි. හොඳට නීතිය ක්‍රියාත්මක වෙනවා නම්, රටේ කාර්යක්ෂම නීතියක් තිබෙනවා නම්, ඔබතුමන්ලාගේ index එක තව ඉහළට යනවා. [බාධා කිරීම්] "පුහුල් හොරා කරෙන් දැනේ" කියන්නේ ඕක තමයි. [බාධා කිරීම්] මට ඒ තත්ත්වයට වැටෙන්න බැහැ නේ. මට ඔබතුමාගේ තත්ත්වයට වැටෙන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආණ්ඩුවට විරුද්ධව තිබෙන -ආණ්ඩුව කියන විධියට බොරු, අපි කියන විධියට ඇත්ත- අල්ලස, දූෂණය, නාස්තිය පිළිබඳ චෝදනාවලින් මිදෙන්න පුළුවන් ක්‍රමය තමයි යහපත් නීති පද්ධතියක් හඳුන්වලා දීලා ඒ නීති පද්ධතිය මේ රටේ ක්‍රියාත්මක කරන එක. දැන් ඒකට මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළින් ගරු ජනාධිපතිතුමා වුණු පොරොන්දුවවත් තවම ඉෂ්ට කරලා නැහැ. ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාට මේ දක්වන උනන්දුව ගැන ප්‍රතිචාර දක්වන ගමන්ම මා කියනවා අපි ඊළඟ මාස කිහිපය තුළ මේ නීති හදමුය කියා.

අන්නා හසාරේ වාගේ ලංකාවේ කවුරුවත් උද්ඝෝෂණ කරන තුරු, සත්‍යග්‍රහ කරන තුරු ඉන්න අවශ්‍ය නැහැ. වුණු පොරොන්දුව ඉෂ්ට කරන්න. මොකද, ඉන්දියාවේ ආණ්ඩුව ඒක පිළිගත්තේ නැහැ නේ. නමුත් මහින්ද චින්තන ඉදිරි දැක්මේ ඒක පිළිගෙන තිබෙනවා. අල්ලස, දූෂණය මැඩලන්න නව නීති ගෙන ඒම ප්‍රමුඛතාවක් වශයෙන් ගරු ජනාධිපතිතුමා හඳුනා ගෙන තිබෙනවා. ඒක හඳුනා ගෙන තිබෙනවා නම්, අපි කවුරුත් එකඟ වෙනවා නම්, ඒක කරන්න අවශ්‍ය දෙයක් කියා ඔබතුමාත් පිළිගන්නවා නම් අපි නිශ්චිත නීති හදමු. එතකොට index එක තව උඩට යනවා. තව ආයෝජකයෝ එනවා; quality ආයෝජකයෝ එනවා; හොරු නොවෙයි. එතකොට රට හැදෙනවා. ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩුව සාර්ථක වෙනවා කියන්නේ මේ රටේ මිනිසුන්ට හොඳයි කියන එකයි. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂය ගැන කලබල වෙන්න එපා. අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාටත් ආයෝජනය කරන්න පුළුවන් හොඳ පරිසරයක් ගොඩ නැඟෙනවා. මම මේ කාරණය කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම සරල දෙයක් නිසායි. පොරොන්දු වූ විධියට අපි මේ රට ඇතුළත අල්ලස, දූෂණය මැඩලන අලුත් නීති අරගෙන එමු. ඒ තියෙන නීති යහපත් ලෙස ක්‍රියාත්මක කරමු. දේශීය සහ විදේශීය යහපත් ආයෝජකයෝ මේ රට තුළ ව්‍යාපාර කරන පරිසරය ගොඩ නඟමු. ඒ වෙනුවෙන් එකතු වෙලා වැඩ කරන්න අපේ අදහස් අපේ දැනුම අපේ පළපුරුද්ද ලබා දෙන්න අපි සූදානම් වෙලා ඉන්නවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.24 ]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට ඉහත කථා කළ ගරු මන්ත්‍රීතුමා විෂය ගැන නොවෙයි කථා කළේ. කෙසේ වෙතත් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් ගැන කථා කරද්දි 2008 අංක 14 ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත කුමක්ද කියන එක අවබෝධ කර ගෙන නැහැ වාගෙයි පෙනුණේ. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් හඳුනා ගන්න අවශ්‍ය නෛතික බලතල දීලා තිබුණත් ව්‍යාපෘතියක් වීමට අවශ්‍ය මූලික සුදුසුකම් ටික එතුමාගේ කථාවේදී කියවුණාද මම දන්නේ නැහැ.

ජාතික යහපත සඳහා වූ ආර්ථික, සමාජ ප්‍රතිලාභ රටට ලබා දිය හැකි වූද, මහජනතාවගේ යහපත සඳහා වන යෝජිත භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් ක්‍රමෝපායක වැදගත්කම, සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ගලා ඒම, සැලකිය යුතු ප්‍රමාණයකින් රැකියා අවස්ථා උත්පාදනය කිරීම, තාක්ෂණය පිළිබඳ අපේක්ෂිත සුභවාදී පරිවර්තනය හරහා රටේ ස්වභාවය සැලකිය යුතු අන්දමින් වෙනසක් සිදු කිරීමට ඇති ව්‍යාපෘති තමයි මේකට අයිති වෙන්නේ. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති ගණයට වැටෙන නිර්ණායකයන් කිහිපයක් ලබා දීලා තිබෙනවා. මේ ව්‍යාපෘති එම නිර්ණායකයන්ට අනුවයි ලැබෙන්නේ.

ඊළඟට බොහෝ දෙනෙක් දැන් කථා කෙරුවා ආර්ථික ප්‍රතිලාභ, සංවර්ධනය ගැන. නමුත් මම කියන්න යන්නේ, මේ Foreign Direct Investments ගැනයි. සෘජු විදේශ ආයෝජන වශයෙන් ලැබෙන ඩොලර් එකක්, ආධාර වශයෙන් දෙන ඩොලර් 20ක් වටිනවාලු. මේක තමයි ඇත්ත කථාන්දරය. මොකද, Foreign Direct Investmentsවලින් අපට විශේෂයෙන් ප්‍රතිලාභ රැසක් ලැබෙනවා. ඒකෙන් පුහුණුව ලැබෙනවා; තාක්ෂණය ලැබෙනවා; වෙළෙඳ පොළ ලැබෙනවා. ප්‍රධාන කර්මාන්තය වෙළෙඳ පොළේ කොටසක් වීමේ අගය එකතු වෙනවා. මේවා තමයි Foreign Direct Investmentsවලින් ලැබෙන්නේ. උදාහරණයක් වශයෙන් Apollo Hospitals ගන්න පුළුවන්. මේ Apollo Hospitals කියන්නේ, Foreign Direct Investment එකක්. මේකෙන් හෘද රෝග සැත්කම් 500ක් කෙරුවා. එකකට වියදම් වුණේ ඩොලර් 3,000යි. පිටින් කෙරුවා නම් ඩොලර් 40,000ක් යනවා. නමුත් මේක Foreign Direct Investment එකක්. තාක්ෂණයයි, වෙළෙඳ පොළයි, ඊළඟට ආයතනයේ නමයි ඔය සේරම එකතු වුණාම අපට ලොකු ප්‍රතිලාභයක් ලැබෙනවා. අවසානයේදී Lanka Hospitals කියන තත්ත්වයට මේක එද්දී නමකුත් එක්කයි ඇවිල්ලා තිබෙන්නේ. විදේශිකයින් රැසක් ඒ Hospital එකට එනවා අපි දැක්කා. මේකයි ප්‍රායෝගික අත් දැකීම. එම නිසා Foreign Direct Investment එකේ එන යෝජනා ක්‍රම කිහිපයක් ගැන තමයි අද මේ ගැසට් එකේ සඳහන් කරලා තිබෙන්නේ.

දැන් බලන්න, ෂැන්ග්‍රි-ලා හෝටලය කිව්වාම නිකම් හෝටලයක් විතරක් නොවෙයි. ඒක බස්නාහිර පළාතේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, උසස් ස්ථරයේ නිවාස සහ නවීන සාප්පු සංකීර්ණයක් ඇතුළුව මිශ්‍ර උපයෝගිතා සංකීර්ණයක් වශයෙනුයි දියුණු කරන්නේ. මෙවැනි ව්‍යාපෘති හතරක් ගැන අපි අද කථා කරනවා. ඒ වාගේමයි හම්බන්තොට ව්‍යාපාරය. ඒකත් මෙවැනි විශේෂ ආර්ථික ප්‍රතිලාභ එක්ක ඒ වාගේම නමක් තියෙන කොම්පැනියක් එක්ක හවුල් ව්‍යාපාරයක් වශයෙනුයි මේ රටට එන්නේ. ඉතින් මේක තමයි ඉතාමත්ම වැදගත් කාරණය. ඇෆ්ගනිස්තානයේ අෂ්රෆ් ඝානි මැතිතුමා කියනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 20ක් ආධාර වශයෙන් ඇෆ්ගනිස්තානයට ලැබිලාත් තවමත් සංවර්ධනය ඉහළට ගියේ නැහැ කියලා. සිංගප්පූරුව එහෙම නොවෙයි. සිංගප්පූරුව අපේ රටටත් වඩා පොඩි -පුංචි අල්ලක් තරම්- රටක්. ඒ රටට ගොඩක් ඇවිල්ලා තිබෙන්නේ Foreign Direct Investments. ආධාර -grants - වලින් loansවලින් කිසිම දවසක රටේ සංවර්ධනයක් ඇති වෙන්නේ නැහැ. මේක යථාර්ථයක් බවට පත් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් රටක සංවර්ධනයක් ඇති වෙන්න නම් මෙවැනි කරුණු කාරණා බලපානවා.

දැන් බලන්න, ලංකාබෙල් කොම්පැනිය ගැන. Foreignersලා 47 දෙනෙක් මෙහේ වැඩ කෙරුවා. ඒ ගොල්ලන් තාක්ෂණයයි, දැනීමයි සියලු දේ අරගෙන ඇවිල්ලා තමයි ආයෝජනය පටන් ගත්තේ. ෂැන්ග්‍රි-ලා හෝටලය ආපුවාම සංචාරකයින්ට advertise කරන්න ඕනෑ නැහැ. සංචාරකයින් එතැන වැඩ පිළිවෙළේ කොටසක් වශයෙන් මෙය ස්ථාන ගත කරනවා. අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ දර්ශනය ඉතාමත්ම වැදගත් වෙනවා. තවමත් අපට නිසියාකාරව Foreign Direct Investments ලැබිලා නැහැ. දැන් අපි ඒවා ගැන කල්පනා කරනවා. ඒවා නිකම් එන්නේ නැහැ. එන්න නම් බදු සහන වාගේ නොයෙකුත් සහන ඒ අයට ලබා දෙන්න ඕනෑ. මොකද, අපේ රට දැන් භයක් නැතිව ජීවත් වෙන්න පුළුවන් රටක් බවට පත් වෙලායි තිබෙන්නේ. මේක ඉතාම වැදගත් කාරණයක්. අපි දැක්කා මේ රටේ තිබෙන යථාර්ථය. මේ යථාර්ථය තමයි ලංකාව අද සංවර්ධනයේ ඉහළට යනවා කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1978 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ foreignersලා ඇවිල්ලා invest කළාම ඒ අයට loans ලබා දුන්නේ අපේ දේශීය බැංකුවලින්. ඒ කාලයේ foreignersලා ආවා; ආයෝජනය කළා; ඊළඟට, දේශීය බැංකුවලින් ණය අර ගෙන තමුන්ගේ ව්‍යාපාර පවත්වා ගෙන ගියා. දැන් එහෙම දෙයක් නැහැ. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ දේශීය බැංකුවලින් foreignersලාට ඒ වාගේ ණය දීමක් දැන් සිද්ධ වන්නේ නැහැ.

ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ප්‍රතිපත්තිය වුණේ මොකක්ද? එතුමා ආර්ථිකය ඉවක් බවක් නැතිව අනවශ්‍ය විධියට විවෘත කරලා දැම්මා. එයින් පස්සේ ආර්ථික, සමාජ ගැටලු රැසකට මූලාරම්භයක් ඇති වුණා. අද ඒවායේ ප්‍රතිඵල අත් විඳින්න වෙලා

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

තිබෙනවා. අද අපේ බ්‍රැන්ඩික්ස් වාගේ කොම්පැනි ගිහිල්ලා වෙනත් රටවල ආයෝජනය කරනවා. හේතුව මොකක්ද? අපේ රටේ ඒ ආර්ථික ප්‍රතිපත්තිය යථාර්ථයක් බවට පත් වෙලා තිබුණු කාලය දැන් අවසන් වෙමින් එනවා. එම නිසා අලුත් විධියට හිතන්න පතන්න පුරුදු වෙන්න ඕනෑ. ඊළඟට මා තවත් කාරණයක් කියන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කථා කරන්නත් ඉස්සර වෙලා කාලය අවසානයි කියනවා නේ. විනාඩි කීයක්ද තිබුණේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 8ක කාලයක් ගරු අමාත්‍යතුමාට ලබා දී තිබුණා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
විනාඩි 8 අවසන් වුණාද? එහෙම නම් මගේ කථාව අවසන් කරන්න වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අවසන් වරට මට කියන්න තිබෙන්නේ මෙයයි. අද බොහෝ දෙනකු කථා කරනවා මම අහ ගෙන හිටියා. ඒ අනුව බැලුවාම ඒ කියපු දේවල් ගැන නම් කනගාටුවක් ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතාවගේ දුක පෙන්නුම් කරන දුක්ඛිතභාවය පිළිබඳ දර්ශකය - Misery Index එක- මේ වන කොට අඩු වෙලා තිබෙනවා. මේක තමයි ලොකුම දේ. Misery Index එක අඩු වෙලා තිබෙනවා. ඒ ගැන මට කියන්න පුළුවන්. කරුණු සහ දත්තයන් මා සතුව තිබෙනවා. නමුත් කාලය නැහැ. කෙසේ වෙතත් 2010 වෙද්දී සියයට 10.8 දක්වා දුක්ඛිතභාවය අඩු වෙලා තිබෙනවා. 2001 දී දුක්ඛිතභාවය සියයට 22.1ක්ව තිබුණා. 2002 දී එය සියයට 18.4ක් වුණා. 2008න් පස්සේ දුක්ඛිතභාවය විශාල වශයෙන් අඩු වීමක් පෙන්නුම් කරලා තිබෙනවා. වසර 40කට පස්සේ මේ තත්ත්වය ඇති වීම ගැන අප සන්තෝෂ වෙන්න ඕනෑ. ඒකට පාදක වෙච්ච ආර්ථික කරුණු රැසක් තිබුණත් වෙලාව මඳ නිසා මම කථාව නතර කරනවා, විෂයය භාර ඇමති ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට කථා කිරීමට අවස්ථාවක් සලසමින්. කෙසේ වෙතත් මා නැවත වරක් කියන්නේ ඔය loansවලට, grantsවලට, එහෙම නැත්නම් අපට දෙන ආධාරවලට වඩා Foreign Direct Investment කියන එක රටෙහි ඇති කර ගත්තොත් එයින් ඇති වන ඵල ප්‍රයෝජනය සුවිශාල බවයි. ඒ බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු අමාත්‍යතුමනි. මීළඟට ගරු වී.කේ. ඉන්දික මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena )
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ගරු වී.කේ. ඉන්දික මන්ත්‍රීතුමා.

[අ. භා. 5.33 ]

**ගරු වී.කේ. ඉන්දික මහතා**
(மாண்புமிகு வி.கே. இந்திக)
(The Hon.V.K. Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම තුළින් අද ගොවියාගේ අයිතිය නැවත වරක් තහවුරු කරන්න කටයුතු කිරීම පිළිබඳව පළමුවෙන්ම අදාළ ගරු අමාත්‍යවරයාටත්, ඒ වාගේම කැබිනට් මණ්ඩලයට සහ අතිගරු ජනාධිපතිතුමාටත් අද ගොවියකු සහ ඉඩම් හිමියකු හැටියට මම පළමුවෙන්ම ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2000 දී තමයි මේ පනත ගෙන ආවේ. පසු ගිය කාලයේදී මේ පනත ක්‍රියාත්මක නොවීම තුළ විශාල අර්බුදයකට අද ගොවියාට සහ ඉඩම් හිමියාට මුහුණ දෙන්න සිදු වුණා. ඒ පනතේ තිබුණු අඩු පාඩුවක් හැටියට අපි දැක්ක දෙයක් තමයි, අද ගොවියා මිය යැමෙන් පසු ඒ අද ගොවියාගේ උරුමක්කාරයකුට ඒ හිමිකම් පැවරීම 2000 පනත තුළින් අහෝසි වීම තුළ, පාරම්පරික අද ගොවිකම රැක ගෙන ආපු ඒ ගොවීන්ගේ දරුවන්ට, අඹුවන්ට පසු ගිය කාලය තුළ කර කියා ගන්න දෙයක් නැති වුණු එක. මා හිතන හැටියට ඔවුන්ගේ අයිතිය නැවත වරක් සුරක්ෂිත කරන්නට මේ පනත් කෙටුම්පත තුළින් හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම තමයි, 2000 පනතේ තිබුණු අඩු ලුහුඬුකම් නිසා එදා අද ගොවීන් සහ ඉඩම් හිමියන් අතර තිබුණු, ගොවිජන විනිශ්චය සභාවලින් විසඳා ගත්ත ආරාවුල්, පසු ගිය කාලයේ උසාවිවලට ගෙන ගිහින් විශාල මුදල් වියදම් කරලා නඩු හබ කියන තරම් තත්ත්වයට පත් වුණා. ඒ නිසා අද ගොවීන් විශාල සංඛ්‍යාවකගේ අයිතිය උසාවිය තුළින් අහෝසි කරන්නට ඒ ඉඩම් හිමියන්ට හැකියාව ලැබුණා. එදා 2000 පනත තුළින් බලාපොරොත්තු වුණේ, අද ගොවියා සහ ඉඩම් හිමියා යන දෙදෙනාම රැකෙන පරිදි කටයුතු කරන්නට වුවත්, එයින් වැඩි වාසියක් අත් වුණේ අද ගොවියාට නොවෙයි; ඉඩම් හිමියාටයි. ඉඩම් හිමියාට බලය පැවරෙන පරිදි තමයි එදා ඒ පනතින් හැකියාව, ශක්තිය ලැබුණේ. එදා සිද්ධ වුණු ඒ අවාසිය අහෝසි කරලා, අද ගොවියා සුරක්ෂිත කරන්නට අද මේ පනත් කෙටුම්පත සමත් වෙනවාය කියන එක අපි ඉතාම සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා.

2000 සිට මේ දක්වා අද ගොවිකම අහෝසි වුණු අද ගොවීන් විශාල ප්‍රමාණයක් අද ලංකාව පුරා ඉන්නවා. ඒ අයට සහනයක් වශයෙන් වන්දි මුදලක් ගෙවන්නට කටයුතු කිරීමත් ඉතාම කාලෝචිත ක්‍රියාවක් හැටියට මා දකිනවා. පසු ගිය කාලය තුළදී තමන්ගේ අද ගොවි අයිතිය අහෝසි වුණාය කියලා අයිතිවාසිකමක් කියන්නට හැකියාවක් නොලැබුණු අද ගොවීන් සඳහා වන්දියක් ගෙවීමට කටයුතු සූදානම් කිරීම ඉතාම කාලෝචිතයි. නැත්නම් ඒ අයට කිසිම අවස්ථාවක් ලැබෙන්නේ නැහැ සාධාරණය ඉටු කර ගන්නට. එහෙම නොවුණොත් ඒ අයට විශාල අසාධාරණයක් වනවා.

මේ පනත් කෙටුම්පත ගෙනෙන්නට ගත වුණු කාලය තුළ අද ගොවීන් සහ ඉඩම් හිමියන් අතර සුවිශාල වශයෙන් ආරාවුල් ඇති වෙලා තිබෙනවා. අත් දැකීමක් හැටියට මට කියන්න පුළුවන්, අද අද ගොවීන් විශාල සංඛ්‍යාවක් ඒ ඉඩම් හිමියන්ට දිය යුතු අඳ වී ප්‍රමාණය ලබා දෙන්නේ නැහැයි කියලා. ඉඩම් හිමියන්ගේ හතරෙන් පංගුව ලබා දෙන්නේ නැහැ. එදා ඉඩම් හිමියන්ටත් සුරක්ෂිතභාවයක් තිබුණා. අද ගොවීන් තමන්ගේ අස්වැන්නෙන් ඉඩම් හිමියාගේ කොටස තුන් වරක් ලබා දුන්නේ නැත්නම්, ගොවිජන සේවා කොමසාරිස් හරහා විනිශ්චය සභාවට ඉදිරිපත් කරලා ඒ අද ගොවි අයිතිවාසිකම අහෝසි කරන්න එදා හැකියාව තිබුණා. ඒ හැකියාවත් පසු ගිය පනත තුළින් අහෝසි වුණා. නමුත් අද නැවත වරක් ඒ අයිතිය ලබා දීලා, අද ගොවීන් සහ ඉඩම් හිමියන් අතර තිබෙන ගැටලු විසඳන්නට ගොවිජන විනිශ්චය සභාවක් නැවත පත් කරන්නට කටයුතු කිරීම ඉතාම වැදගත්. එදා විනිශ්චය සභාව වාගේ නොවෙයි අද ඇති කරන විනිශ්චය සභාව. මේ පනත් කෙටුම්පතට අනුව ගොවීන්ගේ ප්‍රශ්න උසාවියට ගෙන යන්නේ නැතුව, ඇති කරන විනිශ්චය සභාව තුළින්ම විසඳා ගන්න හැකියාව ලැබෙනවා. අවශ්‍යා නම් ඔවුන්ට එයිනුත් ඔබ්බට යන්න පුළුවන්, අද ගොවි අයිතිය සුරක්ෂිත කර ගන්න. ගොවීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අභියාචනා කිරීමටත් අවස්ථාවක් මේ පනත තුළින් ලබා දීලා තිබෙනවා. මේ තමයි ඉතාම වැදගත් දේ.

විශේෂයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කය, අනුරාධපුරය දිස්ත්‍රික්කය හා පොලොන්නරුව දිස්ත්‍රික්කය තමයි අද ගොවීන් වැඩි ප්‍රමාණයක් ජීවත් වන දිස්ත්‍රික්ක වන්නේ. ඉතින් ඒ ප්‍රදේශවල ජීවත් වන අද ගොවීන්ගේ අයිතිය සුරකින්නට මේ ආණ්ඩුව කටයුතු කරන්නට යෙදුණු එක ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපි ආඩම්බර වනවා. එදා නොතිබුණු ඒ ශක්තිය ලබා දීම තුළ අද අද ගොවියාට විශ්වාසයෙන් යුතුව ඔවුන්ගේ කටයුතු කර ගෙන යෑමට හැකියාව ලැබී තිබෙනවා. විශේෂයෙන් පොහොර සහනාධාර හා අනිකුත් සහන ලබා දීලා, අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන ඉලක්ක කරා මේ රටේ වී නිෂ්පාදනය ගෙන යන්නට, අනිකුත් නිෂ්පාදන ගෙන යන්නට මේ තත්ත්වය හේතු වනවාය කියන එක අප කාටත් සක් සුදක් සේ පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගොවීන්ගේ අයිතිය තහවුරු කරන්නට අද ගෙනෙන මේ පනත් කෙටුම්පත සභාය වනවා වාගේම මෙය අද ගොවීන්ට ශක්තියක් වෙලා, අද ගොවීන් සහ කුඹුරු හිමියන් අතර ඇති ගැටලු සියල්ල නිරාකරණය කර ගෙන, අද ගොවීන්ගේ අයිතියත් සුරක්ෂිත කර ගෙන ඉදිරියේදී ඔවුන්ගේ උරුමක්කරුවන්ට කටයුතු කරන්න හැකියාව ලැබෙනවා. මේ පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව ගොවියකු හැටියට මගේ ස්තුතිය හා ගෞරවය පුද කරමින් මා නිහඬ වනවා.

[අ. භා. 5.40 ]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වනවා කාලය ලබා දීම පිළිබඳව.

මම මුලින්ම කියන්න කැමැතියි, අපේ රටේ ආර්ථිකයට බලපාන කරුණු ගණනාවක් මේ සභාවේ අද කථා කරද්දී, විරුද්ධ පාර්ශ්වයේ ගරුමන්ත්‍රීතුමන්ලා සුද්දන්ට ඉඩම් විකිණීමක් ගැන කථා කළ බව. බොහොම කෙටියෙන් කියනවා නම්, සුද්දන්ට ඉඩම් විකුණුවේ අපේ ආණ්ඩු කාලයේද එහෙමත් නැත්නම් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේද කියන එක මේ රටේ මිනිසුන්ට අමතක වෙලා නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම ඔබතුමා ගාල්ල කොටුවට ගිහිල්ලා බැලුවොත්, එහෙමත් නැත්නම් වෙරළ තීරයේ ඉඩම් බැලුවොත් දකින්න පුළුවන්, ඒ ඉඩම් බොහොමයක් අද වන කොට මිලදී අරන් තිබෙන්නේ විදේශිකයන් බව. විදේශිකයෙක් ලංකාවේ ඉඩමක් මිලදී ගන්නවා සියයට 100ක බද්දක් ගෙවන්න ඕනෑය කියලා ඉස්සර නීතියක් තිබුණා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ තමයි ඒ සියයට 100 බද්ද ඉවත් කරලා සුද්දන්ට ඉඩම් විකිණීම බොහොම පහසු මට්ටමට ගෙනාවේ. ඊට පස්සේ අපේ ආණ්ඩුව ආවාට පස්සේ තමයි ඒ සියයට 100 බද්ද නැවත පනවා තිබෙන්නේ. ඒක තමයි ඇත්ත. මේ තත්ත්වය ලංකාවේ මිනිසුන්ට අමතක වෙලා නැහැ. ඒ ගැන කියමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගොවිජන සංවර්ධන පනතට ගෙනෙන සංශෝධන ගැන මගේ අදහස් කෙටියෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

අද ගොවියා සහ අඳය කියන කාරණය කාලයක් තිස්සේ ඉඳලාම අපේ රටට හුරු පුරුදු දෙයක්. අඳය කියන වචනය සංස්කෘතික භාෂාවේ "අර්ධය"කියන වචනයෙන් බිඳිලා ඇවිල්ලා කාලාන්තරයක් තිස්සේ අපේ රටේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ කාලයේ ඉඩම් තිබුණ ධනපති පන්තිය තමන්ගේ ඉඩම්, කම්කරුවෝ එහෙම නැත්නම් වෙනත් අය හරහා සශ්‍රීක කරලා ඒ අස්වැන්නෙන් භාගයක් අරගෙන තිබෙනවා. හැබැයි ඒ හැම කාල වකවානුවකදීම ඒ අද ගොවියා බරපතළ අසාධාරණයන්ට ලක් වුණා. ඒ නිසා තමයි විවිධ අණ පනත් මේ සඳහා ඇති වුණේ. ඇත්තටම මේ සම්බන්ධව1887 අංක 21 දරන ආඥා පනත තමයි මුලින්ම ලංකාවේ නීතියක් හැටියට ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. 1887 ඒ නීතිය පැරණි නඩු තීන්දුවල දැක්වෙනවා. ඊට පස්සේ 1953 කුඹුරුපනත ආදී වශයෙන් ඇවිල්ලා, 2000 ගොවිජන සංවර්ධන පනත තෙක් ආවා. 2000 ගොවිජන සංවර්ධන පනතේ මූලික අරමුණ වුණේ -අපේ වර්තමාන අගමැතිතුමා බොහොම සද්භාවයෙන් ඒක ඉදිරිපත් කළේ -මේ අද ගොවිභාවය නැති කිරීමයි. ඒක තමයි මූලික අදහස වුණේ. ඒ වාගේම ලංකාවේ තිබෙන කෘෂිකාර්මික ඉඩම් -වගාබිම්- වැඩිපුරම කෘෂිකර්මාන්තයට නැඹුරු කර ගැනීම තමයි අදහස වුණේ. නමුත් විවිධ හේතුන් නිසා ඒ මූලික අරමුණුවලට යන්න බැරි වුණා.

අද අපි ස්තුතිවන්ත වනවා, අපේ වර්තමාන ගොවිජන සේවා ගරු ඇමතිතුමාට මේ පනත් කෙටුම්පත ගෙන ඒම ගැන. එතුමා අනුරාධපුරයේ ගොවි පුත්‍රයෙක්. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළේ අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිවම කියා තිබෙනවා, අද ගොවීන්ගේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙනවාය කියන කාරණය. මොකද, අද අද ගොවියා අපේ වී ගොවිතැනේ ප්‍රමුඛ ස්ථානයකට පත් වෙලා සිටිනවා. ලංකාවේ වී වගා කරන අයගෙන් සියයට 15ක් පමණ ඉන්නේ අද ගොවීන්. ඒ නිසා මේක බරපතළ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම අපේ වී.කේ. ඉන්දික ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ හම්බන්තොට දිස්ත්‍රික්කය වාගේ වී වගා කරන දිස්ත්‍රික්කවල අද ගොවීන්ගේ ප්‍රශ්න බරපතළ වෙලා තිබෙනවා. ඒ නිසා අද අපි සන්තෝෂ වනවා, අපේ ගරු ඇමතිතුමා අද ගොවීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයට මෙම පනත ගෙන ඒම පිළිබඳව.

ඒ වාගේම අපේ ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් පනතේ තිබුණා, අද ගොවියා අඳභාවයෙන්

[ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

නෙරපුවොත් අවුරුද්දක් ඇතුළත තමයි පැමිණිල්ලක් කරන්න ඕනෑ කියලා.

ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ට අවුරුද්දක් ඇතුළත පැමිණිල්ලක් කළොත් ඒ සම්බන්ධයෙන් පිළිගැනීමක් තිබුණා. නමුත් අලුත් පනතේ ඒ කාල සීමාව මාස හයයි තිබෙන්නේ. ඒකෙනුත් අද ගොවියාගේ අයිතිවාසිකමට යම් බලපෑමක් තිබෙනවා. අනුරාධපුර ගොවි ජනතාව පිළිබඳව දන්නා කෙනෙක් හැටියට ඒ කාරණය පිළිබඳවත් අවධානය යොමු කරලා අද ගොවීන්ට තිබෙන ඒ ගැටලුවත් විසඳා දෙන්නය කියා ගරු ඇමතිතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා. ස්තුතියි.

[අ. භා. 5.45]

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ අද ගොවීන්ට වැදගත් වන ඉතාම කාලෝචිත පනත් කෙටුම්පතක් අපේ එස්.එම්. චන්ද්‍රසේන ගරු ඇමතිතුමා මේ සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒක වැදගත් වන්නේ ප්‍රායෝගික වශයෙන් අද ගොවීන්ට තිබෙන දුක් ගැහැට සහ ගැටලු පිළිබඳව සැබෑ තත්ත්වය හඳුනා ගත් ගොවි පළාතක ගොවි මහතෙක් විධියට දේශපාලන ජීවිතයට ප්‍රවේශ වුණු එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමා ඒ ජනතාවට අවශ්‍ය සහනය ලබා දෙන්නට කටයුතු කිරීම නිසයි. නිදහසට පෙරත්, නිදහසට පසුවත් අපේ රටේ ඒ වැඩවසම් ක්‍රමය තුළ ඉඩම් හිමියන් විසින් අද ගොවීන් බරපතළ විධියට නොසලකා හැරපු යුගයක 1958 වර්ෂයේදී පිලිප් ගුණවර්ධන ශ්‍රීමතාණන් 1958 අංක 1 දරන පනතින් පළමු වතාවට අද ගොවි පනත නමින් වූ පනතක් හා හා පුරා කියා හඳුන්වා දුන්නා. ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඉතාම විප්ලවීය පනතක් විධියට තමයි එකල අපේ වයෝවෘද්ධ දෙමවුපියන් ඒ පනත හඳුනා ගත්තේ.

1958 සිට අවස්ථා කිහිපයක් විටින් විට මේ පනත සංශෝධනය වුණා. අවසානයේදී 2000 අවුරුද්ද වන කොට අලුත් සංශෝධනත් එක්ක මේක නතර වුණා. එතැනදී ඇති වෙච්ච යම් යම් ව්‍යාකූල තත්ත්වයන් තුළ අද ගොවීන් බරපතළ ප්‍රශ්න රාශියකට මුහුණ දුන්නා. 2000 පනත තුළින් ඉතාම සුබවාදීව එහෙම නැත්නම් සද්භාවයෙන් අද ගොවියා සහ ඉඩම් හිමියා කියන මේ දෙදෙනාම සුරක්ෂිත කිරීම සඳහා තීන්දු තීරණ ගත්තත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේදී අද ගොවියා බරපතළ විධියට දුෂ්කරතාවකට පත් වුණු නිසා 2000 ඉඳලා 2011 වන තෙක් අවුරුදු 11ක් තුළ අද ගොවීන් පිළිබඳව විවිධ ප්‍රශ්නවලට අදාළ පැමිණිලි 4,000ක් පමණ තිබෙනවා. මේ ප්‍රශ්නවලට නිරන්තරයෙන්ම විසඳුමක් නැති වන කොට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට කරුණු සැල කළා. 2005 වර්ෂයේ මහින්ද චින්තනය පිටපත් කරන කොට ඒ තුළ ගැබ් වෙනවා අද ගොවීන්ගේ ප්‍රශ්නයට යම් විසඳුමක් ඉදිරිපත් කරනවාය කියන කාරණය. එය යථාර්ථයක් කරන්න තමයි එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා අද ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මම හිතන්නේ මේ පනත තුළ 2000 පටන් 2011 වන තෙක් අවුරුදු 11ක කාල සීමාවක් තුළ යම් යම් ප්‍රශ්න, ගැටලුවලට මැදි වෙලා අද ගොවිභාවයෙන් ඉවත් වෙච්ච, පැමිණිලි 4,000කින් සමන්විත ගොවි සමූහයට නව සංශෝධනයෙන් යම් සහනයක් අත් පත් කර ගන්නට ඉඩ අවකාශ ලැබේවිය කියා අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම අපේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිටින ඇතැම් ඉඩම් හිමියන්ට ඉඩම් තිබුණත් ඔවුන්ට නිසි විධියට යල මහ කන්න වගා කරන්න අවශ්‍ය පිරිස් බලය, නිශ්චිත කාල වේලාව, ඒ සඳහා ආයෝජනය කරන්න තිබෙන ඉඩකඩ සහ ප්‍රශ්න ගැටලු නිසා හුඟක් කුඹුරු පුරන් වෙනවා. මේක ඒ තත්ත්වයෙන් යම් ප්‍රමාණයකට අත් මුදවලා අපේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සහල් නිෂ්පාදනයට අවශ්‍ය පසුබිම නිර්මාණය වෙන්නේ අද ගොවීන්ගෙනුයි. එහෙම නම් ඒ අද ගොවීන්ගේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් නොදුන්නොත්, ඒක නොසලකා හැරියොත් ජාතික වශයෙන් අපේ නිෂ්පාදනයට බරපතළ පහරක් වෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, අද අපි සම්මත කරන මේ පනතත් එක්ක අපේ හුඟාක් ප්‍රශ්නවලට විසඳුම් ලැබේවිය කියා. කලින් පනත් තුළ ගැබ් වෙලා තිබුණු ගැටලු නිරාකරණය කරලා, අලුත් සංශෝධනවලින් අපි ඒකපුද්ගල විනිශ්චය සභාවක් හඳුන්වා දෙනවා. යම් කෙනෙක් එම ඒක පුද්ගල විනිශ්චය සභාවට එකඟ නැත්නම්, එයින් අතෘප්තියට පත් වෙච්ච යම් පාර්ශ්වයක් ඉන්නවා නම් ඔවුන්ට සමාලෝචන මණ්ඩලයට යන්න පුළුවන්. ඒ සමාලෝචන මණ්ඩලයෙනුත් යම් ප්‍රශ්නයකට විසඳුමක් ගන්න බැරි නම් පළාත්බද මහාධිකරණයකට යන්න පුළුවන්.

පළාත්බද මහාධිකරණය කියන කාරණය තරමක විවාදයට ලක් වන කාරණයක් වෙනවා. අපේ ගම්බදව ඉන්න දුප්පත් අහිංසක ගොවි ජනතාව සමහර විට අවුරුදු හතළිහක් පණහක් මේ කුඹුරුත් එක්ක තමන්ගේ කාලය මිඩංගු කර වයෝ වෘද්ධ වෙලා ජීවිතයේ සැඳෑ සමය ගෙවන මොහොතේ මේ විධියේ අකරතැබ්බයකට මුහුණ දුන්නොත්, ඔහුගේ ජීවිතය අවසාන වන්නට කලින් මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්නට නොහැකි වනවා. අද මේ අධිකරණ ක්ෂේත්‍රයේ තිබෙන යම් යම් ප්‍රායෝගික ගැටලුත් එක්ක එහෙම නැත්නම් ඒ නඩුවල යුක්තිය පසිඳලීමේ තිබෙන ප්‍රමාදයනුත් එක්ක සමහර විට ඔවුන් අපේක්ෂා කරන ඉක්මන් ප්‍රතිඵල එහෙමත් නැත්නම් ඉක්මන් විසඳුම් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. කොයි හැටි වෙතත් මේ පනත් කෙටුම්පත තුළින් තිබුණු තත්ත්වයෙන් මේ අද ගොවීන් අත් මුදවා ගැනීමට අපට විශාල සහනයක් පිටිවහලක් ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විශාල පිබිදීමක් තිබෙනවා. අප පොහොර සහනධාරය ගොවීන්ට ලබා දී ඔවුන්ගේ කුඹුරු යල-මහ කන්න වගා කරන්නට විවිධ ආධාර උපකාර කරමින් ක්‍රමවත් ආර්ථික සංවර්ධනයකට අවශ්‍ය ප්‍රවේශ නිර්මාණය කර තිබෙනවා. විශේෂයෙන් අප දැවැන්ත වාරි ක්‍රම හඳුන්වා දී, තිබෙන වාරි ක්‍රම ප්‍රතිසංස්කරණය කර, ඒ වාගේම කුඩා වාරිමාර්ග ක්‍රම ගම්වල තැනින් තැන ඇති කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ප්‍රමුඛතම ව්‍යාපෘතියක් විධියට කෘෂිකර්ම ක්ෂේත්‍රය කෙරෙහි අද රජය දැඩි අවධානයක් යොමු කර තිබෙනවා. මේ ගත වන 2011 වර්ෂයේ විශාල වැව් ප්‍රමාණයක් සංවර්ධනය කරන්නට ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා අපට මුදල් ලබා දුන්නා.

මා ජීවත් වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේයි. අපේ දිස්ත්‍රික්කය තුළ විශාල වැව් ප්‍රමාණයක් තිබෙනවා. අවශ්‍ය මුදල් හදල් නැතිව මේ වැව් ප්‍රතිසංස්කරණය කර ගන්නට බැරිව, සුළු වාරිමාර්ග නඩත්තු කරන්න බැරිව අප විශාල ප්‍රශ්නයකට මුහුණ දුන්නා. ගරු එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමා සහ අප අවස්ථා කිහිපයක් ක්ෂේත්‍ර චාරිකාවන් සඳහා ඒ ප්‍රදේශවලට බැසිල් රාජපක්ෂ මැතිතුමා එක් කර ගෙන ගියා. එහි ප්‍රතිඵලයක් විධියට අපේ පළාත්වල වැව් ප්‍රතිසංස්කරණය කිරීම එතුමා නිර්දේශ කළා. මා නියෝජනය කරන කුරුණෑගල මැතිවරණ කොට්ඨාසයේ තිබෙන සියලුම වැව් මේ වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 වන දා

වන කොට සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන්න බලාපොරොත්තු වෙනවා. මේ මුදල් වෙන් කිරීමේ දැවැන්ත ක්‍රියාමාර්ගය තුළ ඒ වැව්වල බැමි සකස් කර, හොරොව් සකස් කර, රොන් මඩ ඉවත් කර විශාල වැඩ පිළිවෙළකට යන්නට අපට පුළුවන්කම තිබෙනවා. මේ සියල්ල ඒ විධියට පසුබිම් වන කොට, ඒ සියල්ල සඳහා අවශ්‍ය කටයුතු රජය සකස් කර දෙන කොට එම වැඩ පිළිවෙළේ නියමුවා විධියට කටයුතු කරන අද ගොවියා නීතිමය වශයෙන් සුරක්ෂිත කර ඔහුට බලාපොරොත්තු සහගත වැඩ පිළිවෙළකට යන්නට පුළුවන්කමක් හදා දෙනවා නම් එය ඉතාමත් වටිනා දෙයක්.

විශේෂයෙන් මේ අද ගොවියා වයෝ වෘද්ධ වෙලා තමන්ගේ ජීවිතයේ සැඳෑ සමය ගෙවන කොට සමහර විට තමන්ව නඩත්තු කරන්නට දරුවෙක් නැහැ. හෙට දවසේ ජීවිතය ගැන විශ්වාසයක් නැහැ. ඒ අවස්ථාවේ තමන් වැඩ කළ කුඹුර එහෙම නැත්නම් අඩුම තරමින් ඒ ගොවි බිම පිළිබඳව තිබෙන අද අයිතියවත් කාට හෝ පෙන්වා, නම් කර, ලියා දීලා ඔහුගේ අවසාන කාලයේ ඔහුව රැක බලා ගන්න, ඔහුට සත්කාර කරන්නට යම් කිසි රැකවලෙක් මේ පනත් කෙටුම්පත තුළින් නිර්මාණය වීම මා හිතන විධියට මානුෂීය වශයෙන් අද ගොවියාට විශාල ශක්තියක්ය කියන එක විශේෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. එම නිසා දැන් අද ගොවියාට පුළුවන් තමන්ගේ පවුලේ දරුවකුට පසු උරුමයේ අයිතිය තියන්න. එහෙම කෙනෙක් නැත්නම් බාහිර පුද්ගලයෙක් හඳුනා ගන්නට පුළුවන්. මේ පනත් කෙටුම්පත තුළින් අද ගොවිතැන් බත් කරන විශාල සංඛ්‍යාවකට විශාල සහනයක් ලැබෙනවාය කියන එක විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. කාලාන්තරයක් තිස්සේ ගොවිතැන් කරන ප්‍රදේශවල ජීවත් වන මහජන නියෝජිතයන් විධියට අප මේ ප්‍රශ්න අත් දැක තිබෙනවා. නමුත් ඒවාට සැබෑ විසඳුමක් දෙන්නට නීතියේ තිබෙන ප්‍රතිපාදන ඒ තරම් ප්‍රමාණවත් නොවුණු නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප බරපතළ ප්‍රශ්නවලට මුහුණ දුන්නා. පසු ගිය කාලයේම තමන්ට ප්‍රශ්නයක් ඇති වුණාම ඒ ප්‍රශ්නය සැබෑවට යොමු කරන්න නිශ්චිත නිලධාරියෙක් සිටියේ නැහැ. පනතේ තිබුණු යම් යම් වගන්ති උඩ නිර්මාණය වුණු ඒ සමහර සභාවල උදවිය මුළු කාලය තුළම ඒවායේ අසුන් ගෙන සිටියේ නැහැ. අධිකරණයට ගියාම අද ගොවියාට තිබෙන ආර්ථික ශක්තියත් එක්ක ඔහුට බොහෝ වෙලාවට අධිකරණයට අවශ්‍ය කරුණු කියා පාන්නට මුදල් හදල් වියදම් කරන්න බැරි නිසා ඒ උදවිය ඒ තැන්වල විශාල විධියට අපහසුතාවන්ට පත් වුණා. මේ සියලු තත්ත්වයන් සමනය කර අද ගොවි ජනතාවට වඩාත් සුරක්ෂිත හෙටක් සඳහා ඔවුන්ට ශක්තිය සපයමින් ඔවුන්ගේ ගොවි බිම් තවදුරටත් සශ්‍රීක කරමින් මේ රටට බත බුලත සපයන්නට මේ ප්‍රගතිශීලී පනත තුළ ඇති කර තිබෙන මේ කරුණු කාරණා වඩාත් ඵලදායි වනවාය කියන කාරණය මතක් කරනවා. එසේම ඒ කාරණයට නායකත්වය දුන්, මඟ පෙන් වූ, ඒ සඳහා මූලිකව ක්‍රියා කළ ගරු එස්.එම්.චන්ද්‍රසේන අමාත්‍යතුමාටත් මගේ ස්තුතිය පිරිනමමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 5.55]

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத்தொழில்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡාවට භාජනය වන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව කථා කිරීමට මට අවස්ථාවක් ලබා දීම ගැන මා සතුටු වන අතර, මෙම පනත් කෙටුම්පත මෙම සභාවට ගෙන ආ එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමාටත්, එම නිලධාරින්ටත් මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. 1958 දී කුඹුරු පනත ගෙනැල්ලා මේ රටේ ගොවි ජනතාව කෘෂි කාර්මික ක්ෂේත්‍රයට, එහෙම නැත්නම් වගා ක්ෂේත්‍රයට යොමු කරලා, ඒ අයගේ අවශ්‍යතා හඳුනා ගෙන, ඒ අයගේ අදහස් හා යෝජනා අරගෙන වසර ගණනාවක් තුළ -මේ වෙන කොට අවුරුදු 53ක් වාගේ කාලයක් තුළ- විවිධ අවස්ථාවන් 5කදී එනම්, 1958 අංක 1 දරන කුඹුරු පනත, 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනත, 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත, 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත, 1991 අංක 04 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත, ඒ වාගේම 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත වශයෙන් ඉදිරිපත් කළ පනත්වලින් විවිධ ආකාරයෙන් ගොවි ජනතාවට සෙතක් ශාන්තියක් ඇති කළා; එහෙම නැත්නම් අද ගොවීන් ගැන කථා කළා.

ඇත්තටම මට නම් පෙනෙන විධියට මේ රටේ සැබෑ ගොවියා තමයි අද ගොවියා. අද මම මේ සභාවේදී දැක්කා, විපක්ෂ නායකතුමා මෙම පනත් කෙටුම්පත සම්බන්ධව කථා කළේ එක් පැත්තක් අරගෙන බව. අපට හොඳටම තේරෙනවා, මේ රටේ සැබෑ ගොවියා අතිගරු ජනාධිපතිතුමා වෙන කොට, එහෙම නැත්නම් අද ගොවියා බවට පත් වෙන කොට ඉඩම් හිමියා ගැන තමයි විපක්ෂ නායකතුමා කථා කළේ කියන එක. ඒ කියන්නේ මෙවැනි පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා වාද විවාද කරන වෙලාවේ තවමත් කථා කරන්නේ ඉහළ පෙළන්තිය ගැනයි. කොළඹ ඉන්න සහෝදරවරුන්ට, නෑදෑයින්ට අයිති ඉඩම් ටික නැවත ආරක්ෂා කිරීම තමයි එතුමාගේ සංකල්පය. ජීවිතේට කුඹුරකටවත් බැහැපු කෙනෙක් නොවෙයි නේ. ඒ නිසා අඩු තරමින් කකුල් දෙකේ මඩ ටිකක් ගා ගත්තු කෙනෙක් නොවෙයි නේ. විපක්ෂ නායකතුමා අඩු තරමින් දිය කඩකින්, වක්කඩකින් වතුර ටිකක් අරගෙන මුහුණ හෝදපු කෙනෙක් නොවෙයි නේ. අන්න ඒ වාගේ අවස්ථාවක එක්සත් ජාතික පක්ෂය දරන මතයයි, ආණ්ඩු පක්ෂය දරන මතයයි අතර ලොකු වෙනසක් තිබෙනවා. ඒ අනුව පසු ගිය කාලයේ අද ගොවියා බොහොම ශක්තිමත් ලෙස ගමේ ජීවත් වුණා.

අපට මතකයි පොඩි කාලයේ අපි ඇඹුල අරගෙන නියර දිගේ වෙලට යනවා. නියර දිගේ කමතට ගිහිල්ලා ගොයම් කපන උදවියත් එක්ක එකතු වෙලා බත ඇඹුල කා ගෙන අපි පුංචි කොල්ලෝ හැටියට කුඹුරු වගා කරන, එහෙම නැත්නම් අස්වද්දන අයට ශක්තිය දෙනවා, සී සාන කොට ශක්තිය දෙනවා, එහෙම නැත්නම් ගොයම් කපන කොට ශක්තිය දෙනවා, ඒ වාගේම ගොයම් පාගන කොටත් ගොයම් මිටි ගාල අස්සේ ගිහිල්ලා ඉඳගෙන ඒ අයට ශක්තිය දෙනවා. හැබැයි අද මෙම පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව මම බොහොම සන්තෝෂ වෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, නැවත පරණ යුගය ඇති කරන නිසායි. ඇත්තටම අද මෙම පනත් කෙටුම්පත ගැන කථා කරන්න ඇවිත් සමහර අය කථා කළේ වෙනත් පනත් ගැනයි. එහෙම නැත්නම් මෙම පනත් කෙටුම්පතට මුවාවෙන් හෝටල් ගැන කථා කළා. එහෙම නැත්නම් මෙම පනත් කෙටුම්පතට මුවා වෙලා කථා කළේ තව ව්‍යාපෘතියක් ගැනයි. ඒ නිසා ගොවිජන සංවර්ධන පනතක් වාගේ ඉතාමත් වැදගත් වූ පනතක් හරහා අපි මේ රටේ ජනතාවට මොකක්ද කරන්න හදන්නේ, එහෙම නැත්නම් මෙම පනත මඟින් මොනවාද වෙන්නේ කියන එක පක්ෂ විපක්ෂ එකතු වෙලා සාකච්ඡා කරනවා වෙනුවට වෙනත් දෙයක් කථා කරනවා. මෙම පනත මඟින් ඉතා වැදගත් වාසියක් ඉෂ්ට වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ දවස්වල මේක කළේ බොහොම සහෝදරත්වයෙන්, වාචිකව. ලිඛිතව නොවෙයි. ඒ නිසා ගොයම් පාගන කොට ඇවිල්ලා අස්වැන්න ලැබෙන ක්‍රමය

[ගරු සරණ ගුණවර්ධන මහතා]

බලනවා. එදාම වී ලාස්වලින් එකතු කරලා එක කමතේම දෙපොළක ඒවා ඒ අයට වෙන් කරනවා. අද එහෙම නැහැ. මොකද 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතත් එක්ක හුඟාක් දේවල් අපට නැති වුණා. ඒ නිසා නැවත පැරණි ක්‍රමයට එන්න අපට ශක්තියක් ලැබිලා තිබෙනවා. ඒ නිසාම අද කෘෂි කර්මාන්තයේ යෙදෙන අඳ ගොවියෝ, එහෙම නැත්නම් කෘෂි කර්මාන්තයේ යෙදී සිටින ගොවි මහත්වරු එයින් ඈත් වෙලා තිබෙනවා. අපි දන්නවා, අපේ පළාත්වල මේ ගැන බලන්නේ නැති සමහර අය ඉන්නවා. එහෙම නැත්නම් මේ පනත නිසා අපට වැඩක් නැහැ කියනවා. අක්කර සිය දහස් ගණනක් තිබෙන කෙනෙක් අවුරුදු ගණනාවක් තමන්ගේ ආර්ථිකය හදා ගන්න ගොවි මහත්මයා කළ කැපවීම ගැන දැන් කථා කරන්නේ නැහැ. මෙතැන ගොවි ජන සේවා කොමසාරිස්තුමාගේ නිලධාරින් ඉන්නවා.

උදාහරණයක් විධියට ගත්තොත්, අංක එක දරන අයිතිකාරයාට තිබුණ කුඹුර එතුමාගෙන් පසුව දෙවන පරම්පරාවට යනවා. මම මේ කථා කරන්නේ ඉඩමේ අයිතිය ගැනයි. දෙවෙනි පරම්පරාවෙන් පසුව යම් මට්ටමකට ක්‍රියාත්මක වෙනවා. ඊ ළඟට තුන්වෙනි පරම්පරාවට යනවා. එතකොට ඒ අය කුඹුර ගැන දන්නේ නැහැ. කුඹුරේ ඔප්පුව නැහැ. අඳ ගොවියා කවුද කියලා හඳුනන්නේ නැහැ. එහෙම නැත්නම් අඳ ගොවියාගේ කලත්‍රයා හඳුනන්නේ නැහැ. එතකොට ගැටලු මතු වෙනවා. තුන්වෙනි පරම්පරාවෙන් පසුව ආයෙත් ඉඩම් අයිතිකාරයාගේ හතරවෙනි පරම්පරාවට යනවා නම් මේ ගැටලු තවත් වැඩි වෙනවා. එතකොට අඳ ගොවියායි, ඉඩම් හිමියායි අතර ලොකු ගැටලු මතු වෙනවා. අද ඒ සම්බන්ධයෙන් වන නඩු අධිකරණයේ තිබෙනවා. සමහර වෙලාවට ප්‍රාදේශීය මණ්ඩලවල නඩු තිබෙනවා. ඒ වාගේ ගැටලු නිසා අද කුඹුරු වගා කරන්නේ නැති මට්ටමටක් ඇති වෙලා තිබෙනවා.

මේ පනතේදී අපි ප්‍රායෝගිකව දකින දේ තමයි මේ පනත ක්‍රියාත්මක වන විට අඳ ගොවියා ශක්තිමත් වීම. අඳ ගොවියා ශක්තිමත් කරලා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී, කෘෂිකාර්මික කමිටුවලදී ඒ අයට පොහොර ටික දෙන්න ඕනෑ, තෙල් බෙහෙත් ටික දෙන්න ඕනෑ. ඒ වාගේම වගා කරන්නට අවශ්‍ය වට පිටාව දීලා ඔවුන්ව උනන්දු කරවන්න ඕනෑ.

ගොවි ජන සේවා කොමසාරිස්තුමාත් සිටින නිසා කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මට අයිති කුඹුරක් කොළඹ-නුවර පාරේ තැනක තිබෙනවා. මම තුන් හතර පාරක් කථා කරලා කිව්වා, මේ කුඹුර වගා කරන්න කියලා. මම දන්නවා මට මේ කුඹුර ජීවිතයට වගා කරන්න බැහැ කියලා. මගේ නමට ඔප්පුව තිබෙනවා. මම ඒක ගැන ගරු ඇමතිතුමාටත් කිව්වා. අපේ හුඟක් අයගේ සංකල්ප දැන් වෙනස් කරලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Mr. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම් අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර අය පොල් ඉඩම් තියා ගෙන ඉන්නවා. තමන්ගේ නමට ඉඩම තිබෙනවා. පොල් ටික කඩා ගෙන යන්නේ වෙනත් අය. සමහර අයගේ කුඹුරු ඉඩම් තිබෙනවා නමට. කොළඹ-නුවර පාරේ; එහෙම නැත්නම් ඉන් ඔබ්බට. එහෙම තිබෙන කෙනෙක් තමයි මම. සමහරක් අය කොළඹ-නුවර පාරේ කුඹුරු ගොඩ කරන්න පුළුවන්, එහෙම නැත්නම් ප්‍රධාන මාර්ග අසල ඉඩම් ගොඩ කරන්න පුළුවන් කියලා අදහස් තියා ගෙන, ලක්ෂ ගණන්වලට පර්චසය විකුණන්න පුළුවන් කියලා අදහස් කරගෙන ඒවා වගා කරන්නේ නැතිව ඉන්නවා. මගෙන් කථා කරලා ඇහුවා මේ කුඹුර කරනවාද කියලා. මම කිව්වා මට කරන්න වෙලාවක් නැහැ, කාට හරි දෙන්න කියලා. ඇත්තම කථා කළොත් මට ඒ අස්වැන්නෙන් ශතයක්වත් ලැබෙන්නේ නැහැ. මට ඒක ගැටලුවක් නැහැ. මේ වැඩේ කෙරෙන්නයි ඕනෑ.

අවුරුදු ගණනක් කුඹුරු කළ කෙනෙක් ඉන්නවා නම්, එහෙම නැත්නම් 1958 පනතේ සිට ඇවිල්ලා ඒ හරහා පවුල් සංඛ්‍යාවක් නියෝජනය වෙනවා නම් හෝ එහෙමත් නැත්නම් ඒ හරහා මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න විශාල දායකත්වය දුන්න කෙනෙක් ඉන්නවා නම් මගේ ඉඩම පෞද්ගලිකව ඒ පවුලකට ලියලා දෙන්න මම සතුටු වනවා. මේ වාගේ කැප කිරීම් කරන්න ඕනෑ. එහෙම නැතිව පනත් ගෙනැල්ලා, ඒ පනතට අදාළව පාර්ලිමේන්තුවේ කථා කළා කියලා මේවාට විසඳුම් ලැබෙන්නේ නැහැ. මම විශ්වාස කරන දෙයක් තමයි අද කෘෂි කර්මාන්තය ශක්තිමක් කරන්න ඕනෑ බව. අද උතුරු - නැඟෙනහිර ප්‍රදේශවලට ගිහිල්ලා බලන්න. දැන් එල්ටීටීඊ ත්‍රස්තවාදී ප්‍රශ්නය අවසන් වෙලා තිබෙනවා. අද ඒ ප්‍රදේශවල අස්වැන්නේ සියයට 75ක අතිරික්තයක් තිබෙනවා. අද වගා ක්ෂේත්‍රයෙන් වී ටික ලැබුණාම - පඩංගුවේ පාගලා, කකුලෙන් පාගලා, එහෙම නැත්නම් මැෂින්වලින් අස්වැන්න අරගෙන- බුසල් සියයක් ගත්තොත් උතුරු සහ නැඟෙනහිර ප්‍රදේශවල පාවිච්චි කරන්නේ බුසල් 25යි . අද සියයට 75ක අතිරික්තයක් තිබෙනවා. කවුද කියන්නේ මේ රට ස්වයංපෝෂිත කරන්න බැහැ කියලා. ඒවාට අවශ්‍ය වාරි පද්ධති, ඇළ වේලි, එහෙම නැත්නම් ඒවාට අවශ්‍ය කරන ජලය ලබා දීමේ ක්‍රමවේද තිබෙනවා. අද මේ රජයට ආර්ථිකය ගොඩ නැඟීම සඳහා යම් ක්‍රමවේදයක් තිබෙනවා.

මම පසු ගිය දවස්වල ඒ පළාතේ කෘෂි කාර්මික ව්‍යාපාරය දුර්වලවීමට යම් හේතුවක් සොයා ගෙන ගියා. පළමුවෙනි එක තමයි ඛනිජ තෙල් නොලැබීම. ප්‍රමාද වීම, නිවැරදි වෙලාවට ගන්න බැරි වීම හෝ අධික මිලට ගන්න වීම නිසා ඒ අය අසරණ වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශවල ධීවර කර්මාන්තය, කෘෂි කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න පුළුවන්. මමත් ගරු ඇමතිතුමාත් පුදුකුඩියිරුප්පු, නෙඩුන්කේනි, විශ්වමඩු, අක්කරායන්කුලම් වාගේ අති දුෂ්කර ප්‍රදේශවලට ගියා. අපේ අමාත්‍යාංශයෙන් ඒ යුතුකම් ඉටු කරලා ඒ අයගේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න පුළුවන් හොඳ වට පිටාවක් සැකසුවා. ඔබතුමාත් අපිත් එක්ක එක රැස්වීමකට හිටියා. ඒ වාගේ හොඳට වැඩ කරන්න පුළුවන් වැඩ සටහනක් මේ පනත තුළින් ඇති කරන්න පුළුවන්. මේ පනත ගේන්නේ හදවතින්ම, සද්භාවයෙන්ම මේ කටයුත්ත කරන්න. "දිවි නැඟුම" වැඩසටහන ගෙනාවාම කථා කරන්නේ හෝටල් ගැන. තව කෙනෙක් කථා කරන්නේ රාත්‍රී භෝජන ශාලාවක් ගැන. ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කරන මේ මොහොතේ එක්සත් ජාතික පක්ෂයේ සමහර උදවිය ඒ ගැන කථා කළා. නමුත් අවසාන මොහොතේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ගොවි ජනතාව ආරක්ෂා කරනවාය කියන එකට, සුරක්ෂිත කරන එකට එකඟයි කියලා; මේක අනුමත කරන්නට එකඟයි කියලා මන්ත්‍රීවරු කී දෙනෙක් අත උස්සනවාද කියලා අපි අහනවා. හැබැයි, motion එකක්

ගෙනැල්ලා "මේ ආණ්ඩුව මේවා කරන්නේ නැහැ, ආණ්ඩුව උනන්දු වන්නේ නැහැ, අපි මේ යෝජනාව ගේනවා, මම ඉන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවියොත් එක්කයි" කියලා රටේ ගොවි ජනතාවට කියනවා. එහෙම කියන එක මන්ත්‍රීවරයෙක්වත් අඩුම තරමින් වක්කඩකට බැහැලා වතුර ටිකක් බීලා නැහැ. [බාධා කිරීමක්] කකුල සෝදලාවත් නැහැ. මොකද, ඒ වතුරෙන් සේදුවාම පණුවෝ ගහයි කියලා බයයි. මේ අය බත, බුලත ගැන දන්නේ නැහැ. කන්නය ගැන දන්නේ නැහැ, කයිය ගැන අහලා නැහැ. අපි පොඩි කාලයේ දන්නවා ගොවි මහත්වරු අමුඩය ගහ ගෙන-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, please wind up now.

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොඩ්ඩක් ඉන්න. මේ අමුඩය ගැන කියන්න ඕනෑ. අමුඩය ගහගෙන තමයි ඉස්සර ගොවියා කුඹුරට බැස්සේ. කරේ ලේන්සුව දමා ගෙන, ඒ දවස්වල තිබුණු කිඹුලා උදැල්ල, ලංලෝ උදැල්ල කරේ ගහගෙන තමයි කුඹුරට ගියේ. අද යූඑන්පීය කරන්නේ මොකක්ද? කාර් එකෙන් එනවා. මගින් බහිනවා. කලිසමත් ඇඳ ගෙන කමතට යනවා. ගොයම් ගොඩට එහා පැත්තේ, ඉඳ ගෙන -ගොයම් කොළයට එහා පැත්තේ ඉඳ ගෙන වෙඩි තිබ්බ කථාවේ අනෙක් එක- කලිසම ගලවලා කුඹුරට බහිනවා. මෙන්න එක්සත් ජාතික පක්ෂයේ සංකල්පය. මෙන්න ආණ්ඩුවට ගෙන එන යෝජනා. අපේ ගොවියාට කියන්නේ අලුත් වාහනයක නැඟලා උදැල්ල ඩිකියේ දමා ගෙන ඇවිල්ලා කුඹුරුවල වැඩ කරන්න කියලායි. අඩුම තරමින් කුඹුරේ වක්කඩක් හදන්න, නියරක් රකින්න දන්නවාද? කුඹුරකට ගිහිල්ලා තිබෙනවාද? අඩුම තරමින් කුඹුරේ නියරක දුවන්න පුළුවන්ද? අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට කෘෂිකාර්මික රටක් කරන්න 2005 මැතිවරණයට පෙර, කුඹුරේ, නියරේ ඇවිදලා රටේ ජනතාවට කිව්වා මම හොඳ ගොවියෙක් කියලා. ඒ වාගේම තමයි මේ ඇමතිතුමා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි පවුලක කෙනෙක්. එතුමා එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන්න ගෙවිලියන් ඉන්නවා. රජරට නියෝජනය කරන ගොවිජන සේවා ඇමතිතුමා, රටටම යම්කිසි වැඩ ප්‍රමාණයක් කරනවා. ඒ වාගේමයි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් ඒ හා සම්බන්ධ වෙලා විශාල ශක්තියක් දෙනවා. ඒ නිසා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත්, ගොවිජන සේවා අමාත්‍යාංශයත් එකතු වෙලා ගෙන යන මේ වැඩ පිළිවෙළට මගේ සම්පූර්ණ සහයෝගය දෙන බවත්, ඒ වාගේම අපි එක්සත් ජාතික පක්ෂය සහ අනෙකුත් පක්ෂවලත් මතය විමසන බවත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. T. Ranjith De Zoysa. You have eight minutes.

[අ. භා. 6.07]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
( மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු මෙම වැදගත් පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන අද දවස ශ්‍රී ලාංකීය ගොවි ජනතාවට ඉතාමත්ම ඓතිහාසික දවසක් හැටියට අපි සලකනවා.

1956 ජනතා ජයග්‍රහණයෙන් පසුව ඔද වැඩී ගිය ශ්‍රී ලාංකීය ජනතාව වෙත දිවංගත ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක අගමැතිතුමාගේ රජයේ කෘෂිකර්ම ඇමතිවරයා හැටියට දිවංගත ගරු පිලිප් ගුණවර්ධන ඇමතිතුමා විසින් 1958 දී කුඹුරු පනත ඉදිරිපත් කළා. ඒ පනත මේ රටේ කුඹුරු වගා කරන ගොවි ජනතාවගේ විප්ලවීය වෙනසකට මඟ පෑදුවා. එදත් මේ පනත පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කරන කොට වැඩවසම් ක්‍රමයට ආවඩපු උදවිය කුඹුරු පනතේ බලතල අඩු කරන්නට, කුඹුරු පනත පාර්ලිමේන්තුවේ සම්මත වීම වළක්වන්නට විශාල උත්සාහයක් දැරුවා. නමුත් ඒ සියලු ප්‍රතිගාමී බලවේග පරාජය කරමින් කුඹුරු පනත සම්මත වීමත් එක්ක මේ රටේ ගොවි ජනතාව ඉතාම බලවත් වරමක්, ශක්තියක් සහිතව කෘෂිකර්මාන්ත කටයුතුවලින් ඉස්සරහට ආවා. අද මේ රට කෘෂිකාර්මික වශයෙන් වේගයෙන් දියුණු වෙමින් පවතින වෙලාවක නිෂ්පාදනය වැඩි කරලීම සඳහා; ආහාර නිෂ්පාදනයේ විප්ලවීය වෙනසක් සඳහා තෘප්තිමත් ගොවි ජනතාවක් සිටිය යුතුයි. එදා 1958 ඉදිරිපත් කරපු කුඹුරු පනත වරින් වර බලයට පත් වුණු ආණ්ඩු විසින් විවිධ අවස්ථාවන්වල සංශෝධනය කරමින්, එය වඩාත් තහවුරු කරමින් ඉදිරියට ආවා.

නමුත් 1991දී ගොවිජන සේවා පනත සංශෝධනය කිරීමත් එක්ක, ඉන් අනතුරුව 2000 අවුරුද්දේ ගොවිජන සංවර්ධන පනත ලෙස එම පනත සංශෝධනය වීමත් එක්ක අනුප්‍රාප්තිකයා නම් කිරීම අහෝසි වෙලා ගිහිල්ලා එදා ඒ වන කොට හිටපු ගරු කෘෂිකර්ම ඇමතිතුමාට ඒකෙන් බලාපොරොත්තු වුණු අරමුණු සියල්ල ඉෂ්ට කර ගැනීමට නොහැකි වීම තුළ මේ රටේ අද ගොවියා බලවත් අර්බුදයකට ලක් වුණාය කියන එක අපි ප්‍රකාශ කරන්නට ඕනෑ.

අප නියෝජනය කරන රත්නපුරය වැනි දිස්ත්‍රික්කවල අද ගොවි අයිතිය අහිමි වී යාම තුළ ඉතාමත්ම පසුතැවිල්ලට පත් වෙච්ච ගොවි ජනතාව සිය දහස් ගණනක් මේ වන කොට ඉන්නවා. මහජන නියෝජිතයෝ හැටියට අපි ළඟට ඇවිල්ලා ඔවුන් කියන්නේ, හීන් අප්පුහාමිගේ, පොඩිඅප්පුහාමිගේ, සෝමවතීගේ, පියදාසගේ අද අයිතිය ගොවිජන සංවර්ධන පනත මඟින් අහෝසි වෙලා ගිහිල්ලා තිබෙනවා කියලායි. ඒ උදවියට තමන්ගේ අනුප්‍රාප්තිකයා නම් කර ගැනීමට නොහැකි තත්ත්වය තුළ බරපතළ ආකාරයට පසුතැවිල්ලට හා අසාධාරණයට පත් වෙලා තිබුණා. මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා අවධානය යොමු කිරීමේ ප්‍රතිඵලයක් හැටියට මහින්ද චින්තන ඉදිරි දැක්මේ 79 වන පිටුවට එතුමා ඇතුළත් කළා අද ගොවි අයිතිය නැවතත් තහවුරු කරන වැඩ පිළිවෙළකට යනවාය කියලා. අද දවසේ ඉදිරිපත් කරන ගොවිජන සංවර්ධන සංශෝධන පනත් කෙටුම්පත එදා මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ තුළින් මේ රටේ ගොවි ජනතාවට දීපු පොරොන්දුවක් ඉෂ්ට කිරීමක් හැටියට අපි සලකනවා.

අද උදේ මේ ගරු සභාවේදී විපක්ෂ නායකතුමා කිව්වා, අද ගොවි ක්‍රමය තහවුරු කිරීම තුළ නැවතත් වැඩවසම් ක්‍රමයක් ස්ථාපිත වීමේ මූලික ලක්ෂණ පෙනෙන්න තිබෙනවා කියලා. මහින්ද චින්තන වැඩ පිළිවෙළ වැඩවසම් ක්‍රමයට රට ගෙන යන්නක් හැටියට හඳුන්වන්න එතුමා උත්සාහ කළා. මේ රටේ විපක්ෂ නායකයා හැටියට ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මහින්ද චින්තන වැඩ පිළිවෙළට එරෙහි වීම පිළිබඳව අපට කිසිම දුකක්, කනගාටුවක් නැති වුණත් ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කරන වෙලාවේ රට නැවත වැඩවසම් ක්‍රමයට යාමක් ලෙස හඳුන්වා දීම පිළිබඳව අපි කනගාටු වෙනවා.

ගරු විපක්ෂ නායකතුමා මේ රටේ රාජ්‍ය බලය හොබවපු කාල සීමාව තුළ එතුමන්ලා ගෙන ගිය ක්‍රියා කලාපය අපි දන්නා නිසා ඒ පිළිබඳව වැඩි වැඩියෙන් කථා කරන්න යන්නේ නැහැ. මේ රටේ කුඹුරු ගොඩ කරලා ගොල්ෆ් පිට්ටනි හදන්න, ක්‍රීඩා පිට්ටනි හදන්න යෝජනා කරපු වකවානුවක් තිබුණු කාලයක රට පාලනය

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

කරපු කෙනෙක් හැටියට අදත්, තව දුරටත් ගොවිජන සංවර්ධන සංශෝධන පනත් කෙටුම්පත මේ රට වැඩවසම් ක්‍රමයට ගෙන යාමක් ලෙස එතුමා මේ ගරු සභාව තුළදී ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා. නමුත් ගොවිජන ප්‍රදේශ නියෝජනය කරන මහජන නියෝජිතයෝ හැටියට මේ සංශෝධන පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව අපි ඉතාම සතුටට පත් වෙනවා, ඒ වාගේම අපි බලවත් අමන්දානන්දයට පත් වෙනවා.

මේ කාර්යයට මුල් වීම සම්බන්ධව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් ඒ වාගේම එස්.එම්. චන්ද්‍රසේන ගරු ඇමතිතුමාටත් අපේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම අපේ ගරු කථානායකතුමාත්, ඒ වාගේම ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා හා ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් මහජන නියෝජිතයෝ හැටියට අපිව කිහිප අවස්ථාවකම එතුමන්ලාගේ කාර්යාලයට කැඳවලා මේ පනතේ තිබුණු අඩු පාඩු, දුර්වලතා එකින් එක සාකච්ඡා කරලා අවුරුදු 11කට පස්සේ හෝ මේ පනත අද දවසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කටයුතු කිරීම පිළිබඳව ඒ මුල් වෙච්ච සියලු දෙනාටම ගොවි ජනපද නියෝජනය කරන මහජන නියෝජිතයෙක් හැටියට මගේ ගෞරවය සහ ස්තුතිය ප්‍රකාශ කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2000 ඉඳලා 2011 වන තුරු වර්ෂ 11 තුළ අනුප්‍රාප්තිකයෙක් නම් කරන්න බලතල නොමැති වීම නිසා අද ගොවි අයිතිය නැති වෙලා ගිහිල්ලා අසාධාරණයට ලක් වෙච්ච උදවියටත් සාධාරණයක් ඉෂ්ට කරන්න මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් පියවර ගැනීම පිළිබඳව අපි නැවත නැවතත්, වඩ වඩාත් ස්තුතිවන්ත වෙනවා. ගොවිජන සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ අභියාචනය සාධාරණ කාලයක් තුළ නැවත පරීක්ෂා කර බලලා ඒ අයට සාධාරණ වන්දියක් ලබා දෙන්න තීන්දු කිරීම තුළ අතීතයට බලපාන ආකාරයටත් ගොවීන් පිළිබඳව අවධානය යොමු කිරීම ගැන අපි වඩාත් සතුටට පත් වනවා. විශේෂයෙන්ම මම ගොවි ප්‍රදේශයක් නියෝජනය කරන, ගොවි පවුලකින් පැවත එන මහජන නියෝජිතයෙක් හැටියට ඒ ගැන වඩාත්ම වැඩියෙන් සතුටු වෙනවා.

එදා 1956 ඓතිහාසික ජනතා ජයග්‍රහණය ලබපු කාලයේ, 1956 දරුවෝ හැටියට ඉපදිලා පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට, අද දවසේ මේ ගොවිජන සංවර්ධන පනත නැවතත් සංශෝධනය කරලා අද ගොවි අයිතිය තහවුරු කරන්න මේ රටේ රාජ්‍ය නායකයා ඉහළම උත්සාහය දරලා කටයුතු කරන වෙලාවේ ඒ සම්බන්ධව අදහස් දක්වලා ඒ පනතට සහයෝගය දක්වන්න එක අතක් නොවෙයි අත් දෙකම ඔසවන්න මට අවස්ථාවක් සැලසීම පිළිබඳව මගේ සතුට, ස්තුතිය සහ ගෞරවය ප්‍රකාශ කර සිටිනවා.

මේ පනත් කෙටුම්පත අප සියලු දෙනාගේම සහයෝගය ඇතිව සභා සම්මත විය යුතු එකක් ලෙස ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, on behalf of the Minister of Economic Development, I move,

"That the Order made by the Minister of Economic Development under subsection (4) of Section 3 of the Strategic Development Projects Act, No. 14 of 2008 and published in the Gazette Extraordinary No. 1714/4 of July 11th, 2011, which was presented on 20.09.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, on behalf of the Minister of Economic Development, I move,

"That the Order made by the Minister of Economic Development under subsection (4) of Section 3 of the Strategic Development Projects Act, No. 14 of 2008 and published in the Gazette Extraordinary No. 1718/31 of August 12th, 2011, which was presented on 20.09.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IV

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, on behalf of the Minister of Economic Development, I move,

"That the Order made by the Minister of Economic Development under subsection (4) of Section 3 of the Strategic Development Projects Act, No. 14 of 2008 and published in the Gazette Extraordinary No. 1718/32 of August 12th, 2011, which was presented on 20.09.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත
## கமநல அபிவிருத்தி (திருத்தம்) சட்டமூலம்
## AGRARIAN DEVELOPMENT (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு எஸ்.எம். சந்திரசேன ]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. S.M. Chandrasena.]*

***කාරක සභාවේදී සලකා බලන ලදී.***

***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*

*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]*

*1වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*1 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (2000 අංක 46 දරන පනතට අලුත්1 වන කොටස ඇතුළත් කිරීම)

### வாசகம் 2.- (2000 ஆம் ஆண்டின் 46 ஆம் இலக்கச் சட்டத்தில் புதிய பாகம் 1 ஐ உட்புகுத்துதல்)

**CLAUSE 2.**- (*Insertion of new Part I in the Act, No. 46 of 2000*)

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)

(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා:

1 වන පිටුවේ, (1) "16 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) යම් තැනැත්තකු, වර්ෂ දෙදහසේ අගෝස්තු මස දහ අට වන දිනයට පෙර හෝ ඒ දිනයේදී හෝ ඒ දිනයට පසුව හෝ එළඹෙන ලද, වාචික හෝ ලිඛිත ගිවිසුමක්' " ;

(2) "20 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) අඳ ගොවියකුගේ 1ඇ වන වගන්තිය ප්‍රකාර, අනුප්‍රාප්තිකයකු වන' ";

4 වන පිටුවේ, (1) "5 වන සහ 6 වන පේළි ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රමාණයට අදාළව ඔහුගේ අයිතිවාසිකම්, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව උරුම විය' "

(2) "11 වන සහ 12 වන පේළි ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මිය ගිය හෝ ස්ථිර අබලතාවයකට පත් වූ අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුම වීමට, 1ඇ වගන්තිය හෝ 1ඉ වගන්තිය ප්‍රකාර අනුප්‍රාප්තිකයකු නොමැති' ";

(3) "25 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අයිතිවාසිකම් උරුමවීමට, 1ඇ වගන්තිය හෝ 1ඉ වගන්තිය ප්‍රකාර පවුලේ අනුප්‍රාප්තිකයකු' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සිට 8 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*3 ஆம் வாசகத்திலிருந்து 8 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 3 to 8 ordered to stand part of the Bill.*

## 9 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 9.- (முதன்மைச் சட்டவாக்கத்தின் 39 ஆம் பிரிவைத் திருத்துதல்)

**CLAUSE 9.**- (*Amendment of section 39 of the principal enactment*)

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)

(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ 8 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'බලා අවසන් කළ යුතු අතර, ඒ පිළිබඳව වූ ස්වකීය තීරණ' ";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*9 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 9, as amended, ordered to stand part of the Bill.*

***10 සිට 12 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*10 ஆம் வாசகத்திலிருந்து 12 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 10 to 12 ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ ivඅ අලුත් කොටස ඇතුළත් කිරීම)

### வாசகம் 13.- (முதன்மைச் சட்டவாக்கத்தின் புதிய பாகம் IVஅ வினை உட்புகுத்துதல்)

**CLAUSE 13.**- (*Insertion of new Part $IV_A$ in the principal enactment*)

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)

(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරනවා:

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

"15 වන පිටුවේ, 23 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර,' ";

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*13 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 13, as amended, ordered to stand part of the Bill.*

## 14 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම)

## வாசகம் 14.- ( முதன்மைச் சட்டவாக்கத்தின் 53 ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 14.- (*Amendment of section 53 of the principal enactment*)

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)

(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, 32 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අබලතාවයට පත් වූ අද ගොවියාගේ, 1ඇ වගන්තිය හෝ 1ඉ වගන්තිය ප්‍රකාර අනුප්‍රාප්තිකයා'";

"17 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අරමුණ ඇතිව, වාර්ෂිකව කුඹුරු ඉඩම්වල අද ගොවියන් සංගණනය'";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*14 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 14, as amended, ordered to stand part of the Bill.*

***15 සිට 17 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*15 ஆம் வாசகத்திலிருந்து 17 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 15 to 17 ordered to stand part of the Bill.*

## 2 වන අලුත් වගන්තිය.- (අද ගොවියකු විසින් අනුප්‍රාප්තිකයකු නම් කිරීම)

## புதிய வாசகம் 2.- (வாரப் பயிர்ச்செய்கையாளரினால் அடுத்துறுபவரொருவர் பெயர் குறித்து நியமிக்கப்படுதல்)

**NEW CLAUSE 2.-** (*Nomination of a successor by a tenant cultivator*)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් අලුත් වගන්තිය මා ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ 7 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න

අද ගොවියකු විසින් අනුප්‍රාප්තිකයකු නම් කිරීම.

1ඉ. (1) 1ඇ වගන්තියේ කුමක් සඳහන් වුව ද, එය නොතකා, වෙනත් අද ගොවියකු හෝ අද ගොවියන් සමඟ හවුලේ හෝ තට්ටු මාරුවට කුඹුරු ඉඩම් ප්‍රමාණයක් වගා කරන අද ගොවියකු හැර, යම් අද ගොවියකු විසින්, ඔහුගේ මිය යාම හෝ පූර්ණ අබලතාවයට පත්වීම සිදු වූ විටක ඔහු වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනත යටතේ එම අද ගොවියාගේ අයිතිවාසිකම්වලට අනුප්‍රාප්තිකයා වීමට හිමිකම ඇති, ඔහුගේ පවුලේ යම් සාමාජිකයකු නම් කරනු ලැබිය හැකි ය.

(2) තම අයිතිවාසිකම්වලට යම් අනුප්‍රාප්තිකයකු නම් කිරීමක් කළ අද ගොවියා කිසියම් විටක ඒ නම් කිරීම අවලංගු කර ඒ සඳහා අලුතින් අනුප්‍රාප්තිකයකු නම් කළ හැකි ය.

(3) අද ගොවියකු විසින්, අනුප්‍රාප්තිකයකු නම් කිරීම සහ එබඳු නම් කිරීමක් අවලංගු කිරීම ඒ නම් කිරීම හෝ අවලංගු කිරීම අදාළ වන කුඹුරු ඉඩම් ප්‍රමාණය පිහිටා ඇති ප්‍රදේශයේ රාජකාරි භාරව සිටින, හෝ ඒ ප්‍රදේශයේ රාජකාරිවල නියැලී සිටින දිසාපතිවරයා හෝ ප්‍රාදේශීය ලේකම් වරයා හෝ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා හෝ නොතාරිස්වරයකු හෝ සාමදාන විනිශ්චයකාර වරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකක් සහිතව සාක්ෂි සමඟ ලියා අත්සන් කළ ලියවිල්ලකින් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ලේඛනයක් ලියා අත්සන් කිරීමේ දී මුද්දර ගාස්තුවක් ගැනීම හෝ අය කිරීම නොකළ යුතු ය.

(5) (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව ලේඛනය ලියා සහතික කරනු ලැබුවේ (3) වන උපවගන්තියේ සඳහන් කර ඇති අදාළ යම් නිලධරයකු ඉදිරිපිට දී ද, ඒ නිලධරයා විසින් එසේ ලියා අත්සන් කරන ලද ඒ ලේඛනයේ මුල් පිටපත සහ අනු පිටපත කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු අතර, එවැනි යම් ලේඛනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිසි පරිදි ලියාපදිංචි කරනු ලැබුවහොත් මිස ද, එසේ ලියාපදිංචි කරන තෙක් ද, වලංගු නොවන්නේ ය.

(6) (5) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත භාරදෙනු ලැබූ ලේඛනයේ මුල් පිටපත ලියාපදිංචි කිරීමෙන් පසුව, ඔහු විසින් නම් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලබන අද ගොවියා වෙත ආපසු භාර දෙනු ලැබිය යුතු අතර, එහි අනු පිටපත වාර්තා තබා ගැනීමේ කාර්යය සඳහා ඔහු වෙත තබා ගත යුතු ය. එම වාර්තා නියමිත ගාස්තුව ගෙවීම මත යම් තැනැත්තකු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(7) මෙම පනත යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳව, අද ගොවියා සතු අයිතිවාසිකම්වලට යම් තැනැත්තකු අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරන, (3) උපවගන්තියේ නිශ්චිතව සඳහන් ලේඛනයක් ලියාපදිංචි කිරීමෙන් පසු එම ලියාපදිංචි කළ ලේඛනයෙන් සිදු කෙරුණු නම් කිරීම අවලංගු කරන ලේඛනයක් ලියාපදිංචි කිරීමේ මාර්ගයෙන් යථා පරිදි අවලංගු කරන තුරු, වෙන යම් තැනැත්තකු ඒ අයිතිවාසිකම්වලට අනුප්‍රාප්තිකයා

වශයෙන් නම් කරන ඒ උපවගන්තියේ නිශ්චිතව සඳහන් ලේඛනයක් ලියාපදිංචි නොකළ යුතු ය. එකම ලේඛනයකින් ලියාපදිංචි කළ නම් කිරීමක් අවලංගු කර, ඒ වෙනුවට අනෙක් නම් කිරීමක් ද කළ හැකි ය. එසේ වූ කල්හි, අවලංගු කිරීම හා නම් කිරීම එක්ව දැක්වෙන ලේඛනය ලියාපදිංචි කළ හැකි වන අතර නිසි පරිදි එය ලියාපදිංචි කළ පසුව, කලින් ලියාපදිංචි කළ නම් කිරීම අවලංගු කිරීම සහ අලුත් කෙනෙකු නම් කිරීම යන දෙයාකාරයට ම වලංගු විය යුතු ය.

(8) අඳ ගොවියකු මිය යාම හෝ පූර්ණ අබලතාවයකට පත්වීම සිදු වූ විට, අලුත් අඳ ගොවියකුගේ නම ඇතුළත් කිරීම මඟින් කෘෂිකාර්මික ඉඩම් ලේඛනයක් සංශෝධනය කිරීම සඳහා, 53 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබී ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ අඳ ගොවියාගේ අයිතිවාසිකම් සඳහා අනුප්‍රාප්තිකයකු නම් කරනු ලබන හෝ (2) වන උපවගන්තිය යටතේ එවැනි යම් නම් කිරීමක් අවලංගු කරනු ලබන යම් ලේඛනයක්, තිබේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ලේඛනය සැලකිල්ලට භාජනය කළ යුතු අතර, ඉල්ලීමේ කරුණු තහවුරු කර ගැනීමෙන් පසුව, අදාළ කුඹුරු ඉඩමේ අලුත් අඳ ගොවියා වශයෙන් ඉල්ලුම්කරුගේ නම ඇතුළත් කර ගැනීමට අවශ්‍ය සටහන් ඇතුළත් කරන මෙන් ඒ ඉල්ලීමට අදාළ කුඹුරු ඉඩම පිහිටා ඇත්තේ යම් ගොවිජන සංවර්ධන සභාවක බල ප්‍රදේශය තුළ ද, ඒ ගොවිජන සංවර්ධන සභාවට, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ යුතු ය.

(9) (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් ලේඛනයක් ලියාපදිංචි කරන පිළිවෙළ ද, මේ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලබන ලේඛනවල වාර්තා පවත්වා ගෙන යාම සඳහා තබා ගත යුතු රෙජිස්ටර ද, නියම කෙරෙන නියෝග සාදනු ලැබිය යුතු ය.

(10) මේ වගන්තියේ කාර්ය සඳහා 'පවුලේ සාමාජිකයා' යන්නෙන් අඳ ගොවියාගේ කලත්‍රයා හෝ පුතෙකු හෝ දියණියක අදහස් වේ. තව ද, එසේ අදහස් වීමට ඒ කලත්‍රයාගේ, පුතාගේ හෝ දියණියගේ ප්‍රධාන රැකියාව ගොවිතැන විය යුතු අතර ඒ තැනැත්තාගේ එකම ආදායම් මාර්ගය අඳ ගොවියා වගා කළ කුඹුරු ප්‍රමාණයෙන් ව්‍යුත්පන්න වන්නක් විය යුතු ය.' "

***ඉදිරිපත් කරන ලදින්, පළමු වන වර කියවන ලදී.***
*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*
*Brought up, and read the First time*

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
"වගන්තිය දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***2 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*வாசகம் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென்ற வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*2ஆம் புதிய வாசகம் சட்டமூலத்தின் பகுதியாயிருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Question, that the Clause be added to the Bill, put and agreed to. New Clause 2 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## සිවිල් ආරක්ෂක කමිටු බලගැන්වීම
## சிவில் பாதுகாப்புக் குழுக்களைப் பலப்படுத்துதல்
## EMPOWERMENT OF CIVIL DEFENCE COMMITTEES

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ දී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජයට පත් කිරීමෙන් අනතුරුව අප රටේ ඇති වී තිබෙන සුරක්ෂිතභාවයත්, දේශපාලන ස්ථාවර භාවයත් මත සීඝ්‍ර සංවර්ධනයක් සහ ආර්ථික ශක්තියක් ඇති කර ගැනීමට හැකි වී තිබේ. ඒ බව මෙතෙක් කිසි දිනක අප රට අගය නොකළ සමහර රටවල්, ආයතන මෙන්ම විවිධ පිරිස් විසින්ද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමින් සිටිති. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය තුළ ඉතා සුබදායී සාමකාමී පරිසරයක් නිර්මාණය වී ඇති මෙවන් මොහොතක අප රටේ ඇතැම් පිරිස් හා කණ්ඩායම් විසින් ජනතාව නොමඟ යවමින් කලහකාරී තත්ත්වයන් නිර්මාණය කිරීමට වංක සිතින් කටයුතු කිරීම කනගාටුදායකය. එම නිසා ග්‍රාමීය ප්‍රදේශවල සිදු වන මෙම තත්ත්වයන් සමනය කිරීම සඳහා ග්‍රාමීය වශයෙනුත්, ප්‍රාදේශීය වශයෙනුත් පොලිස් දෙපාර්තමේන්තුව හා බැඳුණු සිවිල් ආරක්ෂක කමිටු ප්‍රතිසංවිධානයක් කොට තවදුරටත් බලගැන්වීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ ත්‍රස්තවාදය නිමා කළාට පස්සේ අපේ රටේ ජනතාවත්, රටක් හැටියට අපිත් අත් පත් කර ගත් විශාල ප්‍රතිලාභ රාශියක් තිබෙන බව අපි කවුරුත් දන්නවා. විශේෂයෙන්ම සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් - ආරක්ෂක ස්ථාවරත්වය - අද අපේ රටේ ජනතාවට, රටක් වශයෙන් අපි සියලු දෙනාට කථා කරන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අද ලෝකයේ රටවල සුරක්ෂිතභාවය පිළිබඳව කථා කරනවා නම්, ඉතාම අතළොස්සක් රටවල තමයි ඒ සම්බන්ධයෙන් නම් කියැවෙන්නේ. ලෝකයේ සුරක්ෂිතභාවයෙන් හෙබි රටවල් අතළොස්ස අතරේ ශ්‍රී ලංකාවේ නම ඉහළින්ම කියන්න පුළුවන් වාතාවරණය අද නිර්මාණය වෙලා තිබෙනවා.

අද අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ හොඳ දේශපාලන ස්ථාවරත්වයක් අපේ රට තුළ ගොඩනඟන්නට හැකියාව ලැබිලා තිබෙනවා. මෙවැනි අවස්ථාවක් රටකට ලැබෙන්නේ ඉතාම කලාතුරකින්. ඉතින් මෙවැනි අවස්ථාවක් ලැබුණු මොහොතක, විවිධ ආකාරයේ කණ්ඩායම්, විවිධ කුමන්ත්‍රණකාරීන්,විවිධ බලවේග විසින් අපි බලාපොරොත්තු නොවූ ආකාරයට විවිධාකාරයේ කලහකාරී තත්ත්වයන් ඇති කරන්නට උත්සාහ කරන බව අපි දකිනවා. ඇත්තෙන්ම, අපේ රට සීඝ්‍ර සංවර්ධනයකට යොමු වෙලා තිබෙන වෙලාවක් මේ. විශේෂයෙන්ම ඒ සීඝ්‍ර සංවර්ධනයට යොමු වුණාය කියලා අපි නොවෙයි කියන්නේ, අපේ රට ගැන කවදාවත් සුබවාදීව කථා කරපු නැති කණ්ඩායම්. කවදාවත් අපේ රට පිළිබඳව සුබවාදී මත දරපු නැති රටවල්, විවිධ සංවිධාන, අද ශ්‍රී ලංකාව ආසියාවේ නැඟී එන රටක් බවට, සීඝ්‍ර සංවර්ධනයක් කරා යොමු වුණු රටක් බවට ප්‍රසිද්ධියේ මාධ්‍ය නිවේදන පවා නිකුත් කරමින් සිටිනවා.

අපි කවුරුත් දන්නවා, මේ වනකොට විශාල සංවර්ධන ප්‍රවේශයක් අපි ඇති කර ගෙන තිබෙන බව. පසු ගිය කාලය තුළ අපි දැක්කා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපේ රට පිළිබඳව ඉතාම ඉහළ අගයකින් කථා කළ බව. ඒ වගේම අපි දැක්කා, ආසියාකාරයේ නැඟී එන රට ශ්‍රී ලංකාව කියා ලෝක බැංකුව ප්‍රසිද්ධ මාධ්‍ය සාකච්ඡා පවත්වලා ප්‍රකාශයට පත් කළ බව. ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානයේ රටවල් ප්‍රකාශ කළා, අපේ රට ඉතාම සෞඛ්‍ය සම්පන්න රටක්; ආසියාවේ සෞඛ්‍ය සම්පන්න රටවල් අතර පෙරමුණේ ඉන්නවා කියලා. අපි ත්‍රස්තවාදය නිමා කර ගත්තාට පස්සේ මේවා තමයි අපේ ජනතාවට ලැබුණ විශාල ප්‍රතිලාභ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සුබවාදී ප්‍රකාශ අහගෙන ඉන්න බැරි අය, මේ සුබවාදී ප්‍රකාශ දෙස බලාගෙන ඉන්න බැරි රටවල්, කණ්ඩායම්, සංවිධාන ඒ වගේම දේශපාලන පක්ෂ විශාල වශයෙන් සිටිනවා. අපේ ජනතාව ඉතාම සාමකාමීව සහජීවනයෙන් කටයුතු කරන එක විනාශ කර දැමීම සඳහා ඒ අය විවිධාකාරයේ හස්තයන් ක්‍රියාත්මක කරමින්, මේ ජන ජීවිතය කඩා දැමීම සඳහා යම් ආකාරයේ කටයුතු කරන බව අපි දුටුවා.

පසු ගිය කාලය තුළදී කහවත්ත වාගේ ප්‍රදේශවල ඇති කරපු ප්‍රශ්න, වතුකරයේ ඇති කරපු ප්‍රශ්න, උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ ඇති කරපු ප්‍රශ්න, පුත්තලම වාගේ ප්‍රදේශවල ඇති කරපු ප්‍රශ්න, ඒ වගේම තවත් නොයෙකුත් ප්‍රදේශවල අනියමින් ඇති කරපු ප්‍රශ්න නිසා සමහර අවස්ථාවලදී ජීවිත පවා විනාශයට පත් වුණා. ඒ වාගේම ජන ජීවිතය කඩාකප්පල් වුණා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට අපේ රටේ ජාතික ආර්ථිකයටත් වක්‍රාකාරයෙන් විශාල ප්‍රශ්න ආව හැටි අපි දැක්කා. ඒ නිසා මේ අවුල් සහගත වැඩ පිළිවෙළවල් පරාජයට පත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේවා පරාජයට පත් කරන්න අපේ අතිගරු ජනාධිපතිතුමාට විතරක් වගකීම දෙන එක සුදුසු නැහැ. මේ කටයුතු ආරක්ෂක ලේකම්තුමාට පමණක්, පොලිස්පතිතුමාට පමණක්, වෙනත් දේශපාලඥයකුට පමණක් එහෙම නැත්නම් ඇමතිවරයකුට පමණක් තනියම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේකට සිවිල් ජනතාවගේ සහයෝගය ලබා ගන්න අවශ්‍ය වෙලා තිබෙනවා. සිවිල් ජනතාවගේ සහයෝගය ලබා ගන්න ඉතාම හොඳ ස්ථානයක් තමයි සිවිල් ආරක්ෂක කමිටු. පසු ගිය කාලයේ ත්‍රස්තවාදය නිමාවට පත් කරන්න යන ගමනේදී සිවිල් ආරක්ෂක කමිටුවලින් අතිවිශාල සේවාවක් සිදු වුණා. පොලිස් දෙපාර්තමේන්තුවට වාගේම රාජ්‍ය ආරක්ෂක අංශවලට එයින් විශාල සහයෝගයක් ලැබුණා. නමුත් පසු ගිය කාලය තුළදී ඒ කටයුතු යම් ප්‍රමාණයකට අඩපණ වෙලා තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. එහෙම අඩපණ වෙලා තිබෙන්නේ, ඔවුන්ව යම් කිසි ආකාරයකට නැවත motivate කරන්න, ඔවුන්ව දිරි ගන්වන්න, ඔවුන්ව සවිබල ගන්වන්න, උනන්දු කරවන්න වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න කටයුතු නොකරන නිසායි. අතිගරු ජනාධිපතිතුමා ඒ ගැන අවධානය යොමු කරලා, ඒ විෂයය භාරව මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා පත් කරලා ජාතික කමිටු, දිස්ත්‍රික් කමිටු, ප්‍රාදේශීය කමිටු, ග්‍රාමීය කමිටු පිහිටුවන්න කටයුතු කරලා තිබෙනවා. මේවා සවිබල ගැන්වීම තුළින් අපේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා විශාල ශක්තියක් ලැබෙනවා.

ඒ සම්බන්ධව මා එක උදාහරණයක් කියන්න කැමැතියි. සිවිල් ආරක්ෂක කමිටු සවිබල ගැන්වීම සඳහා මේ රජය ඉදිරිපත් කර තිබෙන "සුරකිමු ලංකා" වැඩසටහන යටතේ ග්‍රාමීය කමිටුවේ සභාපතිත්වය දරන්න මේ පොතේ හැටියට නම් කරන්නේ විදුහල්පතිවරයෙක්. නමුත් හැම ග්‍රාමසේවා වසමකම විදුහල්පතිවරයෙක් නැහැ. අපි දන්නවා, විදුහල්පතිවරු හිටියාට ඔවුන් ඉතාම කාර්ය බහුල ජීවිත ගත කරන බව. ඔවුන් උදේ ඉඳලා හවස් වනතුරු පාසලේ විවිධ සංවර්ධන කටයුතු සඳහා යොමු වෙලා සිටිනවා. ඒ වාගේ කෙනෙක් සභාපති ධුරයේ නාමිකව තැබුවාට අපි බලාපොරොත්තු වන අරමුණ ඉටු වන්නේ නැහැ. ගම තුළ මොකක්ද වන්නේ, ගමට පිටින් මොනවා හරි ප්‍රශ්නයක් ආවාද,බොරු ප්‍රචාර පැතිරෙනවාද, ඒවාට කොයි ආකාරයේ උත්තරයක්ද දෙන්න ඕනෑ, ගම සංවිධානය කර ගන්න ඕනෑ කොහොමද කියන ඒ නායකත්වය දෙන්න අපහසුතාවයක් ඔවුන්ට ඇති වෙනවා. මා එක උදාහරණයක් විතරයි පෙන්වා දුන්නේ. ඒ නිසා මේ වැඩ පිළිවෙළට අවශ්‍ය සංශෝධන කරලා මේ කමිටු ඉතාම සක්‍රීය තත්ත්වයට පත් කරලා, රජය බලාපොරොත්තු වන අරමුණ කරා ගෙන යන්න පුළුවන් විධියේ සංවිධාන ජාලයක් නැත්නම් ක්‍රමවේදයක් සකස් කිරීම අත්‍යවශ්‍යයි කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. මා මීට වඩා කරුණු පැහැදිලි කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

විශේෂයෙන්ම අපි ත්‍රස්තවාදයෙන් මුදා ගෙන එක් සේසත් කළ දේශයේ සාමය, සමඟිය, සහජීවනය සහ සංවර්ධනය තුළින් අභිමානවත් අනාගතයක් ගොඩ නඟන්න අපේ මේ සිවිල් ආරක්ෂක කමිටුවල ශක්තිය අපේ මේ ජාතික වැඩ පිළිවෙළට යොදා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කර කටයුතු කිරීම සුදුසුයි කියන එක මතක් කරමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Alhaj A.H.M. Azwer will second the Motion.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් වෙලා තිබෙන ඉතාමත්ම කාලෝචිත යෝජනාව මා ස්ථිර කරනවා. අද රටේ සාමය ඇති වෙලා තිබෙනවා; සංවරය ඇති වෙලා තිබෙනවා; සමෘද්ධිය කරා රට පෙරට යනවා. මේකයි මහින්ද චින්තනයේ ආකර්ෂණීය ශක්තිය. විවිධ අවස්ථාවලදී ලෝකයේ ප්‍රචණ්ඩ ක්‍රියා,

මිනී මැරීම්, දේශපාලන ඝාතන, නායක ඝාතන සිදු වී තිබෙනවා. එය අපට විතරක් සිදු වූ දෙයක් නොවෙයි. ඉස්සෙල්ලාම මේ ආකාරයට සිද්ධ වුණු දෙයක් තමයි 1959 සැප්තැම්බර් මාසයේ 26 වැනිදා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාට වෙඩි තබා ඝාතනය කිරීම. ඒ පිළිබඳව විස්තර මා අතේ තිබෙන මේ පොතේ අඩංගු වී තිබෙනවා.

I have this book with me, titled “Dossier Corea: A Portfolio on Crime”. It was well-written by a famous and popular columnist, a crime writer, Firoze Sameer. The whole tragic story is documented in this book very well. This is a fastest-selling publication throughout the world. It is in the website also. You can go to it and read it.

Sir, we fully realize that there is peace. We know that we have won the whole country. The whole world knows that we have won our country. His Excellency Mahinda Rajapaksa has won the country and won the hearts of the whole world. See the progress that we are making!

I must thank the Hon. Shantha Bandara, MP for spotlighting these issues before the House today in order to enlighten the nation. It was only yesterday so many water supply schemes were declared opened by His Excellency the President in the North. Now, our Friends from the North say that nothing has been done over there. But, the amount of projects inaugurated in the North yesterday was amazing and that has never happened before in this country’s history. රුපියල් මිලියන 995ක් වැය කර උප්පාරු පාලම, රුපියල් මිලියන 956ක් වැය කර ගංගෙයි පාලම, රුපියල් මිලියන 575ක් වැය කර රාල්කුලි පාලම, රුපියල් මිලියන 250ක් වැය කර වෙරුගල් පාලම, රුපියල් මිලියන 202ක් වැය කර කායංකේණි පාලම ඉදි කරලා තිබෙනවා. ඒ එක්කම විශාල ජල ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. අද "ඩේලි නිව්ස්" පත්තරයේ first page එක බලන්න. In today's "Daily News", there is a very impressive and an attractive photograph. Under that photograph, what does it say? It states, I quote:

“President Mahinda Rajapaksa yesterday inaugurated the Batticaloa-Vavunathivu water supply scheme. Here the President unveils the commemorative plaque to open the pump house and administrative building. Eastern Province Governor Rear Admiral

Mohan Wijewickrama, Water Resources and Drainage Minister Dinesh Gunawardena, Deputy Ministers Nirupama Rajapaksa and Vinayagamurthi Muralitharan were among those present.”

At left, the aerial view of the pump-house is also published.

The Hon. Dinesh Gunawardena, Minister of Water Supply and Drainage has done a gigantic task. He is providing water not only to the people in the South, but to the people of the North also. The second largest water supply project has been inaugurated in the North yesterday. Now, the Tamil MPs come here and say:

"போராட்டம்! போராட்டம்! உரிமை! உரிமை!" இவற்றினைக் கடதாசியில் எழுதி இனிப்புப் பண்டம்போல் சாப்பிடலாமா? அது ருசிக்குமா? இனிக்குமா? கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நீங்களும் உங்களுடைய தலைவர் மாண்புமிகு டக்ளஸ் தேவானந்தா அவர்களும் யதார்த்தத்தை உணர்ந்து, வடக்கிலுள்ள தமிழ் மக்கள் வாழுகின்ற பிரதேசங்களை அபிவிருத்தி செய்யவேண்டும் என்ற நல்ல நோக்குடன், இலட்சியத்துடன் செயலாற்றி வருகின்றீர்கள். இதனால், தற்பொழுது வடபகுதி மக்களுடைய வாழ்க்கைத்தரம் உயர்வடைந்து வருகின்றது. நேற்று முன்தினம் பொருளாதார அபிவிருத்தி அமைச்சர் மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ அவர்கள்

"யார் என்ன சொன்னாலும் நாங்கள் வடக்கை அபிவிருத்தி செய்வோம்; முஸ்லிம்களுக்கு உதவி செய்வோம்; முஸ்லிம்களுடைய புனருத்தாபனத்துக்காக - மீள்குடியேற்றத்துக்காக உதவிசெய்வோம்"

என்று கூறியிருப்பது பத்திரிகைகளில் வெளியாகியிருக்கின்றது. அத்துடன், இன்னுமொரு உண்மையையும் அவர் சுட்டிக்காட்டியிருக்கின்றார். அதாவது,

"சில வெளிநாட்டு ஏஜன்சிகள் முஸ்லிம்களுக்கு உதவ பணம் தருவதற்கு மறுக்கின்றன."

யார் இந்த 'ஏஜன்சி'கள்? என்று இச்சபையில் இன்று நான் கேட்கின்றேன். ஐக்கிய தேசியக் கட்சியினுடைய கட்டுப்பாட்டிலுள்ள ஏஜன்சிகள்தான் இவை! இவர்கள் ஒருபோதும் வடக்கிலோ, ஏனைய பிரதேசங்களிலோ முஸ்லிம்களுக்கோ, தமிழர்களுக்கோ உதவிகளைச் செய்யப்போவதில்லை என்பது உலகம் அறிந்த உண்மை. 21 ஆண்டுகளுக்கு முன்னர் வட பகுதியிலிருந்து விரட்டியடிக்கப்பட்ட - துரத்தியடிக்கப்பட்ட - முஸ்லிம்கள் தற்பொழுதுதான் மீளக்குடியமர்கின்றார்கள். அங்கு பிரபலமான கல்லூரிகள் இரண்டு உள்ளன என்பது உங்களுக்குத் தெரியும். ஒன்று அபூபக்கர் வீதியிலுள்ள கதீஜா மகா வித்தியாலயம். மற்றையது, ஒஸ்மானியா மகா வித்தியாலயம். தற்பொழுது, அவற்றில் மீளவும் வகுப்புக்கள் நடைபெற்றுவருகின்றன. அவ்விரு பாடசாலைகளும் முன்பிருந்த நிலைக்குத் தரம் உயர்த்தப்படவேண்டும்.

யாழ்ப்பாணத்தில் பெரும் அறிஞர்கள் பிறந்திருக்கின்றார்கள். அங்கே முஸ்லிம் அறிஞர்களும் பிறந்து வாழ்ந்திருக்கின்றார்கள். அவர்களுள் கொழும்பு - மருதானை சாஹிராக் கல்லூரியின் முன்னாள் அதிபரும் செனட்டருமான ஏ.எம்.ஏ. அஸீஸ் அவர்கள் பிறந்தது, வளர்ந்ததெல்லாம் மூர் வீதியிலுள்ள அவருடைய தகப்பனாரின் பெயரைக்கொண்ட அபூபக்கர் ஹாஜியார் தெருவில்தான். அதேபோலவே, Justice எம்.எம். அப்துல்காதர் அவர்களும் யாழ். மண்ணின் உயரிய மைந்தன். யாழ்ப்பாணத்தில் முதல் முதலாக முஸ்லிம் மேயராகத் தெரிவுசெய்யப்பட்ட காதி அல்ஹாஜ் எம்.எம். சுல்தான் அவர்கள் பிறந்த இடமும் யாழ். பட்டணமே! சுபைர் இளங்கீரன் போன்ற தலைசிறந்த எழுத்தாளர்களை உருவாக்கிய மண்ணும் யாழ்ப்பாணமே! இப்படியாகப் பார்க்கும்பொழுது, யாழ்ப்பாணம் நல்லதொரு விளைநிலம் - அறிஞர்களைக் கண்ட பூமி! எனவே, அரசாங்கம் அங்கு முஸ்லிம்களின் வாழ்க்கையினை மீளமைத்துக் கொடுக்கவேண்டும். தமிழ் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்தவர்கள் ஒருநாளும் யாழ்ப்பாணத்து முஸ்லிம்களுடைய வாழ்க்கையைப் பற்றிப் பேசியதேயில்லை. இது எமக்கு அதிர்ச்சியளிக்கும் செயலாகும். இதனையிட்டு நாங்கள் எங்களுடைய கவலையைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றோம்.

මගේ අතේ තිබෙනවා, "දෙසතිය" පුවත් සඟරාව. මේක ඉතාමත්ම හොඳින් අලංකාරව මුද්‍රණය කරපු සඟරාවක්. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින්යි නිකුත් කරන්නේ. මෙහි 12 වැනි පිටුවේ, විදේශ විත්ති/එංගලන්තය යන මාතෘකාව යටතේ සඳහන් වනවා, "ලන්ඩන් ගිනි කෙළි හා මළ කෙළි " යනුවෙන්. සටහන ඉදිරිපත් කර තිබෙන්නේ, ධර්මදාස ගමගේ මහත්මයා. එහි මෙසේ සඳහන් වනවා:

"බ්‍රිතාන්‍ය පොලීසිය මඟින් අත්තනෝමතික ලෙස මරා දමනු ලැබූ සිවිල් වැසියකු මුල්කර ගනිමින් ඇවිළී යන ප්‍රචණ්ඩත්වය දෙසතියක් ගෙවී ගියත් මර්දනය කර ගන්නට හැකි වූයේ නැහැ."

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

මෙන්න එංගලන්තයේ තත්ත්වය. අපි කොයි තරම් දුරට වර්ධනය වී තිබෙනවාද? ලංකාවේ තිබූ සියලු කලහකාරී තත්ත්වයන් මර්දනය කරලා සාමකාමී තත්ත්වයකට රට පරිවර්තනය කරලා අවසානයි. ඊළඟට මෙහෙම කියනවා:

"තුන්වන ලෝකයේ රටවල පොලීසිය හා හමුදා මානව හිමිකම් උල්ලංඝණය කොට අහිංසක සිවිල් පුද්ගලයන් ඝාතනය කරනවා යැයි චෝදනා කරන බ්‍රිතාන්‍ය වැනි රටවල පොලීසිය පවා මානව හිමිකම් රකින ආකාරය මින් පැහැදිලි වෙනවා."

අපේ පොලීසිය මොන තරම් සංවරයිද? දැන් එක්සත් ජාතික පක්ෂයේ අය මෙහි නැඟිටලා පොලීසියට අගෞරව කරනවා; පොලීසියට පහර ගහනවා; පොලීසියට අපහාස කරනවා. පොලිස් uniform එක රට ආරක්ෂා කරන uniform එක. ඒක අමතක කරන්න එපා. හමුදාවේ uniform එක රට ආරක්ෂා කර දුන්නු uniform එක. ගුවන් හමුදාව, නාවික හමුදාවත් එසේමයි. එහෙනම් මේ විරෝදාර භටයන්ව අපි ආරක්ෂා කළ යුතුයි. මෙතැන හොඳින් කියලා තිබෙනවා, අද බ්‍රිතාන්‍යයේ තත්ත්වය. ඊළඟට 14 වැනි පිටුවේ මෙසේ සඳහන් වනවා:

"1980 ජාතිභේදවාදී කැරැලිවලින් පසු ලන්ඩනයේ ඇති වූ විශාලතම නොසන්සුන්තාව බවට එය පත් වුණා. මෙම විරෝධතාවලින් මිය ගිය සංඛ්‍යාව 5ක්. විශාල පිරිසක් තුවාල ලබා රෝහල් ගත කළා."

එම පිටුවේම තවත් තැනක මෙසේ සඳහන් වනවා:

"ලෝක සමාජවාදී වෙබ් අඩවියේ රොබර්ට් ස්ටීවන්ස් ප්‍රකාශ කරන්නේ 1990ත් 2011ත් අතර පොලිස් වෙඩිතැබීම්වලින් 53 දෙනකු ඝාතනය වී ඇති බව. මේ කිසිවකුට වගකිවයුතු නිලධාරින් වැරැදිකරුවන් කර දඬුවම් දී නැති වීම එංගලන්තයේ මානව හිමිකම් කෙ සේ ද යන්න පෙන්වා දෙන්නක්."

ඊළඟට 15 වැනි පිටුවේ මෙසේ සඳහන් වනවා:

"ජනතා අසහනය ගිය අවුරුද්දේ අවසාන භාගයේදී ද දක්නට ලැබුණු අතර මෙ වර එය දැඩි ලෙස පුපුරා ගිය බව යි පෙනී යන්නේ.

ගිය අවුරුද්දේ (2010) නොවැම්බර හා දෙසැම්බර මාසවල විශ්වවිද්‍යාල සිසුන් හා තරුණ වයසේ පිරිස් වීදි බැස විරෝධතාවල යෙදුණේ සිය විශ්ව විද්‍යාල ගාස්තු තුන් ගුණයකින් වැඩි කිරීමට විරුද්ධ ව. දෙසැම්බර 9 වැනි දා ඔවුන්ගේ විරෝධතාවකට මැදි වුණු චාල්ස් කුමාරයාගේ රෝලස් රොයිස් මෝටර් රථයට ද ප්‍රහාරයක් එල්ල වූ බව මේ අවස්ථාවේ දී මතකයට නැඟෙන්නක්."

මෙන්න එංගලන්තයේ තත්ත්වය. ඇමෙරිකාවේ තත්ත්වය ඊටත් වඩා දරුණුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම අසුභ ආරංචියක් ලැබුණා අපට. අපේ රටට හිතවත් මිත්‍රයෙක්-

In the world scene, Colonel Muammar Al Gaddafi, the Leader of Libya had been arrested by the foreign armed forces. We do not know his fate. We, as Muslims pray to அல்லாஹு ஸுப்ஹானஹு தஆலா for his safety and for the country because these counties are self-governing countries. Their sovereignty and independence must be recognized. Now, that is not happening as far as the Superpowers are concerned. Tomorrow is Friday and according to our calendar, it is a holiday for the Muslims for the week. All the Muslims in this country and all over the world will also pray for the safety of this great leader and also for the great country called Libya. It is not only Libya, it is not only the other Arab countries like Iraq, Iran, Egypt, Afghanistan but also other countries. Nobody can come and conquer our country however much powerful they are, as if it is their own business and nobody else's business. Who gave them that right? Has God given the right to any Superpower on earth in order to conquer another country? So, we must be very cautious and aware of these things. We know there are Members of the Opposition - there is not a single UNP Member present today - who go right round the world spreading rumours about Sri Lanka. They want Sri Lanka to be subjugated by foreign powers again. As long as His Excellency Mahinda Rajapaksa is at the helm of affairs of this country and as long as loyal and brave people live in this country, we shall not allow such a thing to happen.

Now, the Hon. Shantha Bandara spoke about the stability. We have won all the Local Governments Elections. In Colombo too, it is a win for us. In 2002, the UNP polled 136,854 votes and in 2011, it polled only 101,920 votes. Their vote base has been eroded. In 2002, the UNP won 32 seats and now in 2011, it won only 24 seats. In 2002, the UNP has received 57.83 per cent of the vote and this time, it received only 43 per cent of the vote.

But, we are glad to note there is a silver line in everything. The "Engal Thesam" -" எங்கள் தேசம்" - newspaper of October 15-31, 2011 reports, I quote :

"இம்முறை கண்டி, நுவரெலியா ஆகிய மாநகராட்சிகள்கூட ஐ.தே.க. வின் பிடியிலிருந்து விடுபட்டுள்ளன. இவ்விரு நகரங்களிலுமுள்ள சிறுபான்மையினரின் ஆதரவு முன்பெல்லாம் ஐ.தே.க. வுக்கு இலகுவாகக் கிடைத்தவண்ணமிருந்தன. அவற்றைத் தக்கவைத்துக்கொள்வதற்குரிய உத்திகள் ஐ.தே.க. விடமிருந்து நீங்கிவிட்ட நிலையில் கட்சியின் உட்பூசல்கள், தலைமைத்துப் போட்டி, எந்தப் புதிய திட்டங்களும் கொள்கைகளும் முன்வைக்கப்படாமை ஆகிய காரணங்கள் இதில் செல்வாக்குச் செலுத்தியிருக்கலாம்."

இதன் காரணமாக அவர்கள் இருக்கின்ற பணத்தையும் இழந்திருக்கிறார்கள். But, Mr. A.J.M. Muzammil, the Mayor elect has publicly told - there is a lengthy interview in the "Dinamina", I do not want to read the whole thing; I do not have time - that he appreciates the Urban Development schemes launched by Mr. Gotabaya Rajapaksa, Secretary to the Ministry of Defence and he says he will co-operate with him. Earlier, during the election time, the UNP said that they would build 65,000 new housing units in Colombo. When the "Dinamina" reporter asked Mayor Muzammil: "Will you build 65,000 new housing units?", he said, "Ask that from Sajith Premadasa". This is the way that party has disintegrated now. Therefore, I once again thank the Hon. Shantha Bandara for bringing this Adjournment Motion today and all what he said will be brought by me to the notice of the Minister concerned.

Thank you very much.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Is there any other Member to speak before the Hon. Minister concerned gives his reply? No. Then the next speaker is the Hon. S.M. Chandrasena. Before he speaks, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. එදා ත්‍රස්තවාදයට යට වෙලා තිබුණු අපේ රට ත්‍රස්තවාදයෙන් බේරා ගන්න ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක නිලධාරීන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරන කොට විශේෂයෙන්ම ගම් ආරක්ෂා කරන්නයි, ඒ වාගේම අපේ රටේ ජනතාව ආරක්ෂා කරන්නයි සිවිල් ආරක්ෂක කමිටු පිහිටෙව්වේ. අපේ රට බේරා ගැනීමේ විශාල කාර්ය භාරයේදී එදා සිවිල් ආරක්ෂක කමිටුවලින් වූ මෙහෙය අපට අමතක කරන්න බැහැ. රට බේරා ගැනීමේ ඒ විශේෂ කාර්ය භාරයේදී සිවිල් ආරක්ෂක කමිටු කටයුතු කරපු ආකාරය පිළිබඳව අපි අදත් මෙනෙහි කරන්න ඕනෑ. ඒ වාගේම අපි ඒ අයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමා කිව්වා වාගේ යුද්ධය අවසන් වෙලා ත්‍රස්තවාදය අවසන් වුණාට තවත් නොයෙක් ආකාරයේ ජාත්‍යන්තර අත පෙවිලි සහ අපේ රටේ සාමය විනාශ කරන්නට තවත් නොයෙකුත් කුමන්ත්‍රණ හැම තැනම වාගේ ක්‍රියාත්මක වෙනවා. වර්ග සැතපුම් 25,000ක් පමණ වන අපේ රට ආරක්ෂා කර ගන්න සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අද එකා වාගේ එකතු වෙලා සිටියත් විදේශ බලවේග විශාල වශයෙන් මේ සමඟිය නැති කරන්න, මේ සාමය නැති කරන්න කටයුතු කරනවා කියන එක අපි දන්නවා. ඒ නිසා නොයෙකුත් විෂබීජ වපුරනවා. පසු ගිය කාලයේ ග්‍රීස් යකා වාගේ දේවල් ගෙනැල්ලා හැම තැනම ජනතාව ව්‍යාකූල තත්ත්වයට පත් කළා. ඒ වාගේම අපි දන්නවා කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ඇති වෙච්ච සිද්ධිය ගැන. ඒවා කුමන්ත්‍රණ. ඒ කුමන්ත්‍රණ තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒවායේ ප්‍රතිඵල අපට විටින් විට භුක්ති විඳින්න සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදය අවසන් වෙච්ච රටක් හැටියට අපේ රට ලෝකයේ ඉතිහාසගත වෙනවා. ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි නායකත්වය දීලා අපේ රට බේරා ගත්තේ. රට බේරා ගත්තා විතරක් නොවෙයි, එතුමා මේ කලාපයටම, ලෝකයටම විශාල ආදර්ශයක් ලබා දුන්නා. ත්‍රස්තවාදය නැති කරන්න පුළුවන් කියන පණිවුඩය ලෝකයට දුන්නු නායකයා එතුමායි. ඒ පණිවුඩය ලෝකයට දුන්නු රට අපේ රටයි. එවැනි වටිනාකමක් තිබෙන මේ රට නැවත විනාශ කරන්න හදන කොට, අවුල් කරන්න හදන කොට, ජන ජීවිතය ව්‍යාකූල තත්ත්වයට පත් කරන්න එන කොට අප සියලු දෙනාම එකා වාගේ එකතු වෙන්න ඕනෑ කිසිම භේදයකින් තොරව.

ඒක තමයි අද විය යුත්තේ. අපි දන්නවා, ලිබියාව ගොඩ නඟපු මුවම්මර් ගඩාෆි ඉතාම ශ්‍රේෂ්ඨ නායකයෙක් කියලා. විදේශ අත පෙවිලි නිසා, විදේශ කුමන්ත්‍රණ නිසා ඒ රට අද විනාශ වෙලා තිබෙනවා. ඒකේ පාඩුව වන්නේ ඒ රටේ අයටමයි. කුමන්ත්‍රණකරුවන්ගේ කුමන්ත්‍රණවලට අහු වෙලා කෝටියක් වටිනා රාජ්‍ය නායකයෙක් අද විනාශ කරලා තිබෙනවා. ඒ වාගේම ඒ රට විනාශ වෙලා තිබෙනවා. ඒ රට නැවත ගොඩ නඟන්න අවුරුදු ගණනක් යනවා. ඒකේ පාඩුව වන්නේ රටේ ජනතාවටමයි. ලිබියාවේ අයට දැන් ඒ පාඩුව දැනිලා ඇති.

ඉරාකයේත් ඒකම සිද්ධ වුණා. සදාම් හුසේන් තමයි ඉරාකය ගොඩ නැඟුවේ. ඉරාකය ගොඩ නඟලා රට ස්වයංපෝෂිත කළා. අන්තිමට සදාම් හුසේන් එල්ලා මැරුවා. අද මුළු රටම විනාශ වෙලා; යුද ගිනි ඇවිළිලා. ඉතින් මේවා අපට හොඳ උදාහරණයි. අපේ රටටත් ඒ දෙය කරන්න තමයි කුමන්ත්‍රණකරුවෝ දඟලන්නේ. ඒක අපේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ. තමන්ගේ දේශපාලන පක්ෂයේ ලකුණ අලියා වන්න පුළුවන්, බුලත් කොළය වන්න පුළුවන්, සීනුව වන්න පුළුවන්. නමුත් මේ ලකුණුවත්, පාටවත් නොවෙයි අද අවශ්‍ය වන්නේ. අපට මේ සියලු දෙයම කරන්න රට බේරෙන්න ඕනෑ; රට සුරක්ෂිත වන්න ඕනෑ; රටේ සාමය තිබෙන්න ඕනෑ. අපි අද භය නැතුව බස් එකේ යනවා; කෝච්චියේ යනවා; ළමයා පාසලට යනවා. අද මැති ඇමතිවරුනුත් භය නැතුව පාරේ යනවා. අද බිම් බෝම්බත් නැහැ; ක්ලේමෝ බෝම්බත් නැහැ. මේ සියලු දේවලින්ම පිරිසිදු කර ගත්ත රට නැවත වරක් අපිරිසිදු කර ගන්න දෙන්න බැහැ.

සිවිල් ආරක්ෂක කමිටු ඉතාම ශක්තිමත් කරන්න ඕනෑ. ඒ පිළිබඳව ජනතාව දැනුවත් කරන්න ඕනෑ. සිවිල් ආරක්ෂක කමිටු දැනට ක්‍රියාත්මක වනවා; ක්‍රියාත්මක නොවෙනවා නොවෙයි. මෙම කමිටුවලට පක්ෂ භේදයෙන් තොරව හැම කෙනාම එකතු කර ගන්නත් ඕනෑ. මොකද, මේ කමිටුවලට පක්ෂයක් තිබිලා බැහැ. ඒ කමිටු මෙහෙයවන පිරිස අවංක වන්න ඕනෑ; විශ්වාසවන්ත වන්න ඕනෑ. එහෙම නැත්නම් සිවිල් ආරක්ෂක කමිටු ඇතුළට කවුරුන් හෝ රිංගා නැති කුමන්ත්‍රණ කරන්නත් පුළුවන්. සිවිල් ආරක්ෂක සේවාවේ වැඩ කොටස් පිළිබඳව, අපේ වැඩසටහන පිළිබඳව ලේඛන තිබෙනවා. එම ලේඛන මා **සභාගත*** කරනවා.

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

විශේෂයෙන් ම රජයක් හැටියට අපි මේ රට නැවත අවුල් කරන්න දෙන්නේ නැහැ; විනාශ කරන්න දෙන්නේ නැහැ. අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක සේවාව ඉතාම දැඩිව ක්‍රියාත්මක වනවා. අතිගරු ජනාධිපතිතුමා මවු බිම රැක ගන්න විශාල කාර්ය භාරයක් කළා. ඊට සහාය දුන්නු සෙන්පතියා හැටියට අපේ ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්තුමා ඉතාම ඕනෑකමින් මේ මවු බිම සුරක්ෂිත කර ගන්න, ආරක්ෂා කර ගන්න, ජනතාව ආරක්ෂා කරන්න ඒ මෙහෙයුම තවම කරනවා. එතුමාට සහයෝගය ලබා දෙන්න, එතුමාගේ වැඩ පිළිවෙළට සහයෝගය ලබා දෙන්න මේ සියලු ආරක්ෂක කමිටු ශක්තිමත් වන්න ඕනෑ. ඒ සිවිල් ආරක්ෂක කමිටු ප්‍රාණවත් කරලා ඒ කමිටු හැම දාම ක්‍රියාත්මක කරන්න ඕනෑ. දැන් යුද්ධය ඉවරයි; ත්‍රස්තවාදය ඉවරයි කියලා මේ කමිටු වසා දමා හරි යන්නේ නැහැ. විපක්ෂයේ සමහර අය නම් කියන්නේ දැන් යුද්ධය ඉවරයි, එම නිසා ත්‍රිවිධ හමුදාව - යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව- බැරැක්කවලට යවන්න ඕනෑය කියලායි. එහෙම හරි යන්නේ නැහැ. අපේ රට ආරක්ෂා කර ගන්න ඕනෑ. ආරක්ෂා කර ගන්න නම් අපි නිතරම විමසිල්ලෙන් ඉන්න ඕනෑ. ඒක අද ත්‍රිවිධ හමුදාවෙන්, පොලීසියෙන් හා සිවිල් ආරක්ෂක අංශයෙන් කරනවා. ඒකටත් අකුල් හෙළන, විවේචනය කරන අයත් ඉන්නවා. ඊට පස්සේ කනවෝ, කනවෝ කියලා කෑ ගහනවා. එම නිසා විශේෂයෙන්ම වග කිව යුතු රජයක් හැටියට, මවු බිමට ආදරය කරන රජයක් හැටියට, රටට ආදරය කරන රජයක් හැටියට, ජනතාව ආරක්ෂා කරන රජයක් හැටියට සිවිල් ආරක්ෂක සේවාව ශක්තිමත් කරන්න, සිවිල් ආරක්ෂක කමිටු ශක්තිමත් කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම අපේ රටේ එවැනි අවුල් තත්ත්වයක් නැවත ඇති වන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

අපේ රජය ශක්තිමත් රජයක්. ජනාධිපතිතුමා ශක්තිමත්. තුනෙන් දෙකකට වැඩි බලයක් තිබෙන, මන්ත්‍රී ධුර 161ක් තිබෙන රජයක් මේක. ඒ අතින් බැලුවාම ඉතාම ශක්තිමත්. ශක්තිමත් රජයක් හැටියට මේ රජයේ වගකීම තමයි ජනතාව ආරක්ෂා කිරීම. ඒ සඳහා ත්‍රිවිධ හමුදාව වාගේම සිවිල් ආරක්ෂක සේවාවත් ඉතාම ශක්තිමත්ව දිගටම ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ විධියටම ශක්තිමත්ව ඉදිරියටත් ගෙන යන්න ඕනෑ. අපි රජයක් හැටියට ඒ කාර්යය කරනවා.

විශේෂයෙන්ම මම ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා.එතුමා පාර්ලිමේන්තුවට එන්න ඉස්සෙල්ලා කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙක් හැටියට මුල ඉඳන්ම ක්‍රියා කළ බව මම දන්නවා. අදත් එතුමා අපේ ආණ්ඩු පාර්ශ්වයේ කණ්ඩායම්වල මේ පිළිබඳව නිතරම කථා කරනවා. ඒ වාගේම එතුමා ජනතාව දැනුවත් කරන්න, අපේ මේ උත්තරීතර ආයතනය දැනුවත් කරන්න අද මේ යෝජනාව සද්භාවයෙන් ඉදිරිපත් කළා. ඒ පිළිබඳවත් එතුමාට ස්තුතිවන්ත වෙමින් රජය හැටියට අපි සිවිල් ආරක්ෂක සේවාව ශක්තිමත් කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

Order, please! ගරු මන්ත්‍රීවරුනි, දැන් ලැබුණු ආරංචියක් අනුව, ලිබියානු නායක මුවම්මර් ගඩාෆි මැතිතුමා අභාවප්‍රාප්ත වූ බව පවසයි. ඒ නිසා අපගේද ශෝකය මෙම අවස්ථාවේදී පළ කිරීමට කැමැතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.00ට, 2011 ඔක්තෝබර් 21 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப.7.00 மணிக்கு பாராளுமன்றம், 2011 ஒக்ரோபர் 21, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 7.00 p.m. until 1.30 p.m. on Friday, 21st October, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.